328 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 328 - இல. 07
Volume 328 - No. 07

2026 ජූලි 23වන බ්‍රහස්පතින්දා
2026 யூலை 23, வியாழக்கிழமை
Thursday, 23rd July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 1122]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1122]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1123-1170]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික දෙමළ සරණාගතයින් මුහුණ දෙන ගැටලු [තීරුව 1171]

රැකියා වීසා හා විදේශ රැකියා ලබා දීමේදී සිදුවන වංචා [තීරුව 1177]

**කොළඹ වරාය නගරයේ ගොඩ කරන ලද ඉඩම් සහ දේපළ බදු දීම සම්බන්ධව නීතිමය විධිවිධාන:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1181]

**ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ළමා අපයෝජන නඩු කඩිනම් කිරීම:**

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1188]

**ආනයන හා අපනයන (පාලන) පනත:**

රෙගුලාසි [තීරු 1195-1237]

**කල් තැබීමේ යෝජනාව:**

1983 කළු ජූලියෙන් උගත් පාඩම් තුළින් එක්සත් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැඟීම [තීරු 1238-1300]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1301-1302]

---

# பிரதான உள்ளடக்கம்

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 1122]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1122]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1123-1170]

**தனி அறிவித்தல் மூல வினா:**

இந்தியாவிலுள்ள இலங்கைத் தமிழ் அகதிகள் எதிர்கொள்ளும் பிரச்சினைகள் [ப: 1171]

வேலை விசா மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புகள் வழங்கலில் இடம்பெறும் மோசடிகள் [ப: 1177]

**கொழும்புத் துறைமுக நகர மீட்கப்பட்ட நிலம் மற்றும் சொத்துக்களைக் குத்தகைக்குவிடுதல் தொடர்பான சட்ட ஏற்பாடுகள்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 1181]

**சிறுவர் உரிமைகளைப் பாதுகாத்தலும் சிறுவர் துஷ்பிரயோக வழக்குகளை விரைவுபடுத்தலும்:**

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1188]

**இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 1195-1237]

**ஒத்திவைப்புப் பிரேரணை:**

1983 கறுப்பு யூலை வழங்கிய பாடங்களினூடாக ஒன்றுபட்ட இலங்கைத் தேசத்தை உருவாக்குதல் [ப: 1238-1300]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1301-1302]

---

# PRINCIPAL CONTENTS

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1122]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1122]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1123-1170]

QUESTION BY PRIVATE NOTICE:

Issues Faced by Sri Lankan Tamil Refugees in India [Col. 1171]

Frauds Involving Issuance of Job Visa and Foreign Employment Opportunities [Col. 1177]

LEGAL PROVISIONS APPLICABLE TO LEASING OUT RECLAIMED LAND AND PROPERTIES WITHIN COLOMBO PORT CITY:

Statement by Deputy Minister of Finance and Planning [Col. 1181]

SAFEGUARDING CHILDREN'S RIGHTS AND EXPEDITION OF CHILD ABUSE CASES:

Statement by Minister of Women and Child Affairs [Col. 1188]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:

Regulations [Cols. 1195-1237]

ADJOURNMENT MOTION:

Building a United Sri Lankan Nation with Lessons Learnt from Black July of 1983 [Cols. 1238-1300]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1301-1302]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 ජූලි 23වන බ්‍රහස්පතින්දා*
*2026 யூலை 23, வியாழக்கிழமை*
*Thursday, 23rd July, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Postgraduate Institute of Pali and Buddhist Studies of the University of Kelaniya for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the -

(i) Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Ministry of Finance, Planning and Economic Development and the thirteen institutions coming under its purview in the Report of the Committee on Public Accounts, which was presented to Parliament;

(ii) Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the five institutions coming under the purview of Ministry of Finance, Planning and Economic Development in the Report of the Committee on Public Accounts, which was presented to Parliament; and

(iii) Report on the observations and steps taken in terms of Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Human Rights Commission of Sri Lanka in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that these Reports be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා ]

අමාත්‍යාංශය යටතේ පවතින ආයතන තුනක් සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கையில் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களம் தொடர்பான விடயங்கள் பற்றி பாராளுமன்ற நிலையியற் கட்டளைகள் 119(4)இன் பிரகாரம், அவதானிப்புகள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் தொடர்பான அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2026 ජූනි 15 දිනැති අංක 2493/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2026 ජූනි 18 දිනැති අංක 2493/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද)

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, හබරාදූව, තල්ගස්මුල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. ගාමිණී මහතා සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මාතලේ, මහවෙල, පරණ දොඹවෙල, අංක 28, වෙල්එළිය යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.යූ.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

ගරු කථානායකතුමනි, ගෙලිඔය, ගුරුදෙණිය, රණවිරු මාවත, අංක 173/සී/2 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. සුමනරත්න බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, මඩකලපුව පාර, අංක 66 යන ලිපිනයෙහි පදිංචි බී.එල්. කිත්සිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -1190/2025 - (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கிறேன்.

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)

ගරු කථානායකතුමනි, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය: මුලතිව් දිස්ත්‍රික්කය
## சுற்றுலாத்துறையை மேம்படுத்தல்: முல்லைத்தீவு மாவட்டம்
## DEVELOPMENT OF TOURISM INDUSTRY: MULLAITIVU DISTRICT

1526/2025

**2. ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සංචාරක ආකර්ෂණ රැසකින් සමන්විත මුලතිව් දිස්ත්‍රික්කය සංචාරක කර්මාන්තය අතින් ඌන සංවර්ධිත දිස්ත්‍රික්කයක් ලෙස පවතින බව දන්නේද;

(ii) දේශීය සහ විදේශීය සංචාරක පැමිණීම ප්‍රවර්ධනය කිරීම පිණිස මුලතිව් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති කවරේද;

(iii) සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීම සඳහා මාර්ග, නවාතැන් පහසුකම්, සංචාරක නිකේතන සහ නැරඹුම් මධ්‍යස්ථාන ඇතුළු මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලසුම් කවරේද;

(iv) එම දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) මුලතිව් දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සංචාරක මඟපෙන්වන්නන් ලෙස, පරිසර සංචාරක පහසුකම් සලසන්නන් ලෙස හෝ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ වෘත්තිකයන් ලෙස පුහුණු කර සේවයේ යෙදවීමේ කිසියම් සැලසුමක් තිබේද;

(vi) මුලතිව් දිස්ත්‍රික්කයේ තෝරා ගත් ප්‍රදේශ කිහිපයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ විශේෂ සංචාරක කලාප ලෙස ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல கண்கவர் சுற்றுலாத் தளங்களைக்கொண்ட முல்லைத்தீவு மாவட்டம், சுற்றுலாத்துறையில் வளர்ச்சி குன்றிய மாவட்டமாகக் காணப் படுவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) உள்நாட்டு மற்றும் வெளிநாட்டு சுற்றுலாப் பயணிகளின் வருகையை அதிகரிப்பதற்காக முல்லைத்தீவு மாவட்டத்தில் செயற்படுத்தப்பட்ட விசேட கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) சுற்றுலாப் பயணிகளை ஈர்க்கும் வகையில், வீதிகள், தங்குமிட வசதிகள், சுற்றுலா விடுதிகள் மற்றும் பார்வையாளர் மையங்கள் உள்ளிட்ட அடிப்படை உட்கட்டமைப்பு வசதிகளை மேம் படுத்துவதற்கான திட்டங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி மாவட்டத்தின் சுற்றுலாத்துறையில் தனியார் துறையினரின் முதலீட்டை ஊக்குவிக்க மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) முல்லைத்தீவு மாவட்டத்தின் இளைஞர், யுவதி களை சுற்றுலா வழிகாட்டிகளாக, சூழலியல் சுற்றுலா வசதிகளை ஏற்பாடு செய்பவர்களாக அல்லது விருந்தோம்பல் துறையின் தொழில் வாண்மை மிக்கவர்களாக பயிற்சியளித்து பணியமர்த்துவதற்கு ஏதேனும் திட்டமொன்று உள்ளதா என்பதையும்;

(vi) முல்லைத்தீவு மாவட்டத்தில் தெரிவு செய்யப்பட்ட சில பிரதேசங்களை, இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின்கீழ் விசேட சுற்றுலா வலயங்களாகப் பிரகடனப் படுத்துவது குறித்து பரிசீலிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that the Mullaitivu District, which is endowed with numerous tourist attractions, remain as an underdeveloped District in terms of the tourism industry;

(ii) the special projects implemented in the Mullaitivu District to promote domestic and foreign tourist arrivals;

(iii) the plans to improve basic infrastructure facilities including roads, accommodation facilities, tourist resorts and observation centres to attract tourists;

(iv) the measures that will be taken to encourage private sector investment in the tourism sector in the said district;

(v) whether there is any plan to train and employ the youth of the Mullaitivu District as tour guides, eco-tourism facility providers or professionals in the hospitality sector; and

(vi) whether consideration will be given to declare several selected areas in the Mullaitivu District as Special Tourism Zones under the Sri Lanka Tourism Development Authority?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

Hon. Speaker, on behalf of the Minister of Foreign Affairs, Foreign Employment and Tourism, I answer the Question.

(a) (i) The Government has identified the tourism potential of the tourist attractions in the Northern Province, including in the Mullaitivu District. The Northern Provincial Tourism Bureau has prepared the 2026-2030 Tourism Development Plan for the Northern Province in collaboration with the Faculty of Postgraduate Studies of the University of Vavuniya, and plans to implement the necessary programmes to further develop it and make the Mullaitivu District a more attractive tourism destination for local and foreign tourists.

It has identified in detail the tourism potential, the major tourist attractions, resources, development opportunities, environmental analysis, gap analysis, strategic interventions, risk mitigation measures et cetera of each district of the Northern Province, including the Mullaitivu District. District-level meetings of government and non-government stakeholders were held throughout the Northern Province in the preparation of this Development Plan. The stakeholders' meeting for Mullaitivu District was held on 13th November, 2025 at the Mullaitivu District Secretariat, where 76 tourist attractions were identified in the district alone and 10 tourist destinations were selected by the stakeholders, considering their tourism potential and development importance.

(ii) Considering these environmental and tourism values, the Northern Provincial Tourism Bureau has identified these areas in the Mullaitivu District as high-priority tourist destinations in the Tourism Development Plan 2026-2030, and the proposed development projects will be implemented in phases in the future.

In order to promote domestic and foreign tourist arrivals in the Mullaitivu District, the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism released funds to the Mullaitivu District Secretary in 2025 for the following projects and those projects were completed in 2025 itself.

- Construction of a resting place with bathroom facilities at Kokkilai Puliyamunai Lagoon - Rs. 9.9 million
- Provision of passenger transport boats for Kokkilai Puliyamunai Lagoon - Rs. 9.92 million

Furthermore, a provision of Rs. 9.58 million has been released to the Mullaitivu District Secretary for the development of infrastructure at Kokkilai Puliyamunai Lagoon in the year 2024, and the said project had also been completed.

(iii) The Ministry of Foreign Affairs, Foreign Employment and Tourism has informed the Mullaitivu District Secretary by letter dated 09.02.2026 to submit tourism project proposals of the Mullaitivu District for the year 2027. Accordingly, 13 tourism project proposals had been submitted by letter dated 09.04.2026 of the Mullaitivu District Secretary and out of those project proposals, the following two project proposals had been forwarded to the Department of National Planning to obtain necessary approval for implementation under provisions from the 2027 budget of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism.

Those two projects are,

development of access roads and income generating facilities on the Mullaitivu coastline - Rs. 80 million.

Pulipenthakal Beach Tourism Development Project, Maritimepattu - Rs. 53.5 million.

(iv) As per the Tourism Development Plan 2026 -2030, there are significant investment opportunities for private sector investors to the develop tourism business in Mullaitivu District, especially in the coastal areas, and necessary measures are to be taken for that purpose.

Sir, since it is lengthy Answer for part (v), I **table*** it.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled :*

(v) Yes.

**(a) Current Programmes**

The Sri Lanka Tourism Development Authority has already established a system to train and employ youths in all provinces of Sri Lanka including Mullaitivu District as tour guides, eco-tourism service providers and professionals in hospitality sector.

**(b) Implementation Method**

From the year 2022, all provincial councils have been delegated the power to identify and select suitable candidates as per the qualifications mentioned in Extraordinary Gazette No. 2140/17, dated 10.09.2019 and the selection procedure approved by the Sri Lanka Tourism Development Authority. Accordingly, the selection of candidates will be done by the respective provincial councils, considering the needs and demands of the respective province. This programme is implemented covering all nine provinces of Sri Lanka, including the Northern Province and the Mullaitivu District. All the guidelines, procedures, required documents and written instructions required for the implementation of this programme have been communicated to all provincial councils on 25.01.2022.

**(c) Training Process**

The selected candidates will be referred to the relevant training programmes conducted by the Sri Lanka Institute of Tourism and Hotel Management and candidates who successfully complete the training and pass the prescribed examinations will be eligible to obtain licences.

**(d) Licence Insurance Process**

After the Sri Lanka Institute of Tourism and Hotel Management forwards the examination results to the Sri Lanka Tourism Development Authority, the Sri Lanka Tourism Development Authority issues the relevant licences free of charge upon payment of the prescribed fee by the applicant to the relevant provincial council and submission of the required documents.

Therefore, qualified youth in the Mullaitivu District also have the opportunity to undergo training and obtain licences under this system, when the relevant provincial council implements programmes based on provincial requirements.

Moreover, in addition to the above programme, the Northern Provincial Tourism Bureau, in collaboration with the Mullaitivu District Secretariat, has initiated the establishment of a Community-based Tourism Society to promote eco-system activities in the Kokkilai West area. Under this programme, the beneficiaries are to be provided with the necessary initial capital to prepare and serve food for tourists. Furthermore, training programmes on provision of tourism services, customer service, basic food safety and hygiene and health care practices are planned to be implemented. For the successful implementation of this programme, it is expected to create sustainable eco-tourism development by obtaining the cooperation of relevant government institutions, local communities, the private sector and other stakeholders.

In addition, the Sri Lanka Institute of Tourism and Hotel Management will conduct a three-month Hotel

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා ]

Multitasker Course under the title of "Sathkaraye Shrama Sena" from 2025 in collaboration with the Department of Samurdhi and other private hotel schools for the unemployed children of Samurdhi beneficiary families across the Island. At present, this programme is being conducted in about six districts and discussions are being held with the Mullaitivu District Secretary to hold this programme in the Mullaitivu District as well, and the course is scheduled to be commenced once the arrangements are made.

(vi) The Sri Lanka Tourism Development Authority will gazette the tourism zones as per the Tourism Development Plan 2026-2030, and will take necessary actions accordingly in the future.

(b) Not relevant.

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! நேற்றைய தினமும் நீங்கள் என்னுடைய சில கேள்விகளுக்குப் பதிலளித் தீர்கள். இருந்தாலும், முல்லைத்தீவு மாவட்டத்திலுள்ள குறைபாடுகளைத் தெரிவிக்க வேண்டியது எங்களுடைய கடமையாகும்.

கௌரவ சபாநாயகர் அவர்களே, இலங்கை சுற்றுலா அதிகாரசபையால் 2025ஆம் ஆண்டு மே மாதம் வெளியிடப் பட்ட இலங்கைக்கான உள்வரும் பயணம் தொடர்பான அறிக்கையில், இலங்கையிலுள்ள 25 மாவட்டங்களில் மிகவும் குறைவான உள்வரும் பார்வையாளர்களைக் கொண்ட மாவட்டமாக முல்லைத்தீவு மாவட்டம் குறிப்பிடப்பட்டுள்ளது. 25 மாவட்டங்களில் கடைசி நான்கு மாவட்டங்களும் வட மாகாணத்திலுள்ள யாழ்ப்பாண மாவட்டம் தவிர்ந்த ஏனைய நான்கு மாவட்டங்களும்தான். முல்லைத்தீவு சூழலியல் சுற்றுலாவுக்கும் வரலாற்றியல் தேடல்களுக்கும் மிகவும் ஏற்ற இடமெனக் குறிப்பிடும் இவ்வறிக்கை, மட்டுப்படுத்தப்பட்ட உட்கட்டமைப்பு வசதிகள் மற்றும் அணுகல் தொலைவு என்பவற்றால் கவனிக்கப்படாது இருப்பதைச் சுட்டிக் காட்டுகின்றது. மாவட்ட அடிப்படையிலான தங்குமிடங்களின் வரிசையிலும் 25 மாவட்டங்களில் முல்லைத்தீவு மாவட்டம் 25ஆவது இடத்திலே உள்ளது. வட மாகாணத்திலுள்ள யாழ்ப்பாண மாவட்டம் தவிர்ந்த ஏனைய நான்கு மாவட்டங்களும் கடைசி நான்கு இடங்களிலே உள்ளன. சுற்றுலா சார்பான முதலீடுகளிலும் வட மாகாணத்தில் யாழ்ப்பாண மாவட்டம் தவிர்ந்த ஏனைய நான்கு மாவட்டங் களிலும் ஒரு செயற்றிட்டம்கூட 2025இல் உள்ளீர்க்கப் படவில்லை. இவ்வாறான புள்ளிவிபரங்கள், சுற்றுலாத் துறையில் மிகவும் கடைசி நிலையிலுள்ள மாவட்டங்களாக முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்கள் காணப்படுவதை சான்றுபடுத்துகின்றன.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, would you finish your first Supplementary Question please?

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

முடியும்.

சமத்துவ அடிப்படையில் 4 சதவீத பங்குபற்றலை ஒரு மாவட்டம் கொண்டிருக்க வேண்டிய நிலையில், கொழும்பு, காலி மாவட்டங்கள் தலா 20 சதவீதத்தையும் முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்கள் தலா 0.08 சதவீதத்தையும் கொண்டிருப்பது, தீவின் மிகப் பெரும் சமத்துவ இடைவெளியை சான்றுபடுத்துகின்றது. இவ்வாறான நிலையில், சுற்றுலா சார்பான அனைத்து புள்ளிவிபரங்களிலும் மிகவும் பின்னடைவான நிலையிலுள்ள இவ்விரு மாவட்டங் களின் நிலைபேறான அபிவிருத்திக்கு தங்கள் அமைச்சு விசேட தலையீட்டை கடந்த காலத்தில் மேற்கொண்டுள்ளதா அல்லது இனிவரும் காலத்தில் மேற்கொள்ளுமா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

Hon. Speaker, we admit that particularly for the Mullaitivu District, there should be a considerable focus on infrastructure development. In fact, tourism is an industry which should be promoted and developed in line with the development of all other basic infrastructure facilities. As a policy, our Government has identified that. We are working particularly with the World Bank and the ADB in relation to several projects to develop those basic infrastructure facilities in line with the tourism potential of those areas. We are also launching a global tourism campaign next month, and these areas will also be included for tourism promotion under that. We admit that we need to focus further on infrastructure development in these areas together with all other relevant Ministries, and we will continue to invest on those basic infrastructure.

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி! முல்லைத்தீவில் நிலைபேறான சுற்றுலா அபிவிருத்திக்கு சமூக அடிப்படையிலான சுற்றுலா, சிறிய அளவிலான விருந்தினர் விடுதிகளுக்கு வாய்ப்பளித்தல் என்பன ஒப்பீட்டளவில் பொருத்தமாகுமென சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின் 2025ஆம் ஆண்டின் மீளாய்விலுள்ள ஆண்டறிக்கை முன்மொழிகின்றது. ஓய்வெடுக்கும் இடங்கள், மலசலகூட வசதிகள், பயணிகளுக் கான போக்குவரத்து வசதிகள், பயிற்றப்பட்ட சுற்றுலா வழிகாட்டிகளை பணிக்கமர்த்தல் என்பவற்றோடு தொடக்கம் பெற்று இன்னமும் முடிவடையாத நிலையிலுள்ள சுற்றுலாசார் கட்டுமானங்களை உடன் நிறைவுக்குக் கொண்டு வருவதற்கான ஏற்பாடுகளையும் முன்னுரிமை அடிப்படையில் தங்கள் அமைச்சு மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

குறிப்பாக, முல்லைத்தீவின் நகர்ப் பகுதியிலுள்ள அங்கயற்கண்ணி அன்னக்குடிலுக்கு அருகில் அமைக்கப்பட்ட பொழுதுபோக்கு பூங்காவுக்குரிய வேலைத்திட்டம் மிக நீண்ட காலமாக முடிவுறுத்தப்படாது கைவிடப்பட்ட நிலையில் காணப்படுகின்றது. குறித்த வேலைத்திட்டத்தை நிறைவுறுத் துவதற்கு 32 மில்லியன் ரூபாய் தேவைப்படுவதாக மதிப்பிடப்பட்டுள்ளது. இவ்வாறாக ஒரு செயற்றிட்டத்தைத் தொடங்கி அதனை அடுத்தடுத்த ஆண்டுகளில் முடிவுறுத்தாது விடுவது ஏன்? மேற்படி பகுதியளவில் உள்ள வேலைத் திட்டங்களை நிறைவுறுத்த தங்கள் அமைச்சு விசேட தலையீட்டை இயல்தகு விரைவில் மேற்கொள்ளுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

Sir, in fact, we call for project proposals from District Secretaries and for those proposals, we get clearance from the Department of National Planning and release funds from the Ministry. Other than that, the Northern Provincial Council also implements certain tourism development projects. However, with regard to this particular project, I will look into it whether it is a project we have funded or by the Northern Provincial Council and take necessary action to complete it.

Regarding small business operators engaged in the tourism and hospitality sector all over the Island, we have had discussions with the World Bank to support them with low-interest loan schemes to construct rooms, washrooms, facilitating them to enter into the hospitality business. That programme will be implemented soon.

Other than that, the Ministry of Industry and Entrepreneurship Development has also introduced low-interest loan schemes for entrepreneurs and tourism is included under that scheme as well.

## පූනාගල-වේවැල්තලාව මාර්ගය: අලුත්වැඩියා කිරීම
## பூணுகலை - வேவெல்தலாவை வீதி: புனரமைத்தல்
## POONUGALA-WEWELTHALAWA ROAD: REPAIR

1548/2025

**3. ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූනුගල සිට වේවැල්තලාව (වැවියතලාව) දක්වා වූ මාර්ගයේ දිග කිලෝමීටරවලින් කොපමණද;

(ii) වාහන ධාවනය කිරීමට පමණක් නොව, පා ගමනින් යෑමට පවා නොහැකි දුෂ්කර තත්ත්වයක එම මාර්ගය පවතින බව දන්නේද;

(iii) එම මාර්ගයේ පූනාගල සිට වේවැල්තලාව දක්වා කොටස පිළිසකර කිරීම සිදු නොකර ඇත්තේ කවර වර්ෂයක සිටද;

(iv) ඉහත මාර්ගය පිළිසකර නොකිරීම, වේවැල්තලාව වතුයායේ පදිංචිකරුවන්ගේ දෛනික කටයුතු සිදු කර ගැනීමට බාධාවක් බව පිළිගන්නේද;

(v) එම මාර්ගය පිළිසකර කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) ඉහත මාර්ගය පිළිසකර කිරීමේදී, අදාළ වතු සමාගම සහ රජය අතර පවතින එකඟතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யட்டியாந்தோட்டை பிரதேச செயலகப் பிரிவின், பூணுகலை தொடக்கம் வேவெல்தலாவை (வேவியதலாவை) வரையிலான வீதியின் நீளம் எத்தனை கிலோமீற்றர் என்பதையும்;

(ii) அப்பாதையானது வாகனப் போக்குவரத்துக்கு மட்டுமன்றி நடைபயணமாகக்கூட செல்ல முடியாத நிலையில் உள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி வீதியின் பூணுகலை தொடக்கம் வேவெல்தலாவை வரையிலான பகுதியானது எந்த வருடத்திலிருந்து புனரமைக்கப்படா துள்ளது என்பதையும்;

(iv) குறித்த வீதி புனரமைக்கப்படாமையானது வேவெல்தலாவை தோட்டத்தில் வசிப்பவர் களுக்கு தமது அன்றாடப் பணிகளை மேற் கொள்வதில் தடையாக இருக்கின்றது என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) மேற்படி வீதியைப் புனரமைப்பதற்கு இது வரையில் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) குறித்த வீதியை புனரமைப்பது தொடர்பில் உரிய பெருந்தோட்டக் கம்பனிக்கும் அரசாங் கத்துக்கும் இடையில் நிலவும் இணக்கப்பாடு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the length of the road from Poonugala to Wewelthalawa (Weviyethalawa) within the Yatiyantota Divisional Secretary's Division in kilometres;

(ii) whether he is aware that the said road had deteriorated to such an extent that it is virtually impassable not only for vehicles, but also for pedestrians alike;

(iii) the number of years that have elapsed since the section of the said road from Poonugala to Wewelthalawa was last repaired;

(iv) whether he admits that the failure to repair the said road is an obstacle to the daily activities of the residents of the Wewelthalawa Estate;

(v) the measures that have been taken so far to repair the said road; and

(vi) the agreement between the relevant estate company and the Government in repairing the said road?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද කෑගල්ල දිස්ත්‍රික් ලේකම්ගේ 2025.07.09 දිනැති ලිපිය හා කැලණිවැලි වැවිලි සමාගම විසින් මේ සම්බන්ධව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම මාර්ගය කිලෝමීටර 15ක් පමණ බව වාර්තා වී ඇත.

(ii) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් විසින් මේ සම්බන්බන්ධව සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව මාර්ගය දුෂ්කර තත්ත්වයක පවතින බව වාර්තා වේ. ඒ සම්බන්ධව සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම 01හි දැක්වේ.

(iii) සමස්ත මාර්ගයේ අලුත්වැඩියාවක් සිදු කර නොමැති අතර, 2025 වර්ෂයේදී කැලණිවැලි සමාගම විසින් කිලෝමීටර තුනහමාරක පමණ කොටසක් තුළ, ඇතැම් ස්ථානවල පිළිසකර කිරීම්/ අලුත්වැඩියා කිරීම් ආදි කටයුතු සිදු කර ඇති බව දන්වා ඇත.

(iv) ඉහත මාර්ගය පිළිසකර නොකිරීම නිසා වේවැල්තලාව වතු යායේ පදිංචිකරුවන්ගේ දෛනික කටයුතු සිදු කර ගැනීමට බාධාවක් ඇති වී තිබෙන බව ප්‍රාදේශීය ලේකම්, යටියන්තොට 2026.07.16 දිනැතිව වාර්තා කර තිබෙනවා.

- වැවියතලාව දමිළ ප්‍රාථමික විද්‍යාලයට ආරක්ෂිතව ගමන් කළ හැකි එකම මාර්ගය එම මාර්ගය වන අතර, එම මාර්ගයේ අබලන් තත්ත්වය හේතුවෙන් ගුරුවරුන්ට පාසල වෙත සේවයට වාර්තා කිරීමේ පවතින දුෂ්කරතා හේතුවෙන් කඩිනමින් ස්ථාන මාරු වීමේ ප්‍රවණතාවක් පවතින බව.
- එසේම, දරුවන් ද ප්‍රදේශයෙන් පිටත පාසල් වෙත යොමු නොවීම හේතුවෙන් උසස් අධ්‍යාපනයට යොමු නොවන බව.
- තවද, හල්ගොල්ල ග්‍රාමීය රෝහලට ප්‍රවේශ වීමට ඇති එකම මාර්ගය ද මෙය වන බැවින්, වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට යන රෝගීන්ට මෙන්ම සේවයට වාර්තා කරන වෛද්‍යවරුන්ට මෙන්ම සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ද මේ හේතුවෙන් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වන බව.
- එසේම, මාර්ගයේ තත්ත්වය මත සිව්රෝද - four-wheel - වාහන පමණක් ගමන් කළ හැකි වීම නිසා එම අතිදුෂ්කර මාර්ගයේ කිලෝමීටර 15ක පමණ දුරක් එදිනෙදා කටයුතු සඳහා වතු ජනතාවට පාගමනින්ම යෑමට සිදු වේ. සමුපකාරයට පවා බඩු රැගෙන යෑම ඉතා දුෂ්කර තත්ත්වයක් යටතේ සිදු කරන බැවින්, වතු පවුල් 150ක් පමණ මේ හේතුවෙන් දුෂ්කරතාවට ලක් වී ඇත.

(v) වැවියතලාව මාර්ගය පිළිසකර කිරීම සම්බන්ධයෙන් කැලණිවැලි වැවිලි සමාගම විසින් මුල් අවධියේදී විරෝධතාව දක්වා ඇත. නමුත්, 2026 පෙබරවාරි 16 දිනැති ලිපිය මඟින් එම මාර්ගය සංවර්ධනය කිරීමට වතු යායේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි ඉහත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා එකඟතාව පළ කර ඇත. ඊට අදාළ ලිපිය ඇමුණුම 02හි දැක්වේ.

එසේම, මෙම මාර්ගයේ සුළු අලුත්වැඩියා/ පිළිසකර කිරීමේ කටයුතු වෙනුවෙන් කැලණිවැලි වැවිලි සමාගම විසින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කරන බව ද දන්වා ඇත.

තවද, 2025 - ග්‍රාම මාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 25/0755/809/022-II හා 2025.04.30 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයට 2025.05.07 දිනැතිව ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනට වතු මාර්ග ද ඇතුළත් කර ඇත. ඒ අනුව, එම අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් සහ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද සංවර්ධනය කළ යුතු මාර්ග හඳුනා ගැනීමේ නිර්ණායක සහ යෝජනා ලබා ගැනීමට අදාළ ආකෘති පත්‍රයද සමඟ ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් 2025.10.09 දිනැතිව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇත.

(vi) ඉහත මාර්ගය පිළිසකර කිරීම සම්බන්ධයෙන් කැලණිවැලි වැවිලි සමාගම විසින් මුලදී එකඟතාව පළ කර නොමැති අතර, කැලණිවැලි වැවිලි සමාගමෙන් නැවත සිදු කළ විමසීම්වලට අනුව, එම වැවිලි සමාගමෙන් පිළිතුරු ලිපියක් 2026.02.16 දිනැතිව යොමු කර ඇත.

එසේම, වැවියතලාව වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වැවිලි සමාගමේ විරෝධතාවක් නොමැති බවත්, විධිමත් ඉල්ලීමක් ලැබීමෙන් පසු ඒ පිළිබඳ වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල එකඟතාව ලබා ගැනීමට කටයුතු කළ හැකි බවත් සඳහන් කර ඇත. එබැවින් 2026.03.11 දිනැතිව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා යවා ඇත.

ඊට අදාළ ලිපිය ඇමුණුම 03 මඟින් දැක්වේ. ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, පළාත් සභා මඟින්, ප්‍රාදේශීය සභා මඟින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමට අමතරව මහාමාර්ග අමාත්‍යාංශයෙනුත් එය සිදු කරනු ලබනවා. මෙතැනදී දිගුකාලීනව තිබුණු ප්‍රශ්නයක් තමයි, වැවිලි සමාගම් වතුවල තිබෙන මාර්ග කාටද අයිති කියන එක. අපි කැබිනට් තීන්දුවක් අනුව දැනුම් දීලා තිබෙනවා, ඒ මාර්ගත් සංවර්ධනය කරන්න රාජ්‍ය මුදල් යොදා ගන්න පුළුවන් කියලා. මොකද, ප්‍රවේශය සඳහා තිබෙන අයිතිය මූලික අයිතිවාසිකමක්. ආණ්ඩුවේ වතු බදු ගත්තාය කියලා සහමුලින්ම ඒ අයිතිය නතර කරන්න අයිතියක් නැහැ. ඒවා කළ යුතුව තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්න තිබෙනවා නම් අහන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. අතුරු ප්‍රශ්න නැහැ.

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල ගුරුවරු: අනුමත සංඛ්‍යාව සහ පුරප්පාඩු

திருகோணமலை மாவட்ட அரச பாடசாலைகளிலுள்ள ஆசிரியர்கள்: அங்கீகரிக்கப்பட்ட ஆளணி மற்றும் வெற்றிடங்கள்

TEACHERS IN GOVERNMENT SCHOOLS IN TRINCOMALEE DISTRICT: APPROVED CADRE AND VACANCIES

1644/2025

**4. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම දිස්ත්‍රික්කයේ සේවයේ යෙදී සිටින ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට තිබෙන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தில் அரசாங்கப் பாடசாலைகளுக்கு அங்கீகரிக்கப்பட்டுள்ள ஆசிரியர்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி ஆசிரியர்களின் எண்ணிக்கை ஒவ்வொரு பாட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தற்போது மேற்படி மாவட்டத்தில் சேவையாற்றி வருகின்ற ஆசிரியர்களின் எண்ணிக்கை யாது;

(iv) தற்போது நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு பாட வாரியாக வெவ் வேறாக யாது;

(v) மேற்படி வெற்றிடங்களை நிரப்ப மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of approved cadre of teachers for government schools in the Trincomalee District;

(ii) number of approved cadre of teachers for each subject, separately;

(iii) total number of teachers currently serving in the said district;

(iv) number of existing teacher vacancies for each subject, separately; and

(v) steps that will be taken to fill those vacancies?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ජාතික පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව - 1,005කි.

පළාත් පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව - 6,021කි.

(ii) ජාතික පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 මඟින් ද, පළාත් පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මඟින් ද ඉදිරිපත් කර ඇත.

(iii) එම දිස්ත්‍රික්කයේ ජාතික පාසල් හා පළාත් පාසල්වල සේවයේ යෙදී සිටින ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන්ව ඇමුණුම 01 හා ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) මේ වනවිට ජාතික පාසල් හා පළාත් පාසල්වල තිබෙන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 හා ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

(v) දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා අනෙකුත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලද අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් මේ වන විට අයදුම්පත් කැඳවා 2026 මැයි මස විභාගය පවත්වා ඇත. ඒ අනුව එකී ගැසට් නිවේදනය ප්‍රකාරව ගුරු සේවයේ පුරප්පාඩු සඳහා මෙම වර්ෂය තුළ උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා ]

එමෙන්ම, 2018-2020 හා 2020-2022 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරි ඌන සාමාර්ථලාභීන් 2026 ජූලි මස සිටත්, 2022-2024 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් එම ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම මත ජාතික හා පළාත් පාසල්හි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියේ පවතින ගුරු පුරප්පාඩු සඳහා 2027 වර්ෂයේ මුල් කාර්තුව තුළත් ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇත.

තවද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගුරු සේවයේ පවතින පුරප්පාඩු ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත ගුරු තුලනය හා පත්වීම් විෂය සංශෝධනයෙන් අනතුරුව තවදුරටත් පවතින ගුරු පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් 2026/2027 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

(ආ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

திருகோணமலை மாவட்டத்திலுள்ள எல்லா கல்வி வலயங்களிலும் ஆசிரியர் வெற்றிடங்கள் காணப்படுகின்றன. நாங்கள் வலயக் கல்வி அலுவலகங்களைத் தொடர்புகொண்டு விசாரிக்கின்றபோது, கணிதம், விஞ்ஞானம் போன்ற பாடங்களுக்கு ஆசிரியர்கள் கூடுதலாகத் தேவைப்படுவதாக அங்கிருக்கின்ற அதிகாரிகள் சொல்கின்றார்கள். நாங்கள் கிராமப்புறங்களில் பின்தங்கிய நிலையில் காணப்படுகின்ற பாடசாலைகளுக்குச் செல்கின்றபொழுது, அங்கு 1-5 வரையான வகுப்பு - primaryக்கு - மாணவர்களுக்கு கற்பிக்கின்ற ஆசிரியர்கள்கூட பற்றாக்குறையாக இருப்பதைக் காண முடிகின்றது. இன்று மாகாண அடிப்படையில் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதன் காரணமாக திருகோணமலை புறக்கணிக்கப்படுகின்றதா என்ற கேள்வி எழுகின்றது. மாகாண அடிப்படையில் அல்லாது மாவட்ட அடிப்படையில் ஆசிரியர் நியமனங்களை வழங்குவதற்கான நடவடிக்கைகளை உங்களுடைய அரசாங்கத்தால் முன்னெடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

திருகோணமலையிலுள்ள கல்வி வலயங்களில் திறமைமிக்க பல மாணவர்கள் இருந்தாலும், ஆசிரியர் பற்றாக்குறை காரணமாக அவர்கள் பின்தள்ளப்படுகின்ற சூழ்நிலை காணப்படுகின்றது. அண்மையில்கூட, பட்டதாரி ஆசிரியர் நியமனங்களுக்கான போட்டிப் பரீட்சை நடாத்தப்பட்டு இருக்கின்றது. அதன்மூலம் ஆசிரியர் நியமனங்களை வழங்கு வதற்கான நடவடிக்கைகளை நீங்கள் மேற்கொள்கின்றீர்கள். எங்களுடைய பகுதிகளிலுள்ள பின்தங்கிய கல்வி வலயங்களில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு எவ்வாறான நடவடிக்கைகளை இந்த அரசாங்கம் முன்னெடுக்கின்றது? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය ඇසීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ලංකාව පුරාම මේ විධියේ ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කරපු විධියට ගණිතය වැනි විෂයන්වලට ගුරුවරුන් විෂයානුබද්ධව බෙදීයාම සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. මෙය, නැඟෙනහිර පළාතට පමණක් තිබෙන ගැටලුවක් නොවෙයි, ලංකාවටම පොදු කාරණයක්. නැඟෙනහිර පළාතේ යම්කිසි අඩුපාඩු ප්‍රමාණයක් තිබෙන බව අප පිළිගන්නවා. අපට එය වාර්තා වුණා. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් මම සඳහන් කරන්නම්. එයින් එකක් තමයි, අපි සඳහන් කරපු අලුතෙන් උපාධිධාරින් බඳවා ගැනීම සම්බන්ධයෙන් වන කාරණය. එතැනදි විෂයානුබද්ධව ගත්තොත්, පළාත් මට්ටමෙන් සහ ජාතික මට්ටමෙන් කියන දෙයාකාරයටම බඳවා ගැනීම් සිදු කරනවා. තමන් පදිංචි දිස්ත්‍රික්කයට අදාළ පළාතෙන් ඉල්ලන්න පුළුවන්. හැබැයි තමන් ඉල්ලන පළාතේ ගුරු ප්‍රමාණයක් සංතෘප්ත වෙලා තිබෙනවා නම් අනෙකුත් පළාත්වලිනුත් ඉල්ලන්න මේ වෙලාවේ හැකියාව තිබෙනවා. ඊළඟට, උපාධිධාරින් ජාතික මට්ටමින් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කරනකොට, ලංකාව පුරාම ඔවුන්ව ස්ථානගත කිරීමේ හැකියාව අපට තිබෙනවා. අපි මේ බඳවා ගැනීම් විශාල ප්‍රමාණයක් කරන නිසා, නැඟෙනහිර පළාතට සැලකිය යුතු මට්ටමේ ගුරුවරුන් පිරිසක් එයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

දෙවැනි කාරණය තමයි, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින් බඳවා ගැනීම. ඔවුන් බඳවා ගැනීම් කරන්නේ දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින්. මම සඳහන් කරපු ආකාරයට, ඒ ඒ දිස්ත්‍රික්කයට අදාළව පදිංචි ගුරුවරුන් පිරිසක් මේ අවුරුද්දේදි නැවත වාරයක් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. එතකොට මේ කොටස් දෙකෙන්ම සැලකිය යුතු ගුරුවරු ප්‍රමාණයක් අධ්‍යාපන පද්ධතියට එකතු වෙනවා. ඒ වාගේම එම ගුරුවරුන් නිශ්චිතවම විෂයානුබද්ධව සහ ගුරු හිඟය තිබෙන ප්‍රදේශවල ස්ථානගත කිරීමේ හැකියාවක් තිබෙනවා. ඒ, බඳවා ගැනීම්වලට අදාළ කාරණා දෙකක්.

ගුරු තුලනය ගැනත් අපි කිව්වා. එතැනදි අපි ඒ සම්බන්ධයෙන් web-based platform එකක් ගැන සාකච්ඡා කරමින්, ගුරු තුලනය සඳහා ඒකත් පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව, ගුරු තුලනය කිරීම තුළිනුත් විෂයන්වලට අදාළ ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේක නැඟෙනහිර පළාතටත් අදාළයි; ලංකාවටම අදාළයි. ඊළඟ අවුරුදු කිහිපය ඇතුළත වැඩිපුරම ගුරුවරු ප්‍රමාණයක් බඳවා ගැනීමට නියමිතයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! எங்களுடைய மாவட்டத்தில் மிகவும் திறமையான விளையாட்டு வீரர்கள் இருக்கின்றார்கள். குறிப்பாக, பாடசாலை மட்டத்தில் இவ்வாறான வீரர்கள் பலர் இருக்கின்றார்கள். அங்கு விளையாட்டு பயிற்றுவிப்பு சம்பந்தமான பல்வேறு தேவைப் பாடுகளும் இருக்கின்றன. 'நல்லாட்சி' அரசாங்க காலத்தில் செய்யப்பட்ட சிறந்த வேலைகளில் ஒன்றுதான், விளையாட்டு பயிற்றுவிப்பாளர்களுக்கான நியமனம் வழங்கப்பட்டமை. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இதனைத் தொடர்ந்து முன்னெடுக்க வேண்டுமென நாங்கள் கோரிக்கை முன்வைக்கின்றோம். ஏனெனில், எங்களுடைய பிரதேசத்தில் தேசிய மட்டத்தில் திறமைகளை வெளிப்படுத்தக்கூடிய விளையாட்டு வீரர்கள் இருக்கின்றபொழுதும், அவர்களுக்குப் பாடசாலைகளில் பயிற்றுவிப்பாளர்கள் இல்லாத நிலை காணப்படுகின்றது.

அடுத்து, GCE (O/L) பரீட்சையில் சித்தியடைந்து மாண வர்கள் GCE (A/L) வகுப்புகளுக்குச் சென்றிருக்கின்ற நிலை யிலும், GCE (O/L) பரீட்சை விடைத்தாள் திருத்தும் பணியில் - paper correctionஇல் - ஈடுபட்ட ஆசிரியர்களுக்கான கொடுப் பனவு இன்னும் வழங்கப்படவில்லை என்ற குற்றச் சாட்டு முன்வைக்கப்படுகின்றது. அரசாங்கம் என்ற அடிப்படையில் நீங்கள் சொல்கின்றீர்கள், தற்போது அரசாங்கத்திடம் பணக் கையிருப்பு 'தொன்' கணக்கில் இருப்பதாக.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු කථානායකතුමනි, මම අවසන් කරනවා.

அந்தக் கையிருப்பைப் பயன்படுத்தி, GCE (O/L) பரீட்சை விடைத்தாள் திருத்தும் பணியில் - paper correctionஇல் - ஈடுபட்ட - ஆசிரியர்களுக்கான கொடுப்பனவை விரைவாக வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට මම පිළිතුරු දෙන්නම්. අපි ඒ ගැන සොයන්න බලාපොරොත්තු වනවා. පුහුණුකරුවන්ගේ හිඟය සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නයට පිළිතුර, ඔව් කියන එකයි. ලංකාව පුරාම ක්‍රීඩා පුහුණුකරුවන්ගේ හිඟයක් තිබෙනවා. ඒ කථාව ඇත්ත. විශේෂයෙන්ම ක්‍රීඩා ගුරුවරුන් සහ ක්‍රීඩා පුහුණුකරුවන් සංඛ්‍යාව 3,000කට ආසන්න වනවා. ඇත්තටම ක්‍රීඩා පුහුණුකරුවන් බඳවාගෙන තිබෙන්නේ එක් වාරයක් පමණයි. ඒ වාගේම ක්‍රීඩා පුහුණුකරුවන් ලංකාව පුරාම බෙදී ගිහිල්ලාත් නැහැ. මේ දිනවල සාකච්ඡා මට්ටමේ තිබෙනවා, විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශය එක්කත් එකතු වෙලා ලංකාව පුරා පාසල් පද්ධතියට පුහුණුකරුවන් ඇතුළු කරගන්නේ කොහොමද කියන එක. අලුතෙන් එකතු වන ගුරුවරුන් එක්ක, විශේෂයෙන්ම උපාධිධාරී ගුරුවරුන් පිරිසකුත් එක්ක ක්‍රීඩා පුහුණුවීම් සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමක මැදිහත් වීමේ හැකියාවක් අපට තිබෙනවා. නමුත් අපි බලාපොරොත්තු වනවා, විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනය ඇතුළත ක්‍රීඩකයෙකු බිහි කිරීම සඳහා පොදුවේ සැලැස්මක් ඇති කරන්න. එතැනදි ක්‍රීඩා හැකියාවක් තිබෙන කිසිම ශිෂ්‍යයෙක් ඒකෙන් මඟහොහැරී යන පරිදි එය කරන්නත් අපි බලාපොරොත්තු වනවා. එතැනදි අපි දැනට ඉන්න ක්‍රීඩා පුහුණුකරුවන් සම්බන්ධයෙන් යම්කිසි තීරණයක් ගන්න බලාපොරොත්තු වනවා, පොකුරක් විදියට අවට පාසල්වලටත් පුහුණු කිරීමේ අවස්ථාව ලබා දීම සඳහා. දැනට ඉන්න පුහුණුකරුවන් ගැනයි මම මේ කථා කරන්නේ. ඉදිරියේදී ක්‍රීඩා අමාත්‍යාංශය එක්කත් එකතු වෙලා පුහුණු කිරීමේ සැලැස්මක්, සංචිතයක් - pool එකක් - සෑදීමේ බලාපොරොත්තුවකුත් අපට තිබෙනවා.

## කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල: විස්තර
### கறுவா அபிவிருத்தித் திணைக்களம் மற்றும் பிரதேச அலுவலகங்கள்: விபரம்
### DEPARTMENT OF CINNAMON DEVELOPMENT AND REGIONAL OFFICES: DETAILS

1657/2025

**5. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කුරුඳු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් ස්ථානගත කර ඇති දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සංවිධාන ව්‍යුහය කවරේද;

(iv) එම දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබේද;

(v) දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත් ලෙස තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கறுவா அபிவிருத்தித் திணைக்களத்தின் பிரதேச கறுவா அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி உத்தியோகத்தர்கள் சேவையில் ஈடு படுத்தப்பட்டுள்ள மாவட்டங்கள் மற்றும் பிரதேச செயலாளர் பிரிவுகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி திணைக்களத்தினதும் பிரதேச அலுவல கங்களினதும் நிறுவனக் கட்டமைப்பு யாது என்பதையும்;

(iv) மேற்படி திணைக்களத்தை பாராளுமன்றச் சட்ட மொன்றின் மூலம் நியதிச்சட்ட நிறுவனமாகத் தாபிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(v) திணைக்களத்தின் வினைத்திறனுக்குத் தேவை யான மனித வளங்கள் போதுமானதாக உள்ளனவா என்பதையும்;

(vi) இன்றேல், அதற்காக எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of Regional Cinnamon Development Officers belonging to the Department of Cinnamon Development;

(ii) separately, the names of the districts and Divisional Secretaries' Divisions where those officers are stationed;

(iii) the organizational structure of the said Department and its regional offices;

[ගරු වානක මාදුගොඩ මහතා]

(iv) whether plans have been made to establish this Department as a statutory body by an Act of Parliament;

(v) whether the human resources required for the efficient functioning of the Department are adequately available; and

(vi) if not, the measures that will be taken in that regard?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කුරුඳු සංවර්ධන නිලධාරීන් 37යි.

(ii) මේ යටතේ ගරු මන්ත්‍රීතුමා අහන්නේ එම නිලධාරීන් වෙන් කර ඇති දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මොනවාද කියන එකයි. එම ලැයිස්තුව ඇමුණුම 01 මඟින් දක්වා තිබෙනවා.

ඇමුණුම 01

| අනු අංකය | නිලධාරියාගේ නම | අනුයුක්ත කර ඇති දිස්ත්‍රික්කය | ආවරණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | කාර්යාල ස්ථානගත කර ඇති ස්ථානය |
|---|---|---|---|---|
| 1 | ඩබ්.ඒ.පී.ඩබ්. කුමාර මයා | ගාල්ල | නියාගම, ඇල්පිටිය, නාගොඩ, වලල්ලාවිට | පිනිකහණ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 2 | ඩිලන්ති පියදිගම මිය | ගාල්ල | මාදම්පාගම, අම්බලන්ගොඩ, බෙන්තොට, බලපිටිය | බටපොළ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 3 | ඒ.එච්.පී. රුවිනි මිය | ගාල්ල | හබරාදුව, යක්කලමුල්ල, ඉමදුව | පිලාන ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 4 | සමන්ත ලියනගේ මයා | ගාල්ල | රත්ගම, හික්කඩුව, කඩවත් සතර, කරන්දෙණිය | රජගම ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 5 | ඩී.එල්.එස්. සකුන්තලා මිය | ගාල්ල | බද්දේගම, වඳුරඹ, ගෝනපිනූවල, වැලිවිටිය-දිවිතුර | වඳුරඹ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 6 | එස්.ආර්. ලියනපතිරණ මයා | ගාල්ල | අක්මීමන, බෝපේපොද්දල, නෙළුව, තවලම | වලහන්දුව ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 7 | එස්.එම්. රුවන්පතිරණ මයා | මාතර | දෙවිනුවර, දික්වැල්ල, කිරින්ද පුහුල්වැල්ල, හක්මන | කිරින්ද පුහුල්වැල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 8 | පී.එම්.යූ.අයි. ලක්මාලි මිය | මාතර | මාලිම්බොඩ, තිහගොඩ, මාතර | මඩිහ ගොඩගම ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 9 | ඊ.එම්.එන්.ආර්.ඒකනායක මිය | මාතර | අකුරැස්ස, වැලිගම, වැලිපිටිය | වැලිගම ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 10 | ඩී.ජේ.ඩී. ජීවන්ත සිල්වා මයා | මාතර | කුඹුරුපිටිය, මුලටියන, පස්ගොඩ | මාපලාන ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 11 | ඒ.ඒ. ගම්මන්පිල මයා | මාතර | අතුරලිය, පිටබැද්දර, කොටපොළ | විල්පිට ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 12 | වී.එච්.එස්. නන්දන මයා | හම්බන්තොට | වලස්මුල්ල, බෙලිඅත්ත, තංගල්ල, ඕකේවෙල | වලස්මුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 13 | ඩබ්.ජී.එස්.ටී. ඇපා මයා | හම්බන්තොට | වීරකැටිය, හම්බන්තොට, සූරියවැව, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාම | ලුනම ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 14 | පී.ජී.ඩී. ප්‍රතිභා මිය | හම්බන්තොට | කටුවන, අම්බලන්තොට, අඟුණකොළපැලැස්ස | කටුවන ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 15 | එම්.ආර්.කේ.ආර්. කුමාර මයා | රත්නපුර | ඉඹුල්පේ, බලංගොඩ, කල්තොට, වැලිගෙපොළ, කොලොන්න | වැලිගෙපොළ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 16 | එච්.පී. රත්නසිරි මයා | රත්නපුර | අයගම, කලවාන, නිවිතිගල, කිරිඇල්ල | බලංගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 17 | ඒ.එස්.එන්. ජයලත් මිය | රත්නපුර | ඇහැලියගොඩ, රත්නපුර, කුරුවිට, ඇලපාත | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 18 | එච්.වයි.කේ. ගුණසිංහ මිය | රත්නපුර | පැල්මඩුල්ල, කහවත්ත, ඕපනායක, ගොඩකවෙල, ඇඹිලිපිටිය | කහවත්ත ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 19 | එන්.ආර්.එස්.එස්. රත්නායක මයා | රත්නපුර | ඇලපාත, කිරිඇල්ල | - |
| 20 | ඊ.එම්.පී. කුමාර මයා | කළුතර | අගලවත්ත, බේරුවල, දොඩංගොඩ, ඉංගිරිය, බණ්ඩාරගම, බුලත්සිංහල, හොරණ, කළුතර, මදුරාවෙල, මතුගම, මිල්ලනිය, පාලින්දනුවර, පානදුර | නාගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 21 | ඩබ්.එම්. චන්ද්‍රරත්න මිය | කුරුණෑගල | අලව්ව, උඩුබද්දාව, කුළියාපිටිය- නැගෙනහිර, කුළියාපිටිය- බටහිර, කොබෙයිගනේ, නාරම්මල, පඩුවස්නුවර- බටහිර, පඩුවස්නුවර- නැගෙනහිර, පන්නල, පොල්ගහවෙල, බමුණාකොටුව, බිංගිරිය, වාරියපොල, වීරඹුගෙදර | නාරම්මල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 22 | පී.ඩී.එම්. විජේවීර මයා | කුරුණෑගල | අඹන්පොළ, ඇහැටුවැව, ඉබ්බාගමුව, කුරුණෑගල, කොටවෙහෙර, ගනේවත්ත, ගල්ගමුව, ගිරිබාව, නිකවැරටිය, පොල්පිතිගම, මල්ලවපිටිය, මහව, මාවතගම, මාස්පොත, රස්නායකපුර, රිදිගම | කුරුණෑගල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 23 | සී.සී.එම්.ගුණවර්ධන මිය | ගම්පහ/ කොළඹ | දොම්පේ, අත්තනගල්ල, මහර, කැළණිය/ සීතාවක,හෝමාගම, කඩුවෙල, පාදුක්ක, කැස්බෑව, මොරටුව, රත්මලාන | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 24 | ජී.ටී. අරඹගේ මිය | ගම්පහ | දිවුලපිටිය, මිනුවන්ගොඩ, කටාන, මීගමුව | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 25 | එම්.සී.එස්. රවිසිංහ මිය | ගම්පහ | ගම්පහ, මීරිගම, ජා ඇල, වත්තල, බියගම | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |

| | | | | |
|---|---|---|---|---|
| 26 | එච්.කේ.එන්. දර්ශිකා මිය | කෑගල්ල | කෑගල්ල, , අරණායක, මාවනැල්ල | බැමණිවත්ත ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 27 | ආර්.ජේ.එච්.එස්. කරුණාතිලක මිය | කෑගල්ල | රඹුක්කන, ගලිගමුව, වරකාපොල, රුවන්වැල්ල, | පින්නවල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 28 | එච්.එම්.පී.එස්.කේ.එම්. හේරත් මයා | කෑගල්ල | බුලත්කොහුපිටිය, දෙහිඕවිට | බුලත්කොහුපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 29 | වී.පී.අයි.ආර්. කුමාර මයා | කෑගල්ල | යටියන්තොට, දැරණියගල | යටියන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 30 | ඩබ්.පී.කේ.සී. පුණ්‍යවීර මයා | බදුල්ල | බදුල්ල දිස්ත්‍රික්කය | හාලිඇල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 31 | ඩී.එම්.ටී. ටිකිරි බණ්ඩාර මයා | මොනරාගල | මොනරාගල දිස්ත්‍රික්කය | - |
| 32 | කේ.එම්.සී.බී. කරුණාරත්න මයා | මහනුවර | පාතදුම්බර, පන්විල, උඩුනුවර, දෙල්තොට, හාරිස්පත්තුව, ගඟඉහළ කෝරලේ, පාතහේවාහැට | තලාතුඔය ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 33 | එච්.එච්.එම්.එන්.එස්. හේරත් මිය | මහනුවර | කුණ්ඩසාලේ, ගඟවට කෝරලේ, උඩපළාත, මැදදුම්බර, මිනපේ, උඩදුම්බර, පස්බගේ කෝරලේ | වාවින්න ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 34 | එච්.එම්.එස්. හේරත් මිය | මහනුවර | පූජාපිටිය, යටිනුවර, දොළුව, තුම්පනේ, හතරලියද්ද, අකුරණ | අංකුඹුර ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| 35 | ඩී.එම්.පී.ආර්. දොරගම මයා | මාතලේ | මාතලේ, යටවත්ත, අඹන්ගඟ කෝරලේ, නාඋල, දඹුල්ල, ලග්ගල-පල්ලේගම | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 36 | ජේ.එම්.ආර්.බී. අමරකෝන් මයා | මාතලේ | පල්ලේපොල, ගලේවෙල, උකුවෙල, රත්තොට, විල්ගමුව | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 37 | ඩබ්.එම්.සී.ටී. විජේරත්න මයා | අනුරාධපුර | අනුරාධපුර දිස්ත්‍රික්කය | අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |

(iii) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කර තිබෙනවා. ඇමුණුම 02 **සභාගත*** කරනවා.

ප්‍රාදේශීය කාර්යාලවල ක්ෂේත්‍ර කටයුතු කරගෙන යෑම සඳහා ස්ථානගත කර ඇති නිලධාරින්ගේ වෙනම සංවිධාන ව්‍යුහයක් නොමැත.

(iv) ඔව්.

(v) නැත.

(vi) පුරප්පාඩුව පවතින මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර, පුරප්පාඩුව පවතින ද්විතීයික ශ්‍රේණියේ කුරුඳු සංවර්ධන නිලධාරි තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ කුරුඳු සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය පැවැත්වීම සඳහා දැන්වීම් අංක 2494 දරන 2026.06.19වැනි දිනැති ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය 2026 සැප්තැම්බර් මස පවත්වා 2027 ජනවාරි මස මෙම නිලධාරින් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

අපට මතකයි, විශේෂයෙන්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2025 වර්ෂයේදී සියයට 103ක ප්‍රගතියක් ලබා ගත් බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වර්ෂයේ ජූලි 31වැනි දා වනකොට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය තිබෙන්නේ සියයට 3යි. ඒක ලොකු ගැටලුවක් විධියට තමයි අපි දකින්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ තමයි කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබෙන්නේ. ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22ක් තිබෙනවා. අද වන විට ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22ම ආවරණය කර ගන්න ඉන්නේ නිලධාරින් 6දෙනායි. කුරුඳු පිළිබඳව විශ්වාසය දිනා ගත්, "Ceylon Cinnamon" කියන නාමය අද ලෝකයේම ප්‍රචලිත වෙලා තිබෙනවා. නමුත්, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු කරන නිලධාරින්ගේ මේ ගැටලුව අපේ ඒ කුරුඳු නාමය ප්‍රචලිත කර ගැනීමට විශාල වශයෙන් බලපානවා.

ඒ වාගේම මේ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, දෙපාර්තමේන්තුවක් විධියට පවත්වාගෙන යනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? මොකද, අපට එහි ඉදිරි පියවර පිළිබඳව නිශ්චිත ප්‍රගතියක් පෙනෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලයේ ඔබතුමන්ලා පැළ තවාන්කරුවන් තෝරා ගැනීම ටෙන්ඩර් මඟින් සිදු කරනවා අපි දැක්කා. ඇත්තටම අපට මේ මොහොතේ මතක් වනවා, කුරුඳු පැළ තවාන්කරුවන් තෝරා ගැනීම ටෙන්ඩර් මඟින් සිදු කිරීමට පෙර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැළ තවාන්කරුවන් ලියාපදිංචි කරලා ඉතාම හොඳින් ඒ කටයුත්ත පවත්වාගෙන ගිය ආකාරය. කිසිම අවස්ථාවක ඒ සඳහා විවේචනයක්වත්, දෝෂාරෝපණයක්වත් තිබුණේ නැහැ. පර්යේෂණ නිලධාරි, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂතුමා, ව්‍යාප්ති නිලධාරි ඇතුළු නිලධාරින් හතර දෙනෙක් තමයි ඒ පැළ තවාන්කරුවන් තෝරා ගන්නේ. අද ඒ පැළ තවාන්කරුවන් තේරීමේ ක්‍රමය ඉවත් කරලා ටෙන්ඩර් ක්‍රමයකට ගිහිල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අපි හදිසියෙන් නේ කථා කරන්නේ, ගරු කථානායකතුමනි. මම විනාඩියෙන් අවසන් කරනවා.

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අතුරු ප්‍රශ්නවලට වෙන් වූ විනාඩි දෙක ඉවරයි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අපි ඔබතුමාට කරදර කරන්නේ නැහැ. මම ඉතාම ඉක්මනින් මේක අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වෙනදා පැළ තවාන්කරුවන් අධීක්ෂණය කරනවා; පුහුණු කරනවා; දැනුම ලබා දෙනවා. එහෙම කරලා පැළ තවාන්කරුවන්ගෙන් ඉතාම හොඳ, ගුණාත්මක පැළ තමයි ගන්නේ. හැබැයි, අද මේ ටෙන්ඩර් ක්‍රමය තුළ ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ගේ පැළවල ගුණාත්මකභාවය පිළිබඳව ගැටලු මතු වෙමින් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අවසන් කරන්න. ඔබතුමා විනාඩි තුනක් ගත්තා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
අවසන් කරනවා, ගරු කථානායකතුමනි. ඔබතුමා කථා කරන වෙලාව මට දෙනවා නම් මේක අවසන් කරන්න පුළුවන්, ගරු කථානායකතුමනි. මම ඉක්මනින් අවසන් කරනවා. ඔබතුමා ඔහොම කළාම අපට ප්‍රශ්නයත් අමතක වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩි තුනකදීත් අතුරු ප්‍රශ්නය අහන්න බැරි වුණා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඔබතුමා ඔහොම කථා කරනකොට අපට ප්‍රශ්නය අමතක වනවා. අපට නිවැරදිව ප්‍රශ්නය ඉදිරිපත් කරන්නත් බැරි වනවා. මට තත්පර පහක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, තත්පර පහක් දෙන්නම්.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මේක මේ රටේ කුරුඳු වගාව පිළිබඳ වැදගත් ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක හොඳට මතක තියාගන්න. මේ සෙල්ලම දැන් කරන්න බැහැ. මම ඊයේත් Parliamentary Business Committee එකේදී පැහැදිලිව මේ ගැන කිව්වා. මුළු ප්‍රශ්නයටම විනාඩි හයයි තිබෙන්නේ. ඔබතුමාට උත්තර දෙන්නත් ඕනෑ. අතුරු ප්‍රශ්නයකට විනාඩි දෙකකට, තුනකට වැඩිය කාලය ගත්තාම ප්‍රශ්නයක් වෙනවා. කරුණාකරලා ඔබතුමා ප්‍රශ්නය කෙටි කරන්න, තත්පර පහකට.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඔබතුමා කථා කරන කාලය මට දෙන්න. ගරු කථානායකතුමනි, මම ඉක්මනින් ප්‍රශ්නය අසනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කුරුඳු පැළ තවාන්කරුවන් තෝරා ගැනීම ටෙන්ඩර් මඟින් සිදු කිරීම නිසා පැළ තවාන්කරුවන් විශාල ප්‍රමාණයකට අවස්ථාව අහිමි වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මේක කඩෙන් ගන්න බඩුවක් වාගේ නොවෙයි. පැළ නිෂ්පාදනය කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර ලබා දෙන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
එතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇතුළේ ප්‍රශ්න ගොඩක් ඇහුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහන්න පුරුදු වෙන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ප්‍රශ්න ගොඩක් ඇහුවා, පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇතුළේ. පළමුවැනි එක, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා. 2025 අවුරුද්ද ගත්තොත්, මීට කලින් වෙන් කරපු මුදල වාගේ තුන් ගුණයකට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ඒ දෙපාර්තමේන්තුව සඳහා අය වැයෙන් වෙන් කළා. ඒ වාගේම 2026 අවුරුද්දටත් විශාල මුදල් ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වෙන් කර තිබෙනවා.

ප්‍රධාන අපනයන භෝග 14ක් තිබෙනවා. ඒ භෝග ප්‍රවර්ධනය කිරීමේ පුළුල් වැඩ පිළිවෙළක් මේ වනකොට අපි අමාත්‍යාංශය විධියට දියත් කර තිබෙනවා. විශේෂයෙන්ම මේ වනකොට අපි අපනයන භෝග ගම්මාන පිහිටුවලා තිබෙනවා. ඒ කටයුතු ඉතාම සාර්ථක වෙලා තිබෙනවා. කුරුඳු පිළිබඳව තමයි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. කුරුඳු සම්බන්ධයෙන් ගත්තොත්, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනම දෙපාර්තමේන්තුවක් විධියට ඉදිරියටත් පවත්වා ගෙන යනවා.

2015 සිට 2025 දක්වා වූ දශකයක කාලය ගත්තාම, කුරුඳුවලින් 2025 අවුරුද්දේ තමයි වැඩිම ආදායමක් ලබාගෙන තිබෙන්නේ. එය ඩොලර් මිලියන 260ක ආදායමක්. මේක තමයි ඒ කාලය තුළ ලැබූ වැඩිම ආදායම. මැද පෙරදිග යුද්මය තත්ත්වය

තුළත් 2026 අවුරුද්දේ මැයි මාසය වනවිට - මාස 5ක් ඇතුළත - කුරුඳුවලින් ඩොලර් මිලියන 108ක ආදායමක් අපි රටක් විධියට ලබා තිබෙනවා.

ඊළඟට, කුරුඳු වගා කරන ගොවීන් ප්‍රවර්ධනය කිරීමට විශේෂ වැඩසටහන් දියත් කර තිබෙනවා. අක්කරයක් වගා කරන ගොවීන්ට රුපියල් ලක්ෂයක ආධාරයක් ලබා දෙනවා. අක්කර කාලක් වගා කරන ගොවියා දක්වා මේ ආධාර ලබා දෙනවා. අක්කර 5ක් දක්වා වගා කරන ගොවීන්ටත් ආධාර ලබා දෙනවා. පැළ සඳහා ගොවියාට රුපියල් 10ක පිරිවැයක් විතරයි දරන්න වෙන්නේ. අනෙක් සියලු පිරිවැය රජය වාගේම අමාත්‍යාංශය දරනවා. ඒ වාගේම පළිබෝධ මර්දනය කිරීම සඳහා වෙනම ආධාර ලබා දෙන වැඩසටහනක් තිබෙනවා. ඒ අනුව කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් විශාල ප්‍රමාණයක් මේ වනකොට දියත් කර තිබෙනවා. ඒ වාගේම අනෙකුත් අපනයන භෝග ප්‍රවර්ධනය කිරීම සඳහාත්, ඒ තුළින් අපේ රටට ඩොලර් ආදායම වැඩි කර ගැනීම සඳහාත් විශේෂ ව්‍යාපෘති ගණනාවක් මේ වනකොට දියත් කර තිබෙනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගේ මූලාසනයට ගරු කරනවා. ඒ නිසා අපි argumentවලට යන්නේ නැහැ. ඇත්තටම අපි ඔබතුමාට ඒ ගරුත්වය ලබා දෙනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න කැමතියි, අපි අහන ප්‍රශ්නයට පිළිතුර ඊට පෙර දවසේ ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා. රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියත් ඒ කාරණය සඳහන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, පුළුවන් නම් අපිට පිළිතුර වේලාසනින් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම සම්ප්‍රදායයක් නැහැ. ඒ ගැන Parliamentary Business Committee එකේදී කථා කරමු, ගරු මන්ත්‍රීතුමනි. දැනට ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
එතකොට අපිට වටේ ගිහිල්ලා ප්‍රශ්නය අහන්න ඕනෑ නැහැ, නිශ්චිත ප්‍රශ්න දෙකක් හදා ගෙන එන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇත්තටම වටේ ගිහිල්ලා තමයි ප්‍රශ්න අහන්නේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ප්‍රශ්න අහන්න වෙන්නේ වටේ ගිහිල්ලා, ගරු කථානායකතුමනි. මොකද, පිළිතුර පිළිබඳව අපිට තිබෙන අවිනිශ්චිතතාව නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්. නැත්නම් මම ඊළඟ ප්‍රශ්නයට යනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහන්නේ නැහැ, ගරු කථානායකතුමනි. එම ප්‍රශ්නය අහන්න මම අර්ච්චුනා මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පැහැදිලිවම දැන් ආයෙත් අනවශ්‍ය විධියට කාලයක් ගත්තා නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මම දැන්ම අවසන් කරන්නද, නැත්නම් අහන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අතුරු ප්‍රශ්නය අහන්න විනාඩියයි, තත්පර 30ක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
විනාඩියයි, තත්පර 30යි නේ. හොඳයි, බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ජෝක් එකක් කර ගන්න එපා, මේ පාර්ලිමේන්තුව.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔයගොල්ලන් කිලිනොච්චිය ප්‍රදේශයේ project එකක් පටන් ගත්තා, "கைப்பிடி மண் விவசாயம்" කියලා. මට ඒක සිංහලෙන් කියන්න තේරෙන්නේ නැහැ. එහෙම project එකක් පටන් ගෙන ඒකෙන් සල්ලි බර ගණනක් වංචා කළා. අපි ඒක පෙන්වා දුන්නාට පසුව ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සරහ වාඩි වෙලා ඉන්න ඔබතුමන්ලාගේ ඇමතිවරු,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මම අවසන් කරනවා. ඉන්නකෝ, පොඩ්ඩක්. *[බාධා කිරීමක්]* ඒ නිසා මාව එළියට දැම්මා. මම අහන්නේ මේකයි. ඔබතුමන්ලා මිලියන 600ක් වියදම් කරලා project එකක් කළා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔය ප්‍රශ්නය මුලින් අහපු ප්‍රධාන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීමක්]*

## නව ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම: පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාසය
## புதிய காணி அனுமதிப்பத்திரங்கள் வழங்கல்: பொத்துவில் பிரதேச செயலாளர் பிரிவு
## ISSUANCE OF NEW LAND PERMITS: POTTUVIL DS DIVISION

1756/2025

**6. ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන්ට ඉඩම් ලබා දීම සහ එම ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා 2008/4 චක්‍රලේඛය ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම චක්‍රලේඛය යටතේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අදියර 1, 2, 3, 4 සහ 5 යටතේ අයදුම් කළ තැනැත්තන්ගේ සංඛ්‍යාව සහ නිකුත් කර ඇති නව ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව අදියර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත චක්‍රලේඛයට අනුව පසුගිය වර්ෂ 17ක කාලය තුළ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිකුත් කර ඇති මුළු නව බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) එම චක්‍රලේඛය යටතේ අයදුම් කර ඇති, එහෙත් මෙතෙක් නිකුත් කර නොමැති ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) නැඟෙනහිර පළාත් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කර ඇති නමුත්, මෙතෙක් නිකුත් කර නොමැති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) එම ඉඩම් බලපත්‍ර නිකුත් නොකර රඳවා තබා ගැනීමට බලපා ඇති හේතු කවරේද;

(vii) අදාළ බලපත්‍ර සුදුස්සන්ට ඉතා කඩිනමින් නිකුත් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணியற்றவர்களுக்குக் காணிகளை வழங்கவும் அவ்வாறு வழங்கப்படும் காணிகளுக்கு காணி அனுமதிப்பத்திரங்களை வழங்குவதற்குமாக 2008/4ஆம் இலக்க சுற்றறிக்கை நடைமுறையில் உள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சுற்றறிக்கைக்கு அமைவாக பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் 1, 2, 3, 4 மற்றும் 5 கட்டங்களின்கீழ் விண்ணப்பித்தவர் களின் எண்ணிக்கை மற்றும் வழங்கியுள்ள புதிய காணி அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை ஒவ்வொரு கட்டடத்தின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி சுற்றறிக்கைக்கு அமைவாக கடந்த 17 வருட காலப்பகுதியில் பொத்துவில் பிரதேச செயலகத்தால் வழங்கப்பட்டுள்ள புதிய அனுமதிப்பத்திரங்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி சுற்றறிக்கைக்கு அமைவாக விண்ணப் பித்துள்ள போதிலும், இதுவரையில் வழங்கப் படாதுள்ள காணி அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) கிழக்கு மாகாண காணி நிர்ணயத் திணைக் களத்தால் விதந்துரைக்கப்பட்டு பொத்துவில் பிரதேச செயலகத்துக்கு ஆற்றுப்படுத்தியுள்ள போதிலும், இதுவரையில் வழங்கப்படாதுள்ள அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) மேற்படி காணி அனுமதிப்பத்திரங்களை வழங்காது நிறுத்தி வைத்திருப்பதில் தாக்கம் செலுத்தியுள்ள காரணங்கள் யாவை என்பதையும்;

(vii) குறித்த அனுமதிப்பத்திரங்களைத் தகுதியானவர் களுக்கு மிகத் துரிதமாக வழங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that Circular No. 2008/4 is currently in force for the allocation of lands to landless persons and for the issuance of permits in respect of such lands;

(ii) if so, the number of persons who have applied under phases 1, 2, 3, 4 and 5 within the Pottuvil Divisional Secretary's Division as per the said circular and the number of new land permits issued under each phase, separately;

(iii) the total number of new permits that have been issued by the Pottuvil Divisional Secretariat during the last 17 years, as per the said circular;

(iv) the number of land permits that have been applied for under the said circular, but have not yet been issued;

(v) the number of permits that have been recommended by the Land Title Settlement

Department of the Eastern Province and have been forwarded to the Pottuvil Divisional Secretariat, but have not yet been issued;

(vi) the reasons that have led to the retention of the said land permits without being issued; and

(vii) whether steps will be taken to issue the said permits to the eligible persons expeditiously?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන්හට ඉඩම් ලබා දීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට 2008/4 දරන චක්‍රලේඛය ක්‍රියාත්මක කරනු ලබන අතර, එහිදී පහත පරිදි ඉඩම් ලබා දීම සිදු කරයි.

- රජයේ ඉඩම් නොමැති හා රජයේ ඉඩම් ලබා දෙන ලෙස අයදුම් පත් යොමු කර ඇති පුද්ගලයන්හට සුදුසුකම් අනුව ඉඩම් ලබා දීම.
- කිසිදු ලියවිල්ලක් නොමැතිව රජයේ ඉඩම්වල පදිංචිව සිටින පුද්ගලයන්හට පදිංචියට පර්චස් 20ක් හා වගා කටයුතු සඳහා අක්කරයක් වශයෙන් පර්චස් 180ක් ලබා දීම.

(ii) එම චක්‍රලේඛය යටතේ පුද්ගලයන් 13,433ක් අයදුම්පත් යොමු කර ඇති අතර, 1,801දෙනෙකුට බලපත්‍ර නිකුත් කර ඇත. බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදු කරන අදියර පහත පරිදි වේ.

- අයදුම්පත් ලබා දුන් පුද්ගලයන් ලියාපදිංචි කිරීම. (ඉඩම් නොමැති හා ඉඩම් ඇති පුද්ගලයන්)
- විමර්ශනය කිරීම.
- නාම ලේඛනයක් සකස් කිරීම. (පොතක් සකස් කිරීම)
- එම සකස් කරන නාම ලේඛන වාර්තා ඉඩම් කොමසාරිස් හා පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කිරීම. (මෑත කාලයේ එය සිදු නොකරයි.)
- ඉඩම් කච්චේරි පවත්වා සුදුසුකම් පවතින පුද්ගලයන්හට බලපත්‍ර නිකුත් කිරීම.

| අදියර | අයදුම් කළ තැනැත්තන් සංඛ්‍යාව | නිකුත් කර ඇති නව බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 2,924 | 210 |
| 2 | 2,328 | 170 |
| 3 | 1,425 | 385 |
| 4 | 4,384 | 473 |
| 5 | 2,372 | 563 |
| එකතුව | 13,433 | 1,801 |

(iii) ඉහත අදියරයන් අනුව සුදුසුකම් ඇති පුද්ගලයන් සඳහා නැඟෙනහිර පළාත් ඉඩම් කොමසාරිස් අනුමැතිය අනුව තෝරා ගත් සුදුසුකම් ඇති පුද්ගලයන්හට බලපත්‍ර 1,801ක් නිකුත් කර ඇත.

(iv) එම චක්‍රලේඛය අනුව පුද්ගලයන් 13,433ක් අයදුම්පත් යොමු කර ඇති අතර, බලපත්‍ර 1,801ක් නිකුත් කර ඇත. එයින් 11,632ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොමැත. මේ අතර එසේ ලබා නොදීමට හේතු වශයෙන්,

- එකම පුද්ගලයන් නැවත නැවතත් අයදුම් කිරීම.
- සුදුසුකම් නොමැති පුද්ගලයන් අයදුම් කිරීම.
- ගැටලු පවතින වෙනත් ආයතන අයිතියේ ඇති ඉඩම් සඳහා අයදුම්පත් යොමු කිරීම. උදාහරණයක් ගත්තොත්, වනජීවී, වන සංරක්ෂණ වාගේ ප්‍රදේශවලට අයිති භූමි.
- තොරතුරු පද්ධති විටින් විට වෙනස් වනවිට එකම පුද්ගලයන් නැවත අයදුම්පත් යොමු කිරීම.
- ඉඩම් නොමැති පුද්ගලයන් අයදුම් කරන විට ඔවුන්ට ලබා දීමට රජයේ ඉඩම් නොමැති වීම හා ඉඩම් හඳුනා ගැනීමේ අපහසුතා පැවතීම යනාදී කරුණු සඳහන් කළ හැකිය.

(v) නැඟෙනහිර පළාත් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවක් නොමැත.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு நன்றி! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

நாடளாவிய ரீதியில் கரையோரங்களில் இடம்பெறுகின்ற உல்லாசத்துறை சார்ந்து வியாபாரம் செய்யும் குடியிருப்பு நிலங்களுக்கு தற்போது வரை உரிமம் - உறுதி - வழங்கப்படாமை காரணமாக குத்தகைமூலம் அனுமதிபெற்று பணம் செலுத்தியே ஹோட்டல்களை நடத்த வேண்டுமென பணிக்கப்பட்டுள்ளது. பொத்துவிலில் கடந்த 50 ஆண்டுகளுக்கும் மேலாக அப்பகுதி வியாபாரிகள் சிறிய சிறிய நிலங்களில் சிறியதாக ஆரம்பம் செய்த இந்த வியாபாரம், அதிகளவாக 40 பேர்ச்சஸ் வரைக்குமான பரப்பு கொண்ட நிலத்திலே நடைபெற்று வருகின்றது. தற்பொழுதுதான் வியாபாரம் கொஞ்சம் கொஞ்சமாக விஸ்தரிக்கப்பட்டுள்ளது. எனவே, பொத்துவில் உட்பட ஏனைய பிரதேசங்களில் உல்லாசத்துறை சார்ந்த வியாபாரங்களைச் செய்கின்ற வியாபாரிகளுக்கான நில உரிமை தொடர்பான - குத்தகை பெறுவது தொடர்பான - நிபந்தனைகளைத் தளர்த்தி, மிக விரைவாகவும் அவசரமாகவும் குத்தகை வழங்குவதற்கு அரசும் அமைச்சும் நடவடிக்கைகளை மேற்கொள்ள முடியுமா? இவ்வாறு நிபந்தனைகளைத் தளர்த்தி, விரைவாக அனுமதி வழங்கி, குத்தகைக்குக் கொடுப்பதன்மூலம் அப்பகுதி வியாபாரிகள் தொந்தரவுகளின்றி வியாபார நடவடிக்கைகளை விருப்பத்துடன் மேற்கொள்ள முடியுமென நம்புகின்றேன். உல்லாசத்துறைமூலம் எமது நாட்டுக்கு வருமானம் அதிகமாகக் கிடைக்கும் என்பது குறிப்பிடத்தக்கது.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමා අහපු පළමුවන අතුරු ප්‍රශ්නය නැගෙනහිර පළාතට විතරක් නොවෙයි, වෙරළබඩ තීරයේ ගොඩක් තැන්වල පැන නැඟී තිබෙන ප්‍රශ්නයක්. මේ ප්‍රදේශවල ව්‍යාපාර කටයුතු කරද්දී විවිධාකාරයට මේ භූමි අත්පත් කර ගැනීම් සිදු කර තිබෙනවා. කොහොම නමුත්, නීත්‍යනුකූලව බලපත්‍ර ලබා දී තිබෙන අයට ඊළඟ පියවරට යන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ අපි සකස් කරමින් තිබෙනවා. දැනට නියමානුකූල කරන්න පුළුවන් භූමි අපි හඳුනා ගනිමින් තිබෙනවා, ඔවුන්ට නීත්‍යනුකූලව පවරා දීම සඳහා.

ඒ වාගේම ඉතාම සංවේදී කලාප තිබෙනවා. ඒ කලාපවල නියමානුකූල කිරීම් කරද්දී රටක් විධියට විධිමත් පරීක්ෂණයක් අපට කරන්න වෙනවා. ඒ නිසා ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට අදාළව ගත්තොත්, බලපත්‍ර ලබා දීම් සහ ලබා දී තිබෙන බලපත්‍ර සම්බන්ධයෙන් ඊළඟ පියවරට යන්න නියමානුකූල කිරීම් සඳහා අපි දැනට වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඔබතුමා හඳුනා ගත් කවුරු හරි ඉන්නවා නම් ඒ අයත් මේකට යොමු කරන්න. නිශ්චිත, නීත්‍යනුකූල වැඩ පිළිවෙළක් හරහා ඔවුන්ට ඒ බලපත්‍ර සහ නීත්‍යනුකූලව ලබා දිය යුතු ලිපි ලේඛන සකස් කර අවශ්‍ය පහසුකම් සලසා දෙන්න අපට පුළුවන්.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கு நன்றி! எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் 2006, 2010ஆம் ஆண்டுகளில், 1990ஆம் ஆண்டுக்கும் அதற்கு முன்னரும் விவசாயம் செய்து பயங்கரவாத நடவடிக்கைகள் காரணமாக செய்கை பண்ணப்படாத மஜீத்புரம், கிரான்கோமாரி, கும்மாவெளி, வேகாமம், துக்கொல்லை, செல்வவெளி, பள்ளியடிவட்டை, செங்காமம், சர்வோதயபுரம் போன்ற பிரதேசங்களிலுள்ள காணிகள் வன இலாகா, வனசீவராசிகள் திணைக்களத்துக்கு உரியவை எனக் கூறி, விவசாயிகள் பலருக்கு எதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ளது. புதிய அரசினது அமைச்சரவைத் தீர்மானத்தின் பிரகாரம், விவசாயம் செய்த வன இலாகா, வனசீவராசிகள் திணைக்களத்துக்கு உரித்தான காணிகளில் பொருத்தமானவற்றை விடுவிக்க முடியுமெனக் கூறப் பட்டுள்ளது. இதன் அடிப்படையில், முன்னர் பிழையாக வழக்குத் தாக்கல் செய்யப்பட்ட கும்மாவெளி, வேகாகம், பள்ளியடிவட்டை, சர்வோதயபுரம், செங்காமம், செல்வவெளி போன்ற பிரதேசங்களிலுள்ள விவசாயக் காணிகளை விடுவிக்க நடவடிக்கை எடுக்க முடியுமா? 1960ஆம், 1980ஆம் ஆண்களில் வேகாமம், கும்மாவெளி போன்ற பிரதேசங்களிலுள்ள காணி களில் செய்கை பண்ணப்பட்டதைக் குறிப்பிட விரும்பு கின்றேன். கும்மாவெளியில் சுமார் 50 ஏக்கர் காணியில் இன்றும் செய்கை பண்ணப்படுகின்றது. எமது பகுதி ஏழை விவசாயிகளினது எதிர்காலம் கருதி, மேற்குறித்த வழக்குகளை வாபஸ்பெற்று காணிகளை விடுவிக்க நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමා දෙවන අතුරු ප්‍රශ්නය යටතේ කියන්නේ පොතුවිල් ආශ්‍රිත විවිධ ප්‍රදේශවල 2006, 2010 කාලවල සහ ඊට පෙර ගොවීන් වගා කරපු භූමි සහ ඊට අදාළව යම් යම් ගැසට් නිවේදන නිකුත් කරලා වෙච්ච සීමා කිරීම් පිළිබඳවයි. ඒ කියන්නේ, වනජීවී සහ වන සංරක්ෂණ ප්‍රදේශ පිළිබඳව.

ඇත්තටම අපි මේ පිළිබඳව දැනට අමාත්‍යාංශයේ සාකච්ඡා පවත්වමින් සිටිනවා. කෘෂි ඉඩම් සම්බන්ධයෙන් සහ අනෙකුත් ජනතාව පරිහරණය කරන ඉඩම් සම්බන්ධයෙන් කාලයක් තිස්සේ රටේ ඇති වෙච්ච තත්ත්ව සහ මේ ප්‍රදේශවල තිබුණු තත්ත්ව එක්ක පැන නැඟුණු පොදු ගැටලු ටිකක් මේ ප්‍රදේශවල තිබුණා. නමුත්, ඒ තත්ත්ව දැන් මහ හැරිලා තිබෙන නිසා, අපි දැනට අමාත්‍යාංශය විධියට විශේෂයෙන්ම නැගෙනහිර පළාත තුළ ඔබතුමා ඉල්ලන මේ කෘෂි ඉඩම් සම්බන්ධයෙන් නිරවුල් කර දීමේ කටයුතු ආරම්භ කරන්න සූදානම් වෙලා තිබෙනවා.

අපිට පුළුවන්, මේ සම්බන්ධව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ක කථා කරලා කටයුතු කරන්න. දැනට යම් සීමාකාරී ගැසට් එකක් තිබෙනවා නම්, ඒ ඒ කාලවල ඒ ඒ තත්ත්වයන්ට ගැළපෙන්න තමයි ඒ ගැසට් නිවේදන නිකුත් කර තිබෙන්නේ. හැබැයි, දැන් තත්ත්වයන් වෙනස් වෙලා තිබෙනවා. ගොවීන්ට සාධාරණයක් කරන්න ඕනෑ. ඒ නිසා අපි ඒ පිළිබඳ සාකච්ඡා කරමින්, මේ ගැටලු විසඳන්න කටයුතු කරමින් ඉන්නවා. අපිට පුළුවන්, ඉක්මනින්ම මේකට අදාළව ඔබතුමන්ලාට සාධාරණයක් කරලා දෙන්න කටයුතු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 07,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) (ආ). ඒකෙන් අදාළ වන්නේ, ස්ථාවර නියෝග 33(1).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමා කියන්නේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ අතුරු ප්‍රශ්නය අහන්න කලින්ම ඔබතුමා මට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මෝඩ විධියට හැසිරෙන්න එපා, ගරු මන්ත්‍රීතුමා. ප්‍රශ්න අංක 07,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am on a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, joke එකක් කර ගන්න එපා, මේ පාර්ලිමේන්තුව. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am on a point of Order!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7, ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am on a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගවල බොහොම පැහැදිලිව සඳහන් වන ආකාරයට, කිසිම මන්ත්‍රීවරයෙකුට අයුතු ආකාරයෙන්, වැරදි විධියට ආමන්ත්‍රණය කිරීම සුදුසු නැහැ. දැන් ඔබතුමා විසින් මෝඩ විධියට හැසිරෙනවා කියලා අර්චුනා මන්ත්‍රීතුමාට ආමන්ත්‍රණය කිරීම, ඒක සුදුසු දෙයක් නොවෙයි. ඒ නිසා මූලාසනයේ ඉඳගෙන ඔබතුමා ස්ථාවර නියෝග ටික හරියට අනුගමනය කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා පැහැදිලිවම මේ august Assembly එකෙහි හැසිරෙන්න පුරුදු වුණා නම් හොඳයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න. මේ සභාවේ,- *[බාධා කිරීමක්]* මට කථා කරන්න අවස්ථාව දෙන්න. මේ සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරයෙකුට ඒ "මෝඩ " කියන කථා කියන්න බැහැ නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැසිරෙන්න එපා කියන කථාව වෙනම දෙයක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක සුදුසු නැහැ, එහෙම කථා කරන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ අපි කවුරුත් ස්ථාවර නියෝගවලට යටත්ව කටයුතු කරන්න ඕනෑ. නමුත්, ඔබතුමා දන්නවා, මෙතැන එක මන්ත්‍රීවරයෙක්, දෙදෙනෙක් ඉන්නවා, මම දන්නා මේ පාර්ලිමේන්තු කාලයේම මේ තරම් සවුත්තු විධියට,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විධියට, නොවැදගත් විධියට වෙන කවුරුත් හැසිරිලා නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නිසා ඉවසාගෙන ඉන්නවා මිසක් මට නම් ඇත්තටම ඉවසා ගෙන ඉන්නත් බැහැ. දැන් වුණත් විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග ගැන කථා කළා. එතකොට මොකක්ද හැසිරිච්ච විධිය? *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒවා මයික් එකෙන් ඇහෙන්නේ නැති වෙන්න පුළුවන්.*[බාධා කිරීමක්]* ඒවා වීඩියෝවල යන්නේ නැති වෙන්න පුළුවන්. නමුත්, මේ පාර්ලිමේන්තුවේ මේ බිත්ති හතර ඒවාට සාක්ෂි. *[බාධා කිරීමක්]* මොන තරම් තුච්ඡ දෙකේ, මුළු දෙමළ ජනතාවටත් අපහාසයක් කරන මේ පුද්ගලයෙක්ද කියලා. *[බාධා කිරීමක්]*

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකයි, ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 76, 77, 77 (1)හි කියන්නේ මොකක්ද? මට විනාඩි දෙක තුනක් දෙන්න, මේ Standing Order එක කියවන්න. ස්ථාවර නියෝග 77 (1)හි මෙසේ සඳහන් වෙනවා:

> "යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතාම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මඟින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිතා කිරීමේ වරද කරනු ලැබූ විගසම කථානායකවරයා විසින්, එම

[ගරු බිමල් රත්නායක මහතා]

මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී "එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටුවනු ලැබිය යුත්තේ ය" යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබා නොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය."

ස්ථාවර නියෝග 77 (2) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"එවැනි යම් යෝජනාවක් සම්මත වී මෙම ස්ථාවර නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්නම්, එසේ එම මන්ත්‍රීවරයාගේ සේවය අත්හිටවීම පළමු අවස්ථාවේදී සති දෙකකට ද, එම සභාවාරයේ ම දෙවැනි අවස්ථාවේදී සති තුනකට ද, එම සභා වාරයේ ම තෙවැනි හෝ ඊට පසුව එළඹෙන කවර හෝ අවස්ථාවක දී සති හතරකට ද වශයෙන් විය යුත්තේ ය:"

ගරු කථානායකතුමනි, මේ යනාදී විධියට මම මේක මීට කලිනුත් කියලා තිබෙනවා. දිගටම මේක තිබෙනවා. ඔබතුමා දන්නවා, මේ පුද්ගලයාගේ හැසිරීම තිබෙන්නේ පාර්ලිමේන්තුවේ පමණක් නොවෙයි කියලා. ඔබතුමාට පක්ෂ නායකයෙක්, ඉතා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් ලිපියක් දීලා තිබෙනවා, එක ළඟ වාඩි වෙලා ඉන්න බැහැ කියලා. ඒ, කුමාර් පොන්නම්බලම් මැතිතුමා.

කුමාර් පොන්නම්බලම් මැතිතුමා ලියුමක් දීලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ සීට් වෙනස් කරන්න කියලා. ඔබතුමා දන්නවා, යාපනයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කරන්න බැහැ. අපි දැන් මේ ඉවසාගෙන ඉන්නේ, යම් කිසි මානසික රෝගී තත්ත්වයක් ඇති, ඒකට බෙහෙත් අරගෙන හරි යයි කියලා. මම අහන්නේ, මෙතැනම බලන්න, දැන් ඔබතුමාට කොහොමද කථා කරන්නේ?

මේ පාර්ලිමේන්තුවේ කරු ජයසූරිය මැතිතුමාට පුටුවෙන් ගහලා තිබෙනවා, මන්ත්‍රීවරු. හැබැයි, ඔහොම කථා කරලා නැහැ. අපි මෙතැන දැක්කා නේ, මයික් කැඩුවා, ඔක්කෝම කළා. ඒ වුණත් ඒ ගැටුමට සම්බන්ධ කිසිම මන්ත්‍රීවරයෙක් කරු ජයසූරිය මැතිතුමාට පෞද්ගලිකව ඔහොම කථා කළේ නැහැ. රණ්ඩු වුණා, දේශපාලන ප්‍රශ්නයකට. ඒකයි මම කියන්නේ. මේ පාර්ලිමේන්තුවේ 225දෙනෙක් ඉන්නවා. ඒ 225දෙනාගේ ආරක්ෂාව එක්කෙනෙක් කැත කළත්, දෙදෙනෙක් කැත කළත් ඔක්කෝටම ඒක එනවා. ඒ නිසා විපක්ෂ නායකතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ, පොදුවේ පාර්ලිමේන්තුවේ විනය සම්බන්ධයෙන් අපි එකඟතාවකට එමු කියලා. ඒ ගැන විවාදයක් නැහැ.

දැන් වානක මාදුගොඩ මන්ත්‍රීතුමා සම්බන්ධව ගත්තොත්, කථානායකතුමා වේලාව සම්බන්ධයෙන් මැදිහත් වුණා. මගේ පෞද්ගලික හැඟීම නම්, එතුමා ඉතාම වැදගත් විධියට හැසිරෙන මන්ත්‍රීවරයෙක්. ගරු කථානායකතුමනි, ඔබතුමාට අයිතිය තිබෙනවා, ඔබතුමාගේ නියෝග ක්‍රියාත්මක කරන්න. "අපි විපක්ෂය" කියලා, එහෙම එකක් නැහැ. නමුත් මේ මොකක්ද මේ? මෙහෙම, පාර්ලිමේන්තුවකට යන්න දෙන්න පුළුවන්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මතක තියාගන්න. මෙහෙමයි. *[බාධා කිරීමක්]* මේක අහගන්න. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා මීට පෙර සභාවේදී මා අමතා ඉතාම අශෝභන විධියේ ප්‍රකාශත් කර තිබෙනවා. අශෝභන, ශිෂ්ට සම්පන්න නොවන ප්‍රකාශ. ඒ නිසා කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා මීට වඩා විනයක් ඇතුව, සංයමයක් ඇතුව කථා කළා නම්, පාර්ලිමේන්තුවේ හැසිරුණා නම් හොඳයි කියලා මම හිතනවා, මේ වාගේ ප්‍රකාශ කරන්නේ නැතුව. හොඳයි, අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, 36 වන ස්ථාවර නියෝගයට. ඔබතුමා එක වෙලාවක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැටියට සඳහන් කරන්නටත්, තවත් වෙලාවක ගරු සභානායකතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැටියට සඳහන් කරන්නටත් කටයුතු කිරීම, ඒවා සුදුසු නැහැ. අනෙක, මෙතුමා සඳහන් කළා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මේක-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. මෙතුමා සඳහන් කළා, "කුමාර් පොන්නම්බලම් මන්ත්‍රීවරයා" කියලා. කුමාර් පොන්නම්බලම් කියලා මන්ත්‍රීවරයෙක් නැහැ, මේ පාර්ලිමේන්තුවේ. ගජේන්ද්‍ර පොන්නම්බලම් ඉන්නේ, කුමාර් පොන්නම්බලම් මැතිතුමාගේ පුතා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගජේන්ද්‍ර පොන්නම්බලම් මන්ත්‍රීතුමා ලිපියක් ලබා දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ගජේන්ද්‍ර පොන්නම්බලම් මන්ත්‍රීතුමා මට ලිපියක් ලබා දීලා තිබෙනවා, එතුමා ළඟ ඉන්න බැහැ කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔය කාරණය මෙතැනින් අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]* කුමාර් පොන්නම්බලම් කියලා කවුරුත් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න. [බාධා කිරීමක්]

ප්‍රශ්න අංක 7 -1790/2025- (1), ගරු බී. ආරියවංශ මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, I rise to a point of Order. - *[Interruption.]*

## මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන: උතුරු පළාත
## மதுபானம் மற்றும் போதைப்பொருளுக்கு அடிமையானவர்களுக்கான புனர்வாழ்வு நிலையங்கள்: வட மாகாணம்
## REHABILITATION CENTRES FOR ALCOHOL AND DRUG ADDICTS: NORTHERN PROVINCE

1824/2026

**8.ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මත්පැන් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, ඒවා ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්ක කවරේද;

(iii) වර්තමානයේදී එම මධ්‍යස්ථානවලින් සේවා සපයනු ලබන්නේද;

(iv) එසේ නම්, සේවා සපයනු ලබන දිස්ත්‍රික්ක කවරේද;

(v) නොඑසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(vi) එම මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම සඳහා අපේක්ෂිත කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மதுபானம் மற்றும் போதைப்பொருளுக்கு அடிமையானவர்கள் புனர்வாழ்வு பெறக் கூடியவாறு வட மாகாண சுகாதார அமைச்சின் கீழ் புனர்வாழ்வு நிலையங்கள் தாபிக்கப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், எந்தெந்த மாவட்டங்களில் இந் நிலையங்கள் தாபிக்கப்பட்டுள்ளன என்பதையும்;

(iii) தற்போது மேற்படி நிலையங்கள் ஊடாக சேவைகள் வழங்கப்படுகின்றனவா என்ப தையும்;

(iv) ஆமெனில், சேவை வழங்கப்படுகின்ற மாவட் டங்கள் யாவை என்பதையும்;

(v) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி நிலையங்களை செயற்படக்கூடிய நிலைக்குக் கொண்டுவருவதற்கு எதிர்பார்க் கப்படும் காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether rehabilitation centres have been established under the Provincial Ministry of Health of the Northern Province for the rehabilitation of individuals addicted to alcohol and drugs;

(ii) if so, the districts in which the rehabilitation centres have been established;

(iii) whether services are currently being rendered from the above centres;

(iv) if so, the districts in which services are rendered;

(v) if not, the reasons therefor; and

(vi) the time frame within which these centers are expected to become functional?

(b) If not, why?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
Hon. Speaker, on behalf of the Minister of Health and Mass Media, I answer the Hon. Member's Question.

(a) (i) Yes.

Alcohol rehabilitation services are being provided through health institutions under the Northern Provincial Ministry of Health. In addition, drug dependence treatment and rehabilitation services have been initiated at selected hospitals in the Northern Province under the National Dangerous Drugs

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය ]

Control Board under the purview of Ministry of Public Security and Parliamentary Affairs.

(ii) Alcohol rehabilitation centres are functioning at the following institutions under the Northern Provincial Health Services:

- Divisional Hospital, Dharmapuram - Kilinochchi District
- Base Hospital, Chavakachcheri - Jaffna District

Drug dependence treatment and rehabilitation services under the National Dangerous Drugs Control Board have been established or are being developed at:

- Divisional Hospital, Oddusuddan - Mullaitivu District
- Divisional Hospital, Gurunagar - Jaffna District

(iii) Yes.

Alcohol rehabilitation services are currently being provided at:

- Divisional Hospital, Dharmapuram
- Base Hospital, Chavakachcheri

Drug-dependence treatment and rehabilitation services have also commenced at the Divisional Hospital Oddusuddan under the National Dangerous Drugs Control Board. The proposed centre at Divisional Hospital Gurunagar is not yet operational, as renovation and infrastructure improvement works are currently in progress.

(iv) Services are currently being provided in the following districts:

| | | |
|---|---|---|
| Jaffna District | - | Alcohol rehabilitation services at Base Hospital, Chavakachcheri. |
| Kilinochchi District | - | Alcohol rehabilitation services at Divisional Hospital, Dharmapuram. |
| Mullaitivu District | - | Drug dependence treatment and rehabilitation services at Divisional Hospital Oddusuddan under the National Dangerous Drugs Control Board. |

(v) Does not arise.

(vi) The drug dependence treatment and rehabilitation centre at Divisional Hospital Gurunagar is expected to become operational following the completion of the ongoing renovation works and the provision of necessary facilities by the National Dangerous Drugs Control Board.

The exact date of commencement will be determined by the National Dangerous Drugs Control Board, which comes under the purview of the Ministry of Public Security and Parliamentary Affairs, based on the progress and completion of the renovation and other preparatory works.

(b) Does not arise.

I hope I clarified your queries, Hon. Member, but unfortunately, I am unable to provide any further answers on behalf of the Ministry. However, I would be happy to provide any further clarifications, if you reach out to me personally, getting down information from the Ministry.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Thank you very much. Tomorrow, there is a Meeting of that Ministerial Consultative Committee. So, I will raise my questions with the Hon. Minister and get them clarified. Again, thank you so much for the Answer.

## සහල් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය: මිල පාලනය
## அரிசி மற்றும் ஏனைய அத்தியாவசிய உணவுப்பொருட்கள்: விலைக் கட்டுப்பாடு
RICE AND OTHER ESSENTIAL FOOD: PRICE CONTROL

1990/2026

**9. ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) උත්සව සමයේදී ප්‍රමාණවත් සහල් තොග වෙළෙඳ පොළට නිකුත් කිරීමට හැකියාවක් තිබේද;

(ii) සියලුම සහල් වර්ගවල පාලන මිල, සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සීමාසහිත ලංකා සතොස මඟින් සහල් බෙදා හැරීමට සකසා ඇති වැඩ පිළිවෙළ කවරේද;

(iv) ආනයනික සහල් වර්ග කවරේද;

(v) එම සහල්වල වර්තමාන මිල, සහල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළ ප්‍රමාණවත් පරිදි ගබඩා කර තිබේද;

(ii) එම ආහාර ද්‍රව්‍ය පෞද්ගලික අංශය මඟින් පමණක් ආනයනය කරනු ලබන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා රාජ්‍ය අංශය මැදිහත් වන ආකාරය කවරේද;

(iv) සහල් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ප්‍රමාණවත් ලෙස මැදිහත් වන්නේද;

(v) එම අධිකාරිය මිල පාලනය සඳහා මැදිහත් වන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டிகைக் காலத்தில் போதியளவு அரிசிக் கையிருப்பைச் சந்தைக்கு விடுவிக்கும் ஆற்றலுள்ளதா என்பதையும்;

(ii) அனைத்து அரிசி வகைகளின் கட்டுப்பாட்டு விலைகள், அரிசி வகைகளின் வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) வரையறுக்கப்பட்ட லங்கா 'சதொச' நிறுவனம் மூலம் அரிசியை விநியோகிப்பதற்கு வகுக்கப் பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

(iv) இறக்குமதி செய்யப்பட்ட அரிசி வகைகள் யாவை என்பதையும்;

(v) மேற்படி அரிசி வகைகளின் நடப்பு விலைகள், அரிசி வகைகளின் வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நாட்டில் அத்தியாவசிய உணவுப்பொருட்கள் போதியளவு களஞ்சியப்படுத்தப்பட்டு உள்ளனவா என்பதையும்;

(ii) மேற்படி உணவுப்பொருட்கள், தனியார்துறை யால் மட்டும் இறக்குமதி செய்யப்படு கின்றனவா என்பதையும்;

(iii) இன்றேல், அரச துறை அதில் தலையீடு செய்யும் விதம் யாது என்பதையும்;

(iv) அரிசி மற்றும் ஏனைய அத்தியாவசிய உணவுப் பொருட்களின் விலைகளைக் கட்டுப்படுத்து வதில் நுகர்வோர் அலுவல்கள் பற்றிய அதிகார சபை போதியளவு தலையீடு செய்கின்றதா என்பதையும்;

(v) மேற்படி அதிகாரசபை, விலைக் கட்டுப்பாட்டில் தலையீடு செய்யும் விதம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House-

(i) whether sufficient rice stocks could be released to the market during the festive season;

(ii) the controlled prices of all types of rice by type, separately;

(iii) the arrangements made to distribute rice through the Lanka Sathosa Limited;

(iv) the types of rice imported; and

(v) the current prices of such rice by type, separately?

(b) Will he also inform this House -

(i) whether sufficient stocks of essential food are stored within the country;

(ii) whether such food is imported solely by the private sector;

(iii) if not, in what manner the public sector intervenes in that regard;

(iv) whether the Consumer Affairs Authority intervenes adequately to control the prices of rice and other essential food items; and

(v) the manner in which the Authority intervenes in price control?

(c) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) දේශීය සහල්

| අනු අංකය | වර්ගය | උපරිම තොග මිල (කිලෝග්‍රෑම් 1ක් සඳහා) | උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑම් 1ක් සඳහා) |
|---|---|---|---|
| 01 | සුදු/රතු කැකුළු සහල් - දේශීය | රු. 215 | රු. 220 |
| 02 | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය (මොට්ටෙයිකරුප්පන් සහ අට්ටකාරි හැර) | රු. 225 | රු. 230 |
| 03 | සුදු/රතු සම්බා - කැකුළු සහ වාෂ්පයෙන් තැම්බූ/ තම්බන ලද - දේශීය (සුදුරු සම්බා හැර) | රු.235 | රු.240 |
| 04 | කිරි සම්බා - කැකුළු සහ වාෂ්පයෙන් තැම්බූ/ තම්බන ලද - දේශීය | රු. 255 | රු.260 |

ආනයනික සහල්

| අනු අංකය | වර්ගය | උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑම් 1ක් සඳහා) |
|---|---|---|
| 01 | කැකුළු සහල් - ආනයනික | රු. 210 |
| 02 | නාඩු සහල් - ආනයනික | රු. 220 |
| 03 | සම්බා සහල් - ආනයනික | රු. 230 |
| 04 | පොන්නි සම්බා - GR 11 (කිරි සම්බා සහල්වලට සමාන) - ආනයනික | රු. 240 |
| 05 | කිරි පොන්නි හෝ පාල් පොන්නි GR 11 - ආනයනික | රු. 255 |

(iii) වී අලෙවි මණ්ඩලය සතු වී තොග සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් වෙතින් සහල් බවට පත් කර ලංකා සතොස ආයතනය හරහා වෙළෙඳ පොළ වෙත නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ද සකස් කර ඇත. තවද, ලංකා සතොස ආයතනය සතිපතා සිදු කරනු

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ලබන ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව මිල දී ගනු ලබන සහල් උපරිම සිල්ලර මිල ද සලකා වෙළෙඳ පොළේ සාධාරණ හා තරගකාරි මිල ගණන්වලට විකුණනු ලබයි.

(iv) පොන්නි සම්බා සහ කීරි/පාල් පොන්නි

(v) පොන්නි සම්බා හා කීරි/පාල් පොන්නි යන ආනයනික සහල්වල වර්තමාන වෙළෙඳ පොළ තොග මිල

| අනු අංකය | වර්ගය | වෙළෙඳ පොළ තොග මිල (කිලෝග්‍රෑම් 1ක් සඳහා) |
|---|---|---|
| 01 | පොන්නි සම්බා - GR 11 (කීරි සම්බා සහල්වලට සමාන) - ආනයනික | රු. 220 |
| 02 | කීරි පොන්නි හෝ පාල් පොන්නි GR 11 - ආනයනික | **රු. 240 රු. 245** |

ආනයනික සහල්වල උපරිම සිල්ලර මිල අංක (අ)(ii)හි දක්වා ඇත.

(ආ) (i) ඔව්.

සහල්, අර්තාපල්, ලොකු ලූනු, පරිප්පු, සීනි, කිරිපිටි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළ පාරිභෝගික ඉල්ලුමට සරිලන පරිදි ගබඩා තුළ පවතී.

(ii) නැත.

තිරිඟු පිටි, පරිප්පු ආදි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ආනයනය මත පමණක් රඳා පවතින අතර අර්තාපල්, සීනි, ලූනු වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනික මෙන්ම දේශීය නිෂ්පාදන ලෙස ද වෙළෙඳ පොළට පැමිණේ. රට තුළ හිඟයක් ඇති වන විශේෂ අවස්ථාවල පමණක් සහල් ආනයනය පෞද්ගලික මෙන්ම රජයේ ආයතන මඟින් ද සිදු කරනු ලබයි. ඒ අනුව, දේශීය වෙළෙඳ පොළ ඉල්ලුමට සරිලන පරිදි ආනයනික මෙන්ම දේශීය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පාරිභෝගික අවශ්‍යතාව සපුරනු ලබයි.

(iii) සාමාන්‍යයෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු බොහොමයක් ද්‍රව්‍ය පෞද්ගලික අංශය විසින් ආනයනය කරනු ලබයි. මෙම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් රට තුළ හිඟයක් හෝ අසාමාන්‍ය මිල ඉහළ යෑමක් පවතින අවස්ථාවලදී ඒ සඳහා රජය මැදිහත් වීම සිදු කරන අතර, රජයේ ආනයනික ආයතනය වන රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC) හරහා ආනයනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

(iv) ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කරනු ලබයි.

(v) යම්කිසි භාණ්ඩයක මිල ඉහළ යෑම පාලනය කිරීම සඳහා එම භාණ්ඩයට උපරිම සිල්ලර මිලක් නියම කිරීමේ හැකියාව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පවතී. එසේ මිල නියම කිරීමෙන් අනතුරුව අදාළ භාණ්ඩ වැඩි මිලට විකිණීම සම්බන්ධව වැටලීම් සිදු කොට අධිකරණය හරහා දඩ නියම කිරීමේ හැකියාව පවතී. උපරිම සිල්ලර මිල නියම කිරීමෙන් සිදු කරනු ලබන මිල පාලනයට අමතරව දැනුවත් කිරීමේ වැඩසටහන්, වැටලීම් වැනි ක්‍රියාකාරකම් මඟින් වෙළෙඳ පොළ මිල පාලනය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මැදිහත්වීම් සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலின சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මම මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. දේශීය කීරි සම්බා සහල් කිලෝවක් සඳහා වර්තමානයේ රුපියල් 260ක පාලන මිලක් ක්‍රියාත්මක වේ. නමුත් මේ වන විට වෙළෙඳ පොළ තුළ දේශීය කීරි සම්බා කිලෝවක් අලෙවි වන මිල රුපියල් 370කට ආසන්න වේ. මේ සහල් සැපයුම්කරුවන් වන්නේ, රටේ ප්‍රධාන පෙළේ සහල් නිෂ්පාදකයන් ය. ඔවුන් විසින් තොග වෙළෙඳුන් වෙත තොග නිකුත් කිරීමේදී කූට බිල් සැකසීමේ ක්‍රමයක් පවත්වාගෙන යෑම ප්‍රසිද්ධ කරුණකි. එබැවින්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හරහා, වැඩි මිලට සහල් අලෙවි කිරීම නැවැත්වීමට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද සහ වැඩි මිලට අලෙවි කිරීම පාලනය කළ හැකිද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා අහන කීරි සම්බා පිළිබඳ ප්‍රශ්නය පසුගිය වසරේදීත් මතු වුණා. මේ වසරේ මහ කන්නය වන විට මේ ප්‍රශ්නය විසඳා ගැනීම වෙනුවෙන් අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහාත් විශාල පරිශ්‍රමයක් දැරුවා. ගරු මන්ත්‍රීතුමනි, කීරි සම්බා සඳහා වන ඉල්ලුම රටේ සහල් පරිභෝජන අවශ්‍යතාවෙන් සියයට 15ක් පමණ වනවා. නමුත් ඒ සියයට 15ක අවශ්‍යතාවට සරිලන ලෙස සියයට 12කට වැඩි වගා වපසරියක් වගා කරන්න අපි උත්සාහ කළා. නමුත් "දිට්වා" ව්‍යසනයෙන් හෙක්ටෙයාර 108,000ක වගා හානියක් සිදු වුණා. නැවත වගා කිරීමේදී හෙක්ටෙයාර 90,000ක් වගා කළත්, අපට අස්වැන්න ලබා ගන්න පුළුවන් වුණේ සියයට 7ක පමණ ප්‍රමාණයක්. අස්වැන්න හානි වුණා වාගේම අපට ප්‍රමාණවත් අස්වැන්නක් ලැබුණේත් නැහැ. ඒ නිසා රට තුළ කීරි සම්බා සහල් හිඟයක් ඇති වුණා.

නැවත වතාවක් සිද්ධ වුණේ, ප්‍රමාණවත් සහල් වෙළෙඳ පොළ තුළ නොමැති වීම නිසා කීරි සම්බා හිඟයක් ඇතිවීම. ඒ නිසා කීරි සම්බා සඳහා වෙළෙඳ පොළ තුළ වැඩි ඉල්ලුමක් ඇති වුණා. කීරි සම්බා වී කිලෝවක් රුපියල් 140ට මිලදී ගන්න කියලා අපි කිව්වාට, රුපියල් 180ටත් කීරි සම්බා වී මිලදී ගත්තා. ඒකට උත්තරයක් ලෙස රජයක් හැටියට අපට තීරණයක් ගන්න වුණා. ඒ අනුව, කීරි සම්බා ආදේශන ලෙස කීරි පොන්නි කියන සහල් වර්ගය ආනයනය කරන්න අපට සිද්ධ වුණා. අපි කීරි පොන්නි ආනයනය කරන්න තීරණය කළේ ඒ නිසායි, ගරු මන්ත්‍රීතුමනි. අපි මේ ආදේශන ආනයනය කළා වාගේම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් රුපියල් 260ට වඩා වැඩි මිලට කීරි සම්බා සහල් විකුණන වෙළෙඳුන් වැටලීම් කළා. 2026 අවුරුද්දේ මුල් මාස 6ට 2,700කට වැඩි වෙළෙඳ සැල් ප්‍රමාණයක් වැටලීම් කරලා දඩ අය කරන්න කටයුතු කරලා තිබෙනවා. 2,700කට වැඩි වෙළෙඳ සැල් ප්‍රමාණයක් වැටලීම් කරන්න කටයුතු කර තිබෙනවා.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலின சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගත්තොත්, වෙළෙඳ පොළේ සිදුවන සුළු කැළඹීමකදී - උදාහරණයක් වශයෙන්, මැද පෙරදිග යුද වාතාවරණය වාගේ තත්ත්වයකදී - ආර්ථික මධ්‍යස්ථාන තුළ සහ වෙනත් තොග සැපයුම්කරුවන් දැවැන්ත ලෙස මිල ඉහළ දමමින් පාරිභෝගිකයන් දැඩි පීඩාවට පත් කරනවා. එවැනි තත්ත්වයක් වෙනස් කිරීමට අමාත්‍යාංශය මඟින්, විශේෂයෙන්ම සතොස බෙදා හැරීමේ මධ්‍යස්ථාන හරහා කටයුතු කරන බව

පැවසුවා. එවැනි වෙළෙඳ මධ්‍යස්ථාන විවෘත කරනවාද, විවෘත කරනවා නම් ඒ කුමන කාල සීමාවක් තුළ, කුමන ස්ථානවල ද කියලා ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව කියන්නේ, ලංකාවේ පළමු තොග වෙළෙඳ සංස්ථාව වාගේම වෙළෙඳ පොළ මිල පාලනය කිරීම සඳහා තොග වෙළෙඳාමට ප්‍රවිෂ්ට වෙන්න හදපු වෙළෙඳ සංස්ථාව. නමුත්, පසුගිය රජයන් විසින් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව එහෙම පිටින්ම වසා දමලා, ඒ ආයතන කුණු කොල්ලයට විකුණා දමලා, වාහන ටිකත් විකුණලා දාලා තිබුණේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඇවිල්ලා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත ස්ථාපිත කරලා, අපේ රටේ තොග වෙළෙඳාමට ප්‍රවිෂ්ට වෙන්න අවශ්‍ය කටයුතු කරලා, දැන් ඒ සඳහා ප්‍රවේශය අරගෙන තිබෙනවා. එහි ආරම්භක පියවර ලෙස සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ තොග මධ්‍යස්ථාන දිස්ත්‍රික්ක 25ක ආරම්භ කිරීමේ තීරණය ගනිමින්, මේ අවුරුද්දේ මේ වෙනකොට තොග මධ්‍යස්ථාන 3ක් ආරම්භ කරන්න අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා. පළමු මධ්‍යස්ථාන දෙක මාතරත්, කුරුණෑගලත් ලබන මාසයේ අපි ආරම්භ කරනවා. මේ වනකොට ඒවායේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබෙනවා.

ඒ අනුව ලබන මාසයේ කුරුණෑගල සහ මාතර තොග මධ්‍යස්ථාන දෙක පටන්ගන්නවා. මේ අවුරුද්ද අවසන් වනකොට තුන්වන මධ්‍යස්ථානය අපි පෑලියගොඩ ආරම්භ කරනවා. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා සෘජු මිලදී ගැනීම් වාගේම, G2G සම්බන්ධතා හරහා අඛණ්ඩ මිල වෙනස් කිරීමකින් තොරව මිලදී ගැනීම් සහ බෙදාහැරීම් සඳහා කටයුතු කරනවා. විශේෂයෙන් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, සමුපකාර සහ ලංකා සතොස හරහා බෙදා හරිනවා වාගේම, පෞද්ගලික අංශයටත් මිලදී ගැනීමට හැකි වන ලෙස මේ තොග මධ්‍යස්ථාන හරහා භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියට ප්‍රවිෂ්ට වෙනවා. ඒ හරහා වෙළෙඳ පොළ තුළ විශාල මිල විචලනයකින් තොරව භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියට ප්‍රවිෂ්ට වෙන්න අදාළ තීරණ අපි අරගෙන තිබෙනවා. ලබන මාසය තුළ මේ වෙළෙඳ සැල් දෙක ආරම්භ කරන්න කටයුතු කරනවා. මේ අවුරුද්ද අවසන් වෙනකොට තවත් වෙළෙඳ සැල් 3ක් පටන්ගන්නවා. ලබන අවුරුද්දේ තවත් වෙළෙඳ සැල් 4කට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න අවශ්‍ය තීරණ අපි අරගෙන තිබෙනවා. ඒ අනුව ලබන අවුරුද්දේ තවත් වෙළෙඳ සැල් 4ක් ආරම්භ කරන්න කටයුතු කරනවා, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -2092/2026- (1), ගරු සුනිල් රාජපක්ෂ මහතා.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## රත්නපුර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල්: ගුරු පුරප්පාඩු
## இரத்தினபுரி மாவட்ட தமிழ் மொழிமூல பாடசாலைகள்: ஆசிரியர் வெற்றிடங்கள்
## TAMIL-MEDIUM SCHOOLS IN RATNAPURA DISTRICT: TEACHER VACANCIES

1790/2025

**7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බී. ආරියවංශ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு பி. ஆரியவங்ஷ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. B. Ariyawansha)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) එම පාසල්වල නම් කවරේද;
(iii) එම පාසල්වල ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) එම පුරප්පාඩු පිරවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்திலுள்ள தமிழ் மொழிமூல பாடசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) அந்தப் பாடசாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;
(iii) அந்தப் பாடசாலைகளில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு பாடத்துக்கமைய வெவ்வேறாக யாது என்பதையும்;
(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -
(i) the number of Tamil-medium schools located in the Ratnapura District;
(ii) the names of the said schools;
(iii) separately, the number of teacher vacancies existing in the said schools for each subject; and
(iv) the measures that will be taken to fill the said vacancies?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික පාසල් - 04
පළාත් පාසල් - 104

(ii) ජාතික පාසල්

ර/ෆර්ගියුසන් උසස් විද්‍යාලය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය)

ර/ජේසු බිලින්දාගේ කන්‍යාරාමය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය)

ර/බලංගොඩ ජෙයිලනි මුස්ලිම් මහා විද්‍යාලය (දෙමළ/ ඉංග්‍රීසි මාධ්‍ය)

රක්වාන ශාන්ත ජෝන් දෙමළ ජාතික පාසල (දෙමළ මාධ්‍ය පමණි)

පළාත් පාසල්වල නම් **ඇමුණුම 01**** මගින් ඉදිරිපත් කර ඇත.

(iii) ජාතික පාසල්වල ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මගින් ඉදිරිපත් කර ඇත.

**ඇමුණුම 02**

| අනු අංකය | පාසල | විෂය | පුරප්පාඩු ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| | | | (දෙමළ මාධ්‍ය) | (ඉංග්‍රීසි මාධ්‍ය) | (සිංහල මාධ්‍ය) |
| 01 | ර/ෆර්ගියුසන් උසස් විද්‍යාලය | | පුරප්පාඩු නොමැත. | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| 02 | ර/ ජේසු බිලින්දාගේ කන්‍යාරාමය | හින්දු | 1 | | |
| | | භූගෝල විද්‍යාව | 1 | | |
| | | පුරවැසි අධ්‍යයනය | 1 | | |
| | | සාහිත්‍ය හා රසාස්වාදය | 1 | | |
| | | භූගෝල විද්‍යාව | | 1 | |
| 03 | රක්වාන ශාන්ත ජෝන් දෙමළ ජාතික පාසල | ගණිතය | 1 | | |
| | | මව්බස (දෙමළ) | 1 | | |
| | | හින්දු | 1 | | |
| | | භූගෝල විද්‍යාව | 1 | | |
| | | චිත්‍ර | 1 | | |
| | | කෘෂි හා ආහාර තාක්ෂණවේදය | 1 | | |
| | | ගෘහ ආර්ථික විද්‍යාව | 1 | | |
| | | සංනිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | 1 | | |
| | | සංයුක්ත ගණිතය | 1 | | |
| | | ඉංජිනේරු තාක්ෂණවේදය | 1 | | |
| | | ජෛව තාක්ෂණවේදය | 1 | | |
| | | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 1 | | |
| | | උසස් පෙළ භූගෝල විද්‍යාව | 1 | | |
| | | දේශපාලන විද්‍යාව | 1 | | |
| | | ඉතිහාසය | 1 | | |
| | | හින්දු ශිෂ්ටාචාරය | 1 | | |
| | | උසස්පෙළ දෙමළ | 1 | | |
| | | තොරතුරු තාක්ෂණය | 1 | | |
| | | ඉංග්‍රීසි | 1 | | |
| | | උපදේශනය | 1 | | |
| | | විශේෂ අධ්‍යාපනය | 1 | | |
| 04 | ර/ බලංගොඩ ජෙයිලානි මහා විද්‍යාලය | විද්‍යාව | 2 | | |
| | | ගණිතය | 3 | | |
| | | සාහිත්‍ය රසාස්වාදය | 1 | | |
| | | සාහිත්‍ය හා රසාස්වාදය (අරාබි) | 2 | | |
| | | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 1 | | |
| | | මාධ්‍ය අධ්‍යයනය | 1 | | |
| | | සංයුක්ත ගණිතය | 1 | | |
| | | උසස් පෙළ ගණිතය | 1 | | |
| | | ජෛව තාක්ෂණවේදය | 1 | | |
| | | ගිණුම්කරණය | 1 | | |
| | | ආර්ථික විද්‍යාව | 1 | | |
| | | දේශපාලන විද්‍යාව | 1 | | |
| | | උසස්පෙළ ගෘහ ආර්ථික විද්‍යාව | 1 | | |
| | | ඉතිහාසය | 1 | | |
| | | උසස් පෙළ චිත්‍ර | 1 | | |
| | | උසස් පෙළ ඉංග්‍රීසි | 1 | | |
| | | තොරතුරු තාක්ෂණය | 1 | | |
| | | ඉංග්‍රීසි | 1 | | |
| | | පුරවැසි අධ්‍යයනය | 1 | | |

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පළාත් පාසල්වල ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම 03**** මගින් ඉදිරිපත් කර ඇත.

(iv) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 6/2021ට අනුව ඉහත පාසල්හි අනුමත ගුරුවරුන් සංඛ්‍යාව හා ඉහත (අ)(iii)හි දක්වන ලද පුරප්පාඩු ප්‍රමාණය පහත පරිදි වන අතර ඌන අතිරික්ත ලේඛනය **ඇමුණුම 04**** ලෙස ඉදිරිපත් කරමි. ඒ අනුව, දැනට සේවයේ නිරත ගුරුවරුන් අනුව ඇතැම් විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු පවතින බවත් ඇතැම් විෂයයන් සඳහා ගුරු අතිරික්තයක් පවතින බවත් නිරීක්ෂණය වේ.

| අනු අංකය | පාසල | අනුමත සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| 01 | ර/ෆර්ගියුසන් උසස් විද්‍යාලය | | |
| 02 | ර/ජේසු බිලින්දාගේ කන්‍යාරාමය | 94 | 5 |
| 03 | රක්වාන ශාන්ත ජෝන් දෙමළ ජාතික පාසල | 62 | 21 |
| 04 | ර/බලංගොඩ ජෙයිලානි මහා විද්‍යාලය | 70 | 23 |

එනමුත් දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා අනෙකුත් උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලද අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් මේ වන විට අයදුම්පත් කැඳවා විභාගය පවත්වා ඇත. ඒ අනුව, එකී ගැසට් නිවේදනය ප්‍රකාරව ගුරු සේවයේ පුරප්පාඩු සඳහා මෙම වර්ෂය තුළ උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇති අතර සබරගමු පළාතෙහි සියලුම පළාත් පාසල් සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුව විසින් ගුරු පුරප්පාඩු 1,997ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ සමඟ ජාතික පාසල් සඳහා ද එකී කමිටුව මගින් ලබා දී ඇති අනුමැතිය අනුව සබරගමු පළාත තුළ පවතින දෙමළ මාධ්‍ය ජාතික පාසල් සඳහා ද 2025.06.30 දිනට පැවැති පුරප්පාඩු අනුව ඉහත (iii) යටතේ දක්වන ලද පුරප්පාඩු 49 අතුරින් 2025.06.30 දිනට පැවැති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නියමිතය.

එමෙන්ම, 2022-2024 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් එම ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම මත ජාතික හා පළාත් පාසල්හි ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියේ පවතින ගුරු පුරප්පාඩු සඳහා 2027 වර්ෂයේ මුල් කාර්තුව තුළ ගුරු සේවයට බඳවා ගැනීමට නියමිතව ඇත. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයන්හි 2026 වසරේ අවසන් විභාගයට පෙනී සිටීමට නියමිත සමස්ත සිසුන් 6,139 අතුරින් 37දෙනෙකු රත්නපුර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල් සඳහා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වන අවසන් විභාගයට පෙනී සිටීමට නියමිතය. ඔවුන් අතුරින් සාර්ථකව ඩිප්ලෝමාව සම්පූර්ණ කරනු ලබන ඩිප්ලෝමාධාරීන් ඉදිරියේදී බඳවා ගැනීමට නියමිතය.

ඒ අනුව, උක්ත බඳවාගැනීම් මගින් හා ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත ගුරු තුලනය මගින් මෙම පාසලෙහි ගුරු සේවයේ පවතින පුරප්පාඩු 2027 වර්ෂයේ මුල් කාර්තුව වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන බව වාර්තා කරමි.

(ආ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(අ) සහ 91(h)(i) යටතේ ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, මම psycho වෙන්න පුළුවන්, හැබැයි homosexual නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික දෙමළ සරණාගතයින් මුහුණ දෙන ගැටලු
### இந்தியாவிலுள்ள இலங்கைத் தமிழ் அகதிகள் எதிர்கொள்ளும் பிரச்சினைகள்
### ISSUES FACED BY SRI LANKAN TAMIL REFUGEES IN INDIA

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ், இந்தியாவிலுள்ள அகதி முகாம்களிலும் அதற்கு வெளியேயும் பல தசாப்தங்களாகப் பாரிய மனிதாபிமான சவால்களை எதிர்கொண்டுவரும் எமது உறவுகளான இலங்கைத் தமிழ் அகதிகளின் அவலநிலை குறித்து இந்த உயரிய சபையினதும் கௌரவ பிரதமரினதும் அவசர கவனத்தை ஈர்ப்பதற்காக நான் இங்கு எழுந்துள்ளேன்.

தற்போது முகாம்களில் வாழும் எமது மக்கள் எதிர்கொள்ளும் மிக முக்கிய சவால்களை நான் இந்தச் சபையில் சுட்டிக்காட் விரும்புகின்றேன்.

- தற்காலிக கடவுச்சீட்டு மற்றும் 'விசா' முடக்கங்கள்

புதிய கடவுச்சீட்டுகளைப் பெற்றுக்கொள்வதில் கொழும்பில் நிலவும் தாமதங்கள் காரணமாக இந்தியாவில் பிறந்து வளர்ந்த இரண்டாவது, மூன்றாவது தலைமுறையைச் சேர்ந்த எமது இளைஞர், யுவதிகள் தங்களின் வேலை வாய்ப்புகளையும் 'விசா' நீடிப்புகளையும் பெற்றுக்கொள்ள முடியாமல் தவிக்கின்றனர். கொழும்பிலிருந்து புதிய கடவுச்சீட்டுகள் அச்சிடப்பட்டு வரும்வரை, அவர்களின் சட்டபூர்வ தன்மையைப் பாதுகாக்கும் நோக்கில் அவசரகால தற்காலிக கடவுச்சீட்டுகளை தங்குதடையின்றி வழங்குவதற்குச் சென்னை \யிலுள்ள இலங்கை பிரதி உயர்ஸ்தானிக ராலயத்துக்கு அரசாங்கம் முழுமையான வசதிகளையும் அனுமதியையும் வழங்க வேண்டும்.

- பிறப்புச் சான்றிதழ் மற்றும் குடியுரிமைச் சிக்கல்கள்

கடந்த காலங்களில் தூதரக நடமாடும் சேவைகள்மூலம் 35,000க்கும் மேற்பட்ட பிறப்புச் சான்றிதழ்கள் எமது மக்களுக்கு வெற்றிகரமாக வழங்கப்பட்டன. ஆனால், தற்போது அந்தச் செயன்முறை முற்றிலும் மந்த கதியிலே இடம்பெறுகின்றது. இந்தியாவில் பிறக்கும் எமது பிள்ளைகளுக்கு இலங்கைத் தூதரகத்தின் ஊடாகப் பிறப்புச் சான்றிதழும் வம்சாவளிக் குடியுரிமையும் முறையாக வழங்கப்படாவிட்டால், எதிர்காலத்தில் அவர்கள் எந்தவொரு நாட்டினதும் அடையாளமற்ற "நாடற்றவர்களாக" மாறும் அபாயம் உள்ளது.

- தாயகம் திரும்புவோருக்கான வாழ்வாதார உத்தரவாதம்

சொந்த மண்ணுக்குத் திரும்ப விரும்பும் எமது மக்களுக்கு முறையான மீள்குடியேற்றம், காணி உரிமை அல்லது வாழ்வாதார உதவிகள் இங்கு வழங்கப்படுவதில்லை. இதனால் தாயகம் திரும்பும் பல குடும்பங்கள் மீண்டும் இந்தியாவுக்கே அகதிகளாகச் செல்லும் அவலநிலை காணப்படுகின்றது. எனவே, கௌரவ பிரதமரிடமும் சம்பந்தப்பட்ட அமைச்சரிடமும் நான் பின்வரும் கேள்விகளை முன்வைக்கின்றேன்.

1. சென்னையிலுள்ள இலங்கை தூதரகம் ஊடாக அகதி முகாம்களில் வாழும் மக்களுக்கான விசேட நடமாடும் தூதரகச் சேவைகளை உடனடியாக மீண்டும் தொடங்குவதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்குமா?

2. புதிய கடவுச்சீட்டு கிடைக்கும் வரை எமது புலம்பெயர் தொழிலாளர்கள் மற்றும் அகதிகளின் 'விசா', வேலைவாய்ப்புகளைப் பாதுகாக்கும் நோக்கில் தற்காலிக 'விசா' நீடிப்பு முத்திரைகள் மற்றும் தற்காலிக கடவுச்சீட்டுகளை தங்குதடையின்றி வழங்க தூதரகங்களுக்குப் போதிய நிதி ஒதுக்கீடுகளும் அறிவுறுத்தல்களும் வழங்கப்படுமா?

3. இந்தியாவிலிருந்து தங்களின் சொந்த விருப்பத்தின் பேரில் தாயகம் திரும்பும் இலங்கைத் தமிழர்களின் காணி மறுசீரமைப்பு, முறையான வாழ்வாதாரக் கொடுப்பனவு மற்றும் மீள் குடியேற்றப் பணிகளுக்காக 2026ஆம் ஆண்டுக்கான விசேட தேசிய நிதி ஒதுக்கீடு எதுவும் அரசாங்கத்திடம் உள்ளதா?

பாதிக்கப்பட்ட எமது தமிழ் மக்களுக்கு இழைக்கப்படும் இந்த நிருவாகப் பின்னடைவுகளுக்கு அரசாங்கம் உடனடியாக முற்றுப்புள்ளி வைக்க வேண்டுமென வலியுறுத்துகின்றேன். நன்றி!

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)

**(**The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

Hon. Speaker, in response to the Question raised under Standing Order No. 27(2) by the Hon. Amirthanathan Adaikkalanathan, I wish to provide the following Answer on behalf of the Hon. Prime Minister and Minister of Education, Higher Education and Vocational Education.

1. Emergency Travel Documents and visa issues:

1.1 The issuance of passports and Emergency Travel Documents falls within the statutory mandate of the Department of Immigration and Emigration of Sri Lanka.

1.2. A Non-Machine Readable Passport - NMRP - was an Emergency Travel Document previously issued by Sri Lankan Missions and posts abroad to facilitate the return of Sri Lankan nationals who did not possess a valid Sri Lankan passport.

1.3. Unlike an ordinary passport, an NMRP was intended solely to enable the holder to return to Sri Lanka. It was not valid for regular international travel or for purposes such as visa renewal, extension of stay, employment, continued residence abroad or travel to a third country.

1.4. The issuance of NMRPs was discontinued with effect from 01st of May, 2026 following the introduction of the machine-readable Emergency Travel Document - ETD - system by the Department of Immigration and Emigration of Sri Lanka. This transition was implemented in accordance with the international travel document standards recommended by the International Civil Aviation Organization - the ICAO.

1.5. An ETD may be issued to a Sri Lankan national who is lawfully residing abroad and does not possess a valid Sri Lankan passport, but wishes to return voluntarily to Sri Lanka due to an emergency. Such circumstances include the loss, theft, damage or expiry of a passport, the exhaustion of all passport pages or cases involving a new-born child who has not yet been issued a Sri Lankan passport.

1.6. An ETD is valid for a period of six months and may be used exclusively for a single journey to Sri Lanka. Accordingly, it cannot be used for visa renewal, extension of stay, continued residence abroad, travel to a third country or any other purpose associated with international travel.

1.7. With regard to Sri Lankan nationals residing in Chennai and the State of Tamil Nadu, applicants submitting applications for renewal of passports through the Deputy High Commission of Sri Lanka in Chennai may return their existing valid passports until their renewed passports are received from the Department of Immigration and Emigration.

1.8. Applicants are advised to submit their passport renewal applications well in advance of the expiry of their existing passports in order to avoid any inconvenience and where necessary, the Deputy High Commission of Sri Lanka in Chennai, in coordination with the Department of Immigration and Emigration, may take appropriate action to facilitate and expedite the processing of passport renewal applications.

1.9. Where a person does not possess the supporting documents required for the issuance or renewal of a regular passport, he or she may seek guidance and assistance from the Deputy High Commission of Sri Lanka in Chennai. Upon verification of the applicants of Sri Lankan citizenship, a Temporary Travel Document - TTD - may be issued subject to the applicable procedures and the approval of the Department of Immigration and Emigration to facilitate the applicants' return to Sri Lanka. Upon returning to Sri Lanka, the applicant may obtain the required supporting documents and apply for a regular passport in accordance with the prevailing laws, regulations and administrative procedures.

1.10 Further information, clarification and assistance regarding the issuance or renewal of passports and emergency travel documents for the Sri Lankan nationals residing in Chennai and the State of Tamil Nadu may be obtained from the Department of Immigration and Emigration of Sri Lanka, which is the competent authority responsible for those matters.

2. Issues related to birth registration and citizenship.

2.1 Under Section 5(2) of the Citizenship Act, No. 18 of 1948, as amended, a child born outside Sri Lanka to Sri Lankan parents, where, at least, one parent was a Sri Lankan citizen at the time of the child's birth, is eligible to claim Sri Lankan citizenship by descent. Such births are required to be registered in accordance with the prescribed legal procedure for the confirmation of citizenship by descent.

2.2 Applications for the registration of birth occurring outside Sri Lanka and citizenship by descent may be submitted through the Deputy High Commission of Sri Lanka in Chennai. The Deputy High Commission

facilitates the processing of such applications in coordination with the Registrar General's Department and the Department of Immigration and Emigration of Sri Lanka.

2.3 The Registrar General's Department is the competent authority responsible for approving the registration of births that occur outside Sri Lanka and issuing the relevant birth certificates. Upon receipt of such approval, the Deputy High Commission of Sri Lanka in Chennai registers the birth in accordance with the applicable laws, regulations and the administrative procedures.

2.4 The registration of birth and citizenship should, as far as possible, be completed within one year from the date of birth. However, where an application is submitted after the expiry of one year, it may still be processed as a delayed registration subject to the prescribed procedures, payment of the applicable additional fees, submission of the required supporting documents and the completion of the necessary verification process.

2.5 In order to improve access to consular service for Sri Lankan nationals residing in the State of Tamil Nadu,, including those residing in refugee or rehabilitation camps, the Deputy High Commission of Sri Lanka in Chennai may, from time to time, organize consular mobile service programmes in accordance with the consular mobile service guidelines issued by the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism. These mobile services facilitate *inter alia* the registration of births and applications for citizenship by descent. The organization of such programmes is subject to the identification of suitable locations, assessment of public demand, availability of the required logistical arrangements and the prior approval of the Ministry.

3. Voluntary repatriation, livelihood assistance and resettlement.

3.1 The Ministry of Foreign Affairs, Foreign Employment and Tourism does not administer financial allocations or programmes relating to land allocation, housing assistance, livelihood development, land restoration or resettlement of persons who voluntarily return to Sri Lanka whether from Chennai or from any other country.

3.2 Matters related to land allocation, housing, livelihood assistance, rehabilitation and resettlement fall within the mandate of the respective Line Ministries, departments and other competent government institutions. Accordingly, such matters should be referred to the relevant authorities responsible for the formulation, implementation and administration of these programmes, where applicable.

Sir, that concludes the Reply to the Hon. Member's Question.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Amirthanathan Adaikkalanathan, you can now seek a clarification.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! வெளிநாடுகளில் passportஐப் புதுப்பிப்பதற்காக விண்ணப்பித்து, அதற்கான கட்டணத்தைச் செலுத்தி receiptஐயும் பெற்று, அதனை இங்கு அனுப்பிய பிறகும் புதிய passportஐப் பெறுவதற்கு ஒரு வருடத்துக்கும் மேல் செல்கின்றது. குறிப்பாக, லண்டன், துபாய், குவைத் போன்ற இடங்களில் இருக்கின்றவர்கள் காலாவதியான தங்களது passportஐப் புதுப்பிப்பதற்கான விண்ணப்பத்தை அங்குள்ள இலங்கை உயர்ஸ்தானிகராலயத்தில் ஒப்படைத்து, அதற்கான receiptஐயும் பெற்றிருக்கிறார்கள். அதுமாத்திரமல்ல, அந்த receipt இங்கும் வந்திருக்கிறது. எனினும், புதிய passport வழங்குவதற்கு ஒரு வருடத்துக்கும் மேல் செல்கின்றது. எனவே, இது தொடர்பில் உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டுமென ஓர் இலங்கையர் என்ற ரீதியில் கேட்கின்றேன்.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

கௌரவ சபாநாயகர் அவர்களே, நாங்கள் ஆட்சி அதிகாரத்துக்கு வந்த ஆரம்ப காலப்பகுதியில் இந்த விடயம் தொடர்பில் பல்வேறு முறைப்பாடுகள் எங்களுக்குக் கிடைக்கப் பெற்றன. எங்களது தலையீட்டின்மூலம் கிடப்பிலிருந்த பல நூற்றுக்கணக்கான கடவுச்சீட்டுகள் தொடர்பான விடயங்கள் அணுகப்பட்டு, அவை மிக வேகமாக அச்சிடப்பட்டு மக்களுக்கு வழங்கப்பட்டன. இன்றும் சில இடங்களில் இவற்றை மேற்கொள்வதில் தடங்கல்கள் இருப்பதாக நாங்கள் அறிகின்றோம். அதாவது, அந்தக் கடவுச்சீட்டுகளை வழங்குவதற்கு அதிக நாட்கள் எடுப்பதாக நாங்கள் அறிகின்றோம். இந்த விடயம் தொடர்பில் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சுடன் நாங்கள் பேசியிருக்கின்றோம். எது எவ்வாறாயினும், டிஜிட்டல் மயமாக்கல் விடயம் மிக வேகமாக நடைபெறுகின்ற பட்சத்தில், இந்த விடயத்துக்கு மிகக் குறுகிய காலத்தில் தீர்வைப் பெற்றுக்கொடுக்க முடியுமென நம்புகின்றோம். இலங்கை சார்ந்த எமது உயர்ஸ்தானிகர் காரியாலயங்களாக இருக்கலாம், எமது தூதரகக் காரியாலயங்களாக இருக்கலாம், எமது Consulate General காரியாலயங்களாக இருக்கலாம், இந்தக் காரியாலயங்கள் பலவற்றுக்கு இலத்திரனியல் மூலமாக biometric verificationஐப் பெற்றுக்கொள்ளக்கூடிய இயந்திரங்களை வழங்குவதற்கு நாங்கள் எத்தனிக்கின்றோம். தற்பொழுது இந்த விடயம் பேசப்பட்டு, தீர்மானிக்கப்பட்டு,

[ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

அதற்கான திகதிகள்கூட குறிக்கப்பட்டு இருக்கின்றன. இந்த விடயங்கள் சரியாக நடைமுறைப்படுத்தப்படும் பட்சத்தில், ஏற்படுகின்ற கால தாமதத்தைக் குறைத்துக்கொள்ள முடியு மென நாங்கள் நம்புகின்றோம்.

நான் இங்கு இன்னுமொரு விடயத்தை விசேடமாகக் கூற விரும்புகின்றேன். அதாவது, குறித்த நபரினது கடவுச்சீட்டு காலாவதியாகுவதற்கு முன்னரோ அல்லது காலாவதி யாகியதன் பின்னர் சில நாட்களுக்குள்ளேயோ அல்லது சில மாதங்களுக்குள்ளேயோ அவர் அதனைப் புதுப்பிப்பதற்கு விண்ணப்பிக்கும் பட்சத்தில், அதனை மிகவும் இலகுவாக மேற்கொள்ளக்கூடியதாக இருக்கும். எனினும், சிலர் காலாவதியாகி பல வருடங்களுக்குப் பின்னர், அதாவது 10 வருடங்களுக்குப் பின்னர், 15 வருடங்களுக்குப் பின்னர், 20 வருடங்களுக்குப் பின்னர் என்று நீண்ட காலத்துக்குப் பிறகு தமது கடவுச்சீட்டுகளைப் புதுப்பிப்பதற்கு விண்ணப் பிக்கிறார்கள். சிலவேளை, இந்த அரசாங்கம் மீதான நம்பிக்கை மக்கள் மத்தியில் ஏற்பட்டதன் பிரகாரம், அவர்கள் தமது நாட்டுக்கு மீண்டும் வரவேண்டுமென்ற அடிப்படையில்கூட அது இருக்கலாம். இன்றும் சில இடங்களில் தொழில்நுட்ப ரீதியான பிரச்சினைகள் இருப்பதாக நாங்கள் அறிகின்றோம். அதேபோல், பாதுகாப்பு சம்பந்தமான பிரச்சினைகளும் இருக்கின்றன. அதற்காக பாதுகாப்பு அமைச்சை அணுகி, அது தொடர்பான அறிக்கைகளைப் பெறவேண்டி இருக்கின்றது. தற்பொழுது, இந்த கடவுச்சீட்டுகளை வழங்கும் செயற் பாட்டைத் துரிதப்படுத்துவதற்காக எமது அமைச்சும் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சும் ஒன்றாகச் சேர்ந்து நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றன. கடந்த காலங்களில் கடவுச்சீட்டுகளை வழங்கியதைவிட வேகமாக எதிர்வரும் காலத்தில் வழங்குவதற்கான சந்தர்ப்பத்தை நாங்கள் ஏற்படுத்துவோம். நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

## II

## රැකියා වීසා හා විදේශ රැකියා ලබා දීමේදී සිදුවන වංචා
## வேலை விசா மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புகள் வழங்கலில் இடம்பெறும் மோசடிகள்
## FRAUDS INVOLVING ISSUANCE OF JOB VISA AND FOREIGN EMPLOYMENT OPPORTUNITIES

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Speaker, இன்று யூலை மாதம் 23ஆம் திகதியாகும். இது 'கறுப்பு யூலை' நினைவு தினமாகும். 43 ஆண்டுகளுக்கு முன்பு, இது போன்றதொரு நாளில் இந்த நாட்டில் அரச பயங்கரவாதத்தால் நடந்த இனவழிப்புக்கு இன்றுவரை நீதி மறுக்கப்பட்டு இருக்கின்றது. அதில் கொல்லப்பட்ட மக்களை நினைவுகூர்ந்தவனாக, நிலையியற் கட்டளை 27(2)இன்கீழான எனது கேள்வியை முன்வைக்கின்றேன்.

ගරු කථානායකතුමනි, විදේශ රටවල, විශේෂයෙන්ම යුරෝපීය රටවල රැකියා අවස්ථා, රැකියා වීසා හෝ විදේශගත වීමේ අවස්ථා ලබා දෙන බවට පොරොන්දු වී පුද්ගලයන්ගෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලබා ගනිමින් සිදු කරනු ලබන සංවිධානාත්මක වංචා පිළිබඳව පැමිණිලි රාශියක් ලැබී ඇත.

ගරු අමාත්‍යතුමා පහත සඳහන් කරුණු මෙම සභාවට දැනුම් දෙන්නේද?

(අ) විදේශ රැකියා වංචා, වීසා වංචා, පුද්ගලයන් විදේශගත කිරීමේ ජාවාරම් සහ මිනිස් ජාවාරම් සම්බන්ධයෙන් පසුගිය වසර පහ තුළ ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව, ඒ ඇසුරින් ආරම්භ කරන ලද පරීක්ෂණ, සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම්, පවරන ලද නඩු, වරදකරුවන් බවට තීන්දු කිරීම් සහ දැනට විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව කොපමණද?

(ආ) මෙම වැරදි සම්බන්ධයෙන් පසුගිය වසර පහ තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී ඇති පැමිණිලි හෝ යොමු කිරීම් සංඛ්‍යාව කොපමණද සහ ආරම්භ කරන ලද පරීක්ෂණ, සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම්, පවරන ලද නඩු, වරදකරුවන් බවට තීන්දු කිරීම් සහ දැනට විභාග වෙමින් පවතින නඩු ඇතුළුව එකී පැමිණිලි සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග මොනවාද?

ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එම වීසා වංචා දෙවිධියකට සිදු වනවා. එකක් තමයි, Europe, Canada, Australia, America වාගේ බටහිර රටවලට work visa ලබා දෙනවා කියලා එක්කරගෙන ගිහිල්ලා ඒ රටවල පදිංචි කරවන්න පොරොන්දු වෙලා මුදල් ගැනීම. දෙවැනි එක තමයි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ - Sri Lanka Bureau of Foreign Employmentහි - register වෙලා පිට රටවලට එක්කරගෙන ගිහිල්ලා, දෙනවා කියන රැකියාව නැතුව වෙන රැකියාවක් දීම. එම වංචනික ක්‍රියා ව දෙවිධියකට සිදු වනවා. එයට මේ මෑතක වුණු උදාහරණයක් මම කියන්නම්.

Ashif என்ற பெயரிலுள்ள agencyஆனது, 1,500 சவூதி ரியால் சம்பளம் என்று சொல்லி 100 பேரை அழைத்துச் சென்று, அவர்களுக்கு 400 சவூதி ரியால் சம்பளத்துக்கு வேலைகொடுத்து இருக்கிறார்கள். அவர்கள் மீண்டும் நாட்டுக்கு வருவதற்கு முயற்சி செய்துகொண்டு இருக்கின்றார்கள். இது Sri Lanka Bureau of Foreign Employmentஇல் பதிவாகிய முறைப்பாடாகும்.

(ඇ) අවශ්‍ය සියලු ගමන් බලපත්‍ර සහ ලියකියවිලි තිබියදීත්, ගුවන් තොටුපොළේදී පුද්ගලයන්ගෙන් අමතර මුදල් ඉල්ලා සිටි බවට වන චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය පරීක්ෂණ පවත්වා තිබේද, එසේ නම් ගන්නා ලද ක්‍රියාමාර්ග සහ එම පරීක්ෂණවල ප්‍රතිඵල මොනවාද?

ගරු කථානායකතුමනි, එය මහා පරිමාණයේ network එකක්. එහිදී වංචනික වැඩක් Airport එකේදි සිදු වනවා. සාමාන්‍යයෙන් යුරෝපයේ කැනඩාව වාගේ රටකට යනකොට Airport එකේදි වීසා ඔක්කෝම තිබියදීත් check -in-counter එකේදි වෙන්න පුළුවන් - මට ස්ථානය හරියටම කියන්න බැහැ - යම් මුදල් ප්‍රමාණයක් ඉල්ලනවා. එතැනදි ඒ මුදල් ප්‍රමාණය දුන්නේ නැත්නම්, මෙම වීසා එක ගැන අපට සැකයි කියලා ඒගොල්ලන්ව නැවත ගෙදර හරවා යවනවා, embassy එකට ගිහින් check කරගෙන එන්න කියලා. එතකොට embassy එකට ගිහිල්ලා check කරගෙන එනවාට වඩා කීයක් හරි දීලා යන්න තමයි ඒ අය බලන්නේ. දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය වන්නේ කවුරුවත් කැමැති නැහැ, directly ඇවිල්ලා පොලීසියට පැමිණිල්ලක් දමන්න. මොකද, ඒගොල්ලන් බලන්නේ ඩොලර් 200ක්, 300ක්, 500ක් කොහොම හරි දීලා ඒ වීසා එකෙන් එදාට රටෙන් යන්න. නිවැරදි වීසා එක තිබෙන මනුස්සයාටත් මේ නිසා යම් අපහසුතාවක් මතුව තිබෙනවා. මේ පිළිබඳව මට සෘජුව පැමිණිලි කරපු අය ඉන්නවා. එම නිසා ඒ පිළිබඳව මම විමසා සිටිනවා.

(ඈ) මෙවැනි වැරදි සඳහා අනුබල දීම, පහසුකම් සැලසීම, එකඟතාව පළ කිරීම හෝ වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් යම් රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා හෝ නඩු පවරා තිබේද?

(ඉ) විදේශ රැකියා වංචා, වීසා වංචා, පුද්ගලයන් විදේශගත කිරීමේ ජාවාරම් සහ මිනිස් ජාවාරම් පිළිබඳ පැමිණිලි ලබා ගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් වග කිව යුතු, ශ්‍රී ලංකා පොලීසියේ අදාළ අංශය කුමක්ද සහ වින්දිතයන් නිසි පරීක්ෂණයකින් තොරව එක් ආයතනයකින් හෝ පොලිස් අංශයකින් තවත් අංශයකට යොමු නොකිරීම තහවුරු කිරීමට ගෙන ඇති පියවර මොනවාද?

ගරු කථානායකතුමනි, සමහර වෙලාවට මඩකලපුවේ ඉන්න මනුස්සයෙකුට සල්ලි දෙනවා. එතකොට ඒ බැංකුව කොළඹ තිබුණොත් මඩකලපුව පොලීසියෙන් කියනවා, කොළඹ බැංකුවේ සල්ලි දාලා තිබෙන්නේ, කොළඹට ගිහිල්ලා පැමිණිල්ල දමන්න කියලා. පැමිණිල්ල දමන්න කොළඹට ආවාම, කොටුවට යන්න කියනවා, නැත්නම් නාරාහේන්පිටට යන්න කියනවා, නැත්නම් ආපහු local පොලීසියට යන්න කියනවා. මම පොලීසියට වැරැද්දක් කියන්නේ නැහැ. මේගොල්ලන් ඒ මුදල් වංචනික ලෙස, නීති විරෝධී ලෙස දෙනකොට agreements ගහලා නොවෙයි දෙන්නේ. රුපියල් කෝටි 2, 3, 4, 5 මෙහෙම දීලා අසරණ වෙච්ච විශාල පිරිසක් ඉන්නවා. ඒකත් මම මේ ප්‍රශ්නයට පැහැදිලි කිරීමක් ලෙස කරනවා. පොලීසියේ යම් department එකක් තිබෙන්න ඕනෑ මේවා පිළිබඳව බලන්න.

(ඊ) මෙම වංචාවල වින්දිතයන් සියදිවි නසා ගැනීමට තැත් කිරීම් හෝ සියදිවි නසා ගැනීම් මඟින් මිය යාම් පිළිබඳ වාර්තා රජය මඟින් සටහන් කරගෙන හෝ පරීක්ෂණ පවත්වා තිබේද, එසේ නම් ඊට ප්‍රතිචාර වශයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද?

පසුගිය අවුරුදු 5 ඇතුළත මම දැනුවත්ව කිහිපදෙනෙකු පොලියට අරගෙන වංචනිකයන්ට මුදල් දීලා, ඒ මුදල් නොලැබීම නිසා පොලීසියේ පැමිණිලි කරලා පොලීසිය හරහා මේකට සාධාරණයක් නොවීම නිසා දිවි නසාගෙන තිබෙනවා. පොලීසියෙන් මේ පරීක්ෂණය සෑහීමකට පත් වන විධියට එතෙක් කරලා නැහැ කියන එක තමයි කියන්නේ. ඒ නිසා තමයි ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ.

(උ) මෙම සංවිධානාත්මක අපරාධ ජාල මර්දනය කිරීමට, විපතට පත්වූවන්ගෙන් වංචනික ලෙස ලබා ගත් මුදල් නැවත අයකර ගැනීමට සහ මින් ඉදිරියට මෙවැනි වැරදි සිදුවීම වැළැක්වීමට ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙන ඇති වැඩිදුර පියවර කවරේද?

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கேள்வி மிக முக்கியமானதொரு கேள்வி! ஏனெனில், இன்று எங்களுடைய பிரதேசங்களில் பல இளைஞர்கள் கனடா, அமெரிக்கா, ஐரோப்பிய நாடுகளுக்குச் செல்வதற்காகப் பலரிடம் நிதியைக் கொடுத்து, மோசடிக்கு உள்ளாக்கப்பட்டு இருக்கிறார்கள். இதனால் அவர்கள் கடனாளிகளாக மாறியிருக்கி றார்கள். அவர்கள் அது தொடர்பில் முறைப்பாடு செய்யப்போனால் பல சிரமங்களை எதிர்நோக்கு கின்றார்கள். உதாரணத்துக்கு, மட்டக்களப்பில் இருக் கின்ற ஒருவர் கொழும்பில் இருக்கின்ற agencyக்கு நிதியை வழங்கியிருந்தால், மட்டக்களப்பு பொலிஸார் சொல்கின்றார்கள், கொழும்பில் நிதியை வழங்கி யிருப்பதால் கொழும்புக்குச் சென்று முறைப்பாடு செய்யுமாறு. கொழும்புக்கு முறைப்பாடு செய்யச் சென்றால், "4ஆம் மாடிக்குப் போங்கள்! CIDக்குப் போங்கள்! FCIDக்குப் போங்கள்" என்று அவர்களைக் கஷ்டப்படுத்துகின்றார்கள். சில நேரங்களில் முறைப் பாடு எடுக்கப்படுவதும் இல்லை. இதனால் எத்தனையோ குடும்பங்கள் சீரழிந்திருக்கின்றன.

மேலும், 'விசா' உட்பட எல்லா ஆவணங்களும் ஒருவரிடம் இருந்தும், airportஇல் வைத்து ஒருசிலர் நிதியைக் கேட்டு வழங்காவிட்டால், embassyக்குப் போய் உறுதிப்படுத்திவிட்டு வருமாறு அவரை மீண்டும் திருப்பி அனுப்புகிறார்கள். எனவே, இது சம்பந்தமாக நடவடிக்கை எடுப்பதற்கு பொலிஸில் விசேட பிரிவொன்றை உருவாக்க வேண்டும் என்பது தான் என்னுடைய முக்கியமான கோரிக்கை. இதனை நான் கௌரவ அமைச்சரிடம் முன்வைக் கின்றேன். நன்றி!

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඇමතිතුමා දැනුම් දීලා තිබෙනවා, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට යම් කාලයක් අවශ්‍ය බව. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය වැදගත්. මම දැන් නිකම් බැලුවාම පෙනුණා, අතුරු ප්‍රශ්න 50කට වැඩි ප්‍රමාණයක තොරතුරු සොයන්න වෙනවා, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න. ඒ නිසා මේ සඳහා එතුමා සාධාරණ කාලයක් ඉල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා, 2026.07.07 දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## කොළඹ වරාය නගරයේ ගොඩ කරන ලද ඉඩම් සහ දේපළ බදු දීම සම්බන්ධව නීතිමය විධිවිධාන: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## கொழும்புத் துறைமுக நகர மீட்கப்பட்ட நிலம் மற்றும் சொத்துக்களைக் குத்தகைக்குவிடுதல் தொடர்பான சட்ட ஏற்பாடுகள்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## LEGAL PROVISIONS APPLICABLE TO LEASING OUT RECLAIMED LAND AND PROPERTIES WITHIN COLOMBO PORT CITY: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

Sir, the Answer to the question raised by the Hon. Ravi Karunanayake on 07.07.26 is as follows:

(a) The status of the Colombo Port City as part of the territory of Sri Lanka was affirmed by the Supreme Court in its Determination in S.C. (S.D.) Nos. 04/2021, 05/2021 and 07/2021 to 23/2021. The Court holds that the Colombo Port City is part of the territory of Sri Lanka in terms of the law and that Parliament has legislative power over the reclaimed area.

Further, by Gazette Extraordinary No. 2135/13 dated 05$^{th}$ August, 2019, the reclaimed land comprising the Colombo Port City was declared, under Section 3 of the Administrative Districts Act, No. 22 of 1955, to form part of the Colombo Administrative District.

Accordingly, the Colombo Port City forms part of the territory of Sri Lanka.

(b) Under the Tripartite Agreement dated 12$^{th}$ August, 2016 and entered into between the China Harbour Engineering Company - CHEC - Port City Colombo (Private) Limited, the Project Company, the Government of Sri Lanka and the Urban Development Authority - the UDA, the Project Company became entitled to 116.1 hectares of reclaimed land on a leasehold basis, as consideration for undertaking and financing the reclamation project. That land area consisted of 46 individual land parcels.

The leasehold interests in those land parcels were granted by the UDA through Master Leases for a period of 99 years, and have been duly registered in the Land Registry. The statutory authority for those lease arrangements is further recognized under the Colombo Port City Economic Commission Act, No. 11 of 2021, which defines "Project Company Marketable Land" in Section 75 as the proportion of the reclaimed land situated within the Area of Authority of the Colombo Port City made available to the Project Company by way of Master Leases issued by the UDA.

Since the execution of the said Master Leases, CHEC Port City Colombo (Private) Limited has surrendered leases over 10 land parcels comprising a total extent of 12.99 hectares. Thereafter, the Colombo Port City Economic Commission executed leases in respect of the same land parcels with investors for the purpose of carrying out the approved developments on those plots.

Accordingly, the balance land presently held under Master Leases by the Project Company continues to constitute "Project Company Marketable Land", as defined in Section 75 of the Colombo Port City Economic Commission Act and remain subject to the leasehold framework established under the Tripartite Agreement, the relevant Master Leases and the Colombo Port City Economic Commission Act.

(c) Persons or entities who obtain land within the Colombo Port City do not acquire freehold ownership of land.

Under Sections 6(1)(c) and (d) and Sections 38(a) and (b) of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021, the Commission is empowered to lease Government Marketable Land and Project Company Marketable Land situated within the Area of Authority of the Colombo Port City.

The leases granted thereunder are for a period of up to 99 years.

(d) The lessee holds the land on a leasehold basis for a term of up to 99 years. Upon the expiry of the lease term, the lessee is required to yield vacant and peaceful possession of the Development Site together with any buildings, fixtures and fittings remaining thereon to the lessor.

Further, any portion of the Development Site and any associated leasehold rights that remain vested in the lessee and have not been lawfully transferred in accordance with the Colombo Port City Economic Commission Act and the relevant transaction documents shall be surrendered to and vest in the Colombo Port City Economic Commission in accordance with the terms of the applicable Indenture of Lease.

It is important to note, however, that while the underlying land within the Area of Authority of the Colombo Port City is made available exclusively on a leasehold basis, the Colombo Port City Economic Commission Act expressly contemplates the creation and disposition of condominium parcels. In terms of Sections 38(c) and 38(d) of the Colombo Port City Economic Commission Act, No. 11 of 2021, the Commission may, jointly with the relevant investor, developer or Project Company, lease or

transfer condominium parcels on a freehold basis. Accordingly, apartment units and other condominium parcels developed on leased land may be transferred to third parties either on a leasehold or freehold basis, notwithstanding that the underlying land itself remains leased and not owned outright.

Further, Sections 6(1)(e) and 6(1)(f) of the Colombo Port City Economic Commission Act empower the Commission to lease or transfer on a freehold basis condominium parcels on Government and Project Company Marketable Land. These provisions, read together with Sections 38(c) and 38(d), demonstrate that the Act distinguishes between ownership of the underlying land and the ownership or transfer of condominium parcels constructed thereon.

Accordingly, where condominium parcels have been lawfully transferred to third parties in accordance with the Colombo Port City Economic Commission Act and the applicable transaction documents, such interests would be governed by the terms of the relevant transfer instruments and applicable law.

(e) The answer is provided for in the Indenture of Lease entered between the Colombo Port City Economic Commission and the lessee under lessee's obligations.

(f) There are no legal provisions for automatic renewal or preferential automatic renewal. The lease shall be valid only for a period of 99 years.

Upon the natural expiry of the lease, as provided for in the Indenture of Lease, the Development Site is to be handed back to the Colombo Port City Economic Commission and the Commission is not obliged to compensate the lessee for any improvements or developments remaining on the site, and the lessee does not require the removal of buildings upon expiry.

Provision 2.6 (d) of the Indenture of Lease provides as follows:

> "The Lessee shall yield unto the Lessor vacant and peaceful possession of the Development Site (or any remaining part thereof) together with all buildings, fixtures, fittings thereon upon the expiry of this Indenture of Lease."

(g) The Colombo Port City Economic Commission Act already provides mechanisms through which Parliament may be informed of matters relating to the administration of assets within the Port City. In particular, Section 6(1)(aa) requires the Commission to submit an Annual Report on its operations, income and expenditure to be placed before Parliament, while Section 15(2) requires audited financial reports to be tabled in Parliament.

In addition, Section 6(1)(z) empowers the President or the relevant Minister to require the Commission to submit reports on any specific matter relating to the Colombo Port City. While the Act does not expressly require periodic reporting to Parliament on the legal status, ownership structure and future disposition of every State land parcel and asset within the Port City, it establishes statutory reporting mechanisms and a transparent legal framework governing the leasing and transfer of land and condominium parcels within the area of Authority.

(h) The detailed information is given in Annex 01. In summary, the proposed investment committed for five years is US Dollars 2.1 billion. With regard to employment generation, the proposed manpower requirement for Year One is 14,335 and the number of employment opportunities created as of December, 2025 is, 9,871. There are 176 companies under four categories: 03 duty-free shops, 09 primary BSIs, 101 secondary BSIs and 63 Aps under those categories. I **table*** this particular list as the Annex.

(i) The Colombo Port City presents a unique opportunity for Sri Lanka to position itself as a globally competitive investment destination by offering what investors value most: stability, efficiency, transparency and predictability. The Government's ongoing economic reforms and efforts to restore macroeconomic stability have strengthened investor confidence and laid the foundation for sustainable economic growth.

To realize this vision, the Colombo Port City Economic Commission is developing the Colombo Port City as a world-class special economic zone and a regional hub, connecting the South Asia, the East Asia, the Middle East, Africa and Europe. Through a transparent and efficient Single-window framework, investors are able to establish and operate businesses with reduced bureaucratic obstacles and greater regulatory certainty.

The Commission, together with the Government, has undertaken several key initiatives, including,

- establishing a clearer licensing and inventive framework;
- enhancing transparency, efficiency and regulatory certainty;
- strengthening investor facilitation through a true Single-window approach; and
- promoting the Colombo Port City as a competitive platform for international investment and regional operations.

The Colombo Port City is being actively promoted to investors from China, India, Japan, Korea, the Middle East, Australia, the

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

United Kingdom, Europe, the United States and other global markets, leveraging Sri Lanka's strategic location at the centre of the Indian Ocean and along one of the world's busiest maritime trade routes. This location provides access to a market of over two billion people within relatively a short flying distance.

The progress achieved thus far demonstrates growing investor confidence. The Colombo Port City, having attracted approximately US Dollars 1.4 billion for construction purposes in foreign development and nearing the completion of the horizontal infrastructure, has potential to attracting a further US Dollars 12 billion and creating over 173,000 high-value jobs. Ten land parcels totaling approximately 12.99 hectares have already been leased to developers and construction has commenced on approximately six of the said land parcels with construction expected to commence on the remaining leased land parcels in the not too distant future.

Accordingly, the Commission continues to work with the Government to continue strengthening the regulatory framework, enhancing the ease of doing business and positioning the Colombo Port City as a credible, secure and predictable investment destination where investors could establish long-term operations with confidence.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can seek for a short clarification.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I am overjoyed that the Government has accepted a business proposition which was rejected earlier *in toto;* they seem to be accepting it in real business terms, which I appreciate again.

Hon. Minister, my concern is whether the interpretation is from the Attorney-General's Department, the Supreme Court or from the Colombo Port City Economic Commission. The information you gave justifies that it was given by the Supreme Court through a judgment. They say that it is a 99-year lease and can no way be changed. And, how could that be subsequently changed through the Colombo Port City Economic Commission is the question I asked. I am a pro-business person; I would love to see anybody doing any business anywhere even to earn a dollar, which is better than earning nothing.

When you have investments coming in from Sri Lankans or whoever it is and when they are ready to invest, if a doubt exists in their minds about the lease, which would be restricted only for 99 years, then the salability of these land plots would be in question. That had been repeatedly asked at three different stages and the Colombo Port City Economic Commission, which is the supreme body, gave three different answers and I would like to see this as the final answer. Then, when it comes to its legality, the Supreme Court's interpretation certainly seems to override the response of the Colombo Port City Economic Commission.

So, Hon. Minister, I am flagging this particular question entirely from an investor's perspective because I would like to see investments growing. But, my concern is, there seems to be a contradictory statement in your Answer given to Parliament. So, I would greatly appreciate it if you would kindly have this rechecked because with what is going on now, you could subsequently, in two, three years, have the investment approach completely changed, saying this was not the interpretation of the Supreme Court.

So, Hon. Minister, I would like it looked at from two different ends. China has invested over US Dollars 1.8 billion into this particular project. At this particular moment, Sri Lankan companies have also invested in your US Dollars 2.1 billion investment portfolio. Why has the Chinese company, which had invested so much in Sri Lanka, not been able to bring investments into the country? They want to put in investments and have dollars coming in from other areas; they get their dividends coming in from monies not brought from their country. Hon. Minister, I think it is a necessity.

That is why I asked question (i), in order to get information on investments coming in from the USA, India, being the closest to us, the European Union, Japan and all of them. Investments coming in from them would be what is expected by the Sri Lankans as a pro-growth approach to develop Sri Lanka. So, Hon. Minister, please do not give me an answer just to satisfy the Question I asked under Standing Order No. 27(2). Look at the legality of this because it would certainly be questionable, if it is not properly looked into.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Member, as of now, the objective of the Colombo Port City, of course, is to create it as an investment hub. It is mainly governed by the rules-based decisions and the entire purpose is to create a conducive environment for investments with ease of doing business.

Then, coming on to the matter of its legality, interpretations were made on the court judgment and under the Colombo Port City Economic Commission Act. - *[Interruption.]* I am going to clarify it. When it comes to the leasehold property, the land, according to the explanation, it is very clear that the lease is for 99 years. - *[Interruption.]* Hon. Member, give me a minute to finish explaining. Then, you can add your ideas. And, when it comes to condominium parcels, there is a possibility that the Commission may go either for leasehold or freehold. That is what is stated.

Then, as to why the Port City has not attracted investments so far, I would like to say that some things are gradually being amended and facilitations would be made in due course. There is a slow growth, as of now. But, I am happy to announce that already 176 companies have either commenced businesses or have agreed to invest and we need to follow them up. That is how there have been investments in addition to the initial investment of US Dollars 2.1 billion. Among them, there are primary strategic business investments and secondary strategic business investments, within which other authorized persons would carry out businesses. However, we will look into other areas for promoting investment opportunities. - *[Interruption]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, you can have a very short verification.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, the problem that exists is this. Assuming that the entire land area of 269 hectares is sold for condominium projects, are you telling me that this country, which has now given it on lease for 99 years, would give it permanently on freehold? So, there is something radically wrong. I am saying this because I would like to see the Prime Lands, the Home Lands, the ICC and others succeed. But, I do not want someone, in order to not to make it futuristic, saying that this is a questionable one. Therefore, as the Deputy Minister concerned, please get it clarified from the relevant authorities and make it legal. Otherwise, people would not come and invest in this country.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, do not go for a debate.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

If there are any other avenues for improvement, we would look into them.

As of now, the separation between land and condominium parcels is very clear. For condominium parcels, there is no restriction - *[Interruption.]* Yes, that is the land, to which this Section refers. Please look into that. - *[Interruption.]* That is true, but when it comes to a property leased out for a period of 99 years, we suppose that it is an adequate time period for any investor to get a return on his investment. And, we will see whether there are any other concerns. Other ease of doing business facilities would be provided.

Thank you. *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, we are not going for a debate on that across the Floor.

Next, the second Ministerial Statement of the day, the Hon. (Mrs.) Saroja Savithri Paulraj, Minister of Women and Child Affairs, in reply to the Question raised by the Hon. Sajith Premadasa under Standing Order No. 27(2) on 09.07.2026.

## ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ළමා අපයෝජන නඩු කඩිනම් කිරීම: කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## சிறுவர் உரிமைகளைப் பாதுகாத்தலும் சிறுவர் துஷ்பிரயோக வழக்குகளை விரைவுபடுத்தலும்: மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரினது கூற்று
## SAFEGUARDING CHILDREN'S RIGHTS AND EXPEDITION OF CHILD ABUSE CASES: STATEMENT BY MINISTER OF WOMEN AND CHILD AFFAIRS

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2026.07.09වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. මෙම පිළිතුරට අදාළව විශාල සංඛ්‍යා දත්ත ප්‍රමාණයක් තිබෙනවා. 2015 සිට 2025 දක්වා වසර 10ක කාලය තුළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබිලා තිබෙන මුළු පැමිණිලි සංඛ්‍යාව 108,581ක් වනවා. එම විස්තර ඇතුළත් වගුව පහත දැක්වෙනවා.

[ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය]

**2015-2025 දක්වා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි සහ අවසන් තීරණ ගැනීමට පවතින පැමිණිලි සංඛ්‍යාව**

| වර්ෂය | යොමු කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | පොලිස් ස්ථානවලට යොමුකර විමර්ශණ සිදුකර ඇති දණ්ඩනීති සංග්‍රහයේ සඳහන් අපරාධමය වැරදි | කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර විමර්ෂණ සිදුකර ඇති ළමුන් සේවයේ නියුක්ත කිරීමේ පනත යටතේ ඇති වැරදි | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන්, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් වෙත යොමුකර විමර්ෂණ සිදුකර ඇති ළමුන්ගේ භාරය සහ ආරක්ෂාවට අදාළ පැමිණිලි | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන්, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් වෙත යොමුකර විමර්ෂණ සිදුකර ඇති අනිවාර්ය අධ්‍යාපනයට අදාළ පැමිණිලි | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන්, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්, මානව හිමිකම් කොමිසම සහ අනෙකුත් අදාළ ආයතන වෙත යොමුකර විමර්ෂණ සිදුකර ඇති1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතට අදාළ නොවන පැමිණිලි | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 2015 | 10733 | 4648 | 312 | 1164 | 1464 | 3139 | 6 |
| 2016 | 9369 | 4181 | 285 | 891 | 1453 | 2552 | 6 |
| 2017 | 9018 | 3966 | 270 | 884 | 1323 | 2575 | - |
| 2018 | 9516 | 4344 | 262 | 908 | 1268 | 2726 | - |
| 2019 | 8558 | 4159 | 265 | 1250 | 1290 | 1592 | - |
| 2020 | 8278 | 3983 | 231 | 741 | 640 | 2677 | 6 |
| 2021 | 11187 | 5327 | 383 | 1527 | 546 | 2854 | 550 |
| 2022 | 10497 | 4329 | 181 | 2996 | 1921 | 1961 | 15 |
| 2023 | 9436 | 4329 | 181 | 2996 | 1921 | 1961 | - |
| 2024 | 8192 | 3935 | 165 | 2919 | 1628 | 2027 | - |
| 2025 | 9212 | 4195 | 173 | 2427 | 1696 | 1968 | - |
| 2026.06.30 දක්වා | 4585 | 2029 | 82 | 1383 | 890 | 1139 | - |
| එකතුව | 108,581 | | | | | | |

2. මේ වර්ෂයේ, එනම් 2026 වර්ෂයේ අප්‍රේල් 30වන විට මහාධිකරණවල විභාග වෙමින් පවතින අපයෝජන නඩු සංඛ්‍යාව 4,421යි. මහාධිකරණවල විභාග වෙමින් පවතින ළමා අපයෝජන මුළු නඩු 4,421ම අධිචෝදනා ගොනු කර ඇති නඩු වන අතර, එම නඩුවල අධිචෝදනා ගොනු කරන ලද දිනයන් සම්බන්ධ - කාල වකවානුව සම්බන්ධ - තොරතුරු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සතුව නැහැ. ඒ වාගේම එම නඩු කඩිනමින් අවසන් කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පොලිස් ළමා හා කාන්තා අපයෝජන දිසාව හරහා පොලිස් කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශ 47ක් සම්බන්ධීකරණය කර ගනිමින් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යමින් නඩු නියාමන කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරනු ලබනවා. නඩු නියාමනයේදී සෑම නඩුවකම අධිචෝදනා ගොනු කරන ලද දිනය පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු ලේඛනයක් මේ වෙලාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සතුව නැහැ.

3. එම නඩු කඩිනමින් අවසන් කිරීම සඳහා අමාත්‍යාංශය අදාළ ආයතන සමඟ ක්‍රියාත්මක කරන විශේෂ වැඩ පිළිවෙළ මෙසේයි. එම ළමා අපයෝජන මුළු නඩු සංඛ්‍යාව ලෙස 4,421ක් මේ වනකොට මහාධිකරණවල විභාග වෙමින් පවතිනවා. තවද, වින්දිත දරුවන්ගේ රැකවරණය තහවුරු කිරීමේ ඉදිරි පියවරක් ලෙස ළමයා අධිකරණය වෙත ඉදිරිපත් නොකොට, කිසිදු බලපෑමකින් තොර පරිසරයක් තුළ ළමයාගේ සාක්ෂිය වීඩියෝ සාක්ෂියක් ලෙස පටිගත කරමින් අධිකරණයට යොමු කිරීමට කටයුතු කරනු ලබනවා. ඒ යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන මූලස්ථානයේ සහ රාගම ළමා පියස ආශ්‍රිතව දැනට ළමුන්ගේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක 2ක් පවත්වාගෙන යනවා.

ගාල්ල කරාපිටිය රෝහල් පරිශ්‍රයේ ද මේ වන විට වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය ස්ථාපිත කර ඇති අතර, පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසු වැඩ කටයුතු ආරම්භ කිරීමට නියමිතයි. අනුරාධපුර වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මේ වන විට ස්ථාපනය කිරීමේ අවසන් අදියරේයි තිබෙන්නේ.

පළාත් මට්ටමින් දිවයින පුරා වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ඒකක 9ක් රෝහල් ආශ්‍රිතව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සුදුසු ස්ථාන හා පරිශ්‍රයන් හඳුනා ගැනීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ප්‍රමුඛ අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කරමින් තිබෙනවා.

4. අංක: අමප/25/1284/819/014 හා 2025.08.04 දිනැතිව ලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව සංශෝධනය කෙරෙන 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත තුළ එම අධිකාරියේ සභාපතිගේ නියෝග මත කටයුතු කරන ස්වාධීන විශේෂ පොලිස් විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා. පනතේ සංශෝධන ක්‍රියාවලිය රජයේ නීති කෙටුම්පත් සම්පාදක විසින් මේ වන විට සිදු කරමින් පවතිනවා. තවද, දැනට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පරිශ්‍රයේ පවතින විශේෂ පොලිස් විමර්ශන ඒකකය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත අනුයුක්ත කර ගැනීම සඳහා වන ඉල්ලීමක් පොලිස්පතිවරයා වෙත 2026.06.23 දිනැතිව යොමු කර තිබෙනවා.

5. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ විධිවිධාන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරමින් එම අධිකාරිය ස්වාධීන කිරීම සඳහා, වග විය හැකි ආයතනයක් බවට පත් කිරීම සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත සංශෝධනය කිරීම මේ වන විට සිදු කරමින් පවතිනවා.

6. අංක: අමප/25/1056/819/013 හා 2025.07.01 දිනැතිව ලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ "ජාතික ළමා ආරක්ෂණය පිළිබඳ පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029" ප්‍රධාන ක්ෂේත්‍ර 10ක් ආවරණය වන සේ සකස් කර 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් පවතින්නක්. මෙම ක්‍රියාකාරී සැලසුම

ක්‍රියාත්මක කිරීමේදී අධීක්ෂණය හා නියාමනය පිණිස වන ජාතික මෙහෙයුම් කමිටුවේ පළමු රැස්වීම 2026.07.02 දින පවත්වන ලද අතර, එම මෙහෙයුම් කමිටුවේ තීරණය අනුව ක්ෂේත්‍ර 10ක් ආවරණය වන සේ විශේෂඥ තාක්ෂණ කමිටුව නම් කිරීම ද සිදු විය යුතු බව හඳුනාගෙන ඇත. ඒ අනුව ඉදිරි මාස කිහිපය තුළ ජාතික මෙහෙයුම් කමිටුවට තාක්ෂණ මග පෙන්වීම සහ ආධාර සැපයීම සඳහා වූ විශේෂඥ සාමාජිකයන් පත් කරමින් එම කමිටුවේ උපදෙස් මත දිස්ත්‍රික් විශේෂඥ තාක්ෂණික කමිටු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

7. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, මේ වන විට පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම අවසන් කර ඇති, ළමුන්ට එරෙහිව සිදු වන ශාරීරික දණ්ඩන වැළැක්වීම සඳහා සිදු කරන නීති සංශෝධන සම්බන්ධව අදාළ උද්දේශනය/ දැනුවත් කිරීම් මේ වන විට ආරම්භ කර තිබෙනවා.

ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මෙම නීති සංශෝධන පිළිබඳව 2026 වර්ෂයේදී විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කරනු ලැබුවා. ඒ යටතේ, ළමුන්ට එරෙහිව සිදු වන ශාරීරික දණ්ඩනය වැළැක්වීම පිණිස සිදු කරන නීති සංශෝධන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඒ පිළිබඳව දැනුවත් කිරීම හා සූදානම් කිරීම, රටක් ලෙස ළමුන් හික්මවීමට යොදා ගන්නා හිංසාකාරී ක්‍රමවේද වෙනුවට ධනාත්මක ශික්ෂණය භාවිත කිරීමේ අවශ්‍යතාව ප්‍රවර්ධනය කිරීම සහ ළමුන්ට එරෙහිව සිදු වන ශාරීරික හිංසන වැළැක්වීම සඳහා අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහා තිරසර වැළැක්වීමේ ක්‍රියාවලියක් ගොඩනැඟීම යන ප්‍රධාන අරමුණු ඇතිව දැනුවත් කිරීම්, ආගමික පූජකවරුන් සමඟ උද්දේශන රැස්වීම් පැවැත්වීම හා මාධ්‍ය ව්‍යාපාරය යන මූලික අංශ 3ක් පදනම් කරගෙන වැඩසටහන් මාලාවක් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ මැදිහත්වීමෙන් සිදු කරමින් පවතිනවා.

ඒ යටතේ ප්‍රධාන වශයෙන් මෙම නීති සංශෝධන පිළිබඳව රජයේ පාසල්වල මෙන්ම පෞද්ගලික අංශයේ පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් මේ වන විටත් ආරම්භ කර පවත්වා අවසන් කර තිබෙනවා. එකී වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුමෙහි දක්වා තිබෙනවා. මා එම ඇමුණුම **සභාගත*** කරනවා.

ළමා ආරක්ෂාව තහවුරු කිරීම පෙරදැරිව, පවත්නා අපරාධ නීතිය සංශෝධනය කරමින් ළමයින්ට එරෙහි ශාරීරික දණ්ඩනයට අදාළව නව නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීම පිළිබඳව සර්වාගමික නායකයන් දැනුවත් කිරීමේ උද්දේශන රැස්වීම් පැවැත්වීම ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ වන විට ආරම්භ කර තිබෙනවා. ඒ අනුව 2026.04.20 වන දින මල්වතු හා අස්ගිරි පාර්ශ්වයේ මහා නායක ස්වාමීන් වහන්සේලා සහ ඉන් අනතුරුව අගරදගුරුතුමන් හමුවීම ආදි කටයුතු මේ වන කොට සිදු කර තිබෙනවා.

මේ සම්බන්ධයෙන් ප්‍රචාරණ වැඩ පිළිවෙළක් දියත් කරමින් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය ආයතන හරහා සහ අනෙකුත් සියලුම ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් දැනුවත් කිරීම, ප්‍රචාරණය ආදි සියල්ලම සිදු කරමින් පවතිනවා. ළමා ආරක්ෂාව, ශාරීරික දණ්ඩනය වැළැක්වීම පිළිබඳ නීතිමය වපසරිය සහ ධනාත්මක ශික්ෂණය යන තේමා ඔස්සේ මහ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කර තිබෙනවා. මෙම විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරින්ගේ, දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරින්ගේ සම්පත් දායකත්වයෙන් කෙටි වීඩියෝ පට මාලාවක් සකස් කර ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණයට කටයුතු සිදු කරනවා.

8. අර්බුදයක් ලෙස නොපිළිගනී. එසේම ක්‍රියාන්විතයක් ලෙස කටයුතු කිරීම සඳහා තවම තීරණයක් ගෙන නැත.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, do you wish to ask for a clarification?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමියනි, පිළිතුර ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ළමා ආරක්ෂණ තත්ත්වය සම්බන්ධයෙන් අර්බුදයක් නැහැ කියලා ඔබතුමිය ප්‍රකාශ කළත් කාලයක් තිස්සේ නිර්මාණය වුණු බරපතළ අර්බුදයක් තිබෙනවා. ඒ අර්බුදය තුළ අගතියට පත් වන්නේ, හානියට ලක් වන්නේ අපේ රටේ දරු පරපුරයි. විශේෂයෙන්ම විගණකාධිපතිවරයාගේ 2024 වාර්ෂික වාර්තාවට අනුව පෙන්වා දී තිබෙනවා, 2014 සිට වසර 10ක් තිස්සේ ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරිය පනතට අනුකූලව ජාතික ප්‍රතිපත්ති සැකසීම, නීති ක්‍රියාත්මක කිරීම, නඩු නියාමන ක්‍රියාවලිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම යනාදි කර්තව්‍යයන් ඉෂ්ට සිද්ධ වෙලා නැහැ කියලා. ඒ වාගේම ළමා අපචාර සම්බන්ධ සියලු නඩු කටයුතුවල විමර්ශන සහ ප්‍රගතිය නියාමනය කිරීමේ වැඩ පිළිවෙළ සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීම වැදගත් වුවත්, දැන ගන්නට ලැබී තිබෙන ආකාරයට එය හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැහැ. ගරු ඇමතිතුමියනි, ඔබතුමියත් දන්නවා, තුෂ් වික්‍රමනායක මැතිනිය මේ විෂයය පිළිබඳව ලොකු උනන්දුවක් දක්වන බව. එතුමිය සඳහන් කරන ආකාරයට මේ දත්ත පද්ධති සකස් කිරීම හරියාකාරව ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම, පරිවාස භාරයේ හෝ ළමා සුරැකුම් ආයතනවල රඳවා සිටින දරුවන් දූෂණයට, ලිංගික අපචාරවලට, ශාරීරික හිංසනයට, අඩන්තේට්ටම්වලට ලක් වෙනවා කියන එකත් අපට ආරංචි වෙනවා. ඒවා වළක්වා ගැනීම සඳහා නිසි, විධිමත් ක්‍රමවේදයක්, වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ නැහැ.

ඒ වාගේම නව තාක්ෂණය උපයෝගි කරගෙන පරිවාස හා ළමා සුරැකුම් ආයතන වැනි ආරක්ෂිත ස්ථාන සඳහා CCTV නිරීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම, panic button ක්‍රමවේද, ආරක්ෂිත ඩිජිටල් පැමිණිලි පද්ධති, online child protection database යනාදි නවීන ක්‍රමෝපායයන් උපයෝගී කරගෙන එම දූ දරුවන්ගේ ආරක්ෂිතභාවය තහවුරු කිරීමේ නව වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙලා නැහැ.

ඒ වාගේම ළමයින් අපරාධවලට සහ අපචාරවලට ගොදුරු වීමට බලපාන ප්‍රධානතම සාධක සහ අවදානම් පරිසරයන් පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කර ඒවාට පිළියම් යෙදීමට

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ක්‍රියාත්මක වීමත් ඉතාම දුර්වල මට්ටමකයි තිබෙන්නේ. මම මේක අවධාරණය කරන්නට ඕනෑ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කේන්ද්‍ර කරගෙන දීර්ඝ කාලීනව තිබෙන, ළමයින්ගේ අයිතිය උල්ලංඝනය වෙන ඉතාම දුර්වල, අකාර්යක්ෂම වැඩ පිළිවෙළක් ගැනයි මම කථා කරන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමියනි, මම ඔබතුමියට කියන්න කැමැතියි, ඒ පිළිබඳව නැවත කරුණු සොයා බලා අලුත් වැඩ පිළිවෙළකට යෑම වැදගත් කියලා. රටේ ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් අන්තර් ආයතන සමඟ සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපනය කරලා විශේෂයෙන්ම ළමයින්ගේ, දරු දැරියන්ගේ, බිළින්දන්ගේ අයිතිය ආරක්ෂා කරන ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවීම අත්‍යවශ්‍යයි. මෙතැනදී ළමයින් ගැන කථා කළාට, මම හිතනවා ඒක ළමයින් සහ කාන්තාවන් කියන දෙකොට්ඨාසයම බද්ධ කරලා ක්‍රියාත්මක කිරීම වැදගත් බව.

අවසාන වශයෙන් මේ කාරණය මම ඔබතුමියට කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම දැන් ව්‍යවස්ථා සංශෝධන ගැන කථා කරනවා. උපරිමාධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම යෑමේ වයස ඉහළ දැමීම ගැන කථා කරනවා. ගරු ඇමතිතුමියනි, මම ඔබතුමියට යෝජනා කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැල්ලා එහි මූලික අයිතිවාසිකම්වලට - Fundamental Rightsවලට, මානව අයිතිවාසිකම්වලට, අනිවාර්යයෙන්ම ළමයින්ගේ අයිතියත්, කාන්තාවන්ගේ අයිතියත් සම්බන්ධ ඡේදයක් ඇතුළත් කරන්න කියලා.

**ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

මම ඔබතුමාගේ සාධනීය යෝජනා සියල්ල පිළිගන්නවා, ගරු විපක්ෂ නායකතුමනි. ඒ වාගේම කියන්න ඕනෑ, ඇත්තටම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පවතින සේවක හිඟය විශේෂයෙන්ම ඒ අකාර්යක්ෂමතාවට යම් මට්ටමකින් හරි හේතු වෙනවා කියනවා නම්, අපි කැබිනට් අනුමැතිය සහිතව 2025 වර්ෂයේ සිට පුරප්පාඩු 109ක් සඳහා අලුතින් නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවා. ඒ බඳවා ගැනීම් මේ වන විට සිදුවෙමින් පවතිනවා. ඒ වාගේම තමයි, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධව ජාතික දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු අපි මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා. ළමයි ඒ අපයෝජන හා අපචාරවලට ගොදුරු වීමේ ප්‍රවණතාවට සාධක හැටියට අපි හඳුනාගත්තු මත්ද්‍රව්‍ය සහ online ආරක්ෂාව පිළිබඳ කටයුතුවලට අවධානය යොමු කරලා අග්‍රාමාත්‍යතුමිය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු සියල්ල ඒකාබද්ධ කරගෙන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අපි මේ වෙනකොට මේ කටයුතු කරමින් පවතිනවා. විශේෂයෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන දරුවන්, මත්ද්‍රව්‍යවලට ගොදුරු වන දරුවන් මෙන්න මේ අපයෝජනවලට ලක්වීමේ ප්‍රවණතාව වැඩි වෙලා තිබෙනවා. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මැදිහත්වීම මත ළමා ආරක්ෂක නිලධාරින්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්, මනෝ උපදේශන නිලධාරින් සහ අනෙකුත් සියලු නිලධාරින් එකතු කරගෙන අපි මේ වෙනකොට ඒ අදාළ වැඩසටහන් ආරම්භ කරලා තිබෙන්නේ.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා විසින් සඳහන් කරන ලද ආයතනවල ඉන්න, විශේෂයෙන්ම පරිවාස කාර්යාල, ළමා නිවාස, රැඳවුම් නිවාස ආශ්‍රිතව ඉන්න දරුවන්ට සිදු වන හිංසන පිළිබඳව අපි අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම ඒවායේ අභ්‍යන්තරිකව දරුවන් සම්බන්ධ ගැටුම් වාර්තා වනවා නම් ඒවා පිළිබඳව සොයා බැලීමට අපි කටයුතු කරනවා. ඒ වාගේම, ඒවායේ ඉන්න නිලධාරින්ට විශේෂ පුහුණුව ලබා දීම සහ මත්ද්‍රව්‍ය වැරදි මත ආයතනගත වන දරුවන් වෙන් කිරීම සඳහා සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා වන වැඩ පිළිවෙළ අපි සකස් කරමින් තිබෙනවා. ඒ වාගේම, ඔබතුමා විසින් කරන ලද අනෙකුත් සියලු යෝජනා අපි භාරගන්නවා. ඒවා පිළිබඳවත් අපි කටයුතු කරමින් තිබෙන බව දන්වන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you a minute, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Give me just one minute.

ගරු ඇමතිතුමියනි, ඇත්ත වශයෙන්ම මම ඔබතුමියට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. ඔබතුමිය බොහොම සාධනීය පිළිතුරක් ලබා දුන්නා. අවස්ථා ගණනාවකදී මම ඔබතුමියගේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට සහභාගි වෙලා තිබෙනවා. ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව තුළිනුත් දරුවන් වෙනුවෙන්, කාන්තාවන් වෙනුවෙන් ඔබතුමිය යම් සාධනීය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට උත්සාහ දරනවා. ඒ වෙනුවෙනුත් මම ඔබතුමියට ස්තුතිය පුද කරන්නට ඕනෑ.

ඒත් එක්කම මම ඔබතුමියට පොඩ්ඩක් බලකරලාම මේ කාරණය කියනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් - Fundamental Rights - කියලා පරිච්ඡේදයක් තිබෙනවා. අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කරන්නට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙන එනවා වෙනුවට, කරුණාකරලා ළදරුවන්ගේත්, ළමයින්ගේත්, කාන්තාවන්ගේත් අයිතිවාසිකම් ඒ Fundamental Rights Chapter එකට ඇතුළත් කරන්නට ඔබතුමිය නායකත්වය ලබා දෙන්න. ඒ උත්සාහයට විපක්ෂයේ අපි සියලුදෙනාම කොන්දේසි විරහිතව අපේ උපරිම සහයෝගය ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, do you want to reply to that?

**ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමනි. අපි ඕනෑම වෙලාවක ඒ යෝජනා භාර ගන්නට කැමැතියි. ඔබතුමා සඳහන් කළා වාගේම තුෂ් වික්‍රමනායක මහත්මියත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමියත් එකතුවෙලා බාහිර පාර්ශ්ව සියල්ලගේම අදහස් හා යෝජනා ලබා ගනිමින් අපේ අමාත්‍යාංශයේ කටයුතු වඩාත් හොඳින් කරගෙන යනවා. මොකද, ඒක අමාත්‍යාංශ කටයුත්තක් විතරක් නොවෙයි, දරුවන් හා කාන්තාවන් වෙනුවෙන් කෙරෙන ජාතික කර්තව්‍යයක්. ඒ වෙනුවෙන් ඔබතුමා දක්වන දායකත්වයට, මැදිහත් වීමට බොහොම ස්තුතියි. අපි අධිකරණ අමාත්‍යාංශයත් එක්ක කථා කරලා ඒ පිළිබඳව කටයුතු කරන්න අදහස් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Notice of Motions at the commencement of Public Business.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon.(Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Then, Public Business. Item Nos. 01 and 02 - Regulations under the Imports and Exports (Control) Act, the Hon. (Dr.) Anil Jayantha. You have 14 minutes.

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

[පූ.භා. 11.54]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජූනි 15 දිනැති අංක 2493/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.07.10 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 දරන යෝජනාව ද මා ඉදිරිපත් කරනවා.

අද දින විවාදයට බඳුන් කරන්නේ විශේෂයෙන්ම ජාතික ආර්ථිකය ඇතුළේ විදේශ වෙළෙඳාම හා සම්බන්ධ වෙන 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතට ගෙන එනු ලබන රෙගුලාසි දෙකක් පිළිබඳවයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විසින් මෙයට සම්බන්ධ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා. එහිදී මෙහි පසුබිම, ඇතුළත් වන කරුණු, කාරක සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ දීර්ඝ ලෙස ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සමස්තය අරගෙන බැලුවාම අපට පැහැදිලි වන දේ මේකයි. මේ රෙගුලාසි තුළින් බලාපොරොත්තු වෙන ප්‍රධානම දේ තමයි අපනයනයේදී හා ආනයනයේදී - තෝරා ගත් ක්ෂේත්‍ර දෙකක පමණක් - යම් ආකාරයක අවිධිමත්භාවයක් තිබුණා නම්, අකාර්යක්ෂමතාවක් තිබුණා නම්, ඒ අකාර්යක්ෂමතා අවම කර ගැනීම සහ අධීක්ෂණ යන්ත්‍රණය වැඩි දියුණු කර ගැනීම. ඒ වාගේම අපේ නීති රීති හා මේ රෙගුලාසි අතර තිබෙන සමහර පුංචි සිදුරු, අඩු පාඩු උපයෝගී කර ගෙන යම් කණ්ඩායම් විසින් නීති විරෝධි ආකාරයට කටයුතු කිරීමෙන් අයථා ලාභ ප්‍රයෝජන උපයා ගැනීමට තිබුණු ඉඩකඩත් ආවරණය කරමින් වඩාත් හොඳ තරගකාරී පරිසරයක්, පොදු පරිසරයක් නිර්මාණය කර දෙන්න තමයි මේ රෙගුලාසි ඉදිරිපත් කරන්නේ. එහෙම නැති වෙනකොට නිසි පරිදි බදු ගෙවා නීතියට අනුව වැඩ කටයුතු කරන අයටත් යම් අසාධාරණයක් සිද්ධ වෙනවා. සාමාන්‍ය ව්‍යාපාරික ලෝකයේ සම බිමක්, පොදු බවක් රැක ගන්න මේ රෙගුලාසි උදවු වෙනවා.

2026.07.10 දින ඉදිරිපත් කරනු ලබන රෙගුලාසි යටතේ ඉදිරිපත් කරන්නේ මේ කරුණු. අපේ රටේ තිබෙන අමුද්‍රව්‍ය, විශේෂයෙන් ලෝහ ආශ්‍රිත අමුද්‍රව්‍ය සඳහා විශේෂ වර්ගීකරණ ගණනාවක් තිබෙනවා. ඒවා අපනයනය කිරීමට බලපත්‍ර ලබා ගන්නට වෙනවා. ඒවා අපනයනය කිරීමට බලපත්‍ර ගන්න කියන්නේ, ඒවා අපනයනය කිරීම වළක්වා තිබෙන්නේ විශේෂයෙන්ම පළමුකොටම දේශීය කර්මාන්ත දියුණු කිරීම සඳහා, දේශීය කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහායි. මොකද, කාර්මික සංවර්ධන මණ්ඩලය අපේ රටේ මේ අමුද්‍රව්‍ය භාවිත කරන්න නිෂ්පාදකයන්ට ලබා දුන්නත්, අමුද්‍රව්‍ය අවශ්‍යතාවෙන් සියයට එකක් විතර තමයි සපුරා ගන්න පුළුවන් වෙන්නේ කියලා තිබෙනවා. මේ සංශෝධන මඟින් අදාළ පාලනය සිද්ධ කළොත්, අපේ රටේ තිබෙන අමුද්‍රව්‍ය යොදා ගැනීම සියයට 25ක් වාගේ ප්‍රමාණයකට වැඩි කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් සිද්ධ වෙලා තිබුණේ ඒ කේත අවභාවිත කරමින් වෙනත් ආකාරයකට, නීති විරෝධි විධියට මේවා අපනයනය කිරීමයි. විශේෂයෙන් ලෝහ වර්ග, - යවන්න බැරි දේවල් - ආකෘතිය වෙනස් කරලා වෙනත් භාණ්ඩ විධියට, වෙනත් සංකේත යටතේ යොදලා යවා තිබෙනවා. මේ රෙගුලාසි මඟින් සිද්ධ කරනු ලබන්නේ නීති විරෝධී අපනයන වළක්වන ගමන් දේශීය කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා උදව්වක් ලබා දීමයි.

දෙවැනි එක තමයි, 2026 අංක 6 දරන ආනයන අපනයන (පාලන) රෙගුලාසිය. මෙය ඉක්මනින් ඇතුළත් කරන්න පාදක වුණේ මේ කාරණයයි. 2023 සිට 2026 දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතනවලට ලැබිලා තිබුණු පැමිණිලි, තොරතුරු හා ඔවුන්ගේ විමර්ශන හරහා සොයාගත්ත තොරතුරු මඟින් වාර්තා තුනක් ඉදිරිපත් වෙලා තිබුණා. ඒ වාර්තා තුනෙන් ප්‍රධාන වශයෙන් සොයාගත් කාරණය තමයි, භාණ්ඩ ආනයනය කිරීමේදී දැනට තිබෙන ප්‍රතිපාදනයක් අනුව භාණ්ඩ ආනයනය කිරීමට අදාළව රේගුවෙන් clearance ලබාගන්න කලින් advance payments කිරීමේ ඉඩ කඩක් තිබෙනවාය කියන එක. භාණ්ඩ ආනයනය කරනකොට විවිධ ආකාරයේ ගෙවීම් ක්‍රමවේද තිබෙනවා. එහිදී

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ආනයනකරුවන්ට යම් ආකාරයක පහසුවක් ලබා ගැනීමට advance payments කරන්න පුළුවන්. ආනයනකරු විසින් advance payment එක කළාට පස්සේ අදාළ මුදල් ගෙවීම් සිදු කරලා ඒ භාණ්ඩ ලංකාවට ගෙන්වා ගන්න ඕනෑ. මේ ප්‍රතිපාදනය ඇතුළේ කලින් ගෙවීම් - advance payments - කළාට පසුව ඒ ආනයනකරුට වගකීමක් තිබෙනවා. ඒ, ඒ භාණ්ඩ වර්ගය අනුව ඒවා ලංකාවට ගෙන ආ යුතු කාලයක් තිබුණා. අදාළ භාණ්ඩය අමුද්‍රව්‍යයක්, පරිභෝජන භාණ්ඩයක් නම් දින 180ක්, කාර්මික උපකරණයක්, නිෂ්පාදනයට යොදා ගන්න භාණ්ඩයක් නම් දින 360ක්, සමහර අවස්ථාවල දින 730ක් - අවුරුදු දෙකක් වාගේ දීර්ඝ කාලයක් - ලබා දීලා තිබුණා, ලංකාවට ගෙන එන්න.

මේ පරීක්ෂණවලින් සොයාගෙන තිබුණා advance payments හරහා යවලා තිබෙන ඩොලර්වලට සාපේක්ෂව කිසිදු භාණ්ඩයක් ලංකාව ඇතුළට ඇවිල්ලා නැහැ කියන එක. ඒක ඉතාම බරපතළ කාරණයක්. මේ සිදුවීම් කරලා තිබෙන්නේ නීතිමය පැත්තේ තිබුණු හිලෙන් රිංගලා ගිහිල්ලා ආවරණය කරගෙනයි. ඉතාම සීමාසහිත කණ්ඩායමක් තමයි මේ කටයුත්ත කරලා තිබෙන්නේ කියන එක මේ තොරතුරුවලින් පැහැදිලි වෙනවා. මේ, දැනට හෙළිදරව් වෙලා තිබෙන තොරතුරු. ඉදිරියේදී තවත් ඉන්න පුළුවන්. පුද්ගලයන් 55දෙනෙක්, සමාගම් 107ක් වැනි කණ්ඩායමක් විසින් තමයි මේ කටයුත්ත සිද්ධ කරලා තිබෙන්නේ.

මුදල් රටින් එළියට ගලා යෑම ඩොලර්වලින් ගත්තාම ඩොලර් මිලියන 715ක් වාගේ විශාල ප්‍රමාණයක් වෙනවා. ඒක අපේ ගෙවුම් ශේෂ තුලනයටත් අහිතකර විධියට බලපාන තත්ත්වයක් තිබෙනවා. මෙහි තිබෙන භයානක තත්ත්වය මේකයි. විදේශ ගෙවීම් කරනකොට උණ්ඩියල්, හවාලා වැනි නීති විරෝධී ක්‍රම තිබෙන බව අපි දන්නවා. සමහර අවස්ථාවලදී ආනයනකරුවන් මෙවැනි නීති විරෝධී ක්‍රමවලින් මුදල් යවලා භාණ්ඩ ගෙන්වා ගන්නවා. එතකොට අපට බදු අහිමි වීමේ ගැටලුවක් තිබුණා වුණත් අවසානයේ මේ දෙක සමාන වෙනවා, ලංකාවට භාණ්ඩ එනවා. නමුත් මේ අවස්ථාවේදී ඒ භාණ්ඩ ලංකාවට ඇවිල්ලා නැහැ. ඒක ඉතාම ගැටලු සහිත තත්ත්වයක්. ඒ නිසා අපි ඉදිරිපත් කරන ලද රෙගුලාසිවලින් ප්‍රධාන වශයෙන් ආකාර දෙකකින් කටයුතු සිද්ධ කරනවා. බැංකුකරුවා advance payment එක කරනකොට අනිවාර්යයෙන් රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙන්න සිද්ධ වෙනවා. ඒ වාගේම බැංකුවේදී ඔවුන් ඒ මුදල් advance කරන්න කලින් විශේෂ තොරතුරු ගණනාවක් ලබා ගන්නවා. මෙහි ඉතාම වැදගත් වෙන දෙයක් තිබෙනවා. අපි සාමාන්‍යයෙන් ගනුදෙනුකරුගේ තොරතුරු ගන්නා අතර ඒ, ඒ ගනුදෙනුවට Tax Identification Number - TIN - එක වාගේ එකක් තිබෙනවා, බදු ගෙවන්නා හඳුනා ගැනීමට. ඒ තිබෙන්නේ එක් පුද්ගලයෙකුට, ආයතනයකට, එහෙම නැත්නම් person කෙනෙකුට. හැබැයි තනි පුද්ගලයෙකුට පුළුවන්, විවිධ ආනයන ප්‍රමාණයක් කරන්න. ඒ නිසා ඉතාම වැදගත් වෙන දෙයක් තමයි unique identification number එක. අන්න ඒ unique identification number එක මේකෙන් අනිවාර්ය කරනවා. සෑම ගනුදෙනුවකටම ඒ number එක අවශ්‍ය කරනවා. ඊට අමතරව ඒ ගනුදෙනුකරුවා පිළිබඳ තොරතුරු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම මුදල් ලබන්නා පිළිබඳ තොරතුරු, ප්‍රේෂණ දිනය, මුදල් වර්ගය මේ වාර්තාවේ ඉදිරිපත් කරලා තිබෙනවා. යම් අකටයුත්තක්, වැරැදි ගනුදෙනුවක් සිද්ධ වුණොත්, මෙයින් ඒ පිටුපස සිටින පුද්ගලයන් අනාවරණය කරගන්න අපට පුළුවන්. ඔවුන් හඹාගෙන යාමට, පරීක්ෂණ කටයුතු වැඩි කරගැනීමට මේක උදවු වෙනවා.

දැන්, ආනයනකරුවන් රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබෙන්නට ඕනෑ, ආනයනවලට එන්න.

අපි මෙම රෙගුලාසිය පැනවූ ගමන් එසේ ලියාපදිංචියට පොඩි තදබදයක් පැන නැඟුණා. ඒ කියන්නේ, ලියාපදිංචි කර ගැනීමේදී යම් කාල පමාවක් ඇති වුණා. නමුත් රේගු දෙපාර්තමේන්තුව යුහුසුලුව එම කටයුතු ඉෂ්ට කළා. ඔවුන් සතුව ලියාපදිංචි ආනයනකරුවන් 15,100ක් සිටිනවා. මේ වනවිට එම සියලු කටයුතු සාමාන්‍ය තත්ත්වයට ගෙනැවිත් තිබෙනවා. එය ස්වයංක්‍රීයවම බැංකු පද්ධතියට සම්බන්ධ කළාට පසුව එම කටයුතු වේගයෙන් සිද්ධ වෙනවා.

ඒ වාගේම මෙහි ගැට ගැසී තිබෙන තව විශේෂ කාරණයක් ගැන සඳහන් කරන්නට ඕනෑ. අපි නීති රීති වෙනස් කරනවා, සංශෝධනය කරනවා, අලුතින් නීති රීති හඳුනා ගන්නවා. අපි ප්‍රධාන වශයෙන්ම ආනයනය සඳහා මුදල් යැවීමක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1953 අංක 24 දරන විනිමය පාලන පනත අහෝසි කර, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ඉදිරිපත් කරනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? එය හොඳ හිතින් කළා වෙන්න පුළුවන්, අපි දන්නේ නැහැ. නමුත් එතැන යම් හිඩැසක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ කියන්නේ කලින් පැවති පනතට අනුව නම් යම් නීති විරෝධී ගෙවීමක් සිදු කළාම එය අපරාධමය වරදක් බවට පත් වෙනවා. ඒ නිසා අපරාධමය වරද යටතේ අදාළ නඩු කටයුතුවලට යන්න පුළුවන්කම තිබුණා. නමුත් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ එවැනි අපරාධමය වරදකට ගැනෙන ආකාරයේ වැරදි, ඒ කියන්නේ මුදල් රටින් බැහැර කිරීමේ කාර්යයන් අනුකූලතාව නොදක්වන - noncompliance - සිවිල් වරදක් විධියට පරිවර්තනය වෙනවා. සාමාන්‍යයෙන් සිවිල් වරදක් වුණාම දඩයකට යටත් වෙනවා. විශේෂයෙන්ම මහ බැංකුවේ දඩයකට යටත් වෙනවා. මේ වාගේ සැලසුම් සහගතව වංචා කරන අයට, අපරාධ කරන අයට මේ දඩය ගෙවන එක එච්චර අමාරු කාරණයක් නොවෙයි. මේ තත්ත්වය තුළ අපිට වගකීමක් තිබෙනවා. මොකද, මේ ඉදිරිපත් කරන රෙගුලාසි බලාත්මක වෙන්න නම් මහ බැංකුව, අනෙකුත් බැංකු, රේගු දෙපාර්තමේන්තුව සහ විශේෂයෙන්ම සමාගම් රෙජිස්ට්‍රාර්වරයා කියන කණ්ඩායම් ඒකාබද්ධ කරලා, තොරතුරු පද්ධතිය සකස් කරලා, තොරතුරු බෙදා ගෙන එම කටයුතු සිද්ධ කළ යුතුයි. එතැනත් ගැටලු ගණනාවක් තිබෙනවා. එහෙම කළත් ඒක සර්ව සම්පූර්ණ වෙන්නේ නැහැ. මොකද, නීතිමය පැත්තෙන් බැලුවාම වැරදි විධියට මුදල් රටින් පිට කළොත්, සිවිල් වරදක්, නැත්නම් එය noncompliance වරදක් වෙනවා. ඒ නිසා එය අපරාධමය වරදකට හසු කරගන්න සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව 2017 අංක 12 දරන විදේශ විනිමය පනත තුළ තිබෙන මෙන්න මේ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා ඉදිරියේදී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නට අපි අදහස් කර තිබෙනවා. ඒ අනුව නීති විරෝධීව කරනු ලබන එවැනි මුදල් ගනුදෙනු, එවැනි වැරදි අපරාධමය වරදක් විධියට නිර්වචනය කර ගැනීමට අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෑත කාලයේ තව තව ප්‍රවෘත්ති පළ වුණා. පසුගිය සතියේ තවත් ආනයනකරුවෙකු අත්අඩංගුවට පවා පත් වෙලා තිබුණා. නමුත් රේගු දෙපාර්තමේන්තුවේ තිබෙන බලතල යටතේ සාමාන්‍ය විධියට අත්අඩංගුවට පත් වෙන්නේ නැහැ. ඔවුන් යම් වරදක් සිද්ධ කරලා නම් දඩ ගැසීමක් කරනවා. නමුත් ඒ ආනයනකරු සම්බන්ධයෙන් වන තත්ත්වය මොකක්ද කියලා අපි විමසා බැලුවා. එතැනදී හෙළිදරව් වෙලා තිබෙනවා, සමාගම් 30ක් උපයෝගී කරගෙන මේ ආකාරයටම මුදල් යවා භාණ්ඩ ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙන බව. විශේෂයෙන් undervaluation එකක් තමයි එතැන පැන නැඟී තිබෙන්නේ. ඒ අදාළ ආනයනකරු විසින් මූලිකවම රේගු දෙපාර්තමේන්තුවට අදාළ පරීක්ෂණ කිරීම සඳහා සහයෝගය නොදැක්වීම මත තමයි එසේ අත්අඩංගුවට ගෙන තිබෙන්නේ. නමුත් ආනයනකරුවන්, ව්‍යාපාරිකයන් අත්අඩංගුවට ගන්නවා

කියලා සමාජය තුළ වැරදි මතයක් යනවා. එහෙම නැහැ. නීතිය ක්‍රියාත්මක කරන්න සහයෝගය දෙන අය, නීත්‍යානුකූලව ව්‍යාපාර කටයුතු කරන අය, නීතියට අවනතව කටයුතු කරන අය, නිසියාකාරව ඒ සහාය දක්වන අය කිසිදු ආකාරයකින් බිය විය යුතු නැහැ. පවතින නීති රීති පද්ධතිය අනුව තමයි කටයුතු කරන්නේ. ඒ කාරණය ගැන මම සඳහන් කළේ සමාජය තුළ වැරදි අදහසක් පවතින නිසායි.

ඒ වාගේම අපි යම් යම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. මොකද, විශේෂයෙන්ම විදේශීය වෙළෙඳාමේදී විදේශ සංචිත සම්බන්ධව, විදේශ විනිමය සම්බන්ධව වෙළෙඳ පොළ තුළ තිබෙන යන්ත්‍රණයට පිටින් බලපාන සාධක - අපට පාලනය කරගන්න බැරි බාහිර සාධක - නිසා යම් යම් ගැටලු පැන නැඟී තිබුණා. එවැනි එක් අවස්ථාවක් තමයි පසුගිය කාලයේ වාහන ආනයනය සම්බන්ධයෙන් ගත් තීරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාස තුනකට, තෝරා ගත් වාහන කාණ්ඩයකට ආනයන තීරු බද්දේ අධිභාරය සියයට 50කින් වැඩි කරන්න ආණ්ඩුව ක්ෂණිකව තීන්දුවක් ගත්තා, ඔබතුමාට මතක ඇති. ඒක වැඩ කළේ නැහැ, එම තොරතුරු ගිහිල්ලා මිනිස්සු වැඩිපුර ආනයනය කර තිබුණා කියලා ඒ අවස්ථාවේදීත් විවිධ චෝදනා ආවා. නමුත් මෙම සභාවට මා සතුටින් කියන්න කැමැතියි, ජූලි මාසයේ පළමු දින 21 ඇතුළතදී එම තත්ත්වය පාලනය වෙලා තිබෙන බව. අවසාන දින දෙක වන ජූලි 20, 21 වනකොට දිනකට එවැනි වාහන ආනයනය සඳහා අදාළ LCs නිකුත් කර තිබෙන්නේ ඩොලර් මිලියන 1.81ක් සහ ඩොලර් මිලියන 1.9ක් වශයෙන්. සාමාන්‍ය - average එක - ගත්තාම මේ දින 21ට, ඩොලර් මිලියන 3.5ක් වාගේ මට්ටමක තිබෙන්නේ. ඒ නිසා එවැනි තත්ත්වයනුත් පාලනය වෙලා තිබෙනවා. අපි හැම තිස්සේම උත්සාහ කරන්නේ පවතින තත්ත්වය යටතේ ප්‍රධාන වශයෙන් තිරසර, සියල්ල සහභාගි වන, සියයට 7 ඉක්ම වූ ආර්ථික වර්ධනයක් අත්පත් කරගනිමින් - අපි අත්පත් කර ගත යුතු ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා - අපි මුහුණ දෙන ප්‍රශ්න ගණනාවකට මූලික පදනම වන ආර්ථික ස්ථාවරත්වයක්, ආර්ථික වෘද්ධියක් අත්පත් කර ගැනීමේ දිශාවට ගමන් කිරීමයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම අපට වැදගත් වන්නේ, වඩාත් ගුණාත්මක, දීර්ඝ කාලීන ආයෝජන කැන්දා ගැනීම වාගේම විදේශීය වෙළෙඳාම පුළුල් කර ගැනීමයි. අද ඉදිරිපත් කර තිබෙන මේ රෙගුලාසිවලින් සිද්ධ කරනු ලබන්නේ අන්න ඒ පරිසරය තව තවත් පුළුල් කිරීමත්, එය කාර්යක්ෂම කිරීමත්, අධීක්ෂණ කටයුතු පහසු කර ගැනීමත්. ඒ සඳහා තමයි මේ රෙගුලාසි වැදගත් වන්නේ කියන කාරණය සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Harsha de Silva. You have 12 minutes.

[අ.භා.12.08]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා කිව්වා, ease of doing business තවදුරටත් ease කරන්න තමයි මේ රෙගුලාසි ගෙනැල්ලා තිබෙන්නේ කියලා. අවාසනාවකට, එතුමාට මේ කාරණය කියන්න මට සිද්ධ වනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීත් අපි මේ ගැන සාකච්ඡා කළාම සියලුම මන්ත්‍රීවරුන්ගේ අදහස වුණේත් මේක ease කරනවා නොවෙයි, more difficult කරනවා කියන එකයි. ඇත්තවශයෙන්ම එතුමාත් කිව්වා, 55දෙනෙකුගේ ප්‍රශ්නයක් නිසා තමයි මේ අලුත් නීතිය ගෙනැල්ලා තිබෙන්නේ කියලා. ගැටලුව තිබෙන්නේ නීතිය නැතිකම නොවෙයි, නීතිය බලාත්මක නොකිරීමයි. නීතියක් තිබෙනවා, නමුත් නීතිය බලාත්මක නොකරන්නේ නම් මේ ප්‍රශ්නය පැන නඟිනවා. තව තවත් නීති ගෙනෙන එක නොවෙයි අවශ්‍ය වන්නේ. ඩොලර් බිලියනයක් නැති වෙලාය කියලා ගරු ජනාධිපතිතුමා එදා පාර්ලිමේන්තුවේදී කියපු කථාවත් එක්ක තමයි මේක වුණේ. මම විශ්වාස කරනවා, මේ අලුත් නීතිය ගේන්නේ තාවකාලිකව කියලා. එහෙම කළොත් හොඳයි. මොකද, එක තැනක නොවෙයි, දැන් තුන් තැනක register වෙන්න සිද්ධ වනවා, import කරන්න. කොහොමත් මේක හරි අමාරු කාර්යයක්. Register වෙලා මාස ගණන් යනවා, මේ වැඩ කරගන්න. දැන් මම කියන්නම්, ගැටලුව මොකක්ද කියලා.

ASYCUDA system කියලා එකක් තිබෙනවා. මේ ASYCUDA system එකට බැහැ, CusDec එකයි, bank transaction document එකයි reconcile කරන්න. ඕකයි අවුල. ඔතැන තිබෙන්නේ technical ප්‍රශ්නයක්. ඔය technical ප්‍රශ්නය විසඳාගන්න බැරි නිසා මේකේ holesවලින් වංචාකරුවන් රිංගලා යනවා. 2012 වසරේ ඉඳලා මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කර තිබෙනවා. නමුත්, කරන්න බැරි වෙලා තිබෙනවා.

දෙවැනි එක මෙයයි. මේක reconcile කරන්න එපායැ. කවුරු හරි TT එකකින් ඩොලර් 50,000ක් යවනවා. ඒ ඩොලර් 50,000ට සරිලන import එකකුත් තිබෙන්න ඕනෑ. මේ import එක reconcile වෙන්න ඕනෑ. එතකොට ASYCUDA system එකට බැරි නම් මේක digitally reconcile කරන්න, අවම වශයෙන් මේකේ spot reconcilement එකක් හරි වෙන්න ඕනෑ. මෙතැන එක පැත්තකින් තිබෙනවා, Sri Lanka Customs එක; තව පැත්තකින් තිබෙනවා, බැංකුව; තවත් පැත්තකින් තිබෙනවා, Department of Imports and Exports Control. මේ ආයතන තුන මේ ගැන කථා කරන්නේ නැහැ. එක්කෙනෙක් එකක් කරනවා, තව එක්කෙනෙක් තව එකක් කරනවා, තවත් එක්කෙනෙක් තවත් එකක් කරනවා. සම්බන්ධීකරණයක් නැති නිසා හොරු මේක අස්සෙන් රිංගලා යනවා. හොරු රිංගලා යනකොට පවතින නීතිය බලාත්මක කරන්නේ නැතිව අලුත් නීති ගෙනෙනවා. එතකොට සියයට 1ක් කරන වරදකට සියයට 99ක්ම හිර වෙනවා.

තුන්වැනි කාරණාව මෙයයි. මහ බැංකුවේ Financial Investigation Unit - FIU - එක issue කර තිබෙනවා, trade-based money laundering ගැන; 2021 වසරේ ඉඳලා actionable intelligence දීලා තිබෙනවා. ඒ කියන්නේ, පාස්කු ප්‍රහාරය වාගේ වැඩක් නේ. හැබැයි 2024 මැයි ඉඳලා 2026 මැයි වෙනකල් මේකට කිසි දෙයක් කරලා නැහැ. Actionable intelligence දීලා තිබෙනවා නම්, නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්නම් කොතැනද වැරැද්ද තිබෙන්නේ? වැරැද්ද තිබෙන තැනට නේ අපි plug එකක් ගහන්න ඕනෑ. එහෙම නැතුව හැම තැනටම නොවෙයි නේ. They say you do not need a jackhammer to put a tintex nail.

ඊළඟ කාරණාව විධියට තිබෙන්නේ, TIN enforcement එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී බැංකුවලටත් යම් වගකීමක් තිබෙනවා. Import කරනවා නම් මෙම TIN එක දාන්න ඕනෑ. නියෝජ්‍ය පොලිස්පතිතුමා අපේ කමිටුවට ආ වෙලාවේ කිව්වා, TIN එක වෙනුවට දාලා තිබෙන්නේ තිතක් කියලා. TIN එකේ නොම්මරය වෙනුවට තිතක් දාලා තමයි ලු මේ documents open කරලා තිබෙන්නේ. එහෙම කරන්න බැහැ නේ. එහෙම කරනවා නම් බැංකු ඒකට වග කියන්න එපායැ. රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු කියන ඔක්කෝම බැංකු මේකට වග කියන්න ඕනෑ. ඒ අවස්ථාවේ ඔවුන් අපට ඒ නම් පවා කිව්වා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

අනෙක් කරුණ මෙයයි. KYC - Know Your Customer - කියලා ක්‍රමවේදයක් තිබෙනවා. හැමෝටම ඇවිල්ලා ඕනෑ ඕනෑ විධියට මේ ගිණුම් විවෘත කරන්න බැහැ. අපට එතැනදී ආරංචි වුණා, "A" කියලා company එකක් තිබෙනවා, "A1" කියලා තවත් company එකක් තිබෙනවා, "A2" කියලා තවත් company එකක් තිබෙනවා, "A4" කියලා තවත් company එකක් තිබෙනවා. එකම පුද්ගලයෙක් මෙවැනි කොම්පැනි විශාල සංඛ්‍යාවක් ආරම්භ කරලා ඒවාට TIN එක වෙනුවට තිතක් පමණක් යොදලා, එමඟින් ඩොලර් 50,000ක මුදලක් transmit කරලා තිබෙන බව. එතකොට කොතැනද වැරැද්ද තිබෙන්නේ? එය රජයේ බැංකුවක් ද, පෞද්ගලික බැංකුවක් ද කියලා අදාළ නැහැ, ඒ වැරැද්ද තිබෙන තැන හොයලා, බැංකු පද්ධතිය විසින් යම් කිසි විධියකට මේක හරියට ක්‍රියාත්මක කර නැත්නම්, ඊට විරුද්ධව ක්‍රියාත්මක වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය මේ ගැන හොයනකොට ඔවුන්ට companies 500කට වඩා හම්බ වෙලා තිබෙනවා. සමස්තයක් ලෙස මේක companies 1,600 ගණනක investigation එකක්. ඉන් සමාගම් 500කට වැඩි ප්‍රමාණයකට verified address එකක් නැහැලු, operating bank account එකක් නැහැලු, Articles of Association නැහැලු, promotersලාගේ background check එකක් පවා සිදු කර නැහැලු. ඉතින් පුදුම වැඩක් නේ මේක. එහෙම කරන්නේ කොහොමද? එහෙම කටයුතු කළාම, නීතිය බලාත්මක කරන්නේත් නැත්නම්, ඕනෑම කෙනෙකුට මේ නීතිය අස්සෙන් රිංගලා යන්න පුළුවන් නේ. අලුත් නීති ගෙනැල්ලා වැඩක් නැහැ. ඇත්තටම සාධාරණ ලෙස බිස්නස් කරන, භාණ්ඩ import කරන මනුස්සයාට තමයි මේකේ පහර වදින්නේ. එතකොට පාරිභෝගිකයා ගන්නා භාණ්ඩයේ මිල තවත් ඉහළ යනවා. මේවා අනවශ්‍ය නීති.

Department of the Registrar of Companiesහි computer system එක කැඩිලා. මේක කවුරුත් දන්නවා. RoC එකෙන් දවසෙන් කරන්න පුළුවන් කියලා එක පැත්තකින් ease කරලා, අනෙක් පැත්තෙන් සමහර වෙලාවට මාස ගණන් යනවා වැඩක් කර ගන්න. මම වෙළෙඳ ඇමතිවරයාට කියන්න කැමැතියි, මේක කරන්න දවස් කීයක් යනවාද කියලා කරුණාකරලා call එකක් දාලා අහන්න කියලා. මේක outdated system එකක්ද, මොකක්ද කියලා අහන්න. ඒ මදිවට beneficial ownership එක හොයන්නත් දැන් RoC එකට භාර දීලා තිබෙනවා. Beneficial ownership එක හොයන එක ලෙහෙසි වැඩක් නොවෙයි. මම හිතන විධියට, දැන් දහස් ගණනක් දැඩි අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. මම ගණන හරියට දන්නේ නැහැ, "X" ප්‍රමාණයක් හිර වෙලා තිබෙනවා, මේ වැඩේ කර ගන්න බැරිව.

අනෙක් කරුණ මෙයයි. ගරු ඇමතිවරයා කිව්වා, 2017 Foreign Exchange Act එකේ භූටපටයක් ගැන. මම දැකලා තිබෙනවා, දේශපාලන වශයෙන් මේ ගැන හැමෝම කථා කරනවා. ඇත්තවශයෙන්ම 2017දී ජාත්‍යන්තරව පිළිගත්තා, මේක criminal offence එකක් නොවෙයි කියලා. Foreign Exchange Act එක යටතේ මොකක් හරි offence එකක් තිබෙනවා නම් ඒක control සම්බන්ධව නොවෙයි, management සම්බන්ධවයි කියලා පිළිගත්තා. ඒ නිසා තමයි ඒක 2017දී civil offence එකක් හැටියට පරිවර්තනය කරලා තිබෙන්නේ. මටත් මතකයි, පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට ගෙන්වා AG's Department එකෙන් කරපු explanation එකේදී මේ සම්බන්ධව ලොකු සාකච්ඡාවක් තිබුණු බව. හැබැයි, 2019 වසර වනකොට දැනගෙන තිබුණා, මේක අස්සෙන් හොරුන්ට රිංගන්න පුළුවන් කියලා. ඒ නිසා 2019දී කැබිනට් මණ්ඩලයට මේක ඉදිරිපත් කරලා approval එක අරගෙන තිබුණා, මේ offences, criminal offences බවට පත් කරන්න අවශ්‍ය නීතිමය වෙනස්කම් කරන්න ඕනෑය කියලා. මේ ගැන අපි හොයා බැලුවා. 2019 වසරේදී මේ සඳහා කැබිනට් මණ්ඩලයේ approval එක ලැබී තිබෙනවා. ගරු අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා, මෙම සංශෝධන ක්‍රියාත්මක කරන්න 2026දීත් නැවත වරක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. මම එතුමාට කියනවා, මේ ගැන හොයලා බලන්න කියලා. මොකද, 2019 වසරේදී Cabinet approval එක ලබා ගැනීම පමණක් නොවෙයි සිදු වුණේ. කැබිනට් මණ්ඩලය එය approve කරලා කෙටුම්පත් පවා සකස් කිරීමට Legal Draftsman වෙත යැව්වා, එම නීතිය සංශෝධනය කරන්න. Legal Draftsmanගෙන් call කරලා අහන්න, ඒ සංශෝධිත නීතිය කෝ කියලා. අවුරුදු 7ක් ගිහිල්ලා තිබෙනවා ද මේ සංශෝධනය ගෙනෙන්න? 2019දී කරපු දෙයක් ගැනයි මම මේ කියන්නේ.

ඊළඟට, enforcement capacity එක ගැනත් කිව යුතුයි. එදා නියෝජ්‍ය පොලිස්පතිතුමා මේ සම්බන්ධව අපට දීර්ඝ පැහැදිලි කිරීමක් කළා. පොලීසියට මේ සම්බන්ධව ක්‍රියාත්මක වන්න නම් ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒකට රජය මැදිහත් වන්න අවශ්‍යයි. පොලීසිය භාර ඇමතිවරයා බලන්න ඕනෑ, මේ වාගේ ගැටලු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ දී ඔවුන්ට අපහසුතා තිබෙනවාද, ඒ අපහසුතා මොනවාද කියලා හඳුනා ගෙන ඒවාට උත්තර දෙන්න. මම නැවත කියන්න කැමැතියි, මෙතැන තිබෙන්නේ නීතිය බලාත්මක කිරීමේ ගැටලුවක් මිස, නීතිය නොමැතිකමේ ප්‍රශ්නයක් නොවෙයි කියන එක. ඒ නිසා අලුතින් නීති ගෙනැල්ලා ආයෙත් මහා විශාල ප්‍රශ්නයකට - මහා ගැටලු ගොඩකට - තල්ලු කරනවා වෙනුවට මේක ක්‍රියාත්මක කරන්න.

අනික් කාරණය මෙකයි. ජාතික ප්‍රතිපත්තියක් අලුතින් ලියන්න ඕනෑ නැහැ, හොරු දූසිමක් නිසා. හොරු දූසිමක් නිසා ජාතික ප්‍රතිපත්ති වෙනස් කරන්න එපා. හොරු අල්ලන්න. දැන් මේකෙදි වෙන්නේ මේකයි. මේ නිසා හරියට import කරන මනුස්සයාට ආයෙත් register වෙන්න වෙනවා නේ. ආයෙත් තැන් තුනක register වෙන්න ගියාම ඒ සඳහා කොච්චර කාලයක් ගත වෙනවාද? කොච්චර cost එකක් ඒ වෙනුවෙන් යනවාද? ඒ ගැන අවධානය යොමු කරවන්න මම කැමැතියි.

අවසාන කාරණය මෙකයි. දැන් එදාට වඩා තාක්ෂණය ගොඩක් ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. ASYCUDA system එකට CusDec එකයි, bank transaction document එකයි synchronize කර ගන්න එච්චර ගැටලුවක් වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේ ගැන කථා කරනකොට මීට වඩා තව ගැටලු සහගත ප්‍රශ්නයක් මතු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, you have only two more minutes of the time allotted to you.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I was given more time, Sir.

Cryptocurrency හරහාත් මේ වංචා වන බව අපට ආරංචි වුණා. දැන් මම එක දෙයක් කියන්න කැමැතියි. මේ දවස්වල LPL කියලා cricket match එකක් ගහනවා. ඒකෙදි MelBet Sri Lanka කියලා company එකක් advertise කරනවා, බෝල දෙකෙන් බෝල දෙකට. මම ඒ ගැන හොයා බැලුවා. ඕනෑ කෙනෙකුට

Google කළොත් ඒ ගැන බලන්න පුළුවන්. MelBet Sri Lanka කියලා company එකක් තිබෙනවා, ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ රූපයකුත් දමාගෙන. මේකේ LPL තිබෙනවා, නොයෙකුත් දේවල් තිබෙනවා. මෙතැන මේ මුදල් එළියට යන එක ගැන නේ කථා කරන්නේ. ඩොලර් 50,000ක් එළියට ගියා ලු. ඉතින්, ඒකට නීතිය වෙනස් කරන්න හදනවා. දැන් මෙතැනින් ඩොලර් කී දාහක් පැයකට එළියට යනවා කියලා හිතනවාද? දවසකට ඩොලර් කී දාහක් එළියට යනවා කියලා හිතනවාද? මේක register කරලාද? ලංකාවේ ජාතික කොඩිය එහෙම කොහොමද දමන්නේ? කොහොමද මේක sponsor කරන්නේ? ඒ ගැන අපි හොයලා බැලුවා. IRD එකෙන් අපි ඇහුවා, මේගොල්ලන් tax ගෙවන්න register වෙලාද කියලා. "නැහැ" කියලා කිව්වා. මේගොල්ලන්ට කැසිනෝ ගහන්න ලයිසන් තිබෙනවාද කියලා ඇහුවාම "නැහැ" කියලා කිව්වා. මේකේ ක්‍රිකට් තිබෙනවා, කැසිනෝ තිබෙනවා. නොයෙකුත් දේවල් තිබෙනවා. ඉතින්, ඩොලර් එළියට යනවා නම් මේවා ගැන හොයන්න ඕනෑ නැද්ද?

අපි අවුරුදු ගණනක් තිස්සේ සටන් කරනවා, casino Regulator කෙනෙක් ගෙනෙන්න. ඊට පස්සේ සෙල් එකක් ගහලා Regulator කෙනෙක් ගෙනාවා. හැබැයි, Regulation නැහැ. Regulator කෙනෙක් ගෙනැල්ලා මොනවා කරන්නද Regulation නැත්නම්? Regulations නැති Regulator කියන්නේ දත් නැති, - මොකක්ද ඒකට කියන්නේ? It has no teeth; you cannot bite because there is no teeth. අපි ඒ ගැන හොයා බැලුවා. අපි Attorney-Generalට ලියුමක් යැව්වා. ඒගොල්ලන් කියනවා, මේකට තව කල් යනවා, අපි මේ වැඩේ කරනවා, Regulations ගෙනෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Gambling Regulatory Authority Act, No. 17 of 2025 කියවන්න. ඒකේ Section 44හි මෙන්න මෙහෙම දෙයක් තිබෙනවා:

> "A person who advertises any gambling carried on in contravention of the provisions of this Act commits an offence……"

අවුරුදු ගණනක් හිරේ දමන්න පුළුවන් කියලා එහි තිබෙනවා. ආණ්ඩුව කියනවා, අපට කල් යනවා, අපි Legal Draftsman's Department එකට දුන්නා, අරක යනවා, මේක යනවා කියලා. ජූනි මාසයේ 30වැනි දා වනකොට ගෙනෙනවා කිව්වා. නමුත්, මේ වනතුරු ගෙනැල්ලා නැහැ. කරුණාකරලා Section 76(1) කියවන්න. Section 76(1)හි මෙහෙම තිබෙනවා:

> "The Minister may make regulations in respect of any other matter which is required by this Act to be prescribed or in respect of which regulations are authorized or required to be made."

Section 76(2) (f)හි තිබෙනවා, restrictions on advertising gambling කියලා. ආණ්ඩුවට නිකම් ඇඟ බේරාගෙන ෂේප් වෙන්න බැහැ. ආණ්ඩුවට කියන්න බැහැ, අයියෝ, මේකට කල් යනවා කියලා. හැම දාම ඕක නේ කියන්නේ, අද නොවේ හෙට. අවුරුදු 4ක් තිස්සේ මේක කියනවා. මේක නිකම් මගේ පෞද්ගලික සටනක් වාගේ දෙයකට පරිවර්තනය වෙලා තිබෙනවා. මට එහෙම ඕනෑ නැහැ. මේක මගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මට කැසිනෝ ගැහුවත් එකයි, නැතත් එකයි. අවුලක් නැහැ. හැබැයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විධියට අපට ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඩොලර් 50,000ක් ගියා කියලා ජනාධිපතිතුමා ඇවිල්ලා සති දෙකෙන් නීතිය වෙනස් කළා. එතකොට මේක වෙනවා ඇස් පනාපිට පෙනෙනවා නේ. ඇයි, ඔයගොල්ලන්ට මේවා පෙනෙන්නේ නැද්ද? මේක කියවලා නැද්ද? ඉංග්‍රීසි තේරෙන්නේ නැද්ද? සිංහල තේරෙන්නේ නැද්ද? ඇයි, මේක වෙන්නේ? මම ඔබතුමාට නැවතත් කියනවා, හොරු අපේ රටේ සල්ලි වංචා කරලා එළියට ගෙනයන එක අපි නවත්වන්න ඕනෑය කියන එක. ඒක ඇත්ත.

Give me just a minute more, Sir.

ඒකට මේ නීතිය ගෙනෙනවා. මේ නීතිය තද වැඩියි, හොරුන්ට ගෙනෙන නීතිය අනෙක් අයටත් පනවන්න ඕනෑ නැහැ. නමුත්, අද මේ online කැසිනෝකාරයෝ හැම තැනම ඉන්නවා.

අනෙක් කාරණය මේකයි. ජූලි මස 01වැනි දා ඉඳලා පිට රටකින් සේවා ගෙනැල්ලා මෙහේ නිෂ්පාදනයක් කරනවා නම් VAT එකට register වෙන්න ඕනෑ. ඒවාත් වෙලා නැහැ. ඔබතුමන්ලාට ඒවා පෙනෙන්නේ නැද්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, I think you should wind up now.

I shall call upon the next Speaker. The Hon. Nishantha Jayaweera. You have ten minutes.

[අ.භා. 12.23]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, රජයක් විධියට අපේ රජයේ ප්‍රධානම අභිලාෂය සහ අපේක්ෂාව වන්නේ මේ අවිධිමත් ආර්ථිකය විධිමත්, නියම ආර්ථිකයක් බවට පත් කරලා, ව්‍යාපාරිකයන්ට සමාන අවස්ථාව ලබා දීමයි කියන එක. ඒ කාරණය සඳහා තමයි අද දින මේ රෙගුලාසි පාර්ලිමේන්තුවේ සම්මත කරලා, බලාත්මක කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයනකරුවෙක් ඉන්නවා නම් ඔහු මේ රටට භාණ්ඩ ආනයනය කරනකොට ඒ ආනයනය කරන භාණ්ඩ වෙනුවෙන් ගෙවීම් කරන්න ක්‍රම කිහිපයක් තිබෙනවා. පළමුවැනි ක්‍රමය තමයි, ණයවර ලිපියක් මඟින් ඒ ආනයනයට අවශ්‍ය කටයුතු සිද්ධ කරලා, ඒ ආනයනයට අදාළ භාණ්ඩ නැව්ගත කරන අවස්ථාවේදී ඒ ගෙවීම කරන එක. දෙවැනි ක්‍රමය තමයි, delivery and payment කියන එක. ඒ කියන්නේ භාණ්ඩ ලංකාවට ආවාට පස්සේ ඒ ගෙවීම කරන්න පුළුවන් කියන එක. අනෙක් ක්‍රමය තමයි, Telegraphic Transfer කියන එක. ඒ කියන්නේ, ප්‍රතිමුඛ ගෙවීම් කියන එක. ඒ ක්‍රමය යටතේ සිද්ධ වන්නේ භාණ්ඩ ආනයනය කරන්න කලින් මුදල් ටික ඒ ආනයනකරු විසින් විදේශයට ප්‍රේෂණය කරන එකයි. ඒක තමයි තුන්වැනි ක්‍රමය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, පසුගිය වකවානුවේදී අපේ රටේ ඩොලරයට විශාල තෙරපුමක් ආපු බව. එලෙස ආපු තෙරපුම තුළදී රුපියල යම් ප්‍රමාණයකට අවප්‍රමාණ වුණා. මේ පිළිබඳව අපි විශ්ලේෂණය කරගෙන යන අවස්ථාවේදී දැක්කා, මේකට ප්‍රධානම හේතුව වුණේ පසුගිය වකවානුවේදී අපේ ආනයන බිල වැඩි වීම බව. සාපේක්ෂව විශාල වශයෙන් එය වැඩි වෙන්න ගත්තා. ඒකට බලපාන ප්‍රධාන කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මැද පෙරදිග යුද්ධය නිසා අපි ඉන්ධන වෙනුවෙන් දරන වියදම ගොඩක් වැඩි වුණු එක. ඒ නිසා

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ඉන්ධන වෙනුවෙන් ගෙවන්න වුණු ඩොලර් ප්‍රමාණය වැඩි වුණා. ඊට අමතරව වාහන ආනයනය විශාල වශයෙන් සිද්ධ වුණා. ඒ වෙනුවෙනුත් ඩොලර් විශාල ප්‍රමාණයක් පිට රටට යන්න පටන් ගත්තා. ඊට අමතරව අනෙක් ආනයනත් සාපේක්ෂව විශාල වශයෙන් වැඩි වුණා. ශ්‍රී ලංකා රේගුව විසින් මේ පිළිබඳව කරන ලද විශ්ලේෂණයේදී විශේෂයෙන් සොයා ගත්තා, මේ භාණ්ඩ ආනයන වෙනුවෙන් Telegraphic Transfer - TT - යටතේ කරන ලද ගෙවීම්වලට අදාළව යම් හඳුනා ගත් පිරිසක් විසින් අපේ ඩොලර් ප්‍රමාණය, එහෙම නැත්නම් අපේ විදේශ විනිමය පිට රටට ප්‍රේෂණය කරනවා, නමුත් එලෙස ප්‍රේෂණය කළාට ඒ විදේශ විනිමය ප්‍රේෂණය කරන ප්‍රමාණයට අදාළ භාණ්ඩ ලංකාවට පැමිණිලා නැහැ කියලා. අන්න ඒ ඔස්සේ සිදු කරන ලද විමර්ශන මඟින් මේ කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් යොමු කරලා තිබෙනවා. ඒ ගැන වැඩිදුරටත් විමර්ශන කරද්දී තවත් කණ්ඩායම් හඳුනා ගත්තා, අපේ රටෙන් Telegraphic Transfer - TT - ක්‍රමය යටතේ විදේශ විනිමය වෙනත් රටවලට යවා තිබෙනවා, නමුත් ඒවාට අදාළ භාණ්ඩ ඇවිල්ලා නැහැ කියලා.

සාමාන්‍යයෙන් දැනට පවතින නීතිය යටතේ තිබෙන්නේ මේකයි. Telegraphic Transfer - TT - ක්‍රමය යටතේ අපේ ඩොලර් ප්‍රමාණයක්, එහෙම නැත්නම් අපේ විදේශ විනිමය පිට රටට යැව්වොත් එසේ යවා දින 180ක් තුළදී අපේ රටට ඒ භාණ්ඩ එන්න ඕනෑ. ඒක කාණ්ඩ තුනකට බෙදෙනවා. දින 180ක්, දින 365ක් සහ දින 700ක් කියලා. සාමාන්‍ය භාණ්ඩයක් වුණොත් දින 180ක් ඇතුළතදී අපේ රටට ඒ භාණ්ඩ ප්‍රමාණය එන්න ඕනෑ. නමුත්, අපේ විදේශ විනිමය එහෙම වෙනත් රටවලට යවලා, ඒක නොලැබීම තමයි විශේෂ ප්‍රශ්නය වුණේ. ඒකෙන් අපේ රුපියල අවප්‍රමාණය වීමටත් යම් ප්‍රමාණයකට බලපෑමක් ඇති වෙනවා. මේ ඔස්සේ සිදු කරන විමර්ශනවලදී විශේෂයෙන්ම මේ වාගේ තත්ත්වයක් ඇති වෙන්න අදාළ හේතු විධියට ප්‍රධාන හේතු තුනක් හඳුනා ගෙන තිබෙනවා. පළමුවැනි එක තමයි, මේ ආනයන සිදු කරන අවස්ථාවේදී සමාගමක් විධියට ලියාපදිංචි වෙලා තමයි ආනයන සිදු කරලා තිබෙන්නේ කියන එක. ඒ කියන්නේ, කරන ලද විමර්ශනවලදී හෙළිදරව් වුණේ සමාගම් විධියට ලියාපදිංචි වෙලා මේ ආනයන සිදු කරලා තිබෙනවාය කියන එකයි. නමුත්, මේ සමාගම් ලියාපදිංචි කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් විධිමත් සොයා බැලීමකින් තොරව ඒවා ලියාපදිංචි කිරීම නිසා ව්‍යාජ සමාගම් බිහි වෙලා තිබෙනවා. ඉතින් ඒ තත්ත්වය හඳුනාගෙන අපි මෑතකදී දේශීය ආදායම් පනතටත් සංශෝධනයක් ගෙනාවා, සමාගමක් ලියාපදිංචි වෙනවා නම් ඒ සමාගම ලියාපදිංචි වෙලා මාස තුනක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු ගෙවන්නා හැඳින්වීමේ අංකයක් අරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙලා, ආදායම් බදු ලිපිගොනු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන්න ඕනෑය කියලා. අන්න ඒ වාගේ නීතිමය සංශෝධන අපි ගෙනාවා. ඒ කාරණය පළමුවැනි දුර්වලතාව විධියට අපි හඳුනාගෙන තිබෙනවා.

දෙවැනි දුර්වලතාව විධියට හඳුනාගෙන තිබෙන්නේ, බැංකු විසින් සමාගම් වෙනුවෙන් ගිණුම් විවෘත කිරීමේදී විධිමත් සොයා බැලීමකින් තොරව බැංකු ගිණුම් විවෘත කිරීම. එවැනි අවස්ථා හමු වෙලා තිබෙනවා. ඊට අමතරව, ආනයන සඳහා යන මුදල්වලට අදාළ භාණ්ඩ ලංකාවට ආවාද කියලා රේගුව සහ මහ බැංකුව විසින් විධිමත් පරීක්ෂාවක් මෙතෙක් කල් සිදුවෙලා නැහැ. ඒ ප්‍රධාන අඩුපාඩු තුන හඳුනාගෙන, ඒ අඩුපාඩු තුන වළක්වන්න තමයි මේ එක නීතියක් ගෙනෙන්නේ.

දැන් මේ පනවන රෙගුලාසි යටතේදී සිද්ධ වෙන්නේ මොකක්ද? ආනයනකරුවෙක් යම් භාණ්ඩයක් ආනයනය කරන්න කලින් රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙන්න ඕනෑ. රේගුවේ ලියාපදිංචි වෙලා බැංකුවට ගියාම ඒ බැංකුවෙන් ඒ සෑම ආනයනයක් වෙනුවෙන්ම අනන්‍ය වූ අංකයක් - unique number එකක් - දෙනවා. ඒ වාගේම ඒ ආනයනකරුගේ විස්තර බැංකුවට ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම මුදල් යවන්නේ කොහාටද, ඒ ආනයනය ලංකාවට ලැබෙයි කියා බලාපොරොත්තු වන්නේ කවදාද යනාදී විශේෂිත තොරතුරු ප්‍රමාණයක් බැංකුවට ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ඒ ලබාදෙන තොරතුරු බැංකුව විසින් රේගුව වෙත ලබා දෙන්න ඕනෑ. ඒ ලබා දීමෙන් අනතුරුව රේගුව විශේෂ අධීක්ෂණයකට ලක් කරනවා, ඒ සියලුම ආනයන නියමිත දිනවලදී භාණ්ඩ විධියට ලංකාවට ඇවිල්ලා තිබෙනවාද, නැද්ද කියලා. එතකොට විධිමත් අධීක්ෂණයකට ලක් වෙනවා, මේ කර තිබෙන සංශෝධන යටතේ. ඒක තමයි මෙහි එක බලාපොරොත්තුවක් වෙන්නේ.

මෙතැනදී විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විපක්ෂය පැත්තෙන් මතු වුණා, මෙන්න මේ යටතේදී ආනයනකරුවන් විශාල කරදරයකට ලක් වෙලා තිබෙනවා කියලා; තැන් කිහිපයක ලියාපදිංචි වෙන්න ඕනෑ, ඒ නිසා විශාල කරදරයකට ලක් වෙලා තිබෙනවාය කිව්වා. අපි දන්නවා, මුල් අවස්ථාවේදී ආනයනකරුවන් යම් අපහසුතාවකට පත් වුණා කියලා. නමුත් ඒ අපහසුතාව හඳුනාගෙන රේගුව කඩිනමින් ක්‍රියාත්මක වෙලා, තමන්ගේ තිබෙන දත්ත පද්ධතිය පාවිච්චි කරලා ඒ දත්ත පද්ධතිය කෙළින්ම බැංකුවලට ලබා දීලා, ඒ කටයුතු වඩාත් විධිමත් කරලා තිබෙනවා. ඒ වාගේම බැංකුවලින් ලැබෙන තොරතුරු ආසිකුඩා පද්ධතිය හරහා ආපසු ලැබෙන්නත් අවශ්‍ය කටයුතු මේ වෙනකොට කරලා තිබෙනවා. ඒ යටතේ නවීන තාක්ෂණය යොදාගෙන, ආනයනකරුවන් අපහසුතාවට පත්වීම වළක්වන්න කටයුතු කරලා තිබෙනවා. ඒ ක්‍රියාවලිය මේ වෙනකොට ඉතාම smooth විධියට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඉතින් මට කියන්න තිබෙන්නේ, එතැනදී ආනයනකරුවන් කිසිම අපහසුතාවකට පත් වෙලා නැහැ කියන එකයි. ඒ ක්‍රියාවලිය විධිමත් වෙලා තිබෙනවා.

දෙවැනි රෙගුලාසිය ගැන බැලුවොත්, අපේ රටේ තිබෙන ලෝහ ද්‍රව්‍ය - ඇලුමිනියම්, යකඩ, පිත්තල, වීනච්චට්ටි වාගේ ලෝහ ද්‍රව්‍ය - වෙනත් රටවලට අපනයනය කිරීම සම්බන්ධව 2020දී නීතියක් - රෙගුලාසියක් - පැනවුණා. ඒ රෙගුලාසිය අනුව එහෙම දෙයක් අපනයනය කරනවා නම්, විශේෂ අපනයන බලපත්‍රයක් ලබාගෙන තමයි අපනයනය කරන්න ඕනෑ. නමුත් ඒ නීතිය තිබෙද්දීත් අපි දැක්කා මෑත කාලීනව ඒ නීතියට බාහිරව, වෙනත් අනුරූ හදලා, ඒ කියන්නේ ඒ ලෝහ ද්‍රව්‍ය වෙනත් ස්වරූපයකට භාජන කරලා අපනයනය කරනවා. එහෙම අපනයනය කරන අවස්ථාවන්ට අදාළ HS codes 15ක් හඳුනාගෙන තිබෙනවා. මේ සංශෝධනයෙන් වෙන්නේ ඒ හඳුනා ගන්නා ලද HS codes 15ට අදාළව යම්කිසි ලෝහයක් අපනයනය කරනවා නම්, ඒ අපනයනය කරන ලෝහයට අදාළව අපනයනය සඳහා අපනයන බලපත්‍රයක් ලබා ගන්න ඕනෑ. මේ රෙගුලාසි පනවන්න විශේෂ වූ හේතුව තමයි අපේ දේශීය කර්මාන්තකරුවන්ට තමන්ගේ ලෝහ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය සපයා ගැනීමට විධිමත් වටපිටාවක් සකස් කර දීම. ඉතින් ඒ සියලු දේවල්වලින් අපේ අවසාන බලාපොරොත්තුව වෙන්නේ, අපේ රටේ නිෂ්පාදකයන්ට අවශ්‍ය වටපිටාව සකස් කරදීම, වඩාත් හොඳින් තමන්ගේ නිෂ්පාදන කරගෙන යන්න අවස්ථාව ලබා දීම සහ අපේ ආර්ථිකය සංවිධිත ආර්ථිකයක් බවට පත් කිරීම. ඒ තුළින් වඩාත් හොඳ ආර්ථික වර්ධනයක් ලබා ගැනීම අපේ අවසාන බලාපොරොත්තුව බව සඳහන් කරමින්, මාගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.00]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கிய மைக்கு நன்றி கூறுகின்றேன். இன்றைய விவாதத் தலைப்புக்கு அப்பால் சென்று, எமது தமிழ் சமூகம், எமது மாவட்டம் சார்ந்த சில விடயங்களை இங்கு முன்வைக்கலாமென நினைக்கின்றேன்.

இன்று கனத்த இதயத்துடன் பேச வேண்டியிருக்கிறது. 1983ஆம் ஆண்டு யூலை மாதம் 23ஆம் திகதி தமிழ் மக்களுக்கு மிகப் பெரிய கொடுமை இழைக்கப்பட்டது. கடந்த கால வரலாறுகள் நம்பிக்கையீனத்தையும் விரக்தியையும் தமிழ் மக்களின் மனங்களில் விதைத்திருக்கின்றன. உண்மையிலேயே தமிழ் மக்கள் பொருளாதார, சமூக, அரசியல் ரீதியாகப் படுகொலை செய்யப்பட்ட நிகழ்வாகவே அந்த யூலை 23ஆம் திகதி இடம்பெற்ற நிகழ்வு அமைந்திருந்தது. இனப்படு கொலையானது, 1983ஆம் ஆண்டு யூலை மாதம் தொடங்கி முள்ளிவாய்க்கால் வரை நீட்சி பெற்றிருக்கின்றது. அதற்கு நீதி வேண்டி நிற்கின்ற தமிழ் சமூகத்துக்கு இந்த நாட்டில் வழங்கப்பட்ட நீதி என்ன? அவர்களுக்கு நீதி வழங்கப் பட்டதாகச் சரித்திரமும் இல்லை; வழங்கப்படுவதற்கான அறிகுறிகளும் இல்லை. இந்த நிலையில், தமிழ் மக்கள் எந்த நம்பிக்கையில் பொருளாதாரத்தைக் கட்டியெழுப்பும் பணியில் பங்கெடுப்பது? என்ற மிகப் பெரிய வினா எழுகின்றது. காலங்காலமாக இழைக்கப்பட்ட அநீதிகளுக்கு உள்நாட்டிலும் சர்வதேச ரீதியிலும் நீதி கிடைக்கப்பெறாத நிலையிலே இன்று இங்கு தமிழ் சமூகம் வாழ்ந்துகொண்டு இருக்கின்றது.

செம்மணியில் 400க்கும் மேற்பட்ட மக்கள் படுகொலை செய்யப்பட்டதற்கான ஆதாரங்கள் இன்று கிடைத்திருக் கின்றன. அது தொடர்பான பகுப்பாய்வை நீதியான முறையில் வெளிநாடுகளின் உதவிகளைப் பெற்று மேற்கொள்வதற்கான சந்தர்ப்பம்கூட மறுக்கப்பட்ட நிலையே காணப்படுகின்றது. இவ்வாறான நிலையில், தமிழ் மக்களின் அரசியல், பொருளாதாரம், சமூக, கலாசார விழுமியங்களைக் கட்டியெழுப்புவதற்காக சமகாலத்தில்கூட பல நம்பிக்கை யீனங்களை நாம் சந்திக்கவேண்டி இருக்கின்றது. மிக முக்கியமாக, வடக்கு, கிழக்கு தமிழ் மண்ணில் 'தொல்பொருள்' என்ற ரீதியில் பல இடங்களில் பௌத்த விகாரைகளின் கட்டுமானங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அவற்றுக்கு பௌத்தம் சார்ந்து பல ஆதாரங்கள் காட்டப்பட்டாலும், 'தொல்பொருள்' என்ற அடிப்படையில் அவற்றைப் பாதுகாப்பதை விடுத்து, அவை கடந்த காலங்களில் எவ்வாறு தமிழ் மக்களின் மனங்களில் சந்தேகங் களையும் விரக்தியையும் உருவாக்கியதோ, அதுபோன்றதொரு நிலை இன்றும் உருவாகுவதற்குரிய சூழ்நிலை ஏற்பட்டுக் கொண்டு இருக்கின்றது.

மேலும், தமிழ் மக்களின் பொருளாதாரத்தை உறுதி செய்வதற்கான எந்தச் செயற்றிட்டமும் இல்லை. மட்டக் களப்பில் மேய்ச்சல் தரைக்காக கால்நடை வளர்ப்போர் ஆயிரம் நாட்களையும் தாண்டி போராடிக்கொண்டு இருக்கின்றார்கள். அயல் மாவட்டங்களில் இருப்பவர்கள் நீதிமன்றத் தீர்ப்புக்கு எதிராக அந்த நிலங்களில் அடாத்தாகக் குடியேறி, அவர்களின் காணிகளைக் கையகப்படுத்தி இருக்கின்றார்கள். இவ்வாறான சம்பவங்கள் நிகழ்கையில், எவ்வாறு தமிழ் மக்கள் இந்த அரசை நம்பி தங்களுடைய பங்களிப்பைச் செய்வது? என்ற கேள்வி எழுகின்றது. தமிழ் பேசும் மக்கள் மிகவும் உறுதியாக இந்த நாட்டின் பொருளாதார வளர்ச்சிக்கு உழைக்க வேண்டுமென்றால், அவர்களுடைய சமூக, கலாசார, பொருளாதார விடயங்களில் நம்பிக்கையை ஏற்படுத்தும் வகையிலான செயற்பாடுகளை மேற்கொள்ள வேண்டும். இவ்வாறான சூழ்நிலையிலே சட்டமூலங்கள் கொண்டுவரப்படுகின்றன. மிக முக்கியமாக நேர்மையையும் நியாயத்தையும் நிலைநிறுத்தக்கூடிய வகையில் கொண்டுவரப்படும் சட்டமூலங்களை நாங்கள் வரவேற்கின்றோம். அதேநேரத்தில், யூலை 23இல் தமிழ் மக்களுக்கு தொடர்ச்சியாக நடந்த அநியாயங்களுக்கு நீதி வழங்கப்பட வேண்டியது மிக முக்கியமானது. எனவே, சர்வதேசத்தின் தலையீட்டுடன் நீதியைப் பெற்றுக் கொடுப்பதை மறுப்பதற்கான சூழ்நிலையை உருவாக்காமல், அந்த மக்களிடத்தில் நம்பிக்கையை ஏற்படுத்தி, அவர்களின் வாழ்வாதாரத்தையும் பொருளாதாரத்தையும் அரசியல் உரிமை களையும் உறுதிப்படுத்துவதற்கு ஒத்துழைப்பையும் ஆதரவையும் வழங்குமாறு கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.05]

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මේ අවුරුද්දේ ජුනි මාසයේ 15වන දාත්, ජුනි මාසයේ 18වන දාත් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍ර දෙකක පළ කරන ලද රෙගුලාසි අනුමත කර ගැනීමේ විවාදයටයි අප අද මේ සම්බන්ධ වෙලා ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවැනි රෙගුලාසි අප අලුතින් එකතු කර ගත යුත්තේ ඇයි? අපි කවුරුත් දන්නවා, ආනයන හා අපනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වන

[ගරු ආර්.ජී. විජේරත්න මහතා]

භාණ්ඩ මොනවාද කියා 2017 නොවැම්බර් 09වන දා අතිවිශේෂ ගැසට් පත්‍රයක් මඟින් ඉදිරිපත් කර තිබුණු බව. මෙතෙක් පැවැති අණ පනත් තුළ යම් යම් අඩුපාඩු තිබෙන නිසාත්, ඒවා කාලීනව සංශෝධනය විය යුතු නිසාත් තමයි අප මේ පනතත් සංශෝධනය කරන්න අදහස් කළේ. විශේෂයෙන්ම අපනයනවලට අදාළව ගත්තාම, ලෝහ බොර, අළු, අපද්‍රව්‍ය වැනි ලෝහ ආශ්‍රිත අබලි ද්‍රව්‍ය අපනයනය කිරීමේදී පසුගිය කාල සීමාව තුළ විවිධ අක්‍රමිකතා සිදු වූ ආකාරය අපි දැක්කා. එහෙමත් නැත්නම්, වෙනත් HS codes යටතේ අපනයනය කිරීම නිසා අපට අවශ්‍ය අමුද්‍රව්‍ය රට තුළ හිඟයක්ව පවතින තත්ත්වයක් අපි දැක්කා. විශේෂයෙන්ම නිෂ්පාදන කර්මාන්ත පුළුල් වීමත් එක්ක ලෝහමය අමුද්‍රව්‍ය අපට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. එය එසේ තිබියදී අපේ ලෝහමය අමුද්‍රව්‍ය ඉතාම අඩු මුදලට පිට රටට යවලා, නැවත විශාල මුදලක් වැය කරලා අමුද්‍රව්‍ය ආනයනය කරන්න අපට සිදු වෙලා තිබෙනවා. එම නිසා, විශේෂයෙන් නිෂ්පාදන ආර්ථිකයක් පිළිබඳව කථා කරන ආණ්ඩුවක් - රජයක් - විධියට අපි කල්පනා කළා, එය පුළුල් කිරීමට නම් ඒ සඳහා අලුත් රෙගුලාසි ගේන්න ඕනෑ කියලා. අන්න ඒ අනුව අපි දැන් කොන්දේසි ගණනාවක් පනවා තිබෙනවා. එතකොට, මින් ඉදිරියට එම ආනයන සිදු කරද්දී, ආනයනකරුවාගේ තොරතුරු විශාල ප්‍රමාණයක් රේගු දෙපාර්තමේන්තුවට ලබා දිය යුතු වෙනවා. ඒ වාගේම, රේගු දෙපාර්තමේන්තුවේ නිසි ලෙස ලියාපදිංචි විය යුතු වෙනවා. පසුගිය කාල සීමාව තුළ එහි හරි නියාමනයක් සිදු නොවුණු නිසා තමයි මෙවැනි අක්‍රමිකතා බොහෝමයක් සිදු වෙලා තිබෙන්නේ. ඒ හේතුව නිසා තමයි, අපේ කර්මාන්ත පද්ධතිය පුළුල් කර ගැනීමට බාධා ඇති වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම නිසා මේ අණ පනත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළාට පසුව, එක පැත්තකින් අපේ අපනයන යම් ප්‍රමාණයකට පාලනය කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ කියන්නේ, රටට අවශ්‍ය අමුද්‍රව්‍ය අපේ රට තුළ රඳවා ගන්න පුළුවන් වෙනවා.

2012දී අතිවිශේෂ ගැසට් පත්‍රයක් මඟින් ආනයනය සඳහා පෙර ගෙවීම් ක්‍රමයක් ඇති කර තිබුණා. ඒ පෙර ගෙවීම් ක්‍රමයේ තිබුණු අඩුපාඩු නිසා තමයි, පසුගිය කාලයේ අපි විවිධ අවස්ථාවල හඳුනා ගත් ආකාරයට අපේ රටේ ඩොලර් පිට රටට ගිහිල්ලා තිබුණේ. අන්න ඒ නිසා තමයි මේ කොන්දේසි පනවා තිබෙන්නේ. මේ කොන්දේසි පැනවීම තුළින් ඒ නීති රාමුව තුළ තිබුණු නොයෙකුත් හිඩැස් ආවරණය කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඇත්තටම, ආනයන හා අපනයන (පාලන) පනතට පමණක් නොවෙයි, අපේ රටේ පවතින පැරණි බොහෝ අණ පනත් කාලීනව සංශෝධනය විය යුතුව තිබෙනවා. ඒ නිසාම තමයි අපි මේ වන විට පනත් විශාල ප්‍රමාණයක් සංශෝධනය කරමින් පවතින්නේ. ඒ විතරකුත් නොවෙයි, රටක් ආර්ථික වශයෙන් සංවර්ධනය වෙනකොට, අලුත් අවශ්‍යතා පැන නැඟෙනකොට, නිෂ්පාදනය පුළුල් වෙනකොට, ඒ සඳහා ආයෝජකයෝ වැඩි ප්‍රමාණයක් දායක කර ගන්න ඕනෑ වෙනකොට පැරණි අණ පනත් සංශෝධනය කර ගනිමින්, ඒවාට නව රෙගුලාසි එකතු කර ගනිමින්, නව චක්‍රලේඛ නිකුත් කරමින් වඩාත් සංවිධිත ආකාරයට මේ ක්‍රියාවලිය සිද්ධ කර ගැනීම තමයි අපේ අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ. නමුත් මේක යම් පුද්ගලයෙකුට හෝ යම් කණ්ඩායමකට හෝ එරෙහිව ක්‍රියාත්මක කරන එකක් විධියට ලඝු කරන්නට මීට පෙර අදහස් දැක්වූ මන්ත්‍රීවරයා කටයුතු කළා. තවත් නීති පනවලා සම්බාධක පැනවීමක් කරනවා වාගේ කතන්දරයක් එතුමා කිව්වා. එහෙම එකක් නොවෙයි, වඩාත් ක්‍රමවත්ව, නිසි පිළිවෙළකට මේ කටයුතු කිරීම තමයි අපේ අරමුණ වී තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, අද සම්මත කර ගත්තාට පස්සේ නිසි ක්‍රමයකට අනුව මේ ආනයන අපනයන පාලන පනතේ රෙගුලාසි ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් වෙයි කියා. සමහර විට මෙයින් පසුවත් යම් අඩුපාඩුකම් වෙන්න පුළුවන්කම තිබෙනවා. එතකොට ඒ ඇති වන තත්ත්වය තුළ ඒ අත්දැකීම් ලබා ගනිමින් අපට පුළුවන්කම තිබෙනවා, තවත් වඩාත් දියුණු තත්ත්වයට මේක ගේන්න. ඒක තමයි සාමාන්‍ය ස්වභාවය. මානව සමාජය තුළ, මානව සමාජයේ සංවර්ධනය තුළ අපි අතීතය පුරාම කරපු දේ ඒක තමයි. අපි ලබා ගන්නා අත්දැකීම් තුළින් තමයි ඊට ප්‍රතිචාර දක්වන්නේ. පසුගිය කාලසීමාව තුළ පැවතිච්ච අණ පනත්වල තිබුණු අඩුපාඩුකම් පිළිබඳව දැන් නිසි ලෙස අධ්‍යයනය කරමින් තමයි අපි මේ කටයුත්ත සිද්ධ කරන්නේ.

විශේෂයෙන්ම ආනයනකරුවන්ට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය දැනුම් දීම් කරලා තිබෙනවා. ඒ ආනයනකරුගේ හඳුනා ගැනීමේ අංකය අනිවාර්යය කරලා තිබෙනවා. ඔහුගේ ලිපිනය හැටියට ස්ථිර ලිපිනයක් සඳහන් කරන්න ඕනෑ. ප්‍රතිලාභියාගේ ගිණුම් අංකය නිවැරදිව දක්වන්න ඕනෑ. ඒ බැංකු කේතය, ශාඛා කේතය, විදේශ මුදල් වර්ගය කුමක්ද, ගෙවීමේ ක්‍රමය මොන ආකාරයටද වෙන්නේ, ප්‍රේෂණය සිදු කළ දිනය කුමක්ද, ඉන්වොයිස් අංකය හරියටම මොකක්ද කියන මෙන්න මේ වාගේ තොරතුරු රාශියක් අපි එකතු කරනවා. ඒ වාගේම අපි ආනයනකරුවන්ගෙන් ඉල්ලීමකුත් කරනවා. මේක ඔබට කරදරයක් කියලා හිතන්න එපා. මොකද, අපි මේ කරලා තිබෙන්නේ මේ කටයුතු වඩාත් ක්‍රමවත් කරන එක; විධිමත් කරන එක. එතකොට ඒ තුළින් වඩාත් කාර්යක්ෂම ආකාරයට මේ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබෙනවා කියන එක තමයි අවධාරණය කරන්න ඕනෑකම තිබෙන්නේ.

ඒ වාගේම විශේෂයෙන් කියන්න ඕනෑකම තිබෙනවා, මේ කටයුතු කරමින් ඇත්තටම අපට ඕනෑකම තිබෙන්නේ නීතිය හරියටම බලාත්මක කරලා නීතිගරුක රටක් හදන්නයි කියන එක. ඒ සඳහා තමයි මේ වෑයම දරන්නේ. අපි දැක්කා, මේක වැරදි විධියට අර්ථකථනය කරමින් විපක්ෂයේ කණ්ඩායම් නොයෙකුත් විධියට ජනතාව නොමඟ යවන ප්‍රකාශ කළ බව. පසුගිය දවසක විපක්ෂ මන්ත්‍රීවරයෙක් කියනවා, "අපි දංගෙඩියට යන එක වළක්වන්න නම් වහාම අපි එකට එකතු වෙන්න ඕනෑ" කියලා. දංගෙඩියට යෑම තීන්දු කරන්නේ උසාවියෙන් නම්, ඒක උසාවියෙන් බේරා ගන්න ඕනෑ කාරණයක්. ඒ නිසා ඇත්තටම ඒකට අවශ්‍ය මැදිහත්වීම නොකර, නැත්නම් නීතියට අනුව කටයුතු නොකර ජනතාව තුළ වැරදි මත ඇති කරමින්, ජනතාව කුලප්පු කරවමින් කටයුතු කරන ස්වභාවයක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි නියෝජනය කරන හඟුරන්කෙත ප්‍රදේශයේ, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවට අයත් කඩ 12ක් පසුගිය කාලයේ අනවසරයෙන් පාවිච්චි කළා. ඒකට අදාළ නඩු කටයුතු සිද්ධ වුණා. දැන් අන්න නඩු තීන්දුව ලැබිලා තිබෙනවා, ඒ කඩවල ඉන්න පුද්ගලයන් අයින් වෙන්න ඕනෑ කියලා. මෙන්න, නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ නිසා අපට ඕනෑකම තිබෙන්නේ, නීතිය හරියට ක්‍රියාත්මක කරලා නීතිගරුක රටක් හදන්නයි. මේ ගෙනෙන වෙනස්කම් තුළින් අපි බලාපොරොත්තු වෙන්නෙත් ඒක. ඒ නිසා විශේෂයෙන් ආනයනකරුවන්ගෙන් සහ අපනයනකරුවන්ගෙන් ඉල්ලා සිටිනවා, අපි සියලුදෙනාම එකට එකතු වෙලා නීතියට අනුව මේ කටයුතු කරන්න මැදිහත් වෙමු කියලා. එහෙම වුණොත් අපට ඒකේ ප්‍රතිලාභ ජනතාවට හරියටම අත්පත් කරලා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.14]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්තමාන ආර්ථිකය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, අදටත් මේ රටේ ගොවි ජනතාවට සිදු වෙන බේදවාචකය පිළිබඳව අපි හැමෝම කනගාටුවට පත් වෙනවා. අපට මතකයි, වර්තමාන රජයේ වග කිව යුතු මැති ඇමතිවරු ගොවි බිමට බැහැලා ගොයම් කකා පොරොන්දු වුණා, වීවලට 150ක සහතික මිලක් ලබා දෙනවා කියලා. දැන් කියනවා 120ක් ලබා දෙනවා කියලා. අද වන විටත් රජය මිලදී ගෙන තිබෙන්නේ වී මෙට්‍රික් ටොන් 3,000ක් පමණයි. මේ කන්නයේ අපේක්ෂිත අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 18-20 අතර ප්‍රමාණයක්. හැබැයි ඒ ප්‍රමාණයෙන් මිලදී ගන්නට යන්නේ මෙට්‍රික් ටොන් 40,000ක් පමණයි. ඒ කියන්නේ මේ රටේ වී ගොවියාගේ අස්වැන්නෙන් 0.02ක් මිලදී ගන්නටයි මේ රජය කටයුතු කරන්නේ. මේ මොහොත වන විට වෙළඳපොළේ වීවල මිල රුපියල් 101, 102 වාගේ ගණන්වලට යනවා. රුපියල් 120ට කොහේවත් විකිණිලා නැහැ. ඒකට ප්‍රධානතම හේතුව මේකයි. වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට ඉතාම වැදගත් වෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් අද ඉන්නේ අසාදු ලේඛනවල. වෙනදා ඒ අයට ලබා දුන්නු pledged loans ටික ලැබෙන්නේ නැහැ; සහන පොලියට ලබා දුන්නු ණය ටික ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, මේ රජය සමත් වෙලා තිබෙනවා සහල් ආනයනය කිරීම තුළින් මේ රටේ ගබඩා ටික පුරවන්නට. වී ගොවියා දෙවිවරු, රජවරු බවට පත් කරනවා කියලා දැන් ඒ අය කසිප්පුකාරයෝ ගාණට දාලා, "artificial ගොවියෝ" කියන වචන උපයෝගී කරගෙන ඒ අයට අපහාස කරලා අද දෙවියන් බවට පත් කරලා තිබෙන්නේ, රජවරු බවට පත් කරලා තිබෙන්නේ ආනයකරුවන් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට කැමැතියි. ඒ නිසා වර්තමාන රජයෙන් අපි මේ කාරණය අහන්නට කැමැතියි. ඇයි ඔබතුමන්ලා ගොවි ජනතාවට ලබා දුන්නු පොරොන්දු ටික ඉෂ්ට නොකරන්නේ?

විශ්වවිද්‍යාලයේ කීර්තිමත් මහාචාර්යවරයෙකු වන වසන්ත අතුකෝරාල මැතිතුමා තවත් බරපතළ සමාජයීය බේදවාචකයක් පිළිබඳව කරුණු එළිදක්වලා තිබෙනවා. අද මේ මොහොත වන විට වාණිජ බැංකුවල පෞද්ගලික ණය සහ අත්තිකාරම් - advances - ඉහළ ගිහිල්ලා තිබෙනවා. 2024 අග වන විට පැවති රුපියල් බිලියන 1,815ක ප්‍රමාණය 2026 මැයි වන විට බිලියන 2,580 දක්වා සියයට 42.1ක වර්ධනයක් ලබලා තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශය වෙත දුන් සමස්ත වාණිජ බැංකු ණය, අත්තිකාරම් සියයට 35.9කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. පුද්ගල ණය සියයට 42.1කින් වර්ධනය වෙලා තිබෙනවා. උකස් ණයවලට මොකක්ද වෙලා තිබෙන්නේ? සැලකිය යුතු ඉහළ යෑමක් තිබෙනවා. එදා බිලියන 660යි, අද වන විට එය බිලියන 1,078යි. සියයට 63.4කින්, ඒ කියන්නේ බිලියන 418කින් උකස් ණය ඉහළ ගිහිල්ලා තිබෙනවා.

මොකක්ද මේ සිද්ධ වෙලා තිබෙන්නේ? ඇත්ත වශයෙන්ම උකස් අත්තිකාරම් සියයට 63කින් ඉහළ ගිහිල්ලා තිබෙන්නේ මේ රටේ ජනතාවට දෛනික ජීවන වියදම් පියවා ගැනීම අපහසු වෙලා තිබෙන නිසායි, ගෘහස්ථ ආදායම් පහළ වැටිලා තිබෙන නිසායි. ඒ නිසා තමන්ගේ රත්තරන් උකස් කරන්නට මේ රටේ ජනතාව කටයුතු කරලා තිබෙනවා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේ ණය ගෙවා ගන්නට බැරි වුණොත් ඒ අයට තමන්ගේ වටිනා කන කර ආභරණ ටික අහිමි වෙන එක.

අද ගෘහස්ථ ණයගැතිභාවයත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. පුද්ගල ණය ගැනීම්වල ශීඝ්‍ර වර්ධනයක් සිදු වෙලා තිබෙන්නේ මේ රටේ සාතිශය විශාල ප්‍රමාණයක් පවුල් මූල්‍ය දුෂ්කරතාවට ලක් වෙලා තිබෙන නිසායි. ඒ කරුණු අවබෝධ කර ගන්නා අතරතුර, අධ්‍යාපනය සඳහා ගත් ණය ප්‍රමාණයත් සියයට 57කින් අඩු වෙලා තිබෙන බව පෙනෙනවා. වෙනදාට ණය ආධාර ලබාගෙන, ඒවා අධ්‍යාපන වැඩ පිළිවෙළට ආයෝජනය කළ අපේ රටේ ජනතාව අද ඉන් බැහැර වෙලා තිබෙනවා. මහාචාර්ය වසන්ත අතුකෝරාල මැතිතුමාගේ විශ්ලේෂණය තුළින් පෙන්නුම් කරන්නේ මොකක්ද? මේ රටේ ජනතාවගේ ජන ජීවිත අද කඩා වැටෙමින් පවතිනවා. තමන් අමාරුවෙන් උපයා ගත් දේපළ, කන කර රත්තරන් භාණ්ඩ උකස් කරනවා. ඒ, ආයෝජන ක්‍රියාවලියකට නොවෙයි, පරිභෝජනය සඳහායි. එදිනෙදා ජීවත් වීමේ අරගළය සඳහා එම මුදල් පාවිච්චි කරන තත්ත්වයට අද රටේ ජනතාව පත් වෙලා තිබෙනවා. ඒ නිසා, පැහැදිලිවම අද ණය බර වැඩි වන ගැටලුවකට අපේ රටේ ගෘහ මූලික පවුල් - කුටුම්භ - මුහුණ දෙනවා. මෙවන් මොහොතක අඩුම ගණනේ ඒ කාරණා පිළිබඳව සංවේදීභාවයක් ඇති කරගෙන ඒ ජනතාවට සහන ලබා දීම වැදගත් කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

අධ්‍යාපනවේදී උපාධිධාරීන් 700ක් ගැටලුවක ඉන්නවා. තවම මේ ආණ්ඩුවට ඒ සඳහා විසඳුම් ලබා දෙන්නට බැරි වෙලා තිබෙනවා. වෙනදාට සම්මුඛ පරීක්ෂණ, ප්‍රායෝගික පරීක්ෂණ පවත්වලා තමයි රැකියා සඳහා බඳවා ගත්තේ. දැන් කියනවා, විභාගයකට මුහුණ දෙන්න කියලා. අධ්‍යාපනවේදී උපාධිය කියන්නේ මොකක්ද? එය ගුරු පුහුණුව ඇතුළත් වෘත්තීය උපාධියක්. ඒ අයට නැවත තරග විභාග අවශ්‍ය වෙන්නේ නැහැ. ඊට සමාන වෙන රැකියාවකුත් ඒ අයට නැහැ. හැබැයි, සමහර පළාත්වල අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගන්නවා. තවත් පළාත්වල බඳවා ගැනීම් නතර වෙලා තිබෙනවා. 2025 ජූලි 24වැනි දා අග්‍රාමාත්‍යතුමියගෙන් මේ පිළිබඳව විමසුවාම කිව්වා, අධිකරණයේ නඩු තිබෙන නිසා ඒකට අත ගහන්න බැහැ කියලා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ ගුරු පුරප්පාඩු පුරවන ක්‍රියාවලියේදී අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා නොගෙන, 700කට වැඩි ප්‍රමාණයක් අද අසරණ කරලා තිබෙනවා; අනාථ කරලා තිබෙනවා. මේ අවස්ථාවේ අපි ඉල්ලීමක් කරනවා. කරුණාකරලා අධ්‍යාපනවේදී උපාධිධාරීන්ගේ ගැටලුවට විධිමත් විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරන්න. ඒ අයව සේවයට බඳවා ගන්නට කටයුතු කරන්න කියලා අපි රජයට යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තව පොඩි වෙලාවක් වැඩිපුර ගන්නවා.

පසුගිය දිනක පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය තීන්දු කරන කාරක සභා රැස්වීමේදී අරුම පුදුම දෙයක් සිද්ධ වුණා. ඔබතුමියත් දන්නවා, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිමත්ම පදනම නිර්මාණය වෙලා තිබෙන ප්‍රධාන කුලුනු තුන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය බව. ඒ වාගේම සිවිල් සමාජයත්, නිදහස් මාධ්‍යයත් අමතර කුලුනු හැටියටයි අපි විශ්වාස කරන්නේ. පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී අපි ඉල්ලීමක් කළා, මේ රටේ අධිකරණය කියන වැදගත් කුලුන, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන ඒ කුලුන පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡාවක්, පාර්ලිමේන්තු විවාදයක් පවත්වන්න න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න කියලා. මොකක්ද ලැබුණු උත්තරය? ඒ පැවැති Parliamentary Business Committee එකේ සියලු සටහන් මා ළඟ තිබෙනවා. එම සටහන් ඇතුළත් වාර්තාව මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මොකක්ද ගත්ත තීන්දුව? රාජ්‍ය පාර්ශ්වය කියනවා, අධිකරණය ගැන මේ සභාවේ කථා කරන්නට හැකියාවක් නැහැ කියලා. අධිකරණය කියන ආයතනය ගැන, ඒ ආයතනය ශක්තිමත් කිරීම ගැන, ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලියේදී අධිකරණයේ වැදගත්කම ගැන අපට කථා කරන්න අයිතියක් නැහැ, වාද විවාද පවත්වන්න අයිතියක් නැහැ, යෝජනාවක් ඉදිරිපත් කරන්න අයිතියක් නැහැ. මොකක්ද මේ කරන්නේ? මේ කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමක්. මේ කරන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරලා රට තුළ එක පක්ෂයක් පමණක් රජ කරවන ක්‍රමවේදයක් තුළ one-party state එකක් නිර්මාණය කිරීම. මේ ඒකාධිපති ක්‍රියාවලිය අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. එයට අපේ විරෝධතාව පළ කරනවා.

මේ රජය උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව අවුරුදු 63 සිට 65 කිරීම, ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 සිට 67 කිරීම ස්වාධීන අධිකරණයට එල්ල කරන මරු පහරක් හැටියට අපි දකිනවා. ස්වාධීන අධිකරණයට එල්ල වන මරු පහර තුළ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය, නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය සහමුලින්ම බිඳ වැටෙනවා. ඒ නිසා, රජයට මේ කාරණය කියන්න මම කැමැතියි. අධිකරණයට විවිධ අල්ලස් ලබා දෙන්නේ නැතිව, තනතුරු අල්ලස් ලබා දෙන්නේ නැතිව, ඉතාම වැරදි, දූර්දාන්ත, අධම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියකට මුල පුරන්නේ නැතිව, කරුණාකරලා ත්‍රෛපාර්ශ්වීය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය - tri-partite system of Government - තුළ බලය බෙදී යාමේ - separation of powers - වැඩ පිළිවෙළ, සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය ශක්තිමත් කරන්න කටයුතු කරන්නට වහා පියවර ගන්න.

දැනට අභියාචනාධිකරණයේත්, ශ්‍රේෂ්ඨාධිකරණයේත් පුරප්පාඩු ගණනාවක් පුරවන්නේ නැතිව තිබෙනවා. ඒවා පෙන්ව-පෙන්වා මානසික අල්ලස් ලබා දෙන්නේ නැතිව, කරුණාකරලා විනිසුරුවරුන්ගේ ගරුත්වයත් රැකගෙන, ඒ අයගේ ආත්ම ගරුත්වයත් සුරක්ෂිත වන ආකාරයට අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට ප්‍රවේශ වන්න. ඒකට ඇඟිලි ගසන මේ රටේ ආඥාදායකත්වයත්, ඒකාධිපතිත්වයත් ස්ථාපනය කරන ගමනට මුල පුරන්න එපා කියන එක මම රජයට ප්‍රකාශ කර සිටිනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.26]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

யூலை 23ஆம் திகதியான இன்றைய தினம் உண்மையிலேயே கவலையான ஒரு தினமாகும். ஏனெனில், அன்று இது போன்றதொரு நாளிலே தமிழ் மக்களுக்குப் பாரிய அநீதி நடந்தது. அதனால் பாதிக்கப்பட்டவர்களுக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தை தெரிவித்துக் கொள்கின்றோம். இங்கு பேசிய கௌரவ உறுப்பினர் ஒருவர், தமிழ் மக்களுக்கு அநீதி நடந்துகொண்டு இருப்பதாகக் கூறினார். கடந்த அரசாங்க காலத்தில் தமிழ் மக்களுக்கு அநீதி நடைபெற்றது உண்மைதான். ஆனால், எங்களுடைய அநுர குமார திஸாநாயக்க அவர்கள் சனாதிபதியான பிறகு, தமிழ் மக்களுக்கு அநீதி நடைபெறவில்லை; நடைபெறவும் மாட்டாது என்பதை நான் தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று இந்தச் சபையில் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாக விவாதிக்கப்படுகின்றது. நாங்கள் இந்த ஒழுங்குவிதிகளைக் கொண்டுவருவதற்கு முக்கிய காரணம், இலங்கையிலிருந்து பெருமளவு டொலர்கள் வெளிநாடுகளுக்கு அனுப்பப் படுகின்றபோதிலும், அதற்குரிய பொருட்கள் இலங்கைக்கு வருவதில்லை. இந்தச் செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்களின் account number, address, அவர்கள் எவ்வகையான பொருட்களை இறக்குமதி செய்கிறார்கள் என்பதைத் தெளிவாக அறிந்துகொள்வதே இதன் முக்கிய நோக்கமாக இருக்கின்றது.

அடுத்து, இங்கு இருக்கக்கூடிய சில முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் தாங்கள் முஸ்லிம் சமுதாயத்தின்மீது மிகவும் அக்கறையோடு செயற்படுவதுபோல காண்பிக்கின்றார்கள். அதாவது, 'ஹஜ்' சம்பந்தமாகவும் அல்-குர்ஆன் பிரதிகள் சம்பந்தமாகவும் மஹர சிறைச்சாலை வளாகத்திலுள்ள பள்ளிவாசல் சம்பந்தமாகவும்தான் அவர்கள் எந்த நாளும் கதைக்கின்றார்கள். முஸ்லிம் சமுதாயம் தொடர்பில் பல விடயங்களைப் பேசவேண்டி இருந்தும்கூட, அவர்களுக்குப் பதிலளிக்க வேண்டியுள்ளது. இதனால் எங்களுக்கு ஒதுக்கப் படுகின்ற நேரம் அதற்காகவே செலவாகின்றது.

நான் முக்கியமானதொரு விடயத்தை இங்கு குறிப்பிட வேண்டும். அதாவது, முஸ்லிம் சமூகம் ஒருபோதும் இந்த அரசாங்கத்தின்மீது நம்பிக்கை இழக்கவில்லை. சென்ற கிழமை கூட, mediaமூலம் மேற்கொள்ளப்பட்ட கருத்துக்கணிப்பில், மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு 98 சதவீதமான முஸ்லிம் மக்கள் ஆதரவு தெரிவித்து இருக்கிறார்கள். ஆனால், சில முஸ்லிம் MPs அபாண்டமான பழிகளைச் சுமத்தி, முஸ்லிம் மக்களைத் தங்கள் பக்கம் இழுத்துக்கொள்ள முடியுமென கனவு காண்கிறார்கள். அந்தக் கனவு ஒரு நாளும் நிறைவேறாது என்பதைச் சொல்லிக்கொள்கின்றேன். இன்று ஏற்றுமதி, இறக்குமதி சம்பந்தமான -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! නිවේදනයක් කිරීමට තිබෙනවා.

තම ධූර කාලය නිම කර සමුගැනීම නිමිත්තෙන් පාර්ලිමේන්තුවට පැමිණ මේ අවස්ථාවේ කථානායක ගැලරියේ රැඳී සිටින මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති His Excellency Qi Zhenhong සහ එම මැතිනිය මෙම සභාව විසින් සාදරයෙන් පිළිගන්නා බවත්, ඉදිරි වැඩ කටයුතු සඳහා සුබපැතුම් එක් කරන බවත් මෙයින් ප්‍රකාශ කිරීමට කැමැතියි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි ගැන කථා කරන මොහොතේ මම මේ කාරණයත් කියන්න අවශ්‍යයි. ආනයන-අපනයනකරුවන්ට අපි හුඟක් අවස්ථා දීලා තිබෙනවා. මේ රටේ ඉඳලා ඩොලර් විශාල ප්‍රමාණයක් පිට රටවලට යනවා. නමුත් බඩු එන්නේ පොඩි ප්‍රමාණයක්. අපි නිර්යාත කරන්න ඕනෑ. ඒ වාගේම මත්ද්‍රව්‍ය ව්‍යාපාර කරන අයත් ඉන්නවා. මේ පනතට අදාළව රෙගුලාසි

පනවා නැති නිසා ඒ අයගේ කළු සල්ලිත් සුදු කරන්න මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා. ඒවා ඉදිරි කාලයේදී නතර කරගන්න අවශ්‍ය කටයුතු කරන්න තමයි මේ පනතට අදාළව මේ රෙගුලාසි පනවන්න අවශ්‍ය වුණේ. ලංකාවෙන් පිට රටවලට යන ඩොලර්වලින් එන බදු ප්‍රමාණය හුඟක් අඩු වෙලා තිබෙනවා. ඒකට හේතුවක් තමයි, කළු කඩකාරයින්, කළු සල්ලිකාරයින්, හිටපු දේශපාලනඥයින් මේ රටේ ඩොලර් ස්විස් බැංකුවල දැමීම. අපි ඒවාත් අනිවාර්යයෙන්ම නතර කළ යුතුයි.

මීට මොහොතකට කලින්, විරුද්ධ පක්ෂ නායකතුමා කථා කළා. එතුමා උසාවිය ගැන කථා කළා. Lawyersලා ගැන කථා කළා. ඒ අයගේ ආණ්ඩු කාලයේ ජොබ් දුන්නේ කොහොමද කිව්වොත්, "කොට නම් කම්කරු, උස නම් සිකියුරිටි" කියලායි කිව්වේ. මටත් ඒ වාගේ කථාවක් ඇහිලා තිබෙනවා. ඒ වාගේ එකක් කියපු කෙනා දැන් රට ගැන, ලෝකය ගැන ලොකු අවබෝධයකින් ඉන්න බව පෙන්වන්න උත්සාහ කරනවා. අපි වැරදිකාරයෝ, ඒක පාර්ශ්වික තීන්දු ගන්නවා, එක පක්ෂයක් තමයි පාලනය කරන්නේ වාගේ කථා දැන් කියනවා. ඒ අය ඒ කාලයේ කරපු දේවල් මතක් කරලා බැලුවොත් හොඳයි.

සජබයේ පාලනය යටතේ තිබෙන ගම්පොල නගර සභාව ගැනත් මම කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ පාලනය කොහොමද කියලා ඒ නගර සභාවේ කටයුතු බැලුවාම අපට තේරුම් ගන්න පුළුවන්. අඩුම ගණනේ කුණු ටිකවත් අයින් කර ගන්න බැරි සභාපති කෙනෙක් තමයි විරුද්ධ පක්ෂ නායකතුමාගේ පක්ෂයෙන් ඉන්නේ. ඒ අයට ඔබතුමන්ලාගේ උපදෙස් දෙන්න, ඒ කුණු ටික අයින් කරන්න. මහනුවර දිස්ත්‍රික්කයේ සිටින ඩෙංගු රෝගීන්ගේ ප්‍රමාණයෙන් දෙවැනි තැනට ගම්පොල නගරය පත්ව තිබෙනවා. ඒ ඩෙංගු උවදුර අපි නැති කර ගන්න ඕනෑ. ඒවා ගැන උපදෙස් දෙන්න. මෙතැන ඇවිල්ලා බොරු පුරසාරම් දොඩවන්න එපා.

ඔබතුමන්ලාගේ පාලන කාලයේ මේ පනත් සංශෝධනය කරලා ඒ කටයුතු කරලා තිබුණා නම් අපට අද මේ පනත් වෙනස් කරන්න අවශ්‍යතාවක් නැහැ. ඔබතුමන්ලා ඒ දේවල් කරපු නැති හින්දා තමයි ඇත්තටම අපට මේවා කරන්න වෙලා තිබෙන්නේ. ගරු ජනාධිපතිතුමා මේ රට කොහොමද දියුණු කරන්නේ කියලා කල්පනා කරනවා. ඔබතුමන්ලා දන්නවා, රාජපක්ෂලා ආර්ථිකයට හානියක් කළා කියලා උසාවි තීන්දු තිබෙනවා කියලා. ඒ වාගේ පාලනයක් තිබුණු රටක් අද ගරු ජනාධිපතිතුමා හොඳ තැනකට ගෙනැල්ලා තිබෙනවා. මුදල් අච්චු ගහන්නේ නැතුව "දිට්වා" සුළි කුණාටුවෙන් වුණු හානි සඳහා රුපියල් කෝටි 50,000ක් අපට දෙන්න පුළුවන් වුණා. ඒ වාගේම මැද පෙරදිග යුද්ධය නිසා පීඩාවට පත් වෙච්ච ජනතාවට රුපියල් 10,000ක සහන ලබා දෙන්න අපි කටයුතු කළා. ඉදිරි කාලයේදීත් මේ රට දියුණු කර ගන්න අපි සියලුදෙනා එකතු වෙලා වැඩ කරමින් යන වෙලාවේ ඔබතුමන්ලා කකුලෙන් අදින්න එපා.

දෙමළ ජනතාව වෙනුවෙනුත් මම යමක් කියන්න ඕනෑ.

இலங்கை வரலாற்றில் முதற்தடவையாக லெவலன் தோட்டத்தில் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட 31 தமிழ் குடும்பங்களுக்கு காணிகளை வழங்கக்கூடிய சந்தர்ப்பம் எங்களுக்குக் கிடைத்தது. தமிழ் மக்களுக்கு இருக்கின்ற அனைத்துப் பிரச்சினைகளையும் தீர்ப்பதற்கு எங்களுடைய அரசாங்கம் முக்கியமான நடவடிக்கைகளை எடுத்து வருகின்றது.

அடுத்து, கம்பளை நகர சபையானது, அப்பிரதேசத்திலுள்ள ஊத்தைகளை அப்புறப்படுத்தாமை மற்றும் கான்களை சுத்தப்படுத்தாமை காரணமாக அங்கு டெங்கு நுளம்புப் பெருக்கம், நுளம்புத் தொல்லை என்பன அதிகரித்துள்ளதால் பாரிய பிரச்சினைகள் ஏற்பட்டுள்ளன. இந்த நகர சபையானது, ஐக்கிய மக்கள் சக்தியால் பரிபாலிக்கப்படக்கூடிய ஒரு நகர சபையாக இருக்கின்றது. இன்று எங்களுடைய அரசாங்கத்தின் மீது பல குற்றச்சாட்டுகளை சுமத்துகின்ற எதிர்க்கட்சித் தலைவர் அவர்கள், அன்று ஆட்சியிலிருந்த காலத்தில் எப்படி நடந்துகொண்டார்கள் என்பதை நாங்கள் கண்கூடாகக் கண்டோம். உயரம் குறைந்தவர்கள் என்றால் தொழிலாளர்கள் என்றும் உயர்ந்தவர்கள் என்றால் கங்காணிகள் என்றும் சொல்லக்கூடிய எதிர்க்கட்சித் தலைவர், இன்று இங்கு பிரச்சினைகள் பற்றி பேசுகின்றார்.

மேலும், கறுப்பு யூலை கலவரத்தால் பாதிக்கப்பட்ட கம்பளை பிரதேசத்தில் அன்று பல கடைகளை அழித்தொழித்த இவர்களுடைய එක්සත් ජාතික පක්ෂය - UNP - அரசாங்கம்தான் தமிழ் மக்களுக்கும் அநீதி இழைத்தது. அன்று யாழ். பொது நூலகத்தை அழித்தொழித்த காமினி திஸாநாயக்க, லலித் அத்துலத் முதலி போன்றவர்களுக்கு உதவி செய்த அந்தக் கட்சியைக் சேர்ந்த இவர்கள், இன்று தமிழ் மக்களுக்காக கண்ணீர்விடுவதை எங்களால் ஏற்றுக் கொள்ள முடியாது. அன்றும் இன்றும் ஒரே கொள்கையில் தான் எங்களுடைய அரசாங்கம் இருக்கின்றது. தமிழ் மக்கள் இந்த அரசாங்கத்தின்மீது நம்பிக்கை வைத்தே வாக்களித்தார்கள். எனவே, எதிர்காலத்தில் எங்களுடைய அரசாங்கம் அவர்களுக்குத் தேவையான விடயங்களை நிச்சயமாகச் செய்யுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 1.35]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද කියලා තේරුම් ගන්න බැරිව මම තවම හොල්මන් වෙලා ඉන්නේ. එකක් කියනවා, තව එකක් කියනවා, ඊට පස්සේ ආයෙත් තව එකක් කියනවා. නිකම් ආතබූත වාගේ කථාවක් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වූ රෙගුලාසි පිළිබඳව කථා කරන මේ වෙලාවේදී ඉතා පැහැදිලිව මම මේ කාරණය කියන්න ඕනෑ. අද අපේ රට හමුවේ තිබෙන අභියෝගය මොකක්ද කියලා අපි තේරුම් ගන්න ඕනෑ. විශේෂයෙන්ම මම ඊයේ ප්‍රශ්නයක් ඇහුවාම ඒකට මුදල් නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නා. එතුමාගේ පිළිතුර ආරම්භයේදී කිව්වා, පසුගිය අවුරුදු එකහමාරට ඩොලර් බිලියන 3.8ක වාගේ ප්‍රමාණයක ආයෝජන ඇවිල්ලා තිබෙනවා කියලා. ඒවායෙන් උත්පාදනය වන රැකියා ප්‍රමාණය, ඒ එක් එක් ව්‍යාපෘති ප්‍රමාණය මම එතුමාගෙන් විස්තරාත්මකව ඇහුවාම ප්‍රායෝගිකව පෙනෙනවා, එහෙම මුදල් ප්‍රමාණයක් ඇවිල්ලා නැහැ, ගිවිසුම් තමයි අත්සන් කරලා තිබෙන්නේ කියලා. ලංකාවේම තිබෙන කළුගල් දැම්මත් හදන්න බැහැ කියපු Port City එක තමයි පැරණි ආයෝජනයක් විධියට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හමුවේ තිබෙන සැබෑ අභියෝගය රුපියල් එකතු කිරීම නොවෙයි. වර්තමාන ආණ්ඩුව ජනතාවගේ ඊරි මාංශ උරා බොනවා වාගේ රුපියල් එකතු කරමින් ඉන්නවා. හැබැයි, අප හමුවේ තිබෙන සැබෑ අභියෝගය මොකක්ද? අපේ ආනයන අපනයන පරතරය ඉහළට ගිහිල්ලා තිබෙනවා. යුද්ධය නිසා අපේ අපනයනවලට බාධා එල්ල වෙලා තිබෙනවා. ඒ වාගේම යුද්ධය දිගටම පැවතුණොත් ශ්‍රී ලාංකික පුරවැසියන්ට මැදපෙරදිග රැකියා නැති වෙමින් පවතිනවා සහ ඒ තත්ත්වය තව වැඩි වීමේ අවදානමක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, සෘජු විදේශ ආයෝජන අපට එන්නේ නැහැ. අපට එක දිගට දැනට එමින් පවතින්නේ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම පමණයි. ඒකත් අභියෝග ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ අපි බලන්න ඕනෑ, ආනයන අපනයන පරතරය අඩු කරමින්, ණය ගෙවීමේ හැකියාව වර්ධනය කරමින්, බඩු භාණ්ඩවල මිල අඩු කරලා මේ රටේ ජනතාවට ජීවත් වීමේ අයිතිය ලබා දෙන්නයි. එහෙම කරන්න නම් අපේ ඩොලර් ආදායම වැඩි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉදිරිපත් කරපු, ආයෝජකයන්ට ආරාධනා කරන app එක මම බැලුවා. ඒකේ ව්‍යාපෘති 5ක් තිබෙනවා. නුවරඑළියේ Theme Park එකක් හදන්න අක්කර 10.9ක් දෙනවාලු, ඩොලර් මිලියන 30ක ආයෝජනයක් ගෙනෙන්න. Horse race, cart race තියන්න Frolic Island Recreational Hub එකක් දියවන්නාව අසල හදන්න අක්කර 27.3ක් දෙනවාලු, US Dollars 115 millionක් බලාපොරොත්තුවෙන්. ඊට පස්සේ, Heritage Kandy Hotel එක හදන්න අක්කර 3ක් ලබා දෙනවාලු, US Dollars 75 million බලාපොරොත්තුවෙන්. ඉස්සර නම් කිව්වේ එකක්වත් විකුණන්නේ නැහැ කියලා. කමක් නැහැ, දැන් ඇත්ත තේරිලා තිබෙනවා නේ. ඊළඟට, Pearl Island Coastal Voyages කියලා project එකක් තිබෙනවා, කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, යාපනය හරහා ව්‍යාප්ත කරන්න. ඒකෙන් ඩොලර් මිලියන 60ක් බලාපොරොත්තු වෙනවාලු. ඊළඟට, Cinema City එකක් නිර්මාණය කරන්න ඩොලර් මිලියන 119ක් බලාපොරොත්තුවෙන් අක්කර 400ක් දෙනවාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් ඉන්දියානු රජය අපේ කන්කසන්තුරේ වරාය දියුණු කරන්න ඩොලර් මිලියන 64.5ක් නිකම් දීලා තිබෙනවා. නමුත්, තවම ඒ මුදල අරගෙන නැහැ. මොකද, ඒක ගන්න භයයි.

පෙරේදා තිබුණු යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මම මතක් කළා, ඉන්දියානු රජය මේක දෙන්නේ ඉන්දියන් භය හඳපු ආණ්ඩුවකට කියලා. දැන් භය වෙන්න දෙයක් නැහැ. මොකද, අපි දැන් ඉන්නේ විපක්ෂයේ. ඉන්දියාවෙන් ගෙනෙන මුදල්වලට අපි විරුද්ධ වෙන්නේ නැහැ. මොකද, අපි කැමති වුණත්, අකැමති වුණත් දමිළ ඩයස්පෝරාව ආයෝජනය කරන්නේ උතුරේ. ඒගොල්ලන් දකුණට ආයෝජනය කරන්නේ නැහැ. එතකොට, ඉන්දියානු ආධාර මත හරි මේ වරාය හැදුවාම උතුරේ යටිතල පහසුකම් ටික දියුණු වෙනවා. ඒ වාගේම දකුණු ඉන්දියානු වෙළෙඳ පොළට අපේ ආර්ථිකය ඇතුළත් වෙනවා. අපෙන් ඔවුන්ට යන ප්‍රමාණයට වැඩිය ඔවුන්ගෙන් අපට එන ප්‍රමාණය වැඩියි. ඒකවත් තේරෙන්නේ නැහැ, අතපත ගානවා. Memorandum of Understanding - MoU - එක අත්සන් කරන්න අවුරුද්දක් තිස්සේ තවම දඟලනවා. මේ වරාය හදලා ඉවර වෙලා, ඒකේ කළමනාකරණ කාලය අවුරුදු 10 හරි, 20 හරි අවසන් වුණාට පස්සේ මේ වරාය ඉන්දියාවට ගෙනියන්නේ නැහැ. මේකෙන් අපේ රටට තමයි වාසි. ඒ වාගේම මේ රට ඇතුළට දකුණු ඉන්දියානු වෙළෙඳ පොළෙන් එන හැම ඩොලරයක්ම මේ රටේ හැම පුරවැසියෙකුටම බෙදිලා යන විධියට ප්‍රතිපාදන සලසන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ආණ්ඩුව මේ විධියට ආයෝජන ගෙන්වන්න හිතාගෙන හිටියාට එහෙම ආයෝජන එන්නේ නැහැ.

අපේ පොලීසිය භාර ඇමතිතුමනි, UDA එක ගත්තොත්, කොළඹ නගරයේ pending projects 22ක් තිබෙනවා. ඒවායෙන් ඩොලර් බිලියනයකට වැඩිය ගෙනෙන්න පුළුවන්. නමුත් අතපත ගාමින් ඉන්නවා. ඒගොල්ලන්ගේ මේ අවුරුද්දේ revenue target එක ඩොලර් මිලියන 500යි. හැබැයි, අද වනතුරු ඒ ඉලක්කයට ඇවිල්ලා නැහැ. හැබැයි, අපි යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විධියට ඉන්දියාවේ සංචාරය කරපු වෙලාවේදී දැක්කා, ඉන්දියානු නවීන තාක්ෂණයත් එක්ක ආයෝජකයන් ගෙන්වන්න පුළුවන් කියලා. මේ කලාපයට ඉන්දියාවේ සහයෝගය නැතිව කටයුතු කරන්න බැහැ. මොකද, අපි ආර්ථික අර්බුදයට ලක් වෙච්ච වෙලාවේදී ඩොලර් බිලියන 3ක් දීලා අපට ඇප තැබුවේ ඒගොල්ලන්. අපි කියන්නේ නැහැ, ඉන්දියාවට විකුණන්න කියලා. අපි කියන්නේ නැහැ, ඉන්දියාවට දණ ගහන්න කියලා. හැබැයි, ඔවුන්ගෙන් ගන්න පුළුවන් දේවල් ගන්න. මොකද, ඒ හරහා අපේ ආර්ථිකයට ඉක්මනින් ලබා ගත හැකි ගොඩක් දේවල් තිබෙනවා. දැන් කොළඹ නගරයේ තිබෙන ව්‍යාපෘති 22න් අඩු ගණනේ ව්‍යාපෘති 5ක්, 6ක් දුන්නත් ඩොලර් මිලියන තුන් හාරසියයක් අපට ගෙනෙන්න පුළුවන්. අධිවේගී මාර්ග වෙන්න පුළුවන්, electronic railway tracks ටික වෙන්න පුළුවන්, වෙනත් යටිතල පහසුකම් වෙන්න පුළුවන්. ඒවා අපේ රටේ සල්ලිවලින් කරනවා කියන එක පට්ටපල් බොරුවක්.

දැන් ආණ්ඩුව හිතාගෙන ඉන්නේ මාර්තු මාසයේ IMF වැඩසටහන නතර වුණාට පස්සේ මේ රටේ ජනතාවගේ ඊරි මාංශ උරාගෙන බීලා මිරිකලා ගන්න ට්‍රිලියන 1.5ක බදු ආදායමෙන් කොළඹ තදාසන්න ප්‍රදේශවල තිබෙන රේල් පාරට බිලියන 250ක් වෙන් කරලා, කුරුණෑගල-දඹුල්ල රේල් පාරට තව බිලියන 200ක් වෙන් කරලා, හොරණ-ඉංගිරිය දක්වා රේල් පාරට තව මුදලක් වෙන් කරලා මේක කරන්න පුළුවන් වෙයි කියායි. ඔව්, අධිවේගී මාර්ග හැදෙන්න ඕනෑ. රේල් පාරවල් හැදෙන්න ඕනෑ. හැබැයි, ඒවා අපේ රටේ සල්ලිවලින් කරන්න බැහැ. මොකද, අපට ඒ සඳහා අවශ්‍ය raw materials රුපියල්වලින් ගෙනෙන්න බැහැ. රුපියල් බිලියන 1,500ක් වියදම් කරනවා නම් ඒකෙන් සියයට 40ක්වත් ආයෙත් පිට රට යවන්න ඕනෑ, raw materials ගෙනෙන්න. එතකොට බිලියන 600ක් පිට රට යවනවා

කියන්නේ, ඩොලර් බිලියන 2ක් ඕනෑ කියන එකයි. අපේ සංචිතය එච්චර ශක්තිමත්ද? එහෙම කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ යථාර්ථය තේරුම් ගන්න. අවසානයේදී වෙන්නේ ගුවන් තොටුපළ පර්යන්තය වැඩිදියුණු කිරීමේ project එක වාගේ මේවාත් අතරමැද නතර වන එකයි. ඒකෙන් සල්ලි නාස්ති වනවා.

ඒ නිසා අපි රජයට කාරණයක් කියන්න කැමැතියි. ආයෝජකයන්ට එන්න කිව්වාට ඔවුන් එන්නේ නැහැ, පොලීසිය භාර ඇමතිතුමනි. ඒකට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්න ඕනෑ, නිදහස තිබෙන්න ඕනෑ. ආයෝජකයෙක් එද්දී රස්තියාදු වෙන්නේ නැතිව BoI එකෙන් approval එක හම්බ වනවා කියන එක පිළිබඳව විතරක් නොවෙයි ඔවුන් බලන්නේ. ඔවුන් මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක වෙනවාද කියලා බලනවා. ඒ වාගේම ඔවුන් බලනවා, මම කරන ආයෝජනයට ඒ රට ඇතුළතදී ප්‍රශ්නයක් ආවොත් ඒකට මට සාධාරණ විසඳුමක් ලැබෙනවාද කියලා. මොකද, සමහර අය අහනවා, ආයෝජනවලට නීතියේ ආධිපත්‍යය කන්නද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, UDA එකේ projects වෙන්න පුළුවන්, බලශක්ති ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වෙන්න පුළුවන්, මහාමාර්ග ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වෙන්න පුළුවන්, දුම්රිය මාර්ග ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වෙන්න පුළුවන්. ඒ ඕනෑම ව්‍යාපෘතියකට ආයෝජකයන් එනකොට මේ රටේ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වෙනවාද කියන එක ඔවුන් බලාපොරොත්තු වන බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. දැන් අපි ඒ ගැන කිව්වොත් ඒවා බොරු කියලා කියයි. හැබැයි, මම ඒ ගැනත් කියන්නම්.

ඊළඟ යුරෝපා සංගම් සාකච්ඡාවේදී බලන්න, අපේ රටේ GSP Plus එකට මොකක්ද වෙන්න යන්නේ කියලා. ඒකට හේතුව තමයි මීගමුව බන්ධනාගාරයේදී සිදු වෙච්ච මිනිස් ඝාතනය. ලංකා ඉතිහාසයේ බන්ධනාගාරයක සිදු වෙච්ච වැඩිම මිනිස් ඝාතනය තමයි මීගමුව බන්ධනාගාරය තුළදී සිද්ධ වුණේ. ඒක සමූල ඝාතනයක්. ඒක මෙහෙම සරල ප්‍රකාශ නිකුත් කරලා, වගකීම භාර ගන්නවා කියලා අත්හරින්න බැහැ. එහි වගකීම භාර ගන්නවා නම් ඒ සඳහා වග වෙන්න ඕනෑ.; if somebody takes responsibility, he should be held accountable. ඒ ගැන වචනයට විතරක් කියලා හරියන්නේ නැහැ. මෙහෙම ගියොත් ආයෝජන එන්නේත් නැහැ, remittances අඩු වෙනවා, අපනයනත් නැහැ, උද්ධමනයත් වැඩි වෙනවා, ආනයන අපනයන පරතරයත් වැඩි වෙනවා, ලැබිලා තිබෙන බදු සහනත් එකිනෙක ක්‍රමානුකූලව දිය වෙමින් පවතිනවා. ඒ නිසා ඔයගොල්ලන්ට "අබ සරණයි" කියන එක තමයි කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා පත් වෙලා පෙරේදාට මාස 22ක් ඉවරයි. එතුමාගේ ධුර කාලය මාස 60යි. ඒකෙන් මාස 5කට කලින් ජනාධිපතිවරණය පවත්වන්න ඕනෑ. එතකොට මාස 55න් මාස 22ක් ඉවරයි. තව මාස 33යි තිබෙන්නේ. තව මාස 7ක්, 8ක් ගිහිල්ලා මේ ආණ්ඩුව බෙදවලා, ආණ්ඩුව කඩාකප්පල් කරන එක නොවෙයි අපිට වුවමනා වන්නේ. මේ විධියට ඉදිරියට ගියොත් මේ රට කඩාගෙන වැටෙනවා. ඒ නිසා මේ තිත්ත ඇත්ත තේරුම් අරගෙන, ආයෝජකයා දිරිගැන්වීම සඳහා සැබෑ ව්‍යාපෘති ටික ඉදිරිපත් කරලා, නීතියේ ආධිපත්‍යය සුරකිමින්, මේ රටේ දියුණුව සඳහා අවශ්‍ය ඇත්ත පියවර ගන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.46]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றிய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

இலங்கையானது, இரட்டைப் பற்றாக்குறை நிலவுகின்ற நாடு! அதாவது, பாதீட்டிலும் பற்றாக்குறை நிலவுகின்றது; சென்மதி நிலுவையிலும் பற்றாக்குறை நிலவுகின்றது. பாதீட்டில் ஏற்பட்டுள்ள பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்காக எமது அரசாங்கம் பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டுள்ளது. உள்நாட்டில் வரி செலுத்தாமல் தப்பி வாழ்கின்றவர்களிடம் இருக்கின்ற கறுப்புப் பணத்தைப் பெற்றுக்கொள்வதற்காக கடந்த வாரம் பாராளுமன்றத்தில் சட்டமூலமொன்று கொண்டுவரப்பட்டு நிறைவேற்றப்பட்டது. அதேபோல், குறைவாகவுள்ள சென்மதி நிலுவையை உயர்த்துவதற்காக இன்றைய தினம் இந்தச் சபையில் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் முன்வைக்கப்பட்டு இருக்கின்றன.

கடந்த காலத்தில் குறிப்பாக, யுத்தத்தின் பின்னர் எமது வன்னிப் பிரதேசத்தில் காணப்பட்ட இரும்பு, பித்தளை, அலுமினியம் போன்ற உலோகங்கள் எவ்வாறு அந்தப் பிரதேசத்திலிருந்து எடுத்துச் செல்லப்பட்டன என்பதை எமது மக்கள் கண்கூடாகக் கண்டார்கள். அவையெல்லாம் குறைந்த விலைக்குக் கொள்வனவு செய்யப்பட்டே வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யப்பட்டன. தற்பொழுது, எமது நாட்டில் கைத்தொழில் துறைகளுக்குத் தேவையான உலோகங்களை எங்களால் பெற்றுக்கொள்ள முடியாத நிலைமையே காணப்படுகின்றது. இதனால்தான் நாங்கள் இவ்வாறான சட்ட ஏற்பாடுகளைக் கொண்டுவந்து இருக்கின்றோம். 2020ஆம் ஆண்டு இலங்கையிலிருந்து உலோகங்களை ஏற்றுமதி செய்வதற்குத் தடைவிதிக்கப்பட்டு இருந்தது. அவ்வாறு இருந்தபோதிலும், பல்வேறு விதமான சட்டவிரோத முறைகள் மூலம் வெவ்வேறு HS குறியீட்டைப் பாவித்து பலர் இலங்கையில் இருக்கின்ற உலோகங்களை ஏற்றுமதி செய்தார்கள். இதனை நிறுத்துவதற்காகவே எமது அரசாங்கம் இந்த ஒழுங்குவிதிகளைக் கொண்டுவந்து இருக்கின்றது.

குறைந்த விலைக்குக் கொள்வனவு செய்யப்பட்டு எமது நாட்டிலிருந்து வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யப்பட்ட உலோகங்கள், தற்பொழுது அதிகூடிய விலைக்கே இறக்குமதி செய்யப்படுகின்றன. உதாரணத்துக்கு இரும்பை எடுத்துக் கொள்வோம். தற்பொழுது கட்டுமானப் பணிகளுக்குத் தேவையான இரும்பானது, பெருமளவில் வெளிநாடுகளில் இருந்தே இறக்குமதி செய்யப்படுகின்றது. கடந்த வருடம் 634 மில்லியன் அமெரிக்க டொலர் பெறுமதியான இரும்பு இறக்குமதி செய்யப்பட்டுள்ளது. இதனால் எமது அந்நியச் செலாவணி குறைவடைந்துள்ளது. வருடமொன்றுக்கு இலங்கையிலிருந்து 90,000 மெற்றிக்தொன் இல்மனைட் வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யப்படுகின்றது. இதன்மூலம் 15 மில்லியன் அமெரிக்க டொலரை அந்நியச் செலாவணியாகப் பெற்றுக்கொள்ள முடிந்தது. இல்மனைட்டை பெறுமதிசேர் பொருளாக மாற்றி அதாவது, titanium dioxideஆக மாற்றி ஏற்றுமதி செய்வதன்மூலம் கூடுதலான அந்நியச் செலாவணியைப் பெற்றுக்கொள்ளக்கூடிய சந்தர்ப்பத்தை எங்களால் உருவாக்க முடியும்.

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

கிளிநொச்சி மாவட்டத்தின் பரந்தனில் இருக்கின்ற இரசாயனத் தொழிற்சாலையில் 1980ஆம் ஆண்டு காலப்பகுதியில் 3,000 மெற்றிக்தொன் sodium hydroxide உற்பத்தி செய்யப்பட்டது. 1985ஆம் ஆண்டுக்குப் பின்னர், யுத்தம் காரணமாக அந்தத் தொழிற்சாலை மூடப்பட்டது. இதனால் தற்பொழுது 12,000 மெற்றிக்தொன் sodium hydroxide இறக்குமதி செய்யப்படுகின்றது. இதற்காக வருடாந்தம் 6.99 மில்லியன் அமெரிக்க டொலர் நாட்டிலிருந்து வெளியேறுகின்றது. இதனைத் தடுப்பதற்காக எமது அரசாங்கமானது இந்த வருட சனவரி மாதத்தில் கிட்டத்தட்ட 7 பில்லியன் ரூபாய் செலவில் அந்தத் தொழிற்சாலையை மீண்டும் ஆரம்பிப்பதற்கு அடிக்கல் நாட்டியுள்ளது. அந்தத் தொழிற்சாலையை மீள ஆரம்பிப்பதன்மூலம் வருடாந்தம் 270 மில்லியன் அமெரிக்க டொலர் அந்நியச் செலாவணி எமது நாட்டுக்குக் கிடைக்குமென நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். பல்வேறுபட்ட கைத்தொழிற் சாலைகளை இலங்கையில் நிறுவுவதன்மூலம் நாட்டின் பொருளாதாரத்தை உயர்த்திக்கொள்ளக் கூடியதாக இருக்கும். எமது நாட்டுக்கு வாகனங்களை இறக்குமதி செய்வதுபோல, LCஐ வெளிநாட்டில் open செய்து, அதன் ஊடாக இலங்கை யிலுள்ள டொலரை வெளிநாடுகளுக்கு பணத்தூய்தாக்கலுக் காக சட்டவிரோதமாக அனுப்புகின்றார்கள். இதனைத் தடுப்பதற்காக - அதாவது, நாட்டிலிருந்து வெளியேற்றப்படும் நிதியைக் கண்காணிப்பதற்காக நாங்கள் ஒரு சட்ட ஏற்பாட்டைச் செய்திருக்கின்றோம்.

எமது அரசாங்கத்தால் நாட்டில் பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் மேற்கொள்ளப்படுகின்றன. குறிப்பாக, 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட முல்லைத்தீவு மாவட்டத்தைச் சேர்ந்த 269 குடும்பங்களுக்கு வீடு கட்டுவதற்காக தலா 50 இலட்சம் ரூபாய் வீதம் எமது அரசாங்கத்தால் வழங்கப்பட்டு வருகின்றது. கடந்த காலங்களில் கூடுதலான வீட்டுத் திட்டங்கள் வெளிநாட்டு நிதி உதவிமூலமே அமைக்கப்பட்டன. ஆனால், தற்பொழுது உள்நாட்டு நிதிமூலமும் வீடுகள் அமைக்கப் படுகின்றன. அதாவது, வரிப் பணத்தின்மூலமும் ஏனைய உற்பத்திகள் மூலமும் கிடைக்கின்ற நிதியைப் பயன்படுத்தி நாட்டில் பல்வேறு அபிவிருத்திப் பணிகள் மேற்கொள்ளப் படுகின்றன. அதன் அடிப்படையில்தான் எமது முல்லைத்தீவு மாவட்டத்திலும் இவ்வாறான அபிவிருத்திகளைச் செய்யக் கூடியதாக இருக்கின்றது. முல்லைத்தீவு மாவட்டமானது, கடந்த கால யுத்தத்தால் உயிரிழப்பு உட்பட பல்வேறு அழிவுகளைச் சந்தித்த ஒரு மாவட்டமாகும். எமது அரசாங்கம் வன்னிப் பிரதேசத்திலும் பல்வேறுபட்ட அபிவிருத்திகளை மேற்கொண்டு வருகின்றது. அடுத்த வருடம் கொக்கிளாய் பாலத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படவுள்ளன. இந்தப் பாலத்தை அமைப்பதன்மூலம் வடக்கு மாகாணத்தையும் கிழக்கு மாகாணத்தையும் புவியியல் ரீதியாக இணைக்கக்கூடிய வாய்ப்பை நாம் பெறுவோம். எமது அரசாங்கம் வடக்கில் வாழ்கின்ற மக்களுக்குப் பல்வேறுபட்ட உதவிகளை வழங்கி, அவர்களுடைய பொருளாதாரத்தையும் வாழ்க்கைத் தரத்தையும் உயர்த்துவதற்குப் பல்வேறு முனைப்புகளை மேற்கொண்டு வருகின்றது என்பதை இந்தத் தருணத்தில் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.53]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ වෙලාව පාවිච්චි කරන්න කැමැතියි, පෙරේදා දිනයේදී තමන්ගේ ක්‍රීඩා දිවියෙන් සමුගත් යුපුන් අබේකෝන් ක්‍රීඩකයා ගැන කථා කරන්න. ඔහු වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලයෙන් බිහි වුණු අතිදක්ෂ ක්‍රීඩකයෙක්. ඔහු මුළු ලංකාවටම විශාල කීර්තියක් ගෙනැවිත් දුන්, තත්පර 10ට අඩුවෙන් මීටර් 100 තරග ඉසව්ව අවසාන කරපු දකුණු ආසියාවේ ඉන්න එකම ක්‍රීඩකයා. ඒ ක්‍රීඩකයා තම ක්‍රීඩා දිවිය අවසාන කළා. මම මේ වෙලාව ගන්නවා, එතුමා ගැන කථා කරන්නට පමණක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද වෙනකොට ඉතාම නරක තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. හැම දෙයකදීම වාගේ මේ වන විට මේකෙදිත් මෙම රජය විසින් ජනතාව දෙකට බෙදීමකට ලක් කර තිබෙනවා. අද වෙනකොට දේශද්‍රෝහියෙකු බවට පත් වෙලා තිබෙනවා, දකුණු ආසියාවේ වේගවත්ම ක්‍රීඩකයා.

මොකක්ද ඒ ක්‍රීඩකයා කිව්වේ? තමන් ක්‍රීඩාවෙන් සමුගන්නවා කියලා ඔහු කිව්වා. හැබැයි ආණ්ඩුවට කිසිම වැරැද්දක් කිව්වේ නැහැ. එහෙම කිව්වේ නැති හේතුව මම කියන්නම්. මොකද, මේ ආණ්ඩුවෙන් විතරක් නොවෙයි, ආණ්ඩු දෙකකින්, එහෙමත් නැත්නම් ක්‍රීඩා ඇමතිවරු තුන්දෙනෙකුගෙන් පමණ මේ දේ සිද්ධ වෙලා නැහැ. ඒ නිසා කවුරුත් කලබල වෙන්න අවශ්‍ය නැහැ. මම මේක කියන්නේ සමාජ මාධ්‍යවල මඩ ගහන කට්ටියට. කාලයක් තිස්සේ ආපු ගමනක් මේක. ඒ නිසා කාගෙවත් ආණ්ඩුවකට චෝදනා කරලා නැහැ ඒ ක්‍රීඩකයා. ඒක විශේෂයෙන් කියන්න ඕනෑ. හැබැයි ඔහු මේ තත්ත්වයේ දක්ෂකමක් දක්වන්න ඔලිම්පික් කමිටුව, මලල ක්‍රීඩා සංගමය, අමාත්‍යාංශය, පෞද්ගලික අංශය ඇතුළු සියලුදෙනා එකතු වෙලා අවුරුදු ගණනාවක ව්‍යාපෘතියක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තේරෙන්නේ නැහැ, එහි වටිනාකම තේරෙනවාද, නැද්ද කියන එක. ඒ නිසා ඉතාලියේද, මොන රටේද කියන එක නොවෙයි, මොන ක්‍රමයකින් හරි ලංකාව නියෝජනය කරනවා නම්, ඒ දක්ෂතාව දක්වලා අපේ රටට ඒ කීර්තිය ගෙනැවිත් දෙනවා නම් ඒ ක්‍රීඩකයෝ බලාගන්න එක තමයි අපේ වගකීම කියන එක මම කියන්න කැමැති. මොකද, ඉතාලි රටේ පුරවැසිභාවය ප්‍රතික්ෂේප කරලා, රැකියා ප්‍රතික්ෂේප කරලා, ඉතාලි ජාතික කණ්ඩායමේ තමන්ගේ ස්ථානය ප්‍රතික්ෂේප කරලා මේ රට වෙනුවෙන් දුවපු ක්‍රීඩකයෙකුට තමයි අද මේ විධියට සලකන්නේ. මිනිස්සු ඔහුට මෙහෙම කථා කරන එක සුදුසුද කියලා මම අහන්න කැමැතියි.

අද ක්‍රීඩා ඇමතිවරයා මාධ්‍ය සාකච්ඡාවක් කැඳවලා ඉතාම නින්දිත විධියට කිව්වා, "ඩොලර් ලක්ෂ 3ක් ඉල්ලනවා, අපිට ඒක දෙන්න බැහැ" කියලා. කොහොමද, ඒ ඩොලර් ලක්ෂ 3ක් ආවේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ගාව තිබෙනවා, ඒ සම්බන්ධ කොන්ත්‍රාත්තුව. ඒ කොන්ත්‍රාත්තුවේ ලේඛනයේ උඩින්ම ලියලා තිබෙනවා "Confidential" කියලා. මේ "Confidential" කියන එක ක්‍රීඩා ඇමතිතුමා ඇවිල්ලා ලජ්ජා නැතුව කියෙව්වා. දැන් ඉතින් මේක තවදුරටත් රහසිගත නැහැ නේ. ඒ නිසා මම මේක අතට අරන් තිබෙනවා. ඩොලර් ලක්ෂ 3ක් කියන්නේ රුපියල් මිලියන 90ක්. රුපියල් මිලියන 90ක් කියන්නේ අවුරුදු ගණනාවක ඔහුගේ වියදම් ටික. මොකද, කිසිම වියදමක් සඳහා මුදල් අරගෙන නැහැ. යම් යම් තැන්වලදී යම් යම් වියදම් ටිකක් දීලා තිබෙනවා. ඒකට ඔහු ස්තුතිවන්ත වුණා කියලාත් මේ ආණ්ඩුවෙන් තර්ජන-ගර්ජන ඇවිල්ලා තිබෙනවා. මම ඒ අය නම් වශයෙන් කියන්න යන්නේ නැහැ. හැබැයි coaching staff එකට, ඉඳුම්-හිටුම් ඇතුළු සියලු දේවල්වලට තිබෙන වියදම් ටික තමයි

මේ රුපියල් මිලියන 90 කියලා කියන්නේ. රුපියල් මිලියන 90ක් කියන්නේ රුපියල් ලක්ෂ 900ක්. මේ, අවුරුදු ගණනාවකටම අදාළ මුදල. දැන් තිබෙන system එක අනුව අවුරුදු දෙකක්, තුනක් ඇතුළත මේ ආකාරයේ දක්ෂතාවක් තිබෙන ක්‍රීඩකයෙක් හදන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අතුළේ තිබෙනවා, achievement bonus එක, performance bonus එක ඇතුළු සියලු වියදම්. ඒවා මොකුත් කියන්නේ නැතුව අර "Confidential" කියන document එකේ තිබෙන එක ඇවිල්ලා කිව්වා. රුපියල් ලක්ෂ 900ක්ය කියලා අද නින්දිත විධියට මඩ ගැහුවා. ඒ නිසා මම අහන්න කැමැතියි, ඒක කිව්වේ කොහොමද කියලා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් තමයි ඒ ක්‍රීඩකයාට අඩු ගණනේ ඩොලර් 100,000ක් දීලා තිබුණේ 2023, 2024 වර්ෂවලට. ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ මොකක්ද? මලල ක්‍රීඩාව කියන්නේ මොකක්ද? අපි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු මිනිස්සුන්ට බැන්නා තමයි. නමුත් ඒ මිනිස්සු අඩු ගණනේ එහෙමවත් බැලුවා. ඊළඟට, ඊළඟ අවුරුදු දෙකේ ඒ කොන්ත්‍රාත්තුවට, එහෙම නැත්නම් ඒ ගණන ගෙවන්න ඉල්ලීම කළාම ක්‍රීඩා අමාත්‍යාංශයෙන් නිර්දේශ ලිපිවත් දුන්නේ නැහැ. මොන පළිගැනීමක්ද මේ? ඒ ක්‍රීඩකයා අඩුම ගණනේ තමන්ගේ මාධ්‍ය සාකච්ඡාවේදී ඒවා ගැන කිව්වාද? එහෙමවත් නොකියපු ක්‍රීඩකයෙකුට තමයි ඒ විධියට මඩ ගැහුවේ. ඒක විශේෂයෙන් කියන්න ඕනෑ.

අර රෝහණ විජේවීර මහත්මයාගේ පවුල බලාගන්න මම හිතන විධියට අවුරුද්දකට දැන් රුපියල් ලක්ෂ 28ක් වියදම් කරනවා. ඒ අය මොනවා දුවලාද? එහෙම කරනවා නම්, මේ රටට මෙච්චර කීර්තියක් ගෙනැවිත් දීපු ක්‍රීඩකයාව බලා ගන්න අවුරුදු ගණනාවක් ඇතුළත රුපියල් ලක්ෂ 900ක් වියදම් කරනවා කියන්නේ මම හිතන විධියට ලොකු ගාණක් නොවෙයි. ඒකත් මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ. කථා කරනකොට කියා සිටියා, පසුගිය ටික ගෙවන්නේ නැහැ කියලා. පසුගිය ටික ගෙවන්න ඕනෑ වෙන මොනවත් නිසා නොවෙයි, ඉදිරියට එන්න ඉන්න ළමයින්ට මේ ජාතියේ දක්ෂතා දක්වන්න දිරිගන්වන්න ඕනෑ නිසායි. මොකද, අපට මතකයි ඉස්සර මේ වාගේ දක්ෂතා පෙන්වපු අයට කොළඹින් ගෙවල් දුන්නා, වාහන ලබා දුන්නා, cash prizes ලබා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒවා ලබා දුන්නේ මොනවාටද? එහෙම තමයි දිරිගැන්වීම් කළේ. දැන් අපේ රටේ ක්‍රීඩාව තුළින් ඉස්සරහට එන්න ඉන්න ළමයින්ට ඒක තමයි සිද්ධ වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටියානා සුමනසේකර කියන්නේ ඇමෙරිකානු ඔලිම්පික් අතිරේක ක්‍රීඩිකාවක්. එතුමිය ලංකාව නියෝජනය කරන්න ඇමෙරිකාව දාලා ආවා. ඉතින් ඒක හොඳයි නේ. ලංකාව අවශ්‍ය නිසා එතුමිය ආවා; මොන හේතුව මත හෝ ආවා. හැබැයි, එතුමිය කිව්වා "මට ඔලිම්පික් යන්න ලේසියි ලංකාවට ආවාම" කියලා. කමක් නැහැ. හැබැයි, ලංකාව නේ නියෝජනය කරන්නේ. ඊයේ දිනයේ ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ ෆේස්බුක් පිටුවේ දානවා, ජර්මනියේ සිටින ලාංකික දරුවන් දෙදෙනෙක් ලංකාව නියෝජනය කරන්න කැමැතියි කියලා. මේ දරුවෝ දෙදෙනා සම්බන්ධයෙන් මේ ඇමතිවරයා ලියා තිබෙනවා, "ඔවුන් ශ්‍රී ලංකා ජාතික කොඩිය යටතේ තරඟ බිමට පිවිසීම සාදරයෙන් පිළිගනිමින් ඒ සඳහා අවශ්‍ය සියලුම රාජ්‍ය සහයෝගය අමාත්‍යාංශය මඟින් ලබාදීමට කටයුතු කරන බව සහතික වූයෙමි" කියලා. දෙයියන්ගේම පිහිටයි! මේ දරුවන්ට මම කියන්නේ, කරුණාකරලා මේකත් හිතට ගන්න කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඒ දරුවන් දෙදෙනා සම්බන්ධයෙන් කළ ප්‍රකාශය සහිත ලේඛනය මම **සභාගත*** කරනවා. අර කොන්ත්‍රාත්තුව සම්බන්ධ ලේඛනය මම සභාගත කරන්නේ නැහැ. .

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා සමාජ මාධ්‍යයේ තිබුණා, "බත් මුට්ටිය උස්සන් දුවපු අයට මේ දිවිල්ල තේරෙන්නේ නැහැ" කියලා. මට ඒකේ ඇත්ත නැත්ත වැඩක් නැහැ. මේ සභාවේ ඉන්නවා ඔලිම්පික් තරඟාවලියේ මීටර් 400 දුවපු නියෝජ්‍ය ඇමතිවරයෙක්. එතුමා සිටියදී මේ වාගේ දෙයක් සිද්ධ වෙච්ච එක ගැන අපට විශාල කනගාටුවක් තිබෙනවා කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.59]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය ඇති කරන්න, ඒ වාගේම ආර්ථික සංවර්ධනය ඇති කරන්න ආනයන හා අපනයන (පාලන) පනතට අත්‍යවශ්‍ය රෙගුලාසි ටිකක් ගෙන එන මේ මොහොතේ, ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මම සතුට පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක් විධියට අපට වගකීම තිබෙන්නේ, කළු කරලා තිබිච්ච ආර්ථිකය සුදු කරලා, වට්ටලා තිබුණු ආර්ථිකය නැඟිට්ටවලා මේ රටේ ආර්ථික ස්ථාවරත්වය ඇති කරන්න, ආර්ථික සංවර්ධනය ඇති කරන්න කටයුතු කිරීමයි. මෙන්න මේ ගමන යාම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග තෝරනකොට මේ පවත්නා පද්ධතියේ තිබෙන ගැටලු, දෝෂ, අඩුලුහුඬුකම් හඳුනාගෙන ඒවාට අවශ්‍ය පිළිතුරු මැනවින් හොයන්න වෙනවා.

විදේශ ගනුදෙනුවලදී ඩොලර්වලට ඇති වන ඉල්ලුම හා සැපයුම මත අපේ විනිමය අනුපාතය තීරණය වෙනවා කියලා අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය ඩොලර් එකේ මිල පාලනය කර ගන්නේ ආර්ථිකය වහලා නොවෙයි. කාලයක් වාහන ආනයනය නවත්වා තිබුණත් අපි නැවත වාහන ගෙන්වන්න ඉඩ දුන්නා. ඒ විතරක් නොවෙයි, ජන ජීවිතවලට බලපාන ආහාර වෙන්න පුළුවන්, ඉන්ධන වෙන්න පුළුවන් මේ කිසි දෙයක් ආනයනය කරන එක අපි පාලනය කරලා නැහැ. ඒ අනුව තමයි අපි ආර්ථිකය කළමනාකරණය කරන්නේ. ඒ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

වාගේම, මේ දවස්වල අන්තර්ජාතික වශයෙන් ඇතිවෙලා තිබෙන යුද්මය තත්ත්වයත් එක්ක අපේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදු වෙලා තිබෙන බවත් අපි දන්නවා. ඒ තත්ත්වය කළමනාකරණය කර ගන්නත් අපට අවශ්‍ය වෙනවා.

දිගුකාලීන විදේශ ගනු දෙනු පිළිබඳව විමසන කොට අපට පේනවා, ඇතැම් ව්‍යාපාරිකයෝ පෙර ගෙවීමේ ක්‍රමය යටතේ මේ රටින් මුදල් බැහැර කරන බව. ඒ ගෙවීමට අදාළව භාණ්ඩ අදාළ කාලය තුළ මේ රටට එන්න ඕනෑ. එක්කෝ දින 180න් තුළ, නැත්නම් ඒ භාණ්ඩයට අනුව අදාළ කාලය තුළ මේ රටට භාණ්ඩ එනවා ද, නැද්ද කියන එක පිළිබඳව නිසි නියාමනයක් තිබිලා නැහැ. බලනකොට හුඟාක් අය රටින් ඩොලර් පිට කරලා තිබෙනවා. නමුත්, ඒවාට අදාළ වටිනාකමට රටට භාණ්ඩ ඇවිල්ලා නැහැ. මෙයින් සිද්ධ වෙලා තිබෙන්නේ මේ රටේ තිබිච්ච ඩොලර් ප්‍රමාණය විදේශ රටවලට ගිහිල්ලා තිබෙන එක විතරයි. අන්න ඒක අපේ ඩොලර් සංචිතවලටත්, අපේ විනිමය අනුපාතවලටත්, විනිමය සංචිතවලටත් බලපානවා. එම නිසා ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතට අවශ්‍ය ගැළපීම් කිරීම සඳහා මෙන්න මේ 2026 අංක 6 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පැනවීම අපේ රටේ ආර්ථික ස්ථාවරත්වය වෙනුවෙන් අත්‍යවශ්‍ය හා කාලීන අවශ්‍යතාවක් විධියට මා දකිනවා.

එය ඒ විධියට හඳුන්වා දෙනවා. විදේශ වෙළෙඳාමේදී භාවිත වන ගෙවීම් ක්‍රම අවභාවිතය වළක්වා එය නිසි මඟට ගන්න අවශ්‍ය කටයුතු අපි මේ මඟින් කරනවා. ඒ විතරක් නොවෙයි. මූල්‍ය භාවිතයේ විනිවිදභාවය ඇති කරන්නත් මේ පාලන රෙගුලාසිය බලපානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා මේ රටේ පැවතුණේ කළු ආර්ථිකයක් බව. එක්කෝ මත්ද්‍රව්‍ය හරහා, එහෙම නැත්නම් කප්පම් ගැනීම හරහා, එහෙමත් නැත්නම් වෙනත් වැරැදි ක්‍රම හරහා හොයා ගත්තු මුදල් - කළු සල්ලි - සුදු කිරීම සඳහා විවිධ ගෙවීම් ක්‍රම පාවිච්චි කරමින් රටෙන් පිටට ඩොලර් යවන්න ගත්තු උත්සාහයන් තිබෙන්න පුළුවන්. ඒ නීති විරෝධී ගනුදෙනු මේ පාලන රෙගුලාසි මඟින් පාලනයට ලක් කිරීමත් මෙහි අවශ්‍යතාවක් වනවා. අපි ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම, අපි මේ තුළින් තවදුරටත් දිරිමත් කරන පිරිසක් ඉන්නවා. මේ රටට ආදරය කරන, මේ රටේ සංවර්ධනයට දායක වන, නීත්‍යනුකූලව කටයුතු කරන ව්‍යාපාරිකයන් දිරිමත් කිරීමත් මේ පාලන රෙගුලාසිවල තවත් බලාපොරොත්තුවක් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය, ආර්ථික උපාය මාර්ගයක් විධියට දේශීය කර්මාන්තකරුවා ආරක්ෂා කරන්න, දේශීය කර්මාන්තකරුවා දිරිමත් කරන්න අවශ්‍ය කටයුතු කළ යුතුය යන්න ප්‍රතිපත්තියක් විධියට පිළිගත්තු රජයක්. 2026 අංක 5 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන්නේ අන්න ඒ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහායි. අපි කවුරුත් දන්නවා, 2017.11.09වැනි දා අංක 2044/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් පනවන ලද රෙගුලාසි මෙහිදී තවදුරටත් සංශෝධනයට ලක් කරන බව. ඒ රෙගුලාසි අනුව මේ රටෙන් ලෝහ බොර, අළු, අපද්‍රව්‍ය, අබලි හෝ අර්ධ නිමි වැනි ලෝහ ආශ්‍රිත භාණ්ඩ අපනයනය සඳහා පාලනයක් ඇති කළා. නමුත්, මේ රටට ආදරේ නැති, මා කලින් කියපු නීති විරෝධී ආකාරයන්ගෙන් රටෙන් මුදල් පිට කරන, එහෙම නැත්නම් රටට මොනවා වුණත් කමක් නැහැ තමන්ට කීයක් හරි එනවා නම් කියලා හිතන ව්‍යාපාරිකයන් මොකක්ද කළේ? තහනම් කරන ලද HS codesවලින් භාණ්ඩ යවන්නේ නැතිව ඒ වෙනුවට ඔවුන් අප ඉහත කී ලෝහමය ද්‍රව්‍යවල හැඩය හෝ අගය සුළු ප්‍රමාණයකින් වෙනස් කරලා, වෙනත් හැඩයකින් වෙනත් HS codes යටතේ අපනයනය කරන්න පටන් ගත්තා. ඒ නිසා ආර්ථිකයට ලොකු පාඩුවක් සිදු වුණා. ඒ තුළින් දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාට අත්‍යවශ්‍ය යෙදවුම් - අමු ද්‍රව්‍ය - හිඟ වුණා. අපි නැවත වතාවක් ඒ හිඟ අමු ද්‍රව්‍ය පිට රටින් ගෙන්වන්න ගියොත් මොකක්ද වෙන්නේ? අපේ ඩොලර් සංචිතවලින් අපට ඒවාට ගෙවන්න සිද්ධ වෙනවා. ඒ වාගේම ඒ ගෙනෙන අමුද්‍රව්‍යවල මිල වැඩි වුණාම මොකක්ද වෙන්නේ? අපේ දේශීය නිෂ්පාදනවල මිල වැඩි වීම තුළිනුත් අපට නැවත වතාවක් අයහපත් ප්‍රතිඵලයක් ඇති වෙනවා. 2026 අංක 5 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පැනවීමෙන් අප බලාපොරොත්තු වන්නේ දේශීය කර්මාන්තකරුවාට අවශ්‍ය අමුද්‍රව්‍ය ටික මේ රට තුළම සුරක්ෂිත කර දෙන්නයි. ඒ විතරක් නොවෙයි. දේශීයව නිෂ්පාදනය කරන ලෝහ භාණ්ඩවල මිල ස්ථාවර මට්ටමකට ගෙන එන්නත්, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ කර්මාන්තවල නියැළී ඉන්න සේවා නියුක්තිකයන්ගේ රස්සා ටික ආරක්ෂා කර දෙන්නත් මේ තුළින් අපට හැකියාව ලැබෙනවා. ඒ වාගේම, නීති විරෝධීව කෙරෙන ලෝහ සහ ලෝහ ආශ්‍රිත අපනයන වැළැක්වීම තුළින් මේ රටට අවශ්‍ය සම්පත් මේ රටේ ඉතිරි කර දීමත් සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දරිද්‍රතා රේඛාවට යටින් ඉන්න අපේ සාමාන්‍ය ජනතාවගේ ආදායම වැඩි කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ටික දිරිමත් කිරීමට අපි මේ වන කොට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන් "ප්‍රජා ශක්ති" දිළිඳුකම තුරන් කිරීමේ ජාතික වැඩසටහන මඟින් දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම කණ්ඩායම් විධියට හෝ තනි තනිව හෝ කුමන හෝ ආදායම් උත්පාදන මාර්ගයක නිරත වීම සඳහා අපි රුපියල් මිලියනයක්, මිලියන එකහමාරක් දීලා තිබෙනවා. එවැනි කර්මාන්තකරුවන් දිරි ගන්වන්න, බිමේ ස්ථාවර කරන්න නම් මෙවැනි පාලන රෙගුලාසි අපට වැදගත් වනවා.

ඒ විතරක් නොවෙයි, අස්වැසුම ප්‍රතිලාභ ලබා ගන්නා අය සවිබලගැන්වීමේ වැඩසටහනක් අපි වෙනමම ක්‍රියාත්මක කරනවා. එතැනිනුත් කර්මාන්තකරුවන් පිරිසක් බිහි වෙනවා. එසේ කර්මාන්තකරුවන් බිහි වන කොට ඔවුන්ට අවශ්‍ය ස්ථාවර පසුබිම, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික අප හදලා තිබුණේ නැත්නම් වෙනදා කර්මාන්ත වෙනුවෙන් වියදම් කරපු මුදල් කොහේ ගියාද කියලා හොයන්න බැරුවා වාගේ අද වියදම් කරන මුදල්වලටත් ඒ දෙයම වෙන්න පුළුවන්. අප මේ රෙගුලාසි පනවන්නේ මේ රටේ කළු වෙලා තිබුණු ආර්ථිකය සුදු බවට පත් කරන්නයි; එහෙම නැත්නම් නීති විරෝධී විධියට මෙරටින් මුදල් පිට වන ක්‍රම වළක්වා මේ ආර්ථිකයේ යම් නියාමනයක් ඇති කරන්නයි; ඒ තුළින් ආර්ථික සංවර්ධනයක් ඇති කරන්නයි. ඒ බව මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට විනාඩි 12ක් තිබුණා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 10ක් කියලායි සඳහන් වන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 2.08]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

මම මේ අවස්ථාවේ කථා කරන්න බලාපොරොත්තු වන්නේ, අපනයන ක්ෂේත්‍රය දියුණු කරනවා වාගේම ආනයන ආදේශන ඇති කරන්නේ කොහොමද කියන එක ගැනයි. මොකද, අද ඉදිරිපත් කරලා තිබෙන්නේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි කිහිපයක්.

මට පෙනෙන විධියට, මේ ආණ්ඩුව විසින් වෙනසක් ඇති කරන්න හදන්නේ සම්පූර්ණයෙන්ම පාලනය කිරීම මඟින් මිස දිරිගැන්වීම්වලින් නොවෙයි. මේකෙන් කොහොමද අරක නැති කරන්නේ, මේකෙන් කොහොමද අරක කරන්නේ, මේකෙන් කොහොමද අපරාධ වළක්වන්නේ කියන ඒවා ගැනයි බලන්නේ. ඒවා කරනවාට වඩා දිරිගැන්වීම් කිරීමයි අවශ්‍ය. මම මේ ගරු සභාවට එන්න ඉස්සෙල්ලා කර්මාන්ත විෂයය පිළිබඳ සාකච්ඡා කරන කාරක සභාවේයි සිටියේ. චතුරංග මැතිතුමාත් එතැනයි සිටියේ. හරි හෝ වැරදි හෝ තීන්දු ගන්න අවශ්‍යයි. නමුත්, මේ අවස්ථාවේ ඔබතුමන්ලාත් කරන්නේ පාලනය කිරීමයි.

මේ කථා කරන මොහොත වන විට මූල්‍ය ක්ෂේත්‍රයේ අපට තිබෙන වැදගත්ම දේ තමයි අපේ මූල්‍ය සම්පත. ඒ කියන්නේ විදේශ මුදල් සම්පත. ඒක තමයි අපට තිබෙන scarce resource එක සහ ලොකුම සම්පත. එය ආරක්ෂා කරන්න අවශ්‍යයි. නමුත්, මේ රටේ කර්මාන්තකරුවන්ට ආනයන අපනයන කාර්යය කරද්දී කොතරම් දේවල් සම්පූර්ණ කරන්න තිබෙනවාද කියලා බලන්න. Registration එක කරන්න Department of Registrar of Companies එකට ගියොත්, මාස දෙකතුනක් ඉන්න වෙනවා. මොකද, ASYCUDA එක online වැඩ කරන්නේ නැහැ. ඊට පස්සේ බැංකුවකට යන්න අවශ්‍යයි. බැංකුවට ගිහිල්ලා බැංකු procedure එක අනුව කටයුතු කරන්න අවශ්‍යයි. KYC පරීක්ෂා කරලා ඒගොල්ලන් මොකක්ද කියන්නේ කියා බලලා එතැන ලියාපදිංචි වෙන්න තිබෙනවා. මහ බැංකුවේ නියෝජිතයා වශයෙන් බැංකු ආයතන කටයුතු කරගෙන යනවා. ආනයනය කරන්න ඉස්සෙල්ලා ඒගොල්ලන්ට කියන්න අවශ්‍යයි, කොහෙන්ද එන්නේ, කීයද, කින්ද මන්ද කියලා. බැංකුව KYC එක බැලුවාට පස්සේ දෙපාර්තමේන්තුවට ගිහිල්ලා import licence එකක් ගන්න සිදු වන අවස්ථාත් තිබෙනවා. ඊට පසුව Sri Lanka Customs එකට ගිහිල්ලා ලියාපදිංචි කරන්න අවශ්‍යයි. Sri Lanka Customsහි ලියාපදිංචි කරන්න පටන් ගත්තාට පසුව මොකද වෙන්නේ? මේ කිව්වේ, ආනයනකරුවන් ගැනයි. අපනයනකරුවෙකු වුණත් එයාත් ගිහින් තමන් අපනයනකරුවෙකු ලෙස අපනයනය කරනවා කියලා ලියාපදිංචි වෙන්න ඕනෑ. අපනයනය කරනවාද, ආනයනය කරනවාද, බොරු කරනවාද කියලා CID එකෙන් පොලිස් වාර්තාවක් ගන්න එක විතරයි කරන්න තිබෙන්නේ.

මහජන ආරක්ෂක ඇමති ගරු ආනන්ද විජේපාල මැතිතුමා එදා හෙළිදරව්වක් කළා. ඒක බොහොම හොඳයි. අපි ඒක ගැන ඊයේ Public Finance Committee එකේ කථා කරන කොට අපට පෙණුනා, මේකේ තිබෙන්නේ සාමාන්‍ය ගනුදෙනු බව; මේක ගැන බැංකු ක්ෂේත්‍රය කටයුතු කරලා නැති බව; එසේ කටයුතු නොකිරීම තුළ ගැටලු මතු වෙලා තිබෙන බව. අපේ රටේ සියයට 95ක් හොඳ ආනයනකරුවන්, හොඳ අපනයනකරුවන් තමයි ඉන්නේ. ඉතින් මේ කියන සියයට දෙකක් තුනක් අල්ලන්න ගිහින් මුළු ක්ෂේත්‍රයම යම් ප්‍රශ්නයකට තල්ලු කරලා තිබෙනවා. මදුරුවෙකු මරන්න T56 එකක් දෙනවා වාගේ වැඩ නොකළ යුතුයි. නීතිගත කරන්න අවශ්‍ය දේවල් ද තිබෙනවා. නමුත්, මීට වඩා දිරිගැන්වීමක් කරන්න අවශ්‍යයි. අපට අවශ්‍ය වන්නේ මේ සම්බන්ධයෙන් දිරිගැන්වීම් කටයුතු කරන්නේ කොහොමද කියන එක ප්‍රකාශ කිරීමයි. ඒ සඳහා කරන්න තිබෙන හොඳම විසඳුමක් තමයි පොලී අනුපාත අඩු කිරීම. ඊට පස්සේ සේවක පිරිසට පඩි ගෙවීමේ ගැටලු තිබෙනවා. සියයට 30ක් tax තියාගෙන කොයි ආකාරයටද ව්‍යාපාරිකයන් දිරිගන්වන්නේ? ඉන්දියාව, බංග්ලාදේශය වැනි රටවල් ඒ බදු ප්‍රතිශතය සියයට 10ත්, 12ත් අතර මට්ටමක තියෙද්දී, අප රටේ මේ තත්ත්වය ව්‍යාපාරවලට ලොකු බාධකයක් ලෙස තමයි මට පෙනෙන්නේ. ඊළඟට අපේ උපයන විට ගෙවන බද්ද - PAYE Tax - සියයට 36ක තිබෙනවා කියන්නේ ව්‍යාපාරිකයන් විශාල අධෛර්යවත් කිරීමක්. මේවා වෙනස් කර ගැනීම තමයි අවශ්‍ය වන්නේ. ඊට පස්සේ අපේ විදුලි බිල, තෙල් මිල වැඩි වීම තරගකාරි බවක් ඇති කර ගැනීමට දැඩි බාධාවක් වෙලා තිබෙනවා. එම නිසා, මේවා සම්බන්ධයෙන් කඩිනම් වෙනසක් ඇති කරන්න ඕනෑ. ආණ්ඩුව ව්‍යාපාර දිරිගැන්වීම තමයි කරන්න ඕනෑ. ඒකට අපේ නිර්පාක්ෂික සහයෝගය සම්පූර්ණයෙන් දෙන්න තමයි අපි කටයුතු කරන්නේ. මොකද, අපි මේවා පාලනය කරනවා වැඩියි කියන මතයේ තමයි මා සිටින්නේ.

BOI එක ගත්තොත්, දැන් එතැනට හොඳ සභාපතිවරයෙක් පත් කර තිබෙනවා. අපි එතුමාට අවස්ථාවක් දිය යුතුයි. නමුත්, ඒ කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් අවුරුදු 35ක් වැඩ කරන පිරිසක්. ඉතින් කිසිසේත්ම අලුත් ගමනක් නැහැ. One-stop-shop කිව්වාට, සියල්ල නැවතෙන්නේත් BoI එකෙන්. කිසිම දෙයකට අවසරයක් නොලැබෙන තත්ත්වයක් එතැන තිබෙන්නේ.

ඒ වාගේම Port City අපි empower කරන්න අවශ්‍යයි. මොකද, එතැන විකුණන්න පුළුවන් හැකියාවක් තිබෙනවා. ලංකාව ලෝකයට ගිහිල්ලා මේ කටයුතු කරන්න පුළුවන් හැකියාව ඇති කරන්නේ කෙසේද කියලා බලන්න ඕනෑ.

මම ආණ්ඩුවෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලන්නේ, කරුණාකරලා මේ තිබෙන බාධක ඉවත් කරන්න කියලායි. මේ අවස්ථාවේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි බදු. මේ බදු කොහොමද අපි මීට වඩා ලිහිල් කරන්නේ? IMF එකෙන් කියන්නේ නැහැ ඒක සියයට 30ද සියයට 40ද කියලා. නමුත් දැන් ආදායමක් උපයා ගෙන එනවා. නමුත් ආදායම වැඩිවීම විතරක් මදි. ඒක වියදම් කරන්න අවශ්‍යයි. කර්මාන්ත ඇති කිරීම, පාරවල් හැදීම, ගෙවල් හැදීම, වරාය හැදීම, expressways ඇති කිරීම වැනි දේවල් තමයි අවශ්‍ය වන්නේ.

මේ අවුරුද්දේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් 1,345ක් වෙන් කර තිබුණත්, දැනට ඒකෙන් වියදම් කරලා තිබෙන්නේ බිලියන 284යි. ඒ පැත්ත වැඩි කරන්න තමයි අවශ්‍යතාව තිබෙන්නේ. මම එහෙම කියන්නේ මේකයි. අපි කුහක දේශපාලනඥයෝ නොවෙයි. අපට අවශ්‍ය වන්නේ මේ ආර්ථිකය නිල්ද, රතු ද, කොළද, කහද නැතහොත් දම්ද කියන එක නොවෙයි. අපට අවශ්‍ය වන්නේ ආර්ථිකයේ වර්ධනය වීමක් ඇති කිරීමටයි. දැන් තිබෙන්නේ Public Financial Management Act එක. ඒකෙන් කියන්නේ ආර්ථික වර්ධන වේගය ගැන. වර්ධනය වැඩි වෙන්න, වැඩි වෙන්න තමයි ආර්ථිකයක් ප්‍රසාරණය වන්නේ. මේ අවස්ථාවේ සියයට 13ක් තමයි වියදමට තිබෙන්නේ. පුනරාවර්තන වියදම්වලට විතරක් මුදල් වෙන් කිරීම පමණක් නොවෙයි අපට අවශ්‍ය වුණේ. ප්‍රාග්ධන වියදම වැඩි කිරීමෙන් තමයි අපේ රටේ

[ගරු රවී කරුණානායක මහතා]

සංවර්ධනයක් ඇති වන්නේ. මොකද, හෙට රටට ආදායමක් ලැබෙන්නේ අද කරන ආයෝජනයෙන්. අද අපි සියයට 10ක ආයෝජනයක් කළොත්, ඒක හෙට සියයට 4ක හෝ 5ක ප්‍රතිලාභයක් උපයන්න පුළුවන් මට්ටමකට එනවා.

කර්මාන්ත අමාත්‍යාංශයෙන් National Export Development Plan එකක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම මෙතැනට එන්න කලින් ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා සමහත් සාකච්ඡා කළා. ඒ අදහස හොඳයි. නමුත් ඒ අදහස ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න බැරි නම්, එතැනින්ම නවතිනවා නේද? මේකද අපට අවශ්‍ය වෙන්නේ? අද තිබෙන යූ.එස්. ඩොලර් බිලියන 18ක ප්‍රමාණය අවුරුදු 5කින් සියයට 36ක් කරනවා නම් සියයට සියයකින්ම වර්ධනය වෙනවා. එලෙස සියයට සියයක වර්ධනයක් ළඟා කර ගැනීමට නම් වසරකට සියයට 15.8ක වර්ධන වේගයක් එක්ක රට සංවර්ධනය වෙන්න අවශ්‍යයි. පසුගිය අවුරුදු 20කදී සියයට 6ක තිබුණු ආර්ථික වර්ධන වේගය, පසුගිය අවුරුදු 10 තුළ තිබෙන සියයට පහක ආර්ථික වර්ධන වේගය දැන් තිබෙන ස්වරූපය අනුව සියයට 15.8කට වැඩි කරන්න පුළුවන්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අන්න ඒ නිසා තමයි අපි ප්‍රායෝගික මට්ටමින් ඉලක්ක තියන්න අවශ්‍ය වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 76ක ශාපය කිව්වාට, ඒ ශාපය තුළ තමයි මහවැලියක් හැදුණේ. ඒ ශාපය තුළ තමයි මහපොළ ශිෂ්‍යාධාර ඇති වුණේ, විශ්වවිද්‍යාල ඇති වුණේ, පාසල් 10,800ක් ඇති වුණේ, ගෙවල් ලක්ෂ 10ක් ඉදි වුණේ, මහා පරිමාණ ජල විදුලි බලාගාර සහ ජලාශ ඇති වුණේ. ඒ වසර 76 තුළ මෙවැනි වැඩ කොටසක් වුණා නම්, ඔබතුමන්ලා ඊට වඩා හොඳින් මේ දේවල් කරන්නේ කොහොමද කියන එක තමයි දැන් රටට පෙන්වන්න අවශ්‍ය වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ තිබෙන ප්‍රශ්න ටික නැති කරන්නයි ඕනෑ. ඒක කරන්නයි මම මෙතැන ඉඳන් උත්සාහ කරන්නේ. මේවා සුරංගනා ලෝකයට ගෙන ගියා කියලා කිසිසේත්ම වෙනසක් වෙන්නේ නැහැ. අපි ආර්ථික වර්ධන වේගය සියයට 15ක් වෙනවා කිව්වොත්, රට වෙනුවෙන් වැඩ කරන රාජ්‍ය සේවය වුණත් හිතයි, මේක ප්‍රායෝගික නැහැ, මෙයින් වැඩක් නැහැ කියලා. මම හිතන විධියට, මෙහි තිබෙන negative aspect එක, ඒ කියන්නේ ආදායම උපයන්න බැරි මට්ටමේ තිබෙන දේවල් නිවැරදි කිරීම තමයි අවශ්‍ය වන්නේ.

අපි මොහොතක් බලමු, මේ තුළින් කොයි ආකාරයෙන්ද අපනයනය වැඩි වෙන්නේ කියලා. බලන්න, අද වෙළෙඳ ශේෂයේ - trade balance එකේ - හිඟය. එහි යම් විධියක අඩුවීමක් තිබෙනවා. මොකද, අපනයනය වැඩි වුණා කියලා ආනයනය අඩු වෙලා නැහැ. ඒක ඊට වඩා වැඩි වෙලා තිබෙනවා. අපනයනය වැඩි වෙලා තිබෙනවා, සියයට 11කින්. ආනයනය වැඩි වෙලා තිබෙනවා සියයට 23කින්. මේක entrepot trading එකක්. Entrepot trading එකක් තිබෙන එක බොහොම හොඳයි. හැබැයි, අද entrepot trading එකට බද්දක් පනවා තිබෙනවා, නිල වශයෙන්ම එකතු කරන්න තිබෙන අගය සියයට 30කට වැඩි වෙන්න ඕනෑය කියලා. සිංගප්පූරුව, Cambodia, වියට්නාමය, මැලේසියාව වාගේ රටවල් entrepot tradingවලින් තමයි ඉදිරියට ගිහින් තිබෙන්නේ. ඒකෙන් ඩොලරයක් එකතු වුණත්, ඒක entrepot trading එකේ සංවර්ධනයට එකතු වුණා කියලා තමයි ඒගොල්ලන් පිළිගන්නේ. නමුත් ලංකාවේ සියයට 30ක් එකතු වෙන්න ඕනෑය කියනවා. ඒක වෙන්නේ නැහැ. මේ තුළ වෙන්නේ අපේ රට තුළ කරන්න පුළුවන් ක්ෂේත්‍ර, කරන්න පුළුවන් කර්මාන්ත කඩා වැටෙන එකයි. ඒ විතරක් නොවෙයි අධෛර්යවත් කිරීමකුත් සිදු වෙනවා. මෙතෙක් කාලයක් ලංකාවට හොඳ නමක් තිබුණා. අපි නිල වශයෙන් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩියක් පමණක් අමතර කාලය වශයෙන් ලැබී තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එච්චරද? මම මේ කථා කළේ හොඳ දේවල් එකතු කරන්නේ කොහොමද කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාවත් එක්ක සටනක් තමයි තිබෙන්නේ කියලා මා දන්නවා.

මම කලින් සඳහන් කළා වාගේ අපට මෙන්න මේවා පරිපාලනය කිරීම තමයි අවශ්‍ය වන්නේ. අද ඩොලරයේ අගය රුපියල් 341යි. ඩොලරයේ අගය රුපියල් 341ක් වන අපේ රටේ වර්ධන වේගය වැඩි වෙලා, ඒකේ nominal rate එක එළියට ගත්තාම, nominal rate එක සියයට හතකින් වර්ධනය වෙලා තිබෙනවා. හැබැයි, ඒකෙන් උද්ධමනය අඩු කළාම ඒක සියයට පහට අඩු වෙලා තිබෙනවා. එතකොට සියයට හතේ වර්ධන වේගයක් කිව්වාට වැඩක් නැහැ, සියයට පහ නම් සැබෑ වර්ධන වේගය. ඒ වාගේම තමයි මම කලින් කිව්වා වාගේ අද වනවිට අපේ විදේශ සංචිත - foreign reserves - ප්‍රමාණය ඩොලර් බිලියන 6.4ක්. කැමැති වුණත්, අකැමැති වුණත් මෙතැනදී කිව යුතු දෙයක් තිබෙනවා. 2024 සැප්තැම්බර් මාසයේ පාලන බලය ගන්නකොට, අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය යූඑස් ඩොලර් බිලියන 6.1ක් තිබුණා. එදා ඉඳලා අද වෙනකොට මාස 24කට ආසන්න කාලයක් ගිහිල්ලා තිබෙනවා. ඒ මාස 24 තුළ අපට මහ බැංකුව තුළ විදේශ සංචිත වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ මිලියන 300කින් විතරයි.

අපි විදේශ සංචිත එකතු කරන්න ඕනෑ. මම හැම අවස්ථාවකදීම කියනවා වාගේ මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. එසේ ගෙන යන්න අවශ්‍ය වන්නේ පාට කිරීමකින් නොවෙයි, ආර්ථිකය සංවර්ධනය කිරීමෙන්. ආර්ථිකය සංවර්ධනය කරන්න නම් අපි මේ පාට ටික නැති කරලා එකට වැඩ කරන්න ඕනෑ. මම මේ කියන්නේ ඔබතුමන්ලාට කරන්න පුළුවන් දේවල් මිසක් කරන්න බැරි දේවල් නොවෙයි නේ. පොලී අනුපාතය අඩු කරන්න, විදේශ සංචිත වැඩි කරන්න, වර්ධන වේගය වැඩි කරන්න, බදු අඩු කරන්න කිව්වොත්, මහ බැංකුව ධෛර්යවත් කරන්න පුළුවන් විධියට ඒ තීන්දු ටික ගන්න පුළුවන් වන්නේ කොහොමද කියන එකයි මේ සියල්ලටම තිබෙන සාධකය වන්නේ. එතකොට මේ National Export Development Plan එක තුළ අපේ වර්ධන වේගය සියයට 15ට නොවෙයි, අඩු ගණනේ සියයට හතක් දක්වා ගියත් ඒක ලොකු දෙයක්. මේවා තමයි කරන්න තිබෙන දේවල්. මේවා තුළින් තමයි රටක් ඉදිරියට ගෙන යන්න පුළුවන්. Imports and Exports (Control) Act එක යටතේ අද මේ Regulations ගෙනෙනවා. හෙට තව එකක් ගෙනැවිත් කියයි, අපනයනය කරන්න තිබෙනවා, ඒ නිසා කරුණාකර අපනයනවලින් උපයා ගන්නා ඩොලර් එකත් ලියාපදිංචි කරන්න කියලා. එහෙම කරන්න ගියොත් ආයෝජකයන් ලේසියෙන් මේ රටට එන්නේ නැහැ. මොකද, ආයෝජකයන් රටකට එන්නේ ඒගොල්ලන්ට ලේසියෙන් වෙළෙඳාමක් කරන්න පුළුවන් හැකියාවක් ඇති කළොත් විතරයි. එහෙම නැතුව ඒගොල්ලන් එන්නේ අපට ආදරේට නොවෙයි. ඒගොල්ලන්ට මේ රට තුළින් ඩොලර් 10ක් හොයා ගන්න පුළුවන් නම්, වෙන රටකින් හොයා ගන්න පුළුවන් වන්නේ ඩොලර් පහක් විතරක් නම්, ඒගොල්ලන් මේ රටට එනවා. නමුත් මේ රටට ඇවිල්ලා ඩොලර් දහයක් හොයා ගැනීමේදී ඒගොල්ලන්ට උසාවියට ඉදිරිපත් වෙන්න වුණොත්, අපනයනය කිරීමේදී ප්‍රශ්න ඇති වුණොත්, - ඒගොල්ලන්ට ඩොලර් දහයක් හොයන්න එච්චර ප්‍රශ්න ඇති වෙනවා නම් - ඒගොල්ලන් මෙහේ වෙළෙඳාම් කරන්නේ නැහැ. වෙනත් රටකට යාවි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක දෙයයි අහන්නේ. යම් නිෂ්පාදනකරුවෙක් මේ රටට අමුද්‍රව්‍ය ආනයනය කරලා, භාණ්ඩ නිෂ්පාදනය කර අපනයනය කරනවා නම් කොතරම් බදු ප්‍රමාණයක් ගෙවන්න වෙනවාද? ආනයනය කරන අවස්ථාවේදී VAT එකට සියයට 18ක් ගෙවන්න ඕනෑ. Import කරනකොට PAL එකට සියයට 10ක් ගෙවන්න අවශ්‍යයි. ඊළඟට, SSCLවලට සියයට 2.5ක් ගෙවන්න ඕනෑ. PAL සහ CAL ගෙව්වාට පසුව තවත් සියයට පහක් Customs Duty විධියට ගෙවන්න අවශ්‍යයි. Customs Duty එක සියයට බින්දුවද, දහයද, විස්සද, තිහද කියා බැලුවාම, බැරි වෙලාවත් සියයට 30ක් වශයෙන් වැඩිම එකේ තිබුණොත්, අමුද්‍රව්‍ය ආනයනය කර යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරලා එළියට ගෙනෙනකොට, එම භාණ්ඩය වෙනත් රටක භාණ්ඩයක් එක්ක සංසන්දනය කර බැලුවාම පෙනී යනවා, එම භාණ්ඩය වෙනුවෙන් සියයට 65ක් ගෙවා තිබෙන බව. ඒ කියන්නේ VAT එක ගෙවා අමුද්‍රව්‍ය ආනයනය කර භාණ්ඩයක් නිෂ්පාදනය කරලා එය අපනයනය කර reclaim එකක් ගන්නයි තිබෙන්නේ. මෙන්න මේවා තමයි අපි නැති කරන්න අවශ්‍ය වන්නේ. ඊට පසුව ලාභයක් ගත්තාම ඒකෙන් සියයට 30ක් ගෙවන්න අවශ්‍යයි. ඒ නිසා, අධෛර්යවත් කරන බදු ඉවත් කරලා මේ අයට සහනයක් දෙන්න. දැන් ටොන් ගණන් සල්ලි හම්බ වෙලා තිබෙනවා නේ. ඒවායින් ආයෝජකයින්ට උදවු කරන්න පුළුවන් විධියට වැඩ කටයුතු කරන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.22]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි විවාදයට භාජන කරන්නේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි දෙකක් පිළිබඳවයි. ඒ තමයි, 2026 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ 2026 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි. අපි දන්නවා, රටක කාර්මීකරණයට බලපාන ප්‍රධාන සාධක කිහිපයක් තිබෙන බව. එහි ප්‍රධාන සාධකයක් තමයි අමුද්‍රව්‍ය - raw materials - කියන එක. විශේෂයෙන්ම "ලෝහ" කියන ප්‍රධාන අමුද්‍රව්‍ය අපේ රටේ නැහැ. අපි ඒක ආනයනය කරනවා. එහෙම කරලා අපි නිෂ්පාදන කටයුතු කරනවා. ඒ වාගේම ඊළඟ මූලාශ්‍රය වෙන්නේ ලෝහ ප්‍රතිචක්‍රීකරණයට භාජන කරලා ලබා ගන්නා ලෝහ. ඒ හරහා අපේ දේශීය නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න අපට පුළුවන්. 2004 වර්ෂයේ ඉඳලා අපේ රටේ අබලි ලෝහ ටික භාවිත කරලා යම් යම් නිෂ්පාදන කටයුතු කළා. විශේෂයෙන්ම දේශීය නිෂ්පාදකයන් අගය එකතු කිරීමේ නිෂ්පාදන - value addition - කළා. නමුත්, යම් බෙදවාවකයක් තිබෙනවා. මේ ක්ෂේත්‍රයේ කටයුතු කරන සමහර කර්මාන්තකරුවන් ප්‍රතිචක්‍රීකරණය කරන ලද ලෝහ පිට රට යවනවා. මෙන්න මේ කටයුත්ත හරහා දේශීය කර්මාන්තකරුවන්ට විශාල තර්ජනයක් ඇති වෙනවා; ඔවුන්ට අවශ්‍ය ලෝහ නැති වෙනවා. ඒ නිසා මේ කර්මාන්ත ක්‍රමයෙන් අභාවයට පත් වෙනවා. විශේෂයෙන්ම මෙන්න මේ කාරණාව සලකා බලා තමයි අද දවසේ අපි මේ සාකච්ඡා කරනු ලබන රෙගුලාසි පිළිබඳව කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ සංවර්ධනය ගැන කථා කරනකොට මෑත ඉතිහාසය අපට අමතක කරන්නට බැහැ. 2022 දී ලංකාව මුහුණ දුන්නේ සාමාන්‍ය ආර්ථික මන්දගාමීත්වයක නොවෙයි කියන එක අපි දැක්කා. ඒක රටේ මූලික ආර්ථික පද්ධතිවල බිඳ වැටීමක්. ඒ වාගේම විදේශ විනිමය හිඟය උග්‍ර වෙනවා; ඉන්ධන පෝලිම් දෛනික ජීවිතයේ කොටසක් බවට පත් වෙනවා; රෝහල්වල ඖෂධ සැපයීම අඩාළ වෙනවා; අද අපි කථා කරන කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන්න බැරි වෙනවා; මේ රටේ උද්ධමනය වැඩි වෙලා ජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය පහළට වැටෙනවා; රුපියල දැඩි ලෙස දුර්වල වෙනවා, අපි දැක්කා. අවසානයේ මොකද වෙන්නේ? රජයේ ණය ගෙවීම් නවතා දමනවා. මෙන්න මේක තමයි වෙන්නේ. ඒ විතරක් නොවෙයි. රටේ දළ දේශීය නිෂ්පාදිතය සෘණ 7.3ට හැකිළුණා; රාජ්‍ය ආදායම් පදනම දුර්වල වුණා. විශේෂයෙන්ම ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාවේදී රටට අවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය තිබුණේ නැහැ. මෙන්න මෙවැනි අඳුරු ආගාධයක තිබුණු මේ රටට 2026 ජුලි මාසයේදී මොකද වෙන්නේ? ලෝක බැංකුව විසින් අපේ රට ඉහළ මැදි ආදායම් ලබන රටක් විධියට ප්‍රකාශයට පත් කරනවා. ඒක කොහොමද වෙන්නේ? අපට චෝදනා එල්ල වුණා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට පෙට්ටි කඩයක්වත් කරගන්න බැහැයි කිව්වා; ආධුනිකයි කිව්වා. හැබැයි, ඒ ආණ්ඩුව තමයි අද වෙනකොට මේ රට ඔසවා තබන්නේ. කොහොමද මේක වෙන්නේ? ඉහළ මැදි ආදායම් කාණ්ඩයට යන්න නම් ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,636 පන්නන්න ඕනෑ. මොකද වෙන්නේ? 2025 දී රටේ ආර්ථික ස්ථායීකරණය යටතේ අපි මේ මට්ටම පන්නනවා. 2022 දී රට බිඳ වැට්ටුවාට පසුව අපි කරපු ප්‍රාතිහාර්යය මොකක්ද? රට පුරාම දැඩි මූල්‍ය විනයක් නිර්මාණය කිරීම.

මේ රටේ බිඳ වැටිලා තිබුණු ආර්ථිකයේ වර්ධනය අපි සිදු කරනවා. ඒ වාගේම මේ රටේ විදේශ විනිමය ශක්තිය දවසින් දවස ඉහළට ගෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවක් ගිලෙන්න යනකොට ඒක ගොඩගන්න නම් අපි කරන්න ඕනෑ මොකක්ද කියලා අපි දන්නවා. ඒ නැවට නව ගමනාන්තයක් නිර්මාණය කිරීම නොවෙයි, ඒ නැවට වතුර ඇතුළු වෙන පුංචි පුංචි සිදුරු ටික වහන්න ඕනෑ. ඒ වාගේ තමයි, කඩා වැටුණු මේ ආර්ථිකය ගොඩනැංවීමේදී අපි කළේ මොකක්ද? නව සංවර්ධන පොරොන්දු දෙන එක නොවෙයි. රටේ උද්ධමනය, විදේශ විනිමය හිඟය, ණය පීඩනය වාගේම, රාජ්‍ය මූල්‍ය විනය බිඳ වැටීමට හේතු වෙච්ච සාධක, ඒ මූලික ගැටලු පාලනය කරන්න ඕනෑ. මෙන්න මේ විධියට ජාතික ජන බලවේගය ආණ්ඩුව ඒ මූලික ආර්ථික මූලධර්ම දැඩිව අනුගමනය කළා. ඒකේ ප්‍රතිඵලයක් විධියට දැන් මොකද වෙන්නේ? මේ රට ඉහළට යනවා. අපි උද්ධමනය පාලනය කළා. ඒ වාගේම ණය ප්‍රතිව්‍යුහගතකරණය කළා. කෙටි කාලීන ණය ගැනීම් පීඩනය අපි අඩු කළා. ඒ වාගේම මේ රටේ රාජ්‍ය මූල්‍ය විනය ඇති කරනවා. අපි කොහොමද ඒක කරන්නේ? අපි ආදායම් රැස් කිරීම ශක්තිමත් කරනවා, වියදම් පාලනය කරනවා, අය වැය හිඟය අඩු කරනවා. අපි අවිධිමත් ණය ගත්තේ නැහැ, මුදල් අච්චු ගැහුවේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

Order, please! අද දින වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
අන්න ඒ විධියට තමයි අපි මේ රටේ මූල්‍ය විනය ඇති කළේ. 2022දී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තොත්, 8.4ක් ලෙස තිබුණා. අපි 2025 වෙනකොට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 16.7ට අරගෙන ආවා. ඒක කොහොමද වෙන්නේ? ඒක ස්වයංක්‍රීයව සිද්ධ වෙච්ච දෙයක් නොවෙයි. අපි බදු පරිපාලනය ශක්තිමත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බදු අනුකූලතාව වර්ධනය කරනවා. අපි ඩිජිටල්කරණය, ආදායම් රැස් කිරීම සිදු කරනවා. ඒ වාගේම මේ රටේ වියදම් පාලනය ක්‍රමානුකූලව කරනවා. ඒ විතරක් නොවෙයි. මේක දූෂණයට එරෙහිව ගත්ත පාලන ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක්.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2022දී ප්‍රාථමික ශේෂය සියයට සෘණ 3.4යි. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට එහි හිඟයක් තිබුණේ. ඒක, 2025 වෙනකොට සියයට 5.4ක අතිරික්තයක් බවට පරිවර්තනය වෙනවා. ඒ වාගේම, ඒකට සමගාමීව අය වැය හිඟය සියයට 2.3ක් දක්වා අපි අඩු කරනවා. මේක, එසේ මෙසේ වෙනසක් නොවෙයි. 1956න් පස්සේ වාර්තා වෙච්ච අඩුම අය වැය හිඟය, මේක. විපක්ෂයේ ආර්ථික ඔස්තාර්ලා දැන් මොකද කියන්නේ කියලා මම අහනවා. මට ප්‍රථමයෙන් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් හා විපක්ෂ නායකතුමා කිව්වා, ජන ජීවිතය කඩා ගෙන වැටිලාලු, ණය බර වැඩි වෙලාලු, ජනතාවට සහන දෙන්න සංවේදී නැතිලු, ඒ වාගේම කියනවා අපි මේ රටේ දේවල් පාලනය කරනවාලු. නැහැ, අපේ ආර්ථික ක්‍රමය අනුව ඒ කාරණා ක්‍රමයෙන් එකින් එක අපි ඉදිරියට අරගෙන යන මොහොතක්, මේ. මේ විධියට තමයි ජාතික ජන බලවේගය "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්තිය පදනම් කරගෙන, ඊළඟ මට්ටමට මේ රට ගෙනාවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතින්, ලෝක බැංකුවේ මේ සහතිකය ලැබීමත් එක්ක, ජාත්‍යන්තරය කරන්නේ මොකක්ද? මේ රට පිළිබඳව තිබෙන ආකල්පය වෙනස් වෙනවා. දකුණු ආසියාවේ රාජ්‍යයන් ගත්තාම, අපිත් එක්ක මෙවැනි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ මාලදිවයින විතරයි. ශ්‍රී ලංකාව ඉහළ මධ්‍ය ආදායම් ලබන රටක් බවට පත්වීමත් එක්ක ආයෝජකයන්ගේ ආකල්ප වෙනස් වෙලා, මේ රටේ කර්මාන්තවලට විදේශ ආයෝජන ගෙන ඒම සඳහා අලුත් දොරටුවක් විවෘත වෙනවා. එහෙම නම් අපේ ඊළඟ ඉලක්කය මොකක්ද? තව වසර 10ක් යන විට අප ඒ ඊළඟ පියවරට යන්න අවශ්‍යයි. ඒ මොකක්ද? ඉහළ ආදායම් ලබන රටවල් කාණ්ඩයට ඇතුළු වීම. මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ සඳහා ආරාධනා කරනවා. අපේ ඉලක්කය ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 13,035 පැන්නීමයි. අන්න ඒක තමයි අපි මේ කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීන ප්‍රතිපත්තිය යටතේ ලියන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ සඳහා ඔබ සැමට ආරාධනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද කරන්න යන කථාව මේ සභාවේ සියලුදෙනාත්, අපේ රටේ ජනතාවත් අවධානයෙන් අහගෙන ඉඳීවි කියලා හිතනවා. මීට කලින් රවී කරුණානායක මහත්මයා කථා කළා. එතුමා කිව්වා, ආර්ථිකය ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ග ගැන. ඒ උපාය මාර්ග ඔක්කෝම එක්ක තමයි 2015-2019 කාලයේදී ඒගොල්ලන් සියයට 2.3ක ආර්ථික වර්ධන වේගයකට මේ රට ගෙනාවේ. ඒ වාගේම කියනවා, ආයෝජකයන්ට බදු සහන ඇතුළු අනෙක් සහන දෙන්නේ නැහැ කියලා. ඉතින් එතුමන්ලාම හදපු ආර්ථිකය බංකොලොත් වෙච්ච නිසා තමයි 2023දී බදු පදනම පුළුල් කරන්න වුණේ. ඒ නිසා මේක සුවිශේෂී අවස්ථාවක්. මොකද, අද මේ නිවැරදි කරන්න යන්නේ රවී කරුණානායක මහතා එදා ගෙනාපු පනතේ තිබුණු ප්‍රශ්නයක්. ඒ නිසා තමයි මේ රටේ ජනතාව මේ ගැන හරියට දැනගන්න ඕනෑ. මොකද, 2017 ජූලි මාසයේ 25වැනි දා, ඒ කියන්නේ හරියටම මීට අවුරුදු 9කට ඉස්සෙල්ලා විපක්ෂයේ හිටපු විජිත හේරත් මන්ත්‍රීතුමා - දැන් අපේ පක්ෂයේ ඇමතිතුමා - මේ සභාවේදීම ඒ පනතට කිව්වා, "කළු සල්ලි සුදු කිරීමේ පනත" කියලා. එහෙම තමයි ඒ පනත හැඳින්වූයේ. ඒකේ ප්‍රතිවිපාක තමයි අද අපි රටක් විධියට අත්විඳින්නේ.

1953 අංක 24 දරන විනිමය පාලන පනත - Exchange Control Act - මෙතුමන්ලා අයින් කළා, 2017දී. අයින් කරලා Foreign Exchange Act එක ගෙනාවා. අන්න එතැනදී මම හිතන විධියට මේ සභාවේදීම ලොකු විවාදයක් ගියා, ඒ පනත ගෙන ඒම තුළින් රට මුදල් විශුද්ධිකරණයට කොච්චර නිරාවරණය වනවාද, මේ රටේ කළු රාජ්‍යයක් බිහි කරන්න ඒක කොච්චර පාදක වනවාද කියන එක ගැන. එකල විශේෂයෙන්ම විපක්ෂයේ

මන්ත්‍රීවරුන් ඒ ගැන තර්ක කළා. ඒ තර්කවලට ප්‍රතිඋත්තර දැක්වූයේ අපේ හර්ෂ ද සිල්වා මහත්මයා සහ රවී කරුණානායක මහත්මයා. ඉතින් ඒක සිද්ධ වන්නේ මෙන්න මෙහෙමයි. ඒ පනතේ තිබුණා, විදේශ විනිමය සම්බන්ධයෙන් අපරාධමය වැරදි මොනවාද කියලා. මේගොල්ලන් ඒ පනතෙන් ඒක අයින් කළා. අයින් කළාට පස්සේ ඒ පනතේ තිබෙන වැරදිවලට දෙන්න පුළුවන් වුණේ, සිවිල් දඬුවම් විතරයි. ඒ කියන්නේ, දඩ අය කරන්න විතරයි පුළුවන් වුණේ. ඒ නිසා තමයි 2017 ඉඳලා යාළුවෝ ඔක්කෝම එකතු වෙලා හොරකම් ඔක්කෝම පටන් ගත්තේ. මොකද, සිවිල් දඬුවමක් විතරයි දෙන්න පුළුවන් වන්නේ. ඒ වාගේම ඒ පරීක්ෂණයට CID එකට සහභාගි වෙන්නත් බැහැ, ඒ පරීක්ෂණය මාස 6ක් ඇතුළත ඉවර වෙන්නත් ඕනෑ. අන්න ඒ ටික කර ගන්න තමයි මේගොල්ලන් ඒ පනතේ තිබුණු දේවල් හැංගුවේ. යාළුවෝ ටික මාට්ටු වුණාම දඩයක් ගෙවලා බේරෙන්න පුළුවන් විධියට පනත ඇරලා දුන්නා, ඕනෑ සෙල්ලමක් කරන්න, ඕනෑ කළු සල්ලියක් මෙහෙන් එහාට යවන්න, එහෙන් මෙහාට එවන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අද ඔප්පු වෙලා තිබෙන්නේ, 2023 ඉඳලා 2026 දක්වා කාලය තුළ පමණක් ඩොලර් මිලියන 715ක් පිල්ලි ගහලා තිබෙනවා කියලා. අනිවාර්යයෙන්ම ඒවාට තමයි එදා ඉඩ සැලසුවේ. එතකොට, අපි තවම දන්නේ නැහැ, 2017 ඉඳලා 2023 වෙනකල් මේගොල්ලන්, මේගොල්ලන්ගේ යාළුවෝ කොච්චර පිල්ලි ගැහුවාද කියලා. ඉතින් මේක තමයි අපේ රටේ යථාර්ථය.

මේගොල්ලන් ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී ඒ ගැන වචනයක්වත් කථා කළේ නැහැ. එතැනදී පැහැදිලිව කිව්වා, ඒ පනත එහෙම හදපු නිසා ඒ පනතේ තිබුණු අඩුපාඩු මගහරවන්න, 2017දී ගෙනාපු පනත අනුව අපරාධ කරන්න තිබෙන හැකියාව වහන්න කියලා 2019 ඉඳලා රාජ්‍ය නිලධාරින්, මහ බැංකු නිලධාරින් රජය දැනුවත් කළා, කැබිනට් මණ්ඩලයට පවා ඒ තොරතුරු යැව්වා කියලා. මේගොල්ලන් ඒ ඔක්කෝම ආපසු හරවා යවා තිබෙනවා. 2023දීත් ආපසු හරවා යවා තිබෙනවා. ඉතින් ඒ නිසා මේ රටේ වංචාවට, දූෂණයට විරුද්ධ, මත්ද්‍රව්‍යවලට විරුද්ධ ආණ්ඩුවක් එන්න ඕනෑකම තිබුණා, ඒවා වෙනස් කරන්න. ඒ පනත සංශෝධනය කරන්න මේ වනකොට අපි සාකච්ඡා කරගෙන යනවා. ඒ පනතේ තිබුණු හිඩැස හරහා තමයි අපේ රටේ මුදල් විශුද්ධිකරණය වෙලා තිබෙන්නේ. අපේ රටේ ජනතාව දැනගන්න ඕනෑ යථාර්ථය මෙන්න මේකයි. මේගොල්ලන් අණ පනත් හදලා කළේ, දූෂිතයන්ට, වංචනිකයන්ට, මත්ද්‍රව්‍ය වෙළෙන්දන්ට, ඒ වාගේම හොර ඉන්වොයිස් දමලා, අඩු ඉන්වොයිස් දමලා වෙළෙඳාම් කරපු ව්‍යාපාරිකයන්ට කළු රාජ්‍යයක් හදලා දීපු එක. ඒ කළු රාජ්‍යය තමයි දැන් අපට අනෙක් පැත්ත හරවන්න වෙලා තිබෙන්නේ. ඒක ලෙහෙසි නැහැ. හැබැයි, දැන් අපි ඒක කරනවා.

ඒ වාගේම මේගොල්ලන් කරපු ඊළඟ මගඩිය ගැනත් මම කියන්නම්. අපි දන්නවා, රටක් කාර්මීකරණය කරනකොට ලෝහ කියන්නේ ඒ රටට අත්‍යවශ්‍ය දෙයක් බව. මොකද, අපේ රටේ ලෝහ නිෂ්පාදනය කරන්නේ නැහැ. එතකොට තඹ, රත්‍රන්, රිදී, යකඩ ආදී සියල්ල අපි ගෙන්වන්න ඕනෑ. ඕනෑම රටක් තමන්ගේ ආර්ථිකය ඉහළ නංවනකොට, ඒ රටට යම් කිසි ලෝහයක් ගෙනාවොත්, ඒ ලෝහයෙන් උපරිම ඵල ගන්නවා. උපරිම ඵල ගන්නවා කියන්නේ ප්‍රතිචක්‍රීකරණය කරමින් ඒ ලෝහ පාවිච්චි කිරීම. එතකොට තමයි ඒ රටට පුළුවන් වන්නේ ලෝහ භාවිත කරලා ඒ රටේ නිෂ්පාදනය කරන ඕනෑම කාර්මික භාණ්ඩයක මිල අඩු කර ගන්න. එහෙම නැතිව, අපට අලුතෙන් ලෝහ ආනයනය කරන්න ගියාම ඒ සඳහා ඩොලර් වැය වනවා. එතකොට භාණ්ඩයේ මිල වැඩි වනවා. 2004දී පැවති ආණ්ඩුවෙන් මේකට වැට බැන්දා. නමුත් මේගොල්ලන් එතැනින් එහාට එය ක්‍රියාත්මක කළේ නැහැ. මේගොල්ලන් අවසර දුන්නා, සැරින් සැරේ, තැනින් තැන මේ ලෝහ විවිධාකාරයෙන් මේ රටෙන් එළියට යවන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ වනකොට ලංකාවේ අබලි ලෝහ විවිධාකාරයෙන් රට යවනවා. ඒ නිසා අපේ රටේ නිෂ්පාදනවලට අවශ්‍ය ලෝහ අඩු පිරිවැයට ලබා ගන්න බැරි වුණා. මෙන්න මේකට කර්මාන්ත අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබුණා. ඒකත් 2004දී ජනතා විමුක්ති පෙරමුණ සහභාගි වෙච්ච ආණ්ඩුවකින් තමයි කළේ. එදා කර්මාන්තකරණයට ජනතා විමුක්ති පෙරමුණ සහභාගි වෙච්ච වෙලාවේ තමයි ඒකත් නැවැත්වූයේ. නමුත් ඒක මේගොල්ලන්ට ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා.

ඊට පසුව මේ ලෝහ අපනයනය කරන කුට වෙළෙන්දන් කරපු දේ තමයි, අර තහනම් කරපු HS codes දෙක පැත්තක තියලා වෙනත් HS codes හරහා විවිධ ආකෘතිවලින් මේ ලෝහ අපනයනය කරන්න පටන් ගැනීම. එතකොට BoI එක මේ වෙලාවේ බලනවා, ලෝහ ද්‍රව්‍ය නිෂ්පාදනය කරලා පිටරට යවන්න අවසර දීපු ආයතන මොනවාද, දේශීය වෙළෙඳ පොළෙන් ලෝහ මිලදී ගන්න අයිතියක් ලබා දුන්නේ කොහෙන්ද කියලා. ඉතින් මෙන්න මේ විධියට මේක නවත්වන්න මේ අවුරුද්දේ අපේ කර්මාන්ත අමාත්‍යාංශය භාර කර්මාන්ත ඇමතිතුමා සන්දේශයක් ඉදිරිපත් කළා, කැබිනට් මණ්ඩලයට. අපි දැන් මේ සඳහා තව HS codes 15ක් එකතු කළා. ඒ නිසා මින් මත්තට විවිධ හැඩරුවවලින්, විවිධ ආකෘතිවලින් ලෝහ මේ රටෙන් එළියට යවන්න කවුරු හරි උත්සාහ කරනවා නම්, ඒ පිළිබඳව දන්නා ඕනෑම කෙනෙක් කර්මාන්ත අමාත්‍යාංශයට දැනුම් දෙන්න, අපි ඒක නවත්වනවා. හැබැයි, මේකෙන් අපි කිසි විටෙකත් ලෝහ භාවිතයෙන් කරන නිසි අපනයන නවත්වන්න උත්සාහ කරන්නේ නැහැ. අගය එකතු කළ, ලෝකයේ අගයක් තිබෙන ඕනෑම භාණ්ඩයක් මේ ලෝහවලින් නිෂ්පාදනය කරලා අපනයනය කිරීමේ අවස්ථාව දැන් තිබෙනවා. හැබැයි, දැන් මේ HS codes 55ට අදාළ ලෝහ භාවිත කරලා යම්කිසි දෙයක් නිර්මාණය කරනවා නම්, ඒක IDB එකේත්, කර්මාන්ත අමාත්‍යාංශයේත් අනුමැතිය හරහා තමයි මේ රටෙන් පිට කරන්න පුළුවන් වන්නේ.

ඉතින්, මෙන්න මේ ක්‍රියාවලි ගත්තොත් අපට පෙනෙන්නේ මොකක්ද? සම්පූර්ණයෙන් අසංවිධිත ආර්ථික බිහි කරලා, මේ ක්‍රියාවලියට දායක වෙච්ච දේශපාලනඥයන් තමයි අපේ රට වට්ටලා දැන් කෑ ගහමින් අපෙන් අහන්නේ අපනයනය ඩොලර් බිලියන 38ක් කරන්නේ කොහොමද කියලා. ඊගොල්ලන් බංකොලොත් කරපු රාජ්‍යයේ, කර්මාන්ත ප්‍රතිපත්තියක් නැති රටේ, බදු ටික එකතු කර ගත්තේ නැති රටේ, ප්‍රවාහනය හදා නොගත් රටේ මේවා ඔක්කෝම අපි දැන් එකින් එක හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාවලිය ජනතාව දැනගන්න ඕනෑ. මේ රට බංකොලොත් කළේ මේගොල්ලන්. දැන් ඔය ආර්ථික ඔස්තාර්ලා වාගේ හිටියාට එදා හිටියේ "මීක්" ගාන්නේවත් නැතුව.

මම බැලුවා, 2017 හැන්සාඩ් වාර්තා. ඒවා කියවා බලන්න. විහිළුසහගතයි, දෙගොල්ලන් දෙපැත්තට කථා කර ගත්ත විධිය. ඒ, මේක defend කරපු අය. මම බැලුවා, ඒ කාලයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව තිබුණාද කියලා. ඒ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවටවත් ඒ පනත් කෙටුම්පත දාලා නැහැ. දැන් නම් අපි එන හැම පනත් කෙටුම්පතකම "අ" ඉඳලා "ඇ" දක්වා ඔක්කෝම දේවල් පිළිබඳව අපේ සභාපතිතුමා එක්ක හොඳට සාකච්ඡා කරලා මුදල් අමාත්‍යාංශයට උපදෙස් පිට උපදෙස් දෙනවා. නමුත් 2017දී මේ පනත ගේනකොට දීපු උපදෙසක් නැහැ. එදා මේකේ අවදානම highlight කරලා නැහැ. මොකද, එක්සත් ජාතික පක්ෂය තමයි මේ ලෝකයේ කොහේවත් කරන්නේ නැති විවෘත කිරීමක් ඔළුවේ තියාගෙන රටවල් හදන්න උත්සාහ කළේ, දේශීය සම්පත් ටික ඔක්කෝම කුණුකොල්ලෙට විකුණලා දාලා. දැන් මේ රටේ

[ගරු චතුරංග අබේසිංහ මහතා]

තිබෙන මේ පාඩු ඔක්කෝටම හේතුව එදා කරපු දේවල් තමයි. විදුලිබල මණ්ඩලය, පෙට්‍රෝලියම් එක, ප්‍රවාහන අමාත්‍යාංශය එදා අපි හරියට හදාගත්තා නම්, මේ වනකොට මේ රට තිබෙන්නේ වෙන තැනක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයෝජන ප්‍රවර්ධනය කරන්න කියලා මේගොල්ලන් දැන් කථා කළාට, එදා ආයෝජන ප්‍රවර්ධනය කරන්න කර්මාන්තපුර හදලා තිබුණේ නැහැ, තිබුණු ඒවායේත් පහසුකම් හදලා නැහැ, ආයෝජන ප්‍රතිපත්තියක් හරියට ක්‍රියාත්මක කරලාත් නැහැ, ප්‍රතිපත්තියකට අනුව බදු සහන දීලාත් නැහැ. මේ එකක්වත් එදා කරලා තිබුණේ නැහැ. Ease of Doing Business Index එකේ අපේ රට අන්තිම මට්ටමට දාලා තමයි අපට දුන්නේ. ඒ නිසා මේ සියල්ල අපට හදන්න වෙලා තිබෙනවා. දැන් අපි මේ සියල්ල හදාගෙන යනවා.

ඒත් එක්කම මම සතුටින් කියන්න කැමැතියි, තව ජාවාරමක් සම්බන්ධයෙන් අපේ ඇමතිතුමා මැදිහත් වෙලා ඒකට සම්පූර්ණයෙන් තිත තබපු බව. විශේෂයෙන්ම වැලි, ගල් කර්මාන්ත කියන්නේ, මේගොල්ලන්, මේගොල්ලන්ගේ යාළුවෝ කරපු මාෆියාවක්. ඒකට අපි තිත තැබුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව ඉස්සරහට හොරට වැලි කපන්න වෙන්නේත් නැහැ, ප්‍රවාහනය කරන්න වෙන්නේත් නැහැ. ඉදිකිරීම් කර්මාන්තයට තිබෙන මේ බාධාව අයින් කරන්න, හොර වැලි මගඩියේ යෙදුණු අය අපි මේකෙන් සම්පූර්ණයෙන් ඉවත් කරනවා. ඒ වාගේම ඒගොල්ලන් ඛනිජ සම්පත් ලයිසන් 400 ගණනක් හොර තක්කඩීන්ට දීලා තිබුණා. අපි දැන් ඒවාත් ඔක්කෝම cancel කරලා හෝ ඒවාට ගන්න ඕනෑ නීති ක්‍රියාමාර්ග අරගෙන ඒ ක්ෂේත්‍රයත් සංවිධිත කරනවා. ඒ නිසා ජනතාව දැනගන්න ඕනෑ, අපි හදන්නේ මොන වාගේ රටක්ද කියලා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජුනි 18 දිනැති අංක 2493/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.07.10 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

## 1983 කළු ජූලියෙන් උගත් පාඩම් තුළින් එක්සත් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැඟීම
## 1983 கறுப்பு யூலை வழங்கிய பாடங்களினூடாக ஒன்றுபட்ட இலங்கைத் தேசத்தை உருவாக்குதல்
## BUILDING A UNITED SRI LANKAN NATION WITH LESSONS LEARNT FROM BLACK JULY OF 1983

[අ.භා. 2.43]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1983 වසරේ සිදු වූ 'කළු ජූලිය' යනු හුදෙක් දේශපාලන වුවමනාව මතම නිර්මාණය කරන ලද්දකි. එම බල දේශපාලන වුවමනාව මත දශක කිහිපයක් තිස්සේ මුළුමහත් රටම ආර්ථික, සමාජයීය හා සංස්කෘතිමය වශයෙන් ආපස්සට ඇද දමන ලදී. ඒ හේතුවෙන් වටිනා ජීවිත විශාල ප්‍රමාණයක් සහ අතිවිශාල දේපළ ප්‍රමාණයක් රටට අහිමි වූ අතර, රට ආර්ථික වශයෙන්ද දැවැන්ත පසුබෑමකට ලක් විය. කෙසේ වුවත්, එම භෞතික හානියට වඩා රටට සිදු වූ බරපතළම සහ විශාලතම විනාශය වන්නේ ජන කොටස් අතර අන්‍යෝන්‍ය නොසන්සුන්තාව, බිය සහ සැකය වර්ධනය වීමයි. එම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් බවට පත් වූයේ ශ්‍රී ලාංකික පුරවැසියා ගොඩනැඟීම හුදු සිහිනයක් බවට පත්වීමය.

නමුත්, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේදී පටු බෙදීම් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් උතුරද, නැගෙනහිරද, බටහිරද, දකුණද නැතහොත් මධ්‍යම කඳුකරයද කියා කිසිදු භේදයක් නොතකා රට පුරා විසිරී සිටින සමස්ත ජනතාවම ජාතික ජන බලවේගය කෙරෙහි එක ලෙස විශ්වාසය තබා ඓතිහාසික තීන්දුවක් ලබා දී ඇත. මෙම සුවිශේෂී ජන වරම යනු සැබෑ ශ්‍රී ලාංකික ජාතියක් නිර්මාණය කිරීම උදෙසා ජනතාව විසින් තබන ලද ඉතාම ශක්තිමත් සහ දැවැන්ත පදනමකි. නමුත්

ඒ ඓතිහාසික කාර්යභාරය ඉටු කිරීමට ජාතික ජන බලවේගය ආණ්ඩුව කටයුතු කරමින් සිටින මොහොතේ එය ආපසු හැරවීම උදෙසා ජාතිවාදී සහ අන්තවාදී පටු දේශපාලන අරමුණු සහිත වුවන් 83 නැවත වෙනත් මුහුණුවරකින් ප්‍රතිනිර්මාණය කිරීමට නිරර්ථක උත්සාහයක නිරත වෙමින් සිටී.

ඒ අනුව, අතීතයේ කටුක මතකයන් සහ සැකයන් දුරු කරමින් රට පුරා ජනතාව ලබා දුන් මෙම පොදු ජනතා පදනම මත පිහිටා නව ශ්‍රී ලාංකික පුරවැසියෙක්, ශ්‍රී ලාංකීය ජාතියක් නිර්මාණය කිරීම උදෙසා කටයුතු කළ යුතු යැයි යෝජනා කරමි.

ඒ සඳහා මෙම ගරු සභාවේ සියලුදෙනාගේ සහාය ලබා දිය යුතු යැයි ද මා යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට පුරාම විසිරී ඉන්න සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ කියන ජාතිකත්වයන්ගෙන් යුතු, විවිධ සංස්කෘතීන්ගෙන් යුතු විචිත්‍රවත් සංස්කෘතියක් සහිත ශ්‍රී ලාංකිකයන් එකිනෙකා එක්ක සහයෝගයෙන්, අන්‍යෝන්‍ය අවබෝධයෙන් වැඩ කරන, ඕනෑම අවස්ථාවකදී අනෙක් ජනතාව ගැන හිතන පතන, ඔවුන් ගැන ආදරයෙන් දකින, වැඩ කරන ජනතාවක්, එහෙම නැත්නම් පුරවැසියන් කොටසක්. හැබැයි, අපේ රටේ ඉතිහාසයේ අමිහිරි අත්දැකීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. දශක ගණනාවක් පැරණි අත්දැකීම් වාගේම මෑත කාලීන සිදුවීම් තිබෙනවා. දැවැන්ත සිදුවීම් වාගේම තැන් තැන්වලට සීමා වුණු කුඩා හුදකලා සිදුවීම් ජාතිවාදී අර්ථයෙන්, බෙදුම්වාදී අර්ථයෙන් අපේ රටේ සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, අපි ගෞරවයෙන් සහ සමගියෙන් ජීවත් වෙන්න හැකියාව තිබෙන ජනතාව සහිත රටක්.

නමුත් මොකක්ද දැන් මේ වෙලා තිබෙන්නේ? ඉතිහාසයේ ඉඳන්ම අපේ රටේ දේශපාලන ව්‍යාපාර අසමත් වුණා, මේ රටේ ජනතාවට ජීවත් වෙන්න පුළුවන් හොඳ රටක් නිර්මාණය කරලා දෙන්න. එය ශ්‍රී ලාංකික පුරවැසියන්ට සාධාරණ ආර්ථිකයක්, අධ්‍යාපනයේ සම අවස්ථා, ඔවුන්ට තිබිය යුතු ගෞරවය හා රාජ්‍ය ආරක්ෂාව ලබා දීමට එවකට සිටි පාලකයන් විසින් අසමත් වීමේ ප්‍රතිඵලයක්. ඒගොල්ලන් බලය අහිමි වීම වළක්වා ගැනීම සඳහා උපක්‍රමික ලෙස එය ජාතිවාදයට හරවලා බෙදුම්වාදී වැඩ පිළිවෙළවල් පෝෂණය කළා. ඒ සඳහා සිද්ධි නිර්මාණය කරලා, දූෂිත මැතිවරණ පවත්වමින් ඒවා හරහා මැතිවරණ ජයග්‍රහණ ලබමින් ආපු ඉතිහාසයක් තමයි අපට තිබෙන්නේ.

ඒ ඉතිහාසය තුළ අපේ රටට කළු පැල්ලමක් එකතු වුණු එක් අවස්ථාවක් තමයි, මීට අවුරුදු 43කට කලින් 1983 ජූලි 23වැනි දා ඇති වුණු කළු ජූලිය. එතැන ඉඳලා ඒක ඉදිරියට ඇදිලා ගියා. අපි දන්නවා, ඒක පිටුපස තිබුණු දේශපාලනය මොකක්ද කියලා. අපි ඇති තරම් ඒ ගැන කථා කරලාත් තිබෙනවා. එවකට බලය පැවති එක්සත් ජාතික පක්ෂය ඇතුළු කණ්ඩායම් සංවේදී ජනතාවන්ට හානි කරමින් කොළඹ ප්‍රදේශයේ එකට ව්‍යාපාර කරමින්, එකට සෙල්ලම් කරමින්, එකට උදේ හවස හමු වෙමින් ජීවත් වුණු ජනතාව එකිනෙකා මරා ගන්නා කණ්ඩායම් බවට ක්ෂණිකව වෙනස් කළා. හැබැයි, ජනතාව ක්ෂණිකව වෙනස් වුණාට එහි පිටුපස දීර්ඝ කාලයක් තිස්සේ සැලසුම් සහගතව ගොඩනඟපු ක්‍රියාවලියක් තිබෙනවා. දේශපාලනඥයන් විසින් ඉතිහාසයේ ආරම්භ කළේ ඔන්න ඔහොම ක්‍රියාවලියක්. එම ක්‍රියාවලිය ඒ විධියට ඉස්සරහට ඇවිල්ලා ඒක දීර්ඝ කාලීන යුද්ධයක් බවට පත් වුණා. අද අපි මුහුණ දීලා තිබෙන තත්ත්වය ගත්තොත්, අපේ රටේ ජනතාව මේ පැරණි දේශපාලනය ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ අත්දැකීම් සියල්ලම එක්ක ජනතාවට අවබෝධ වෙලා තිබෙනවා, තවදුරටත් මෙහෙම ඉදිරියට යන්න බැහැ කියලා. ඒ නිසා තමයි අපේ රටේ ජනතාව උතුරේද, දකුණේද, නැඟෙනහිරද, මධ්‍යම කඳුකරයේද කියලා බලන්නේ නැතුව පසුගිය ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත්, අනෙකුත් මැතිවරණවලදීත් ජාතික ජන බලවේගයට ඔවුන්ගේ ඡන්දය ප්‍රකාශ කළේ. ඒක අපේ රටේ ඓතිහාසික සිද්ධියක්. මෙය සංස්කෘතික විවිධත්වයත් එක්ක සමගියෙන් යුතුව ශ්‍රී ලාංකික ජාතියක් ලෙස ඉස්සරහට යන රටක් බිහි කර ගැනීම සඳහා අපේ රටේ ජනතාව වෙනස් වෙලා අපට ලබා දුන් අවස්ථාවක්.

හැබැයි අපට පෙනෙනවා, ඒවාට උල්පන්දම් දීපු, ඒවා පෝෂණය කළ, ඒ හරහා දැවැන්ත ජන වාර්ගික යුද්ධයකට රට ඇද දාලා අපේ රට ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් විනාශයට ලක් කළ අයට අද තමන්ගේ බලය අහිමි වීම දරා ගන්න බැරි වෙලා තිබෙන බව. මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් ඒ තුළින් අහිමි වුණා. තමන්ගේ පවුලේ අය අහිමිවීම ගැන ජනතාවට නැවත හිතෙනකොට කොපමණ දුකක්ද? අපේ රටේ විවිධ ප්‍රදේශවල ජීවත් වන ජනතාව ඒ විධියට දුකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් දමිළ ජනතාව, සිංහල ජනතාව වාගේම මුස්ලිම් ජනතාවත් දුකට පත් වෙනවා. ඒ තත්ත්වය විවිධ ආකාරයෙන් නැවත නැවතත් පෝෂණය කරමින් ඒ පාලකයෝ ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. එම නිසා ජනතාව ඒ ඓතිහාසික වැරදිවලින් පාඩම් ඉගෙන ගත් ජාතියක් හැටියට නව දේශපාලන සංස්කෘතියක් එක්ක ඉස්සරහට යන්න ඒ පක්ෂ ප්‍රතික්ෂේප කරලා අද වනකොට ජාතික ජන බලවේගයට අවස්ථාව ලබා දීලා තිබෙනවා. එම නිසා කළු ජූලිය සිදු වෙලා වසර 43ක් ගත වන අද දවසේ අපි හිතන්න ඕනෑ, ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගෙන අපේ රට සංවර්ධිත සහ සමගියෙන් ජීවත් වෙන්න පුළුවන් හොඳ රටක් බවට පරිවර්තනය කර ගැනීම සඳහා දේශපාලන ව්‍යාපාර විධියටත්, පුරවැසියන් විධියටත් අප සියලුදෙනා සතු වගකීම ඉටු කරමින් ඉදිරියට යන්න ඕනෑ කියලා. මේ ලබා දුන් ඓතිහාසික අවස්ථාව ආරක්ෂා කර ගනිමින් ඉදිරියට යෑමට සියලුදෙනාට ධෛර්යය, ශක්තිය හා වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.51]

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් අද දවසේ ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා.

අද ජූලි 23වන දා. මෙම යෝජනාව තුළ කියැවුණා, 1983 ජූලි 23 කියන දවස ලංකා ඉතිහාසයේ කළු පැල්ලමක් ඇති කළ දවසක් බව. හැබැයි, අපි දැනගන්න ඕනෑ, එදින සිදු වුයේ හුදෙක් අහඹුවක් නොවෙයි කියන එක. ඒක එක දිනක සිදු වුණු සිදුවීමක් නොවෙයි. ඒකට දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. අපි දන්නවා, නිදහසින් පසුවත් අපේ රටේ දේශපාලන ව්‍යූහයක් තිබුණාය කියන එක; දේශපාලන පෙළැන්තියක් හිටියා, මේ රට පාලනය කරපු. අපි කියනවා, "කළු සුද්දෝ" කියලා. ඔවුන් විසින් මේ රට පාලනය කරගෙන ගියේ ඔවුන්ට ලැබුණු පාලන ක්‍රමය අනුව. මොකද, මේ ලංකාව ඇතුළු අධිරාජ්‍යවාදීන්ට යටත් වෙච්ච රටවල් අධිරාජ්‍යවාදීන් විසින් පාලනය කරද්දී ඔවුන් භාවිත කරපු method එකක් තිබුණා, divide and rule කියලා. ඒක ලංකාවෙත් දැවැන්ත විධියට පාවිච්චි කළා, ඉංග්‍රීසි අධිරාජ්‍යවාදය. රුවන්ඩාව කියලා රටක් තිබෙනවා. ඒ රට පාලනය කළේ ප්‍රංශ අධිරාජ්‍යවාදීන්. ඔවුන් ඒ රට පාලනය කරන්නත් මෙන්න මේ divide and rule කියන method එක පාවිච්චි කළා. ඒකෙදි "හුටු" සහ "ටුට්සි" කියලා ජාතීන් දෙකක් ඔවුන් ගොඩ නැඟුවා. නාසය දිග, උස කට්ටිය එක ජාතියක් විධියට ප්‍රකාශ කළා. අනෙක් අය තවත් ජාතියක්. ඒක

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

minority කියලා කිව්වා. එයාලාව හඳුනා ගන්න තිබුණු එකම දේ තමයි Identity Card එක. භාෂාවවත් නොවෙයි, Identity Card එකෙන් තමයි ජාතීන් වෙන් කළේ. එහෙම වෙන් කරලා පාලනය කරලා, අවසානයේ දැවැන්ත මිනිස් සංහාරයක් ඇති කළා, රුවන්ඩාවේ. ඒකෙන් ලක්ෂ 8ත්, 10ත් අතර ප්‍රමාණයක් මැරුණා. ඒ වාගේ අත්දැකීම් ලෝකයෙත් තිබෙනවා. ලංකාවෙත් එහෙමමයි.

අධිරාජ්‍යවාදීන්ට පස්සේ කළු සුද්දා ඇවිල්ලා මේ ලංකාවත් පාලනය කරලා, අවසානයේ කළු ඉතිහාසයක් ඇති කරපු දිනයක් බවට 1983 ජූලි 23 දින පත් කළා. ඒකත් එක්ක තමයි උතුරේ - යාපනයේ වෙන්න පුළුවන් - ඒ තරුණයා අවි අතට ගත්තේ. ඒක හුදෙක් අහඹුවක් නොවෙයි. අපි ඒ වේදනාව දන්නවා. ඒ නිසා අපි ජාතික ජන බලවේගය විධියට, ජනතා විමුක්ති පෙරමුණ විධියට දැවැන්ත මතවාදී අරගළයක් ලංකාව පුරා අරගෙන ගියා, ජාතිවාදයෙන් තොර ශ්‍රී ලාංකික ජාතියක් ගොඩ නැඟීමට අවශ්‍ය කටයුතු කොයි විධියටද සම්පාදනය කර ගන්නේ කියලා. කොච්චර අමාරුකම් තිබුණත්, දේශපාලන වශයෙන් කොපමණ අභියෝග ආවත්, අපි ඒ මතය අත්හැරියේ නැහැ. අපේ තනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ තිබුණා වාගේම අවසානයේ අපට හැකි වුණා, මුළු ලංකාවම එකම පාටකින් පාට කරන්න. එක තමයි පළමුවෙනි ප්‍රතිඵලය; අපේ මතවාදී අරගළයේ පළමුවෙනි ප්‍රතිඵලය ඒක. 2024 සැප්තැම්බර් 21වැනි දා අනුර දිසානායක සහෝදරයාව මේ රටේ ජනාධිපති බවට පත් කරද්දී සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා ශ්‍රී ලාංකිකයන් විධියට ඒ මතවාදී අරගළය පිළිගත්තා. අන්න, අපට පුළුවන් වුණා, පළමුවෙනි ප්‍රතිඵලය ඒ විධියට දෙන්න. ඒ පළමුවෙනි ප්‍රතිඵලයෙන් පස්සේ අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරගෙන ගියා.

ආණ්ඩුව විධියට විවිධ අමාත්‍යාංශ මඟින් මේ සංහිඳියාව මෙතැනින් එහාට ගොඩ නඟන්න, දියුණු කරන්න, සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා එකයි කියලා පෙන්වන්න අප කටයුතු කරනවා. තවමත් ඒ අරගළය තිබෙනවා; ඒ මතවාදී අරගළය තිබෙනවා. ඒ දැවැන්ත අරගළය තවමත් අපට අභියෝගයක් විධියට තිබෙනවා. අපි ඒක තවමත් ඉටු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම තරුණ කටයුතු අමාත්‍යාංශය සහ ජාතික තරුණ සේවා සභාව විධියට මේකට දැවැන්ත නායකත්වයක් දෙමින් ඉන්නවා.

අපි දන්නවා, ජාතික තරුණ සේවා සභාවෙන් “Youth Link Sri Lanka” කියන programme එක ක්‍රියාත්මක වන බව. ඒ “Youth Link Sri Lanka” programme එකෙන් උතුරේ ඉන්න තරුණයාට දකුණේ තිබෙන සංස්කෘතිය පෙන්වන්න, දකුණේ තරුණයාට උතුරේ සංස්කෘතිය පෙන්වන්න, නැඟෙනහිර තරුණයාට දකුණේ සංස්කෘතිය පෙන්වන්න, දකුණේ තරුණයාට නැඟෙනහිර සංස්කෘතිය පෙන්වන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙනවා. යම් තරුණයන් පිරිසක් ඒ ප්‍රදේශවලින් ඇවිල්ලා දවස් 6, 7ක් වෙනත් භාෂාවක් කථා කරනවා, වෙනත් සංස්කෘතියක් තිබෙන, වෙනස්ම පරිසරයක ජීවත් වෙනවා. ඔවුන් එක්ක කථා කරද්දී අපට තේරෙනවා, ඒ තරුණයාට තිබෙන අභිලාෂම තමයි අනික් ප්‍රදේශවල සිටින තරුණයන්ටත් තිබෙන්නේ කියලා; ගම්පහ ඉන්න තරුණයාට තිබෙන අභිලාෂම තමයි උතුරේ තරුණයාට තිබෙන්නේ, මඩකලපුවේ ඉන්න තරුණයාටත් තිබෙන්නේ. ඔවුන්ට තිබෙන්නෙත් එකම පැතුමයි. ලාංකික තරුණයන්ට තිබෙන්නේ එකම පැතුමක්. ඒ තමයි, ලස්සන රටක ජීවත් වීම, ලස්සනට ඇඳ පැළඳ ජීවත් වීම, ඔවුන්ගේ අම්මලාට, තාත්තලාට සලකමින් ජීවත් වීම. අන්න ඒ පැතුම ඉටු කරන්න අපි ආණ්ඩුවක් විධියට සාමූහික ප්‍රයත්නයක ඉන්නවා. ඒ "Youth Link Sri Lanka" එකෙන් පස්සේ කථා කරලා ඔවුන් කිව්වේ මොකක්ද? ඔවුන් කිව්වේ, "මෙහෙම සංස්කෘතියක්, මෙහෙම ළෙන්ගතුකමක් අපි බලාපොරොත්තු වුණේ නැහැ" කියායි. ඒක අවසන් කොට ආපසු යද්දී ඔවුන් ඇඬුවා. අපේ සහෝදර සහෝදරියෝ උතුරේ ඉඳලා ආපසු එද්දී, එහෙම නැත්නම් උතුරේ සහෝදර සහෝදරියෝ දකුණේ ඉඳලා ආපසු යද්දී ඇඬුවා, වැලපුණා. ඔවුන් තුළ ඇති වුණු ඒ මිත්‍රත්වය තවම පවතිනවා. මේ "Youth Link Sri Lanka" වැඩසටහන ඒ තරම් මිත්‍රත්වයක් ගොඩනැඟුණු අවස්ථාවක් වුණා. 2025 වර්ෂයේ මේ "Youth Link Sri Lanka" වැඩසටහන හරහා 800ක විතර පිරිසක් ලංකාව පුරා සංචාරණය කරවන්න අපට පුළුවන් වුණා. 2026 වර්ෂයේ ඒ ප්‍රමාණය 1,600ට ආසන්න ප්‍රමාණයක් දක්වා වර්ධනය කරන්න අපට පුළුවන් වුණා.

අපි හිතන විධියට, මේක ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. දශක ගණනක් තිස්සේ මේ ලාංකික සමාජය ගෙනැල්ලා අතහැරපු තැනක් තිබෙනවා; මේ මනෝභාවයන් ගොඩනඟපු තැනක් තිබෙනවා. අන්න ඒ ගොඩනඟපු තැන වෙනස් කරන එක ලෙහෙසි නැහැ. ඒක හුදු ආණ්ඩු මාරුවකින්, හුදු පැන් පහරකින් වෙනස් කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒකට ලොකු සමාජ අරගළයක්, ලොකු මතවාදීමය අරගළයක් කරන්න අවශ්‍යයි. ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට, ජනතා විමුක්ති පෙරමුණ විධියට ඒ වෙනුවෙන් කරන්න පුළුවන් උපරිමය අපි ඉටු කරනවා. විශේෂයෙන්ම ලාංකික සමාජයෙන් අපි ඉල්ලීමක් කරනවා, ඒ සඳහා අවශ්‍ය සියලුම සහාය ලබා දෙන්න, විපක්ෂයේ ජාතිවාදී, දූෂ්ට අදහස්වලට රැවටෙන්න එපා කියලා. එම ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.59]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි, 1983 ජූලි මාසයේ 23වැනි දා බණ්ඩාරගම මගේ නිවස ආසන්නයේ ජීවත් වුණු, මගේ ගමේ පාසලේ එකම පන්තියේ හිටපු දීපිකාගේ තාත්තා, තිලකරත්න සූරියආරච්චි යාපනයේදී හමුදා සෙබළුන් 13දෙනෙක් එක්ක රට වෙනුවෙන් දිවි පිදූ බව. ඒ ඇති වුණු ආවේගයත් සමඟ විවිධ දූෂ්ට බලවේග විසින් මේ රටේ ගෞරවය විනාශ කරන, මේ රට බිහිසුණු යුද්ධයකට ඇද දමන, ඒකට පදනම සකස් කරන දැවැන්ත විනාශයක් කළු ජූලිය හරහා සිදු කළා. ඒ කළු ජූලිය නිසා ඇති වුණු මහත් වූ දුක්ඛදායක තත්ත්වයන්ට සිංහල, දෙමළ, මුස්ලිම් කියලා භේදයක් නැතුව මුළු රටම මුහුණ දුන්නා. අපි හදවතින්ම කනගාටු වෙනවා, එම සිදුවීම පිළිබඳව. අපි හදවතින්ම කනගාටු වෙනවා, එම සිදුවීම මත පදනම් වෙලා දශක ගණනක් ඇදී ගිය යුද්ධයේ වින්දිතයන් පිළිබඳව. ඒ වාගේම නැවත යුද්ධයක් ඇති නොවන්නට සහ ජනවාර්ගික අර්බුදය ඇති වීමට මූලික වෙච්ච බලය නිසි ලෙස බෙදා හැරීම ඵලදායී ලෙස කරලා අවසන් කරන්න, සමගි ජන බලවේගය හැටියට අපේ කැපවීමත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එම නිසා, සියලුම වින්දිතයන්ට අපි අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැඟීම ඉතා වැදගත් බව අපි කථා කළා. පසුගිය ජනාධිපතිවරණයේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජන වරම ලබා ගත්තේ එතුමාගේ "පොහොසත් රටක් -

ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරලා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 229, 230, 231 පිටුවල ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟන ආකාරය ගැන කියලා තිබෙනවා. මට කලින් කථා කරපු යෝජක මන්ත්‍රීමාත්, ඒක ස්ථිර කරපු මන්ත්‍රීතුමාත් මේ ප්‍රතිපත්ති ප්‍රකාශය අමතක කර ඇති බව තමයි මට පෙනී යන්නේ. එම නිසා විපක්ෂයේ සිටින මට සිද්ධ වෙනවා, ජනාධිපතිතුමා ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනඟන ආකාරය ගැන කියලා තිබෙන විසඳුම් පිළිබඳව මතක් කරන්න.

පළමුවැනි ක්‍රියාමාර්ගය එහි මෙසේ සඳහන් වනවා:

"2015-2019 කාලය තුළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට අනුගමනය කළ ක්‍රියාදාමය කඩිනමින් අවසන් කොට සමානාත්මතාව හා ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම්ව එක රටක් තුළ සියලු ජනතාව පාලනයට සම්බන්ධ විය හැකි වන ලෙස සෑම පළාත් පාලන ආයතනයකටම, දිස්ත්‍රික්කයකටම සහ පළාතකටම දේශපාලනමය හා පරිපාලනමය වශයෙන් බලය බෙදා හැරෙන, ආණ්ඩුකරණය සඳහා සියලු ජාතිකත්වයන්ගේ දේශපාලන හවුල්කාරිත්වය සහතික කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම"

මේ ගරු සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ට කියන්න පුළුවන්ද, එය ඉටු කළා කියලා? ජනාධිපතිතුමා ධුරයට පත් වෙලා දැන් අවුරුදු දෙකක් ගත වෙලා. ඒ කියන්නේ නියමිත අවුරුදු පහෙන් දෙකක් ගත වෙලා ඉවරයි. නමුත්, අද වනකල් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන එක ගැන කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. අඩු ගණනේ කමිටුවක්වත් පත් කරලා නැහැ. විපක්ෂයේ අපි එය දිගින් දිගට පෙන්වා දෙද්දී ආණ්ඩුව එය සම්පූර්ණයෙන් නොතකා හැර තිබෙනවා. බලය විමධ්‍යගත නොකිරීම නිසයි මේ කියන ජනවාර්ගික ප්‍රශ්නය ඇති වුණේ. එහි අතුරු ප්‍රතිඵලයක් හැටියටයි "කළු ජූලිය" කියන කලබලය ඇති වුණේ. ඒ සිදුවීම නිසා මේ රටේ අපි සියලුදෙනා දුක් වින්දා. ඒකට විසඳුම සැබෑ ලෙස බලය විමධ්‍යගත කිරීමයි; බලය විමධ්‍යගත කිරීම පිළිබඳ අඩුපාඩු නිවැරදි කර ගැනීමයි. හැබැයි, ඒ පිළිබඳව දී තිබෙන අංක එකේ පොරොන්දුව ඉටු කර නැත.

ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 230 පිටුවේ සඳහන් වෙනවා, දැනට දින නියමයක් නොමැතිව කල් තබා ඇති පළාත් සභා මැතිවරණය වසරක් තුළ පවත්වා අවසන් කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය පැවැත්වුවාද? දැන් කමිටු දමමින්, කල් දමමින් ඒ කාරණය ඇදගෙන යනවා. ඊට අදාළ විශේෂ කාරක සභාව අර්ථ ශූන්‍ය ලෙස ඇද ගෙන යනවා. ඒ නිසා අප ඒ කමිටුවේ තවත් කොච්චර කල් ඉන්නවාද කියලා අපි තීරණය කරනවා. වුවමනාවෙන්මයි ඒක ඇදගෙන යන්නේ. මැතිවරණ පවත්වන්න තිබෙන බයට දැනට තිබෙන අඩුපාඩු නිවැරදි කරගෙන මැතිවරණ තියන්නේ නැහැ. නමුත් පොරොන්දුව, වසරක් තුළ පළාත් සභා මැතිවරණය පැවැත්වීමයි. මෙසේ සඳහන් වන්නේ සමඟි ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නොව, අනුර දිසානායක මහත්මයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 230වන පිටුවේයි. මෙහි තවත් පොරොන්දු ගණනාවක්ම සඳහන්ව තිබෙනවා. ඒවායෙන් කීපයක් මම කියන්නම්.

"වෙනස් කොට සැලකීමට එරෙහි නෛතික බලතල සහිත කොමිෂන් සභාවක් (Commission Against Discrimination) ස්ථාපිත කිරීම."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කොමිසමක් ගැන ඔබතුමා දන්නවාද? දන්නේ නැහැ නේද?

"උතුරු නැගෙනහිර ඇතුළු අනෙකුත් ප්‍රදේශවල පසුගිය කාලයේ සිදු වූ දේශපාලන ඝාතන, අතුරුදහන්වීම් සහ පැහැර ගැනීම් පිළිබඳව විමර්ශනය කොට යුක්තිය ඉටු කිරීම."

අලුත් විමර්ශන කිසිවක් ආරම්භ කරලා නැහැ. අප ආරම්භ කරපු විමර්ශනම අවසන් කරගෙන යනවා. ඒක හොඳයි. නමුත් අලුතින් විමර්ශන කිසිවක් ආරම්භ කරලා නැහැ.

"ජාතිවාදය හා ආගමික අන්තවාදය හේතුකොටගෙන සිදුවී ඇති ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කිරීමට සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමේ ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම." - Commission for Truth, Unity and Reconciliation".

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කළාද? අඩු ගණනේ දැනට ඉදිරිපත් කර තිබෙන ඒ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට, ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැඟීමට එක පියවරක් හරි අරගෙන තිබෙනවාද?

"අන්තර් ආගමික ගැටලු නිරාකරණයට සියලු ආගමික ප්‍රධානීන්ගෙන් හා ආගමික උගතුන්ගෙන් සමන්විත අන්තර් ආගමික සභාවක් පිහිටුවීම."

එය කර නැත.

"ලෝක ආගම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම."

එය ද කර නැත.

ඒ විතරක් ද නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊයේ දිනයේ ගරු අධිකරණ ඇමතිතුමා කිව්වා, "දේශපාලන සිරකරුවන් කියා කිසිවෙක් නැත. ඒ නිසා නිදහස් කරන්න කියලා අපට අමුතු වැඩ පිළිවෙළකුත් නැත" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක නැත්නම් මා මතක් කර දෙන්නම්, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 231වන පිටුවේ සඳහන් පොරොන්දු කීපයක්:

"දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම හා ඔවුන් නිදහසේ සමාජගත වීම සහතික කිරීම"

අනුර කුමාර දිසානායක මැතිතුමායි මෙසේ කියන්නේ. නමුත්, මේ කිසිවක් කර නැත. එහෙම ප්‍රශ්නයක් තිබෙන බවක් පිළිගන්නේ ද නැත. දේශපාලන සිරකරුවන් ඉන්නවා කියන්නේ නැහැ. දැන් කියන්නේ, එහෙම අය නැහැ කියලායි.

ඊළඟට, තවත් කාරණා තිබෙනවා.

"ප්‍රතිත්‍රස්ත පනත ඇතුළු සියලු මර්දනකාරී අණපනත් අහෝසි කර සියලු ජනතාවගේ නිදහස සහතික කිරීම"

"ඉඩම් හා වාසස්ථාන පිළිබඳ ජාතික කොමිසමක් මඟින් පවතින ගැටලු නිරාකරණය කිරීම"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර කුමාර දිසානායක මහත්මයා ජනාධිපති වෙච්ච, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 159ක බලයක් තිබෙන, එනම් තුනෙන් දෙකේ බලයක් සහ විධායක ජනාධිපතිකම තිබෙන මහත් ජන වරමක් සහිත මේ ආණ්ඩුව ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනැඟීම සඳහා තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන වැදගත් එකම දෙයක්වත් කරලා නැහැ. ආණ්ඩුවේ කාට හෝ නැඟිටලා කියන්න පුළුවන්ද, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ - මේ යෝජනා මාලාවේ - 230, 231 පිටුවල සඳහන් එක යෝජනාවක් හෝ ඉටු කරලා තිබෙනවා කියලා? කළ හැකි දේ, කළ යුතු දේ අවබෝධ කරගෙන තිබියදීත්, ඒ සඳහා ජන වරමකුත් තිබියදීත් ඒ කිසිවක් කරන්නේ නැතුව, හෙට අනිද්දාට අපේ විනිශ්චයකාරතුමන්ලාගේ විශ්‍රාම යන වයස වැඩි කරන්න - අවුරුදු 63 අවුරුදු 65 කරන්න, අවුරුදු 65 අවුරුදු 68 කරන්න - යෝජනාවක් ඉදිරිපත් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව සුළු වේලාවකින් මම අවසන් කරන්නම්.

[ගරු  අජිත් පී. පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සඳුදා - 2026.07.20වන දා - අමාත්‍ය මණ්ඩල තීරණ 14ක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිල වශයෙන් ප්‍රකාශයට පත් කළා. ඒ කිසිම තීරණයක නැහැ, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස වැඩි කිරීම - අවුරුදු 63 අවුරුදු 65 කිරීම, අවුරුදු 65 අවුරුදු 67 කිරීම - පිළිබඳව ප්‍රතිපත්තිමය පත්‍රිකාවක්, සංකල්ප පත්‍රිකාවක් අනුමත කළා කියලා. එසේ තිබියදී අද වන කොට රජය ප්‍රකාශ කරමින් ඉන්නවා, "අපි සංකල්ප පත්‍රිකාව අනුමත කළා. ඒ පිළිබඳ පනත් කෙටුම්පත ලබන සතියේ අරගෙන එනවා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න තිබෙනවා නිල ලේඛනය. ඒ වාගේම, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවේදී කිව්වා, "මේ ගැන සොයා  බලන්න, අධ්‍යයනය කරන්න කියලා අපි අධිකරණ ඇමතිතුමාට කිව්වා" කියා. ශ්‍රී ලංකා නීතිඥ සංගමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්බන්ධව උනන්දුයි. ඔවුන් එයට සහභාගි වෙන්න ඉල්ලා සිටිනවා. මේ රටේ නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් ප්‍රධාන කොටසක්, නීතිඥවරු. 25,000කට වැඩි නීතිඥවරු තමන්ගේ යම් මතයක් දරනවා. ඒ පිළිබඳව ආණ්ඩුවත් එක්ක සාකච්ඡා කරන්න ඒ අය කැමැතියි. නමුත්, ඒ කිසිවෙකු එයට සම්බන්ධ කර ගන්නේ නැහැ. ඒ නිසා මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා, ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම් අරගෙන ඇවිල්ලා, බලය විමධ්‍යගත කරලා, ජාති ආගම් අතර සහයෝගිතාව හදලා, ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැඟීම පිළිබඳව වෙච්ච පොරොන්දු එකක්වත් ඉෂ්ට නොකරන මේ රජය පෞද්ගලික වාසියට, දේශපාලන වාසියට අධිකරණය දේශපාලනීකරණය කරන්න, අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගහන්න ඉතාම අසතුටුදායක විධියට කටයුතු කරනවා. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.08]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1983 කළු ජූලිය පිළිබඳ සභාව කල් තබන අවස්ථාවේ විවාදයට එකතු වීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටට පත්වෙනවා.

එහා පැත්තෙන් හැමදාම එන ගෝරනාඩුව තමයි, මේ අවුරුදු එකහමාර ඇතුළේ අපි - ආණ්ඩුව - මොනවා හරි කරලා තිබෙනවාද  කියන එක. මම එතුමාත් එක්ක සංවාදයක පැටලෙන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් අපේ රටේ ජනතාව දන්නවා, ලංකාවේ පළමුවැනි වතාවට ජනතාවාදී රජයක් පත්වෙලා තිබෙනවා කියලා. ඒක ඇතුළේ සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ සියලු දෙනා එකට එකතුවෙලා වැඩ කරනවා. මතක තියාගන්න, මේක තමයි අවුරුදු එකහමාරක් ඇතුළේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජනතාව අතර කිසිදු ජාතිවාදී ගැටුමක් ඇති නොවෙන්න කටයුතු කරපු ආණ්ඩුව. ඒ, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. ඒක මතක තියාගන්න. ඒ ප්‍රතිපත්තියේ තව දේවල් තිබෙනවා මතක තියාගන්න. මේ ආණ්ඩුව තමයි ලංකාවේ පළවැනි වතාවට ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනැඟීම වෙනුවෙන් වැඩ කරන, ඒකට මැදිහත්වෙන ආණ්ඩුව බවට පත්වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. 1983 කළු ජූලියේදී වෙච්ච සිදුවීම් හුදකලා සිදුවීම් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවාට මැදිහත් වුණු එක්සත් ජාතික පක්ෂය, ඒ වාගේම ඒකත් එක්ක සම්බන්ධ වුණු දේශපාලන ව්‍යාපාරවල දේශපාලන  කුමන්ත්‍රණය තමයි 1983 කළු ජූලිය ඇතුළේ හෙළිදරව් වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට අමතර විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
බොහොම ස්තුතියි.

ඒ වාගේම තමයි පාස්කු ප්‍රහාරය. මම මේ කියන්නේ මොකක්ද? මේ ඉස්සරහ ඉන්න මහත්වරු ඒගොල්ලන්ගේ පක්ෂ වෙනුවෙන්, ඒගොල්ලන්ගේ දේශපාලනය වෙනුවෙන් එක පැත්තකින් සිංහල-දෙමළ ගැටුමක් හැදුවා. එතැනින් පස්සේ තිස් අවුරුදු යුද්ධයක් ඇති කළා. එහි ප්‍රතිඵලය වුණේ අපි රටක් විධියට අගාධයට යෑම. එතැනින් මේගොල්ලෝ පාඩම් ඉගෙන ගත්තාද? නැහැ, මේගොල්ලෝ පාඩම් ඉගෙන ගත්තේ නැහැ. මේගොල්ලෝ එතැනින් පස්සේත් මොකක්ද කළේ? මේගොල්ලෝ නැවත සිංහල-මුස්ලිම් ගැටුමක් හැදුවා. ඒක තමයි පාස්කු ප්‍රහාරය. අද ඒ මහත්වරුන්ට රිදෙන්න පටන්ගෙන තිබෙනවා. මොකද, ජනතාවාදී ආණ්ඩුවක් ඇවිල්ලා  අද ඒවා හෙළිදරව් වෙන්න පටන්ගෙන තිබෙන නිසා. ඒක තමයි මේ වෙන්නේ.

මම කියන්නම්, 1983 කළු ජූලිය කියන්නේ මොකක්ද කියලා. මේ පිළිබඳව අපේ ප්‍රතිපත්තිය මොකක්ද? විශේෂයෙන් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා, ජාතිය ගොඩනැඟීම වෙනුවෙන් මැදිහත්වෙච්ච කීර්තිමත් ජාත්‍යන්තර නායකයෙකු වන දකුණු අප්‍රිකානු නෙල්සන් මැන්ඩෙලාගේ ප්‍රකාශයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු කියනවා, "කිසිවෙකු තවත් පුද්ගලයෙකුගේ සමේ පැහැයෙන්, ඔහුගේ පසුබිමෙන් හෝ ආගමෙන් වෛරයක් සහිතව උපදින්නේ නැත. මිනිසුන් වෛර කිරීමට ඉගෙන ගනිති. කෙසේ නමුත් ඔවුන්ට ආදරය කිරීමටද ඉගැන්විය හැක. මන්ද, මිනිසුන්ගේ හදවතට වෛරයට වඩා ආදරය සමීපය" කියලා. අපි හදවතින්ම ඒක විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1983 කළු ජූලිය වෙලාවේ  අපේ පක්ෂය ඇතුළුව තවත් පක්ෂ 2ක් තහනම් කළා. නමුත් අපි ජාතිවාදය වැළඳ ගත්තේ නැහැ. අපි සියයට 3ට වැටිච්ච වෙලාවල් තිබුණා, මේ මහත්වරු එළියේ ජාතිවාදය වෙනුවෙන් බැට් කරපු වෙලාවේ. අපි ඒ කිසි වෙලාවක ජාතිවාදය වැළඳ ගත්තේ නැහැ. අපි අමාරු මොහොතේත් එක් සත්‍යයක් වෙනුවෙන් පෙනී සිටියා. ඒ මොකක්ද? අපි ජාතික සමගිය මත පදනම් වෙච්ච ව්‍යාපාරයක්. අපි ඒක අපේ දේශපාලනය තුළ කරමින් ඉන්නවා. ඒකට බලය තිබුණාද, නැද්ද කියන එක අපට අදාළ වෙන්නේ නැහැ.  අපට ඡන්දය තිබුණාද නැද්ද කියන එක ඒකට අදාළ නැහැ. එහෙම දේශපාලන ව්‍යාපාරයක් තමයි අපි.

1983 කළු ජූලිය කියන්නේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1977දී ජේ.ආර්. ජයවර්ධන  බලයට එනවා. ජේ.ආර්. හයෙන් පහක බලයක් ගත්තා. නමුත් ජේ. ආර්ට බැරි වුණා, යාපනයේ දිස්ත්‍රික්කයෙන් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්

දිනාගන්න. නමුත් අපි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ අපට තමයි ලංකාවේ පළමුවැනි වතාවට සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ කියන භේදයෙන් තොරව සියලු දිස්ත්‍රික්කවලින් මහජන නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට අවස්ථාව ලැබුණේ. ඒක තමයි මේ තත්ත්වය වෙනස් කරපු තැන. ඒක මතක තියාගන්න. 1977දී හයෙන් පහයක බලයක් අරගෙනත් ජේ.ආර්ට ඒක කරන්න බැරි වුණා. ඡන්ද නොවෙයි, අපේ රටේ දෙමළ මනුස්සයාගේ හදවත දිනාගන්න බැරි වුණා. අපි මොකක්ද කරගෙන තිබෙන්නේ? ලංකාවේ පළමුවැනි වතාවට සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ සියලුදෙනාගේම හදවත අපි දිනාගෙන තිබෙනවා. *[බාධා කිරීම්]* මේ මහත්වරු නම වෙනස් කළාට පාට වෙනස්වෙලා නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ඉඳගෙන ගහපු ගේම,- *[බාධා කිරීම්]* 1977 ජේ.ආර්. බලයට ආවාට පස්සේ මොකක්ද වුණේ? 1981දී සංවර්ධන සභා ඡන්දය තිබුණා. මේගොල්ලෝ අද අපට ඡන්ද ගැන උගන්වනවා. හැබැයි, ලංකාවේ අපකීර්තිමත්ම, කුමන්ත්‍රණකාරී මැතිවරණය කළේ මේ මහත්වරු. එක්සත් ජාතික පක්ෂය 1981දී සංවර්ධන සභා ඡන්දය,- *[බාධා කිරීම්]* ඒ වාගේම, මේක මතක තියාගන්න. මම කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1981 මැයි මාසයේ මේගොල්ලන්ගේ ජේආර් කැබිනට් ඇමතිවරු 4දෙනෙක් එකතු කරනවා, මේ කුමන්ත්‍රණය වෙනුවෙන්. ඒවා ප්‍රතිඵල විධියට තිබෙනවා. එක්කෙනෙක් තමයි ඉඩම්, ඉඩම් සංවර්ධන සහ මහවැලි සංවර්ධන අමාත්‍ය ගාමිණී දිසානායක. අනෙක් එක්කෙනා කර්මාන්ත සහ විද්‍යාත්මක කටයුතු අමාත්‍ය සිරිල් මැතිව්. අනෙක් එක්කෙනා ෆෙස්ටස් පෙරේරා, ධීවර අමාත්‍ය. අනෙක් එක්කෙනා කවුද? මේගොල්ලන් අද හුළං ගහන තරුණ කටයුතු හා රැකීරක්ෂා සහ අධ්‍යාපන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ. හරිද? මතක තියාගන්න. මේගොල්ලෝ එකතු වෙලා ජනාධිපති මන්දිරයේ කුමන්ත්‍රණය කරනවා, 1981 සංවර්ධන සභා ඡන්දය කොල්ල කන්නේ කොහොමද කියලා.

ඊට පස්සේ 1981 මැයි මාසයේ 31වැනි දා යම් සිදුවීමක් වෙනවා. ඒ මොකක්ද? ඉස්සෙල්ලාම යාපනයේ මැතිවරණ රැලියකදි "ශිවානන්දන්" කියලා පොලිස් නිලධාරියෙක් ඝාතනය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන්ගේ plan එක විධියට මොකක්ද තිබුණේ? ජේආර්ට මිනිස්සුන්ගේ හදවත දිනාගන්න බැරි වුණා. එතුමාට හයෙන් පහක බලයක් තිබුණා. එතුමාට හයෙන් පහක බලයක් තිබුණාට උතුරේ බලය නැතිවෙන්නයි යන්නේ. අද මේ මහත්වරු ඒවා කථා කරන්නේ නැහැ. මම මේක කියන්නේ මේ ඔක්කෝටම නොවෙයි. මෙතැන ඒ එක්කෙනෙක් ඉන්නවා නේ. එයාටයි මම කියන්නේ. 1981 සංවර්ධන සභා ඡන්දය කොල්ල කන්න ප්ලෑන් කරනවා මේගොල්ලන්. අද මේගොල්ලන්ගේ නම විතරයි වෙනස්. ඒ පක්ෂය ඇතුළේ ඔක්කෝම බඩු ටික හිටියා. ඒගොල්ලෝ තමයි මේක කළේ. ඊට පස්සේ මොකද වෙන්නේ? උතුරේ ප්‍රචාරක රැලියේදී ශිවානන්දන් කියන පොලිස් නිලධාරියා ඝාතනය කරනවා.

ඒ විතරක්ද? 1981දී තමයි යාපනය පුස්තකාලය ගිනි තියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුස්තකාලයක් නොවෙයි යාපනයේ තිබෙන්නේ. ඒක දෙමළ මනුස්සයෝ, සිංහල මනුස්සයෝ කියන සියලුදෙනාගේ හදවත බඳු සංකේතයක්. ලංකාවේ පළමුවැනි පුස්තකාලය, නැත්නම් එකම පුස්තකාලය ඒක වෙන්න ඇති. මම දන්නේ නැහැ, ලෝකයේත් එහෙම තියෙනවාද කියලා. මම දන්න විධියට පාවහන් ගලවලා ඇතුළට යන එකම පුස්තකාලය තමයි යාපනය පුස්තකාලය. ඇයි ඒ? ඒක ඒ මිනිස්සුන්ගේ හදවත; වන්දනාව. එහෙම තිබුණු එකට මේ මහත්වරු මොකක්ද කළේ? යාපනය පුස්තකාලයට ගිනි තිබ්බා. අපට තිබෙන තොරතුරු අනුව යාපනය පුස්තකාලයේ 97,000කට වඩා පොත් ප්‍රමාණයක් තිබුණා. එය දකුණු ආසියාවේ ලොකුම පුස්තකාලය. අපට තිබෙන තොරතුරු අනුව පැනෙන් ලියපු මුල් පිටපත් 10,000කට වැඩි ප්‍රමාණයක් එහි තිබුණා. මේ මහත්වරුන්ගේ නායකයෝ ගිහිල්ලා අමු අමුවේ ඒක ගිනි තිබ්බා, සංවර්ධන සභා ඡන්දය වෙනුවෙන්. ඒ විතරක් නොවෙයි, ඒ පුස්තකාලය ගොඩනඟපු ඩේවිඩ් කියලා පියතුමෙක් හිටියා. ඒ පියතුමා ඒ වෙලාවේ ඒ පුස්තකාලයේ හිටියේ නැහැ. හැබැයි ඒ පියතුමා ඒ ආසන්නයේම ඉන්න තවත් සහෝදර පියතුමෙකුට කථා කරලා අහනවා, "පුස්තකාලයෙන් දුමක් එනවා, ඒ මොකක්ද පියතුමනි?" කියලා. ඉතිහාසයේ සඳහන් වන්නේ මොකක්ද? ඒ පියතුමා ඩේවිඩ් පියතුමාට පණිවුඩය දෙනවා, "යාපනය පුස්තකාලයට ගිනි තිබ්බා" කියලා. එච්චරයි. ටෙලිෆෝන් එකත් කනේ තියාගෙන හෘදයාබාධයකින් ඒ පියතුමා මිය යනවා. අද මේ කැ ගහන්නේ එහෙම කට්ටිය. 1981දී යාපනය පුස්තකාලයට ගිනි තිබ්බා. ඉතා සැලසුම්සහගතව තමයි ඒ වැඩේ කරලා තිබුණේ. *[බාධා කිරීම්]*

ඒ විතරක්ද? 1981 ජූලි මාසයේ 01වැනි දා *[බාධා කිරීම්]* මේ මහත්වරු ගිහිල්ලා "ඊළනාඩු" කියන පුවත්පත් කාර්යාලයට ගිනි තිබ්බා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගන්න.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

ඒ විතරක්ද? 1981දී තව මොකක්ද වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? යාපනය පුස්තකාලයට ගිනි තියනවා. දේශපාලන පක්ෂවලට අදාළව ප්‍රචණ්ඩත්වය එනවා. දෛනිකව තොරතුරු තිබ්බව එකම පුවත්පතේ කාර්යාලයට ගිනි තියනවා. ඊට පස්සේ මේගොල්ලෝ ලෑස්ති වෙනවා, සංවර්ධන සභා ඡන්දය තිබෙන දවසට මංකොල්ල කන්න. ඒ වෙනුවෙන් ජූනි මාසයේ 02වැනි දා මේගොල්ලන්ගේ ජයවික්‍රම පෙරේරා කුරුණෑගලට කට්ටිය එකතු කරනවා. මේ මහත්වරු මතක තියාගන්න. අපි දන්න ඉතිහාසයේ තිබෙන්නේ එහෙමයි. ඊට පස්සේ කුරුණෑගල station එකට ආවා. ඒකේ announce කළේ වෙන දා ඉන්න Station Master නොවෙයි. එදා Station Master වුණේ කවුද? ජයවික්‍රම පෙරේරා. ජයවික්‍රම පෙරේරා මොකක්ද මයික් අරගෙන කියලා තිබුණේ? "දෙමළුන්ට හොඳම පාඩමක් උගන්වනවා. ශ්‍රී ලාංකිකයෝ වීරවරයන් බවට පත්වෙන්නයි යන්නේ" කියලායි ඒ මහත්මයා කිව්වේ? ඔයගොල්ලන්ගේ පක්ෂයේ හිටපු නායකයෝ තමයි ඒ වෙලාවේ එහෙම කිව්වේ. ඒ මතය තමයි එතැන හැදුවේ?

ඒ විතරක්ද? තව කාරණයක් මම කියන්නම්. දැන් මේගොල්ලන් භූමිතෙල් ගෑවිලා වාගේ දඟලනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක කියන්නේ මම නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවක තිබෙනවා, ගම්පහ එස්.ඩී. බණ්ඩාරනායක මහත්මයා කියපු දෙයක්. ඒ මහත්මයා 1981 ජූනි මාසයේ 10වැනි දා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරනවා, මේක ගැන. 1981.06.10වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 269 සහ 270හි සඳහන් වෙලා තිබෙනවා, යාපනය පුස්තකාලය ගිනි තියද්දි, සංවර්ධන සභා ඡන්දය මංකොල්ල කද්දි, මේගොල්ලෝ ඔක්කෝම - රනිල් වික්‍රමසිංහ ඇතුළු එවකට හිටපු සියලු ඇමතිවරු - ඒ අවස්ථාවේ තානායමේ හිටියා කියලා. එදින හැන්සාඩ් වාර්තාවේ එම තීරුවල පිටපතක් මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
හොඳයි.

ඊළඟට, මොකක්ද වුණේ? මේ කට්ටිය කරපු දේවල්, මේ. ඊට පස්සේ මොකක්ද වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? 1981 ජූලි මාසයේ 4වැනි දා, - *[බාධා කිරීමක්]* මේවා කියන කොට මේගොල්ලන්ට රිදෙනවා. 1981 ජූලි මාසයේ 4වැනි දා මේගොල්ලෝ යාපනයේ ඡන්දය පවත්වනවා. හැබැයි, ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන්නේ නැහැ. ඡන්ද පෙට්ටි 9කට වැඩි ප්‍රමාණයක් අතුරුදහන් වෙනවා; තොරතුරු නැති වෙනවා, දැනටත් නැහැ. පුළුවන් නම් ගිහිල්ලා ඒවා හොයලා දෙන්න. මේගොල්ලෝ එහෙමයි ඡන්ද කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිඵලය විධියට ආවේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව නැති නිසා මම ඒ ගැන කියන්නේ නැහැ. ඒකේ හිටපු නිලධාරින් තොරතුරු දුන්නා. මේගොල්ලන්ගේ නායකයෝ ඡන්ද මධ්‍යස්ථානවලට ගිහිල්ලා කිව්වේ මොකක්ද? සතාට ඡන්දය දෙන්න කියලා. සත්තු තමයි ඉඳලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* සතාට ඡන්දය දෙන්න කියලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* හැබැයි, ප්‍රතිඵලය මොකක්ද? ඡන්දය තියලා දවස් 10කට පස්සේ ඡන්ද ප්‍රතිඵල ආවා. 1981 ජූලි මාසයේ තමයි ඡන්ද ප්‍රතිඵල ආවේ. දෙමළ එක්සත් විමුක්ති පෙරමුණට ඡන්ද 263,369යි. මේගොල්ලෝ මිනිස්සු මරලා, පුස්තකාල ගිනි තියලා, රට විනාශ කරලා 23,302යි ඡන්ද ගත්තේ. ඒක තමයි අවසාන ප්‍රතිඵලය.

1983 කළු ජූලිය කියන්නේ මොකක්ද? මම ඉතා ඉක්මනින් මේ ගැන කියලා ඉවර කරන්නම්. අපේ අනෙක් කථිකයන් මේ ගැන විස්තර කරයි. 1983 කළු ජූලිය කියන්නේ මොකක්ද? ජූලි මාසයේ 15වැනි දා මොකක්ද වුණේ? මම හිතන විධියට ඒ වෙලාවේ සන්නද්ධ කණ්ඩායමක්, - *[බාධා කිරීම්]* මට වඩා උතුරේ හිටපු නායකයන් ඒ ගැන දන්නවා. ඒ සන්නද්ධ කණ්ඩායම්වල හිටපු දෙදෙනෙක් ඝාතනය වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
1983 ජූලි මාසයේ 23වැනි දා හමුදාවේ සෙබළුන් 13දෙනෙක් ඝාතනය වුණා. හමුදාවේ සෙබළුන් 13දෙනෙක් ඝාතනය වුණාට පස්සේ මොකක්ද වුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් හමුදා සෙබළෙක් ඝාතනය වුණාට පස්සේ ඒගොල්ලන්ගේ ගෙවල්වලට තමයි ඒ දේහයන් දෙන්නේ කියලා අපි දන්නවා. හැබැයි, මේගොල්ලෝ මොකක්ද කළේ? ජාතිවාදී ගැටුමක් හදන්න පුළුවන් කියන අදහසින් එදා ලේ පිපාසයෙන් හිටපු ඒ නායකයෝ තීන්දු කළා, එම හමුදා සෙබළුන්ගේ මෘත දේහ - dead bodies -බොරැල්ලේ කනත්තට ගෙනෙන්න. බොරැල්ල කනත්තට මෘත දේහ ගෙනෙද්දි මොකක්ද වෙන්නේ? බොරැල්ල කනත්තට මෘත දේහ ගෙනෙද්දි ජාතිවාදි කණ්ඩායම් ඇවිස්සෙනවා. තොරතුරු තිබෙනවා, මේගොල්ලන්ගේ පක්ෂයේ කට්ටිය කොළඹ කච්චේරිය කැඩුවා කියලා. කඩන්නේ මොකටද? ඡන්ද නාම ලේඛන ටික ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද නාම ලේඛන ටික ගන්නේ ඇයි? දෙමළ මිනිස්සුන්ගේ නම් ටික ගන්න. ඊට පස්සේ මොකක්ද කරන්නේ? දෙමළ මිනිස්සුන්ගේ නම් ටික අරගෙන වීදි පුරා ගිහිල්ලා කඩ ගිනි තියලා, මිනිස්සු ඝාතනය කළා. මේගොල්ලන් එහෙම දේශපාලන ව්‍යාපාරයක් තමයි කළේ. එහෙම තිබුණු මැදිහත් වීමක් තමයි 1983 කළු ජූලිය කියන්නේ. එය හුදකලා සිදුවීමක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගන්න, අහගන්න.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
ඊට පස්සේ මොකක්ද වුණේ? 1983 ජූලි මාසයේ 25වැනි දා වැලිකඩ බන්ධනාගාරයේ හිටපු 35දෙනෙක් - කුට්ටමනී ඇතුළු 35දෙනෙක් - ඝාතනය කළා. ඊට පස්සේ 26වැනි දා තමයි මේගොල්ලන්ට හදිසි නීතිය දාන්න මතක් වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමගි ජන බලවේගය කියලා පක්ෂයට නම දාගෙන හිටියාට ලංකා ඉතිහාසයේ පොලීසියත්, හමුදාවත් බැරැක්කවලට තියලා, මේගොල්ලන්ගේ පක්ෂවල හිටපු සිංහල සාමාජිකයන්ට, ජාතිවාදය මත පදනම්ව වැඩ කරපු නායකයන්ට අවශ්‍ය කරන ගැටුම හදන්න වැඩ කරපු මහත්වරු තමයි මේගොල්ලෝ. ඒගොල්ලන්ගේ පක්ෂවල හිටපු කට්ටිය තමයි මේගොල්ලෝ. ඒ විතරක්ද? 1983 ජූලි මාසයේ 27වැනි දා දෙවැනි වතාවටත් වැලිකඩට ප්‍රහාර එල්ල කළා, මිනිස්සු ඝාතනය කළා. මේ, එහෙම කරපු කට්ටියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉතිහාසය කැතයි. මේ ඉතිහාසය අපි පිළිගන්න කැමැති නැහැ. හැබැයි, ඉතිහාසය තුළ අප ඉදිරියේ මේ වාගේ දේවල් සිද්ධ වුණා. ඒ මහත්වරු ඒ වාගේ දේවල් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන් ඒකෙනුත් පාඩම් ඉගෙන ගත්තේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
මම අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේගොල්ලෝ වාගේ කුහකකමට නොවෙයි, අපි මේ කාරණා මතු කරන්නේ. අපි මේවායින් පාඩම් ඉගෙන ගත්ත මිනිස්සු නිසායි මේ කාරණා මතු කරන්නේ. අපි ඒ වෙනුවෙන් කැප වෙනවා. සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ කියන සියලු ජාතීන්ගේ හදවත වෙනුවෙන් අපි වැඩ කරනවා. ඒක නිසා තමයි අපි කියන්නේ, අපි මේ මහත්වරු වාගේ නොවෙයි කියලා. අපි සියයට 3ට වැටුණාම ඡන්දය වෙනුවෙන් වැඩ කරපු මිනිස්සු නොවෙයි. *[බාධා කිරීමක්]* අපි කවදාවත් අපට ආණ්ඩු බලය තිබුණාද, නැද්ද කියලා බලලා හැසිරිච්ච මිනිස්සු නොවෙයි. ඔයගොල්ලන්ගේ වාර්තා ඇතුළේ මට පෙන්වන්න පුළුවන්, ඔයගොල්ලන් මොනවාද කළේ කියලා. ඒකට මට දැන් වෙලාව නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මැදිහත් වීම මොකක්ද? අපේ තිබෙන්නේ වෛරය වෙනුවට ආදරය. අපේ තිබෙන්නේ අමනුස්සකම වෙනුවට මනුස්සකම. අපේ තිබෙන්නේ අවිද්‍යාව වෙනුවට විද්‍යාව, ජාතිවාදය වෙනුවට ජාතික සමඟිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලුදෙනා එකට එකතු වෙලා ඒ ගමන වෙනුවෙන් අපේ මැදිහත් වීම කරනවා. මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
பாராளுமன்ற நிலையியற் கட்டளை 91(ஊ) மற்றும் 92 (2)(ஆ): නිකම් කෙඳිරිගාන්න එපා කියන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point එක බලන්නකෝ. මේ අයට නිකම් කෙඳිරිගාන්න එපා කියන්න. අපි මේගොල්ලන් කරපු වැඩ ඔක්කෝම දන්නවා. සුනාමි එනකොට කන්න බොන්නත් දෙන්න බැහැ කියලා කියපු මිනිස්සු. දැන් අඬනවා, පුස්තකාලය පිච්චුවා කියලා. කොච්චර බොරු වැඩක් ද? *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔය කාරණය විවාදයක් කර ගන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.23]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ දෙමළ, මුස්ලිම්, සිංහල කණ්ඩායම් සමඟියෙන් ජීවත් වුණා. 1983 ජූලි 23 කළුජූලිය ගැන මතක් කරමින් නැවත වරක් ජාතිවාදය වපුරන්න ද හදන්නේ කියලා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නේ මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු උදවියයි කියලා අපි දන්නවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නේ පාර්ලිමේන්තුවට ගිනි තියන්න ආපු උදවිය. අපි ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු සාමාජිකයන්. එක්සත් ජාතික පක්ෂයවත්, සමඟි ජන බලවේගයවත් කවදාවත් ජාතිවාදයට උල්පන්දම් දුන්නේ නැහැ. ඩී.එස්. සේනානායක මැතිතුමා එක්සත් ජාතික පක්ෂය පිහිටුවද්දී කිව්වේ මොකක්ද? සිංහල වේවා, ද්‍රවිඩ වේවා, මුස්ලිම් වේවා, බර්ගර් වේවා සියල්ලන්ටම ඉන්න පුළුවන් පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය කියලා කිව්වා. අපේ පසුගිය යහ පාලන ආණ්ඩුවේ ද්‍රවිඩ ඇමතිවරු තුන්දෙනෙක් හිටියා. මුස්ලිම් ඇමතිවරු 4දෙනෙක් හිටියා. ඔබතුමන්ලාගේ කොහොමද? තමුන්නාන්සේලාගෙන් මම අහනවා, කෝ! කඳුකරයේ ද්‍රවිඩ ඇමතිවරයෙක් ඉන්නවා ද? මුස්ලිම් ජාතිකයෙකුට අමාත්‍ය ධුරයක් දීලා තිබෙනවා ද? තමුන්නාන්සේලා එකම එක ඇමතිකමක් දීලා තිබෙනවා. බොහොම ලජ්ජයි! බොහොම ලජ්ජයි! අපි මේ රටේ ජනවාර්ගික අර්බුදයට උත්තරයක් දෙන්න පළාත් සභා ක්‍රමය ගෙනාවා. අපි ඉන්දියාවත් එක්ක IPKF පිළිබඳ සාම ගිවිසුම අත්සන් කරලා පළාත් සභා ක්‍රමය ගේනකොට අපි එතැනින් බලාපොරොත්තු වුණේ උතුරට, නැගෙනහිරට, මධ්‍යමට, දකුණට බලය විමධ්‍යගත කරන්නයි. තමුන්නාන්සේලාගේ ජනතා විමුක්ති පෙරමුණ මොනවාද කළේ? ඒකට විරුද්ධව මිනී මැරුවා. තමුන්නාන්සේලා කී දෙනෙක් මරලා තිබෙනවා ද? 1987 ඉඳලා 1992 වෙනකම් 6,577ක් මරලා තිබෙනවා. භික්ෂූන් වහන්සේලා 30නමක් අපවත් වෙලා තිබෙනවා. කතෝලික පූජකවරු දෙදෙනායි. එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් 2,735යි. රජයේ සේවකයන් 487යි. පොලිස් නිලධාරින් 382යි. හමුදා භටයන් 209යි. මෙන්න, තමුන්නාන්සේලාගේ කළු ඉතිහාසය. ඒක තමයි කළු ජූලිය. හිරේ දමන්න ඕනෑ මිනිස්සු අද පාර්ලිමේන්තුවේ ඉන්නවා.

තමුන්නාන්සේලා මේ කාරණයත් දැනගන්න. අද තමුන්නාන්සේලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට දොස් කියනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි 71 කැරැල්ලේ උදවිය රිමාන්ඩ් කළාට පස්සේ, හිරේ දැම්මාට පස්සේ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව ගෙනැල්ලා විජේවීරව එළියට දැම්මේ. 1983 කළු ජූලියේදී කළේ මොනවාද? එක්සත් ජාතික පක්ෂය නොවෙයි මේක අවුස්සන්න ඕනෑ,- එදා බුද්ධි අංශ වාර්තා කළා, ජනතා විමුක්ති පෙරමුණේ උදවියත් මේ කළු ජූලියේ මංකොල්ලකෑම්වලට, මිනීමැරුම්වලට සම්බන්ධ වුණා කියලා. ඒක නිසා තමයි 1983දී JVP එක තහනම් කළේ; ඒක තමයි එදා තහනම් කළේ. මෙතැන මේ ඉදිරි පෙළේ ඉන්න සේරම අය අද හිරේ ඉන්න ඕනෑ අය. මේ මිනීමැරුම් විතරක් නොවෙයි, මේ රටේ ආර්ථිකයට කරපු ලොකුම හානිය කළේත් මේගොල්ලන්. තමුන්නාන්සේලා මරපු හාමුදුරුවරු ගැන මම කියන්නම්. පොහොද්දරමුල්ලේ පේමාලෝක නායක ස්වාමීන් වහන්සේ, කොටිකාවත්තේ සද්ධාතිස්ස නායක ස්වාමීන් වහන්සේ, තිරානගම රතනසාර නායක ස්වාමීන් වහන්සේ, වැලිමඩ ඉන්ද්‍රසුමන ස්වාමීන් වහන්සේ, වැල්ලේතොට පඤ්ඤාදස්සි ස්වාමීන් වහන්සේ, හබරගොඩ පඤ්ඤාසාර ස්වාමීන් වහන්සේ කියන හාමුදුරුවරු මැරුවා. ඒ වාගේ මහා කළු ඉතිහාසයක් තමුන්නාන්සේලාට තිබෙන්නේ; මිනීමරු ඉතිහාසයක් තිබෙන්නේ. පළාත් සභා මැතිවරණයේදී ඡන්දය දාන්න ගියාම මගේ දිස්ත්‍රික්කයේ මාලිගාවිලදී තමුන්නාන්සේලා 4දෙනෙක් මැරුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි දෙකක අමතර කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඔබතුමාට තවත් අමතර විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
බොහොම ස්තුතියි.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

උතුරු, නැඟෙනහිර ජනතාව අද ඊයේ නොවෙයි, පසුගිය ජනාධිපතිවරණයේදීත් අනුර කුමාර දිසානායකට නොවෙයි ඡන්දය දුන්නේ. මේ, යාපනය දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵල: සජිත් ප්‍රේමදාසට දෙනවා ඡන්ද 121,177ක්; රනිල් වික්‍රමසිංහට දෙනවා ඡන්ද 84,558ක්; අනුර කුමාර දිසානායකට ඡන්ද 27,083යි. ඔන්න! දෙමළ ජනතාව තුළ තමුන්නාන්සේලාට තිබෙන ආදරය. ඒක තමයි අද තමුන්නාන්සේලා මෙතැන ජාතිවාදය වපුරලා දෙමළ ඡන්ද ගන්න බලන්නේ. දෙන්නේ නැහැ, මඩකලපුව දිස්ත්‍රික්කයේ ඡන්ද. සජිත් ප්‍රේමදාසට ඡන්ද 139,110යි. රනිල් වික්‍රමසිංහට ඡන්ද 91,000යි. අනුර කුමාර දිසානායකට ඡන්ද 38,000යි. මෙන්න මෙහෙමයි තමුන්නාන්සේලාව විශ්වාස කරන්නේ. මේ දෙක එකතු වුණාම කොහොමද? හෙට අනිද්දා අපි එකතු වෙනවා. ඒකට බයේ තමයි කෑගහන්නේ. බය වෙන්න එපා. ඒකට බයේ තමයි කෑගහන්නේ. ඔන්න, උතුරු නැඟෙනහිර ජනතාව තමුන්නාන්සේලාට සලකලා තිබෙන හැටි. ජනමත සමීක්ෂණ තියලා දැන් කියනවා, අනුර කුමාර දිසානායකට සියයට 75යිලු. අපි කියනවා, පළාත් සභා ඡන්දය තියන්න කියලා. උතුරු, නැඟෙනහිර ජනතාවට බලය විමධ්‍යගත කරන්න ලබා දුන් පළාත් සභා ඡන්දය පවත්වන්නේ නැහැ. විශේෂ කාරක සභා ඇද ඇද ඉන්නවා. අපි තමුන්නාන්සේලාට කියනවා, බොරු කියලා ජනතාව රවට්ටලා තමුන්නාන්සේලාට ද්‍රවිඩ ඡන්ද ගන්න බැහැ, මුස්ලිම් ඡන්ද ගන්න බැහැ කියලා. ඒගොල්ලන් ඉන්නේ අපි එක්ක.

කෝ, මුස්ලිම් ජාතිකයින්ට ඇමතිකමක් දීලා තිබෙනවාද? මට මතකයි, අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ අයට කැබිනට් ඇමතිකම් පහක් දීලා තිබුණා කියලා. එදා ඉඳලා මුස්ලිම් ජනතාවට හැම ආණ්ඩුවකම කැබිනට් ඇමතිකමක් තිබුණා. අද ඒ අයට කැබිනට් ඇමතිකමක් නැහැ. ඔන්න, තමුන්නාන්සේලා අනෙක් ජාතීන්ට සලකන විධිය. තමුන්නාන්සේලා අනෙක් ජාතීන්ට සලකන විධිය. කෝ කඳුකරයට? කඳුකරය ගැන කථා කරනවා. කඳුකරයට කැබිනට් ඇමතිවරයෙක් ඉන්නවාද? ඉන්නවාද? තමුන්නාන්සේලා යටින් ඒගොල්ලන්ට කප කපා උඩින් ඡන්ද ටික ගන්න යනවා. අද - ජූලි 23වෙනි දා - මේ යෝජනාව ගෙනාවේ ජාතිවාදය නැවත අවුස්සන්නයි. මේ රටේ ජනතාව අවුරුදු ගණනක් බොහොම සාමකාමීව ජීවත් වුණා. එක්සත් ජාතික පක්ෂය අපේ පරණ පක්ෂය. අද සජබය. මේ දෙකම සියලු ජාතීන්ට එකට ඉන්න පුළුවන් පක්ෂ. අපේ සභාපති මුස්ලිම් ජාතිකයෙක්. ඒ වාගේම ද්‍රවිඩ ජාතිකයන් ඉන්නවා. තමුන්නාන්සේලාගේ කවුද ඉන්නේ? තමුන්නාන්සේලාගේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ එක ද්‍රවිඩ ජාතිකයෙක්, එක මුස්ලිම් ජාතිකයෙක් ඉන්නවාද කියලා මට කියන්න? කවුරුවත් නැහැ. *[බාධා කිරීම්]* කරුණාකරලා බොරුවට කෑගහන්න එපා. තමුන්නාන්සේලා මේ රටේ ජාතිවාදය වපුරලා ආයෙත් අවුස්සන්න හදන්න එපා. තමුන්නාන්සේලාගේ ඉතිහාසය මිනීමැරුම් ඉතිහාසයක්; ලේ ගැවුණු ඉතිහාසයක්. මේකේ ඉන්න නායකයන් හිරේ ඉන්න ඕනෑ උදවිය. අද පිරිසිදු වෙන්න එනවා. කරුණාකරලා නැවත වරක් මේ රටේ ජාතිවාදය වපුරන්න එපා කියලා ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[பி.ப. 3.32]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையில் மிகவும் முக்கியமானதொரு விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. 1983ஆம் ஆண்டில் இடம்பெற்ற கறுப்பு யூலையின் அனுபவங்களைப் பகிர்ந்துகொள்வதற்கும், மீண்டும் அவ்வாறானதொரு சம்பவம் ஏற்படாமல் தடுப்பதற்கும், இந்த நாட்டில் தமிழ், சிங்கள, முஸ்லிம் மக்கள் மத்தியிலான ஐக்கியத்தை மீண்டும் கட்டியெழுப்புவதற்குமே இன்று இந்தப் பிரேரணை கொண்டுவரப்பட்டு இருக்கின்றது.

எனக்கு முன்னர் உரையாற்றிய ஐக்கிய மக்கள் சக்தியின் பொதுச் செயலாளர் ரஞ்ஜித் மத்தும பண்டார அவர்கள் இன ஐக்கியம் பற்றி பெரிதாகப் பேசினார். அவருக்குப் பின்னால் அமர்ந்திருக்கும் இராதாகிருஷ்ணன் அவர்களுக்குத் தெரியும், நுவரெலியாவை எரித்துச் சாம்பலாக்கியவர் யார் என்று. 1983ஆம் ஆண்டு காலப்பகுதியில் மகாவலி அபிவிருத்தி அமைச்சராக இருந்த காமினி திஸாநாயக்க அவர்கள், நுவரெலியாவில் இருந்த எங்களுடைய 'யோகா ஸ்டோர்ஸ்' உட்பட பல கடைகளையும் அங்கிருந்த எங்களுடைய பெண்களையும் பிள்ளைகளையும் நாசமாக்கிய பாவித் தனமான நடவடிக்கைகளுக்குக் காரணமாக இருந்தார். அவர் சார்ந்த ஐக்கிய தேசியக் கட்சியில்தான் இந்த ரஞ்ஜித் மத்தும பண்டார அவர்களும் இருந்தார். நாங்கள் இங்கு இன்னுமொரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். அன்று பதுளையில் இராணுவத்தினர் தமிழர்களுடைய கடைகளுக்கு முன்னால் chalkஆல் கோடு போட்டுச் சென்றார்கள். பிறகு ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்த காடையர்கள் வந்து அந்தக் கடைகளைத் தீ வைத்துக் கொளுத்தியது மாத்திரமல்ல, அங்கிருந்த பச்சிளம் குழந்தைகளையும்கூட தீயில் போட்டு எரித்தார்கள். இவற்றுக்கெல்லாம் முக்கிய காரணம் என்ன?

1978ஆம் ஆண்டு இந்த நாட்டில் ஆட்சி அதிகாரத்துக்கு வந்து, திறந்த பொருளாதாரக் கொள்கையைக் கொண்டுவந்து நாட்டை நாசமாக்கினார்கள்; 1978-1979ஆம் ஆண்டு காலப்பகுதியில் இரத்தினபுரி, பலாங்கொடை, பெல்மடுள்ளை,

பண்டாரவளை, அப்புத்தளை போன்ற பிரதேசங்களில் தோட்டத்தொழிலாளர்களின் ஆடு, மாடுகளைக் கொள்ளை யடித்தது மாத்திரமல்லாமல் வன்முறைகளையும் நிகழ்த்தி னார்கள். இவர்கள் வேறுயாருமல்ல, அன்றைக்கு இருந்த ஐக்கிய தேசியக் கட்சியினராகும். இது கௌரவ இராதாகிருஷ்ணன் அவர்களுக்கு நன்றாகத் தெரியும். இவை எல்லாவற்றுக்கும் மேலாக, 1979ஆம் ஆண்டு இந்த நாட்டில் அவசரகாலச் சட்டத்தை நடைமுறைப்படுத்தியும் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தைக் கொண்டுவந்தும் இந்த நாட்டில் தமிழர்களைப் பூண்டோடு அழிக்கின்ற நடவடிக்கையை எடுத்த பாவி வேறுயாருமல்ல, அன்றிருந்த ஜே.ஆர். ஜயவர்தன என்ற நபராகும்.

1981ஆம் ஆண்டு வடக்கு, கிழக்கில் இருந்த தமிழ் இளைஞர்கள் ஜனநாயகத்தின்மீது நம்பிக்கை வைத்து குறிப்பாக, வாக்குரிமைமீது நம்பிக்கை வைத்து மாவட்ட அபிவிருத்தி சபைத் தேர்தலில் போட்டியிட்டார்கள்; அதற்காகச் செயற்பட்டார்கள். எனினும், அவர்கள் வைத்த நம்பிக்கைக்கு வேட்டு வைத்தார்கள்; மோசடி செய்தார்கள். அதுமாத்திரமல்ல, தமிழருக்குச் சொந்தமாகவும் அவர்களுடைய இதயமாகவும் கருதப்பட்ட யாழ். நூலகத்தை எரித்துச் சாம்பலாக்கி, அங்கிருந்த 97,000 புத்தகங்களைக் கொளுத்திய பாவித் தனமான நபர்கள் வேறு யாருமல்ல, காமினி ஜயவிக்ரம பெரேரா, காமினி திசாநாயக்க, சிறில் மத்தியூ போன்றவர்களே! முதலில் தேர்தலில் மோசடி செய்தார்கள். பிறகு அங்குள்ள மக்களுடைய இதயமாகக் கருதப்பட்ட யாழ். நூலகத்தை எரித்துச் சாம்பலாக்கிய பாவிகள் வேறுயாருமல்ல, ஐக்கிய தேசியக் கட்சியினரே ஆகும். அந்த ஐக்கிய தேசியக் கட்சிக்குப் பின்னால் ஓடுகின்றவர்கள், அந்த ஐக்கிய தேசியக் கட்சியினரின் காலை நக்கிப் பிழைக்கின்றவர்கள், இன்றைக்கு எங்களைப் பார்த்து எள்ளிநகையாடுகின்றார்கள். அந்த மாதிரி யான பைத்தியக்காரர்கள், மோசடிக்காரர்கள், முட்டாள் களோடு எங்களுக்கு எந்தவிதமான வாதமும் கிடையாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் இதனை அரசியல் ரீதியான செயற்பாடாகக் கருதுவதற்குக் காரணம் வேறு எதுவுமல்ல, 1982ஆம் ஆண்டு இந்த நாட்டில் நடைபெற்ற சர்வஜன வாக்கெடுப்புதான். அந்த சர்வஜன வாக்கெடுப்பு என்பது மோசடியான வாக்கெடுப்பு! வடக்கு, கிழக்கில் இருந்த தமிழர்களின் எந்தவொரு எதிர்பார்ப்பையும் ஜனநாயக உரிமைகளையும் மதிக்காமல் இடம்பெற்றதுதான் அந்த சர்வஜன வாக்கெடுப்பு! அந்த மோசடிக்கு எதிராக அன்று எங்களுடைய தலைவராக இருந்த ரோஹண விஜேவீர அவர்கள் வழக்குத் தாக்கல் செய்தார். அதன் முதலாவது மற்றும் இரண்டாவது விசாரணைகளின் பின்னர் தெரிய வந்தது, எங்களுடைய பேரன்புக்குரிய தலைவரான ரோஹண விஜேவீர அவர்கள் அந்த வழக்கில் வெற்றிபெறக்கூடிய வாய்ப்பு இருப்பதாக. அவர் தாக்கல் செய்த வழக்கானது, 1983ஆம் ஆண்டு நடைபெறவேண்டிய பொதுத் தேர்தல் சம்பந்தமானது. அந்தத் தேர்தலுக்குப் பதிலாகத்தான் சர்வஜன வாக்கெடுப்பு நடைபெற்றது. அவர் அந்த வழக்கில் வென்றிருந்தால், ஜனநாயக ரீதியான தேர்தல் நடத்தப்பட்டு இருக்கும். அந்தத் தேர்தலில், எங்களுடைய ரோஹண விஜேவீரவுக்கு சனாதிபதித் தேர்தலில் கிடைத்த 273,000 வாக்குகள் எங்களுக்குக் கிடைத்திருந்தாலும்கூட, எங்களுடைய கட்சியைச் சேர்ந்த 6-9 பேர் பாராளுமன்றத்துக்குத் தெரிவுசெய்யப்பட்டு இருப்பார்கள். அப்படி அவர்கள் பாராளுமன்றத்துக்குத் தெரிவாகி இருந்தால், அன்று ஜே.ஆர். ஜயவர்த்தன அவர்களால் முன்னெடுக்கப்பட்ட இனவாத, மதவாத, ஜனநாயக விரோத செயற்பாடுகளுக்கும் மக்களைக் கொள்ளையடிக்கின்ற திறந்த பொருளாதாரத்துக்கும் பாரிய பிரச்சினைகள் ஏற்பட்டிருக்கும்.

1983ஆம் ஆண்டு யூலை மாதத்தில் இனக் கலவரத்தை ஏற்படுத்திவிட்டு, அதனூடாக எங்களுடைய கட்சியைத் தடை செய்தார்கள். அன்றைய காலகட்டத்தில் ஐக்கிய தேசியக் கட்சியினர் குறிப்பாக, ஜே.ஆர். ஜயவர்தன, சஜித் பிரேமதாஸவின் அப்பாவான ஆர். பிரேமதாஸ, காமினி திசாநாயக்க போன்றவர்கள் இந்த நாட்டிலுள்ள தமிழ் மக்களைப் பூண்டோடு அழிப்பதற்காக நாட்டில் கலவரத்தை ஏற்படுத்தினார்கள். தங்களுக்கு அரசியல் ரீதியாக ஏற்படவிருந்த ஆபத்தை தவிர்த்துக் கொள்வதற்காகவே அன்றைக்கு எங்களுடைய கட்சியான மக்கள் விடுதலை முன்னணியைத் தடைசெய்தார்கள். அன்றைய காலகட்டத்தில் பொதுத் தேர்தல் இடம்பெற வாய்ப்பு இருந்தது. அந்தத் தேர்தல் இடம்பெற்று இருக்குமானால், நிச்சயமாக கறுப்பு யூலை இடம்பெற்றிருக்காது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 'கறுப்பு யூலை' என்பது இந்த நாட்டில் தமிழ் இளைஞர்களை ஆயுதப் போராட்டத்துக்குள் தள்ளுகின்ற பாவித்தனமான நடவடிக்கைகளின் ஒரு குறியீடாகும். அதனால்தான் அதனை 'கறுப்பு யூலை' என்கின்றோம். அன்று ஜே.ஆர். ஜயவர்தன அவர்களுக்கு 5/6 பெரும்பான்மை கிடைத்தது. அதனைப் பயன்படுத்தி இந்த நாட்டில் இருக்கின்ற தமிழ், சிங்கள, முஸ்லிம் மக்களை ஒரு கொடியின்கீழ் கொண்டுவந்து இன ரீதியாகவும் மத ரீதியாகவும் ஒன்றுசேர்ப்பதற்குப் பதிலாக, அவர்களை நாசம் செய்கின்ற பாவித்தனமான நடவடிக்கைகளை எடுத்தவர்கள் வேறுயாருமல்ல, ஐக்கிய தேசியக் கட்சியினராகும். அந்தக் கட்சியைச் சேர்ந்தவர்கள் இன்றைக்கு இன ஐக்கியம் பற்றி பெரிதாகப் பேசுகின்றார்கள். எது எவ்வாறு இருந்தபோதிலும், எமது நாட்டில் எதிர்காலத்தில் கண்ணியமானதொரு சமுதாயத்தை உருவாக்குகின்ற செயற்பாடுகளை முன்னெடுக்கின்ற, தமிழ், சிங்கள, முஸ்லிம் மக்களுக்கு இடையில் ஒற்றுமையைக் கட்டியெழுப்புகின்ற ஓர் அரசாங்கமாகவே எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் இருக்கின்றதெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ வீ.எஸ். இராதாகிருஷ்ணன் அவர்கள்! உங்களுக்கு 5 நிமிடங்கள் உண்டு.

[பி.ப. 2.41]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று யூலை மாதம் 23ஆம் திகதியாகும். இதுபோன்றதொரு நாளிலே 1983ஆம் ஆண்டு கறுப்பு யூலை இனக்கலவரம் நடைபெற்றது. இது இலங்கையின் வரலாற்றில் மாறாத ஒரு வடுவாக இருக்கின்றது என்பது எல்லோருக்கும் தெரிந்த விஷயமாகும். 1983ஆம் ஆண்டு இடம்பெற்ற யூலை கலவரத்தால் நேரடியாகப் பாதிக்கப்பட்டவர்களில் நானும் ஒருவன். அப்போது எனக்கு வயது 30. என்னுடைய அனுபவத்தைச் சொல்வதற்கு இந்தப் பாராளுமன்றம் சந்தர்ப்பத்தை ஏற்படுத்தித் தந்திருக்கின்றதென நான் நினைக்கின்றேன்.

இந்த நாட்டில் தமிழர்களை அழிக்க வேண்டுமென்ற நோக்கத்தில் அன்றைய அரசாங்கம் 1983ஆம் ஆண்டு திட்டமிட்டுச் செயற்பட்டது. தமிழர்கள் பெரும்பாலும்

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

வாழுகின்ற கொழும்பு, கண்டி, நுவரெலியா, பதுளை, யாழ்ப்பாணம், கிளிநொச்சி போன்ற நகரங்களை அழித்து, அங்குள்ள தமிழ் மக்களையும் அழிக்க வேண்டுமென்ற திட்டத்தில் அப்போதைய அரசாங்கம் செயற்பட்டதை எங்களால் அறியக்கூடியதாக இருந்தது. அன்று கொழும்பில் இருந்த பிரபல வர்த்தகர்கள் புலம்பெயர்ந்து இந்தியாவுக்கு அல்லது வேறு நாடுகளுக்குப் போவதற்கான சந்தர்ப்பத்தை இந்தக் கலவரம் உருவாக்கியது. குறிப்பாக, எமது மனித வளம் வெளிநாடுகளுக்குச் செல்வதற்கு இது காரணமாக அமைந்தது. இவ்வாறானதொரு நிலை மீண்டும் ஏற்படக் கூடாது என்பது எங்களுடைய கருத்தாகும். அதனால்தான் இன்று கறுப்பு யூலையை ஞாபகப்படுத்திப் பேசுகின்றார்கள். இந்த நாட்டில் மீண்டும் ஓர் இனக்கலவரம் ஏற்படக் கூடாது. தமிழர்களாக இருந்தால் என்ன, சிங்களவர்களாக இருந்தால் என்ன, முஸ்லிம்களாக இருந்தால் என்ன, நாங்கள் இந்த நாட்டுக்கு விசுவாசமான பிரஜைகள் என்பதை மறந்துவிடக் கூடாது. நடந்தது நடந்துவிட்டது. நடப்பது நல்லதாகவே நடக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

அன்று யூலை கலவரத்தின்மூலம் தமிழ் மக்களை அழிக்க வேண்டுமென திட்டம்போட்டு இருந்தாலும், பெரும்பாலான சிங்கள மக்கள் தமிழ் மக்களைக் காப்பாற்றி இருக்கிறார்கள் என்பதை எங்களால் அறியக்கூடியதாக இருந்தது. அதனை நான் இங்கு சொல்ல விரும்புகின்றேன். தமிழ் மக்களுடைய பிரச்சினை என்ன என்பது அன்றிலிருந்து இன்றுவரை பதவிக்கு வந்த எல்லா அரசாங்கத்துக்கும் தெரியும். பிரச்சினை ஒன்றுதான். அதாவது, இந்த நாட்டில் அதிகாரப் பரவலாக்கல் இருக்க வேண்டும் என்பதுதான். தமிழர்களுக்கும் ஆள்வதற்கு உரிமை கொடுக்க வேண்டும். அவர்கள் இந்த நாட்டை ஆள்வதற்கான அதிகாரத்தைக் கேட்கவில்லை. தங்களுடைய மாகாணத்தை அல்லது தாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற பிரதேசங்களை ஆள்வதற்கான சந்தர்ப்பத்தைக் கொடுக்க வேண்டுமென்பது அவர்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது. ஆனால், அது அன்று முதல் இன்று வரை நடைமுறையில் இல்லை என்பதுதான் உண்மை! இந்த நடைமுறையைக் கொண்டுவருவதற்காகத்தான் அன்று மாகாண சபை முறைமையை அறிமுகப்படுத்தினார்கள். மாகாண சபை முறைமையை அன்று முழுக்க முழுக்க எதிர்த்தது, JVP என்பதை நான் இங்கு ஞாபகப்படுத்த வேண்டும். ஒழுங்கான வரன்முறைகளைப் பின்பற்றி மாகாண சபை முறைமை ஊடாக அவர்களுக்கு அதிகாரப் பரவலாக்கலைக் கொடுத்திருந்தால், இந்த நாட்டில் ஏனைய சமூகங்களுடனான நல்லுறவை இன்னும் பேணுவதற்குச் சந்தர்ப்பம் கிடைத்திருக்கும்.

மாகாண சபை முறைமையை மையப்படுத்தி அன்று நாட்டில் பிரச்சினைகள் ஏற்பட்டன; ராஜீவ்காந்தி அவர்கள் இலங்கைக்கு வந்தபோது சிப்பாய் ஒருவரால் தாக்கப்பட்டார். அதற்குப் பிறகு, ராஜீவ்காந்தி அவர்கள் இந்தியாவில் கொலை செய்யப்பட்டார். இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் பல்வேறு பிரச்சினைகள் உருவாக்கப்பட்டன. அன்று இந்திய எதிர்ப்பு அதிகமாக இருந்தது. அந்த எதிர்ப்பை உருவாக்கிய JVPஇனரும் இந்திய அரசாங்கமும் இன்று நட்புடன் இருக்கின்றார்கள். இது வரவேற்கக்கூடிய ஒரு விஷயம். இன்று நீங்கள் உரிமை பாராட்டுகிறீர்கள்; நட்பு பாராட்டுகிறீர்கள். இந்த நட்பு தொடர வேண்டும். அந்த அரசாங்கம்தான் செய்தது, இந்த அரசாங்கம்தான் செய்தது என்று நடந்தவற்றைச் சொல்லிக்காட்டாமல், எங்களுடைய கௌரவ சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்த நாட்டுக்கு நல்லதைச் செய்ய வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றும் மலையகத்தில் தினமும் கறுப்பு யூலை போன்றுதான் இருக்கின்றது. கடந்த வாரம்கூட, ஹாலிஎல பகுதியில் superintendent ஒருவர், இளைஞர் ஒருவரைத் தாக்கி காயம் ஏற்படுத்தியிருக்கிறார். இது உங்களுக்கும் தெரியும். இப்படி தினம் தினம் நடக்கும் நிகழ்வுகளையும் உள்ளடக்கி, தோட்டத் தொழிலாளர்களின் பிரச்சினைகளையும் தமிழர்களின் பிரச்சினைகளையும் தீர்ப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் உங்களைக் கேட்டுக் கொள்கின்றேன். உண்மையிலேயே இந்த அரசாங்கத்தில் மதிக்கத்தக்க ஓர் அமைச்சராக கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் இருக்கின்றார். I like him. நான் உண்மையிலேயே அவரை விரும்புகின்றேன். ஏனெனில், நாங்கள் அவரிடம் ஒரு பிரச்சினையைச் சொன்னால், அதனைக் கேட்டு, அதற்குரிய பதிலைச் சொல்லி, அதனை நல்ல முறையில் தீர்ப்பதற்கு நடவடிக்கை எடுப்பார். எனவே, மேற்குறித்த விடயங்கள் தொடர்பிலும் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். அண்ணன் சந்திரசேகர் அவர்கள் இங்கே இருக்கின்றார். நானும் நீங்களும் அந்தக் காலத்தில் ஒரே நகரத்தில் இருந்திருக்கிறோம். அன்று நுவரெலியாவில் 16 பேரை ஒரே நேரத்தில் கொளுத்தினார்கள். 'கம்பிக்காரர்கள்' என்று சொல்லப்படுகின்ற அவர்கள் உங்களுடைய சொந்தக்காரர் என்று நினைக்கின்றேன். இதனை நான் இந்த நேரத்தில் ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

இவ்வாறான செயல்கள் இனியும் இலங்கையில் நடக்கக் கூடாது. இன்று நாங்கள் ஓரளவு துணிந்து போகின்றோம்; வருகின்றோம். இனப் பிரச்சினைக்கு ஒரு முடிவு காண வேண்டும். இனப் பிரச்சினைக்கு முடிவு காண்பதற்குரிய ஒரேயொரு சக்தியாக இன்று இருப்பது NPP அரசாங்கம்தான். NPP அரசாங்கமானது இந்த விடயத்தைக் கையிலெடுத்து, நடைமுறையில் செய்துகாட்ட வேண்டும். பேச்சளவில் மாத்திரம் இருக்காது நடைமுறையில் செய்து காட்டுவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டு விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1983 ජූලි මාසයේ ඒ අඳුරු දිනයෙහි සේයාවන් සහ ඒ දිනයේ තිබුණු අඳෝනාවන්ගේ දෝංකාරය තවම අපට ඇසෙමින් පවතිනවා කියන එක තමයි මගේ අදහස. ඒ තිරශ්චීන සිදු වීමෙන් පසුව අපිට ඉතුරු වුණේ 1983 වර්ෂයට කලින් තිබුණු රට නොවෙයි. එතැනින් පසුව විශාල බෙදුම්වාචකයක් එක්ක ඉස්සරහට යන්න වුණු රටක් තමයි අපට ඉතුරු වුණේ.

උතුරේ වෙම්මනි මිනී වළෙන් මතු වන ඇට සැකිලිවල වගකීම 1983 ජූලි මාසයේ ඒ ජාතිවාදී තිරශ්චීන සිදුවීමට අනුබල දීපු ඒ දේශපාලන නායකයන් භාර ගන්න ඕනෑ. මොකද, පසුගිය දශක කිහිපය පුරාවටම මේ රට තුළින් හමු වුණු සමූහ මිනී වළවල්වලින් ගොඩ ගත් ඒ සියලු ඇට සැකිලිවල වගකීම 1983 වර්ෂයේදී ඉතාම

නින්දිත විධියට මේ රටේ මිනිස්සු කොටවා ඒ විනාශය ඇති කරවපු ජාතිවාදීන් භාර ගන්න ඕනෑ. ජේ.ආර්. ජයවර්ධන ඇතුළු එවකට එම කෝලාහලයට, එහෙම නැත්නම් එම තිරශ්චීන සිදුවීමට, අනුබල දීපු අය ඒ වගකීම භාර ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සිනමාකරුවෙක්. අපේ රටේ පළමුවැනි චිත්‍රපටය වන්නේ කඩවුණු පොරොන්දුව නම් චිත්‍රපටයයි. 1947 වර්ෂයේදී එම චිත්‍රපටය නිර්මාණය කළේ ඉන්දියානු -දමිළ- ජාතිකයෙක්. 1962 වර්ෂයේදී ලංකාවේ පළමුවැනි දමිළ චිත්‍රපටය නිර්මාණය කළා. ඒ, සිංහල ජාතිකයෙක්. ඔහු හෙන්රි චන්ද්‍රවංස. 1962 වර්ෂයේදී මේ රටේ ආරම්භ වුණු දමිළ සිනමාව තුළ 1982 වර්ෂය වනකොට දමිළ චිත්‍රපට -සිනමා කෘති- 27ක් පමණ නිර්මාණය කර තිබුණා. ඒ අවුරුදු 20ක් පුරාවට ලංකාව තුළ දමිළ චිත්‍රපට 27ක් පමණ නිර්මාණය වුණා. එම චිත්‍රපටවලට ලංකාවේ සිංහල කලාකරුවන්, දමිළ කලාකරුවන් කියන සියලු දෙනා සම්බන්ධ වුණා. නමුත් 1983 වර්ෂයෙන් පසුව 1992 වර්ෂය වෙනකම් අවුරුදු දහයක පමණ කාලය ඇතුළත හැදුණේ එකම එක දමිළ චිත්‍රපටයයි.

විශේෂයෙන්ම ලංකාවේ සිනමා කර්මාන්තය රැඳී තිබුණේ ලංකාවේ සිටි දමිළ ව්‍යාපාරිකයන් අතේයි. ඔවුන් සතුව තමයි ලංකාවේ සිනමා ශාලා බොහෝ ප්‍රමාණයක් තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබ දන්නවා ඇති, 1983 වර්ෂයේදී ඒ ඇති වුණු සිදුවීමත් එක්ක ලංකාවේ සිනමා ශාලා විශාල ප්‍රමාණයක් ගිනි තැබූ බව. විශේෂයෙන්ම චිත්‍රාගාර දෙකක් ගිනි තැබුවා. හැඳල ප්‍රදේශයේ තිබුණු විජය චිත්‍රාගාරය ගිනි තැබුවා. එම චිත්‍රාගාරයේ තිබුණා ඉතා වටිනා සිංහල චිත්‍රපටවලට අදාළ සේයා පට. එම චිත්‍රාගාරය ගිනි තබන්න හේතුව වුණේ එහි හිමිකරු දමිළ ජාතිකයෙක් වීමයි. ඒ නිසා එදා ඒ ජාතිවාදීන් ගිහින් එම චිත්‍රාගාරය ගිනි තැබුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, මරදානේ ගාමිණී සිනමා ශාලාව ගිනි තැබුවා. වැල්ලවත්තේ සැෆායර් සිනමා ශාලාව ගිනි තැබුවා. කොම්පඤ්ඤ වීදියේ රියෝ සිනමා ශාලාව ගිනි තැබුවා. අදටත් ගියොත් බලන්න පුළුවන්, තවම ඒ අඟුරු තිබෙන බව. එම ව්‍යාපාරිකයා එතැනින් පසුව ඒ හෝටල් සංකීර්ණය හැදුවේ නැහැ. සිනමා ශාලාව පමණක් අලුත්වැඩියා කර පවත්වා ගෙන යනවා, සිනමාවට තිබෙන ආදරය නිසා. නමුත් ඒ හෝටල් සංකීර්ණයේ ගොඩනැඟිලි අත ගාලා බැලුවොත් බලා ගන්න පුළුවන්, එදා ගිනි ගත් උළුවහු තවම තිබෙන බව. ඒ බව කෙනෙකුට ගිහිල්ලා බලන්න වුණත් පුළුවන්. කොම්පඤ්ඤ වීදියේ තිබෙන රියෝ සිනමා ශාලාව ගැනයි මම ඒ කිව්වේ. ඒ වාගේම දෙහිවල ට්‍රිසෝ සිනමා ශාලාව, මීගමුවේ රාජ් සිනමා ශාලාව, මාතලේ කැසිනෝ සිනමා ශාලාව, කඳපොළ රාධා සිනමා ශාලාව, බදුල්ලේ ලිබර්ටි සිනමා ශාලාව, මොඩර්න් බදුල්ල, මොඩර්න් බණ්ඩාරවෙල, කොටහේන යනාදී මේ සියලු සිනමා ශාලා 1983 වර්ෂයේදී ගිනි තැබුවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාපනය ප්‍රදේශයේ සිනමා ශාලා දහයකට ආසන්න ප්‍රමාණයක් 1983 වසරේදී ගිනි තබා ඇති බව අපිට ලැබුණු තොරතුරුවලින් අපි දැන ගත්තා. ඒ වාගේම නැඟෙනහිර පළාතේ සිනමා ශාලා 75ක් පමණ ගිනි තබා තිබෙන බවත් අපට තොරතුරුවලින් හොයා ගන්න පුළුවන්කම ලැබුණා.

1970 දශකය කියන්නේ සිංහල සිනමාවේ ස්වර්ණමය යුගය කියලා තමයි අපි සලකන්නේ. එසේ තිබුණු සිනමා ක්ෂේත්‍රය කඩා වැටුණු හේතුව අපට දැන් හඳුනා ගන්න පුළුවන්. ලංකාවේ කලාවට, සිනමාවට ආදරය කරන සියලු දෙනා මතක තබා ගත යුතුයි, 1983 වසරේදී වුණු එම සිදුවීම මේ රටේ ජාතිවාදී කෝලාහලයක් ඇති කරවා, අවුරුදු 30ක් ඇදුණු යුද්ධයකට පාර කැපුවා විතරක් නොවෙයි, මේ රටේ මිනිස්සුන්ගේ සංස්කෘතික ජීවිතය කඩා වට්ටන්නත්, හිරි වැටුණු සමාජයක් බිහි කරන්නත් පාදක වුණු සිදුවීමක් බව.

ඒ විතරක් නොවෙයි, මතක තියාගන්න ලංකාවේ "සිරි පතුල" චිත්‍රපටය හදපු කේ. වෙන්කට් කියන සිනමාකරුවා ඝාතනය කරලා ඔහුගේම වාහනයට දමලා පිච්චුවා. එය ඇසින් දුටු සාක්ෂිකරුවෙක් මේ සභාවේ ඉන්නවා. ඒ වෙන කවුරුවත් නොවෙයි, මේ දසවන පාර්ලිමේන්තුවේ අධිකරණ ඇමති ධුරය දරන අපේ හර්ෂණ නානායක්කාර මැතිතුමා. එතුමාගේ ගෙදර ඉඳන් තමයි එදා කේ. වෙන්කට් මහත්මයා එළියට බැහැලා ගෙදර යන්න ගියේ. ඒ වෙලාවේ යසපාලිත නානායක්කාර - ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමාගේ පියාණන් - කිව්වා, "වෙන්කට්, අද එළියට බැහැලා යන්න එපා. එළියේ කලබල" කියලා. ඒ වෙලාවේ කේ. වෙන්කට් කිව්වේ මොකක්ද? "මම සිරිපතුල චිත්‍රපටය හදපු මනුස්සයා. 'මිනිසාමයි ලොව දෙවියන් වන්නේ' කියන ගීතය තිබෙන්නේ මගේ චිත්‍රපටයේ. සිංහල මිනිස්සු මට මොකුත් කරන එකක් නැහැ. ඒ හින්දා මට යන්න දෙන්න" කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ආමන්ත්‍රණයෙන් කියනවා නම් එදා එළියට බැහැලා ගිය වෙන්කට් අංකල් නැවත ගෙදර ගියේ නැහැ. ඔහුව ඝාතනය කළා.

මේ ආකාරයෙන් ඉතිහාසයට කළු පැල්ලම් රාශියක් එකතු කරපු මේ සිදුවීමේ වගකීම දැරිය යුතු ඒ පක්ෂය නියෝජනය කරන, ඒ පක්ෂයෙන් කැඩිලා ආපු, වෙන වෙන නම්වලින් ඉන්න බහුතරයක් දෙනා අද මේ පාර්ලිමේන්තුවේදී ඒ ඉතිහාසය විකෘති කරන්න හදනවා. අපට අවශ්‍ය නැහැ ඒ ඉතිහාසය කර තියාගෙන ඉස්සරහට යන්න; ඒ තුවාල තව තවත් පාරන්න; එහෙම නැත්නම් ඒ තුවාලවල වේදනාව මතින් දේශපාලනය කරන්න. අපට අවශ්‍යයි, මේක ඉවරයක් වෙනවා දකින්න. අපට අවශ්‍යයි, මේ රට ශ්‍රී ලාංකික ජාතියක් විධියට ඉස්සරහට යනවා දකින්න. ඒ විතරක් නොවෙයි, අනාගතයේදී ජාතිවාදය මුලිනුපුටා දමපු - අතුගා දමපු - සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනාට එක්ව, සමානව ජීවත් වෙන්න පුළුවන් රටක් ගොඩනඟන්න අපට අවශ්‍යයි. ඒකට අවශ්‍ය පළමු පියවර ජාතික ජන බලවේගය විධියට අපි තියලා තිබෙනවා. අපි සියලුදෙනා එකතු වෙලා මේ රටේ සාමකාමීව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදන්න, සියලු දෙනාට එක්ව ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදන්න කැප වෙලා වැඩ කරමු කියන ඉල්ලීම සහිතව මගේ වචන ස්වල්පය අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ எம். நிசாம் காரியப்பர் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் உண்டு.

[3.54 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Presiding Member, I think the Government has opened the wrong cupboard, the cupboard full of the skeleton of "Black July". You open that cupboard and you get that skeleton, which was the result of what happened, first, on the 07th of July, 1956. වැරදි cupboard එකක් තමයි මේගොල්ලන් ඇරගත්තේ. මම හිතන විධියට මෙය පටන් ගන්නේ 1956දී වෙන්න ඕනෑ. "සිංහල පමණයි" කියන කාරණය සම්බන්ධයෙන් වන පනත බණ්ඩාරනායක මහතා පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒ තමයි, පළමුවැනි කළු ජූලිය.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

1956ஆம் ஆண்டு யூலை மாதம் 07ஆம் திகதி சிங்களம் மட்டும் அரச கரும மொழியாகப் பிரகடனப்படுத்தப்பட்டது. அதுதான் முதலாவது கறுப்பு யூலை. அதற்குக் காரணம், பண்டாரநாயக்க அவர்கள். The next "Black July" happened on the 23rd of July, 1983. இரண்டாவது, கறுப்பு யூலை!

දෙවන කළු ජූලිය තමයි ඔයගොල්ලන් දැන් අල්ලගෙන දඟලන ජූලි 23 දින ඇති වුණේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා තමයි ඒකට වගකියන්න ඕනෑ. ඒක එතැනින් ඉවර වුණේ නැහැ. අනෙක් ජූලිය කියන්නද? තරහා වෙන්න එපා. 1987 ජූලි 29 මතකද? දෙමළ ජනතාවට අවම සහනය දීපු අර පළාත් සභා පිළිබඳ කාරණයට විරුද්ධව වෙලා, ලංකාවට ආපු රජීව් ගාන්ධිට ගහපු දවස මතකද? මතක නැද්ද? ඒකේ නායකයා රෝහණ විජේවීර.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பிழையான யூலையைத் தொடங்கிவிட்டார்கள். எவ்வளவு தைரியம் இருந்தால் இவர்கள் இதனைச் செய்ய முடியும்? முதலாவது கறுப்பு யூலையான, 1956 யூலை 07இல் நடைபெற்றதை பண்டாரநாயக்க பொறுப்பெடுக்க வேண்டும். இரண்டாவது கறுப்பு யூலையான, 1983 யூலை 23இல் நடைபெற்றதை ஜே.ஆர். ஜயவர்தன பொறுப்பெடுக்க வேண்டும். மூன்றாவது கறுப்பு யூலையான, 1987 யூலை 29இல் நடைபெற்றதை ரோஹண விஜேவீர பொறுப்பெடுக்க வேண்டும். பழையதை விட்டுவிடுவோம். பரவாயில்லை! புதிதாக ஆரம்பிப்போம். පැරණි ඒවා අමතක කරමු. ඔක්කෝම අයගෙන් වැරදි සිදු වෙනවා. කමක් නැහැ. අලුත් පරිච්ඡේදයක් පටන් ගනිමු.

நான் ஆரம்பத்திலிருந்து சொல்லி வருகின்ற விடயமான "இலங்கையர்" என்ற அடையாளத்தை அதாவது, நாங்கள் இலங்கை மக்கள் என்ற அடையாளத்தைப் பெற்றுத் தருவீர்களென தமிழ் பேசும் மக்களான தமிழ், முஸ்லிம் மக்கள் உங்களை நம்பினார்கள். நான் இல்லையென்று சொல்ல வில்லை. இது தொடர்பில் உங்களுடைய Manifestoஇலும் சொல்லியிருந்தீர்கள். இதனை கௌரவ அஜித் பீ. பெரேரா அவர்கள் மிக அழகாகச் சுட்டிக்காட்டினார். "சமத்துவப் பிரஜை மற்றும் பாகுபாட்டுக்கு எதிரான நடவடிக்கை" என்பது உங்களுடைய Manifestoஇலுள்ள விடயம். அடுத்து, தேசிய மொழிக் கொள்கை! அதில் பிரச்சினை இல்லை. அது ஏற்கெனவே நடந்துகொண்டு இருக்கிறது. மலையகத் தமிழர் பற்றியும் நான் சொல்ல வரவில்லை.

அடுத்து, அதிகாரப் பகிர்வு மற்றும் புதிய அரசியலமைப்பு என்ற விடயத்துக்கு வருகின்றேன். எங்கே உங்களுடைய புதிய அரசியலமைப்பு? எங்கே உங்களுடைய அதிகாரப் பரவலாக்கல்? மனசாட்சியைத் தொட்டுச் சொல்லுங்கள் பார்ப்போம்! அடிபட்ட தமிழ் பேசும் சமூகத்தினர், அதிலும் முக்கியமாக தமிழர்கள் தங்களுடைய உயிர்களைத் தியாகம் செய்து பெற்றுக்கொண்ட ஆறுதல் பரிசுதான் மாகாண சபை! ஆறுதல் பரிசு என்பதைவிட, இழப்பீடு என்று சொல்லாம். The bare minimum reparation is the bare minimum Provincial Council.

அதனைக்கூட நீங்கள் வழங்காமல் இருக்கிறீர்கள். உங்களுக்கு வெட்கமில்லையா? அது பற்றி கேட்டால், குழுக்களை நியமித்து, மாகாண சபைத் தேர்தலை நடாத்தாமல் இருப்பதற்கான வழிகளைத் தேடுகின்றீர்கள். வெட்கமாக இருக்கின்றது. எல்லாவற்றையும் விட்டுவிட்டு, தமிழ் பேசு கின்ற மக்களுக்கு நடந்த இந்த அநியாயத்தைப் பற்றி நீங்கள் பேசுகின்றீர்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் மாத்திரமே உண்டு.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ஒரு விடயத்தை மாத்திரம் சொல்லி முடித்துக் கொள்கின்றேன்.

அன்று யூலை 23. அப்பொழுது நான் இலங்கை சட்டக் கல்லூரியில் முதல் வருட மாணவனாக இருந்தேன். அப்போது நான் தெஹிவளையில் தங்கியிருந்தேன். என்னுடைய roomக்குச் செல்லும்போது சரணங்கர வீதியில் மலையகத்தைச் சேர்ந்த ஒரு தமிழ் மகன் நிர்வாணமாக்கப்பட்டு தாக்கப் பட்டார். அது நான் கண்கண்ட கொடூரமான காட்சி! தான் ஏன் அடிபடுகிறேன் என்று அவருக்குத் தெரியாது. அவருக்குச் சரியாகச் சிங்களம் கதைக்க முடியாது. Police guardக்கு முன்னால் அழுதார். அப்படியே தூக்கி எறிந்து உயிரோடு பற்ற வைத்தார்கள். கடந்த காலத்தை மறந்து விடாதீர்கள். அன்று கறுப்பு யூலையைக் காரணமானவைத்து ரோஹண விஜேவீரவும் JVPயும் ban பண்ணப்பட்டதை இன்று நீங்கள் மறந்து விட்டீர்கள். அதற்கான பதிலை நீங்கள் சொல்ல வேண்டுமென கேட்டுக் கொள்கின்றேன். தயவுசெய்து, பழையதை மறந்து விடுங்கள்! அவற்றை மீண்டும் கிளற வேண்டாம். அதை மீண்டும் மீண்டும் பேசி அரசியல் இலாபம் தேடுவதற்குத் தயாராக வேண்டாம்.

இந்த NPP அரசாங்கம் தமிழ் பேசும் தமிழ், முஸ்லிம், மலையக மக்களுக்கு நியாயத்தைப் பெற்றுக்கொடுக்குமெனச் சொல்கின்றவர்கள், இன்னும் JVPஇன் கொள்கையை வைத்துக்கொண்டு "அதிகாரப் பரவலாக்கல் ஊடாக நியாயத்தைப் பெற்றுக்கொடுக்க முடியாது, சமத்துவம் மட்டும் போதும்" என்று இங்கே சொல்வது பிழை! உங்களுடைய மனசாட்சிக்குத் தெரியும், தமிழ் பேசும் தமிழ், முஸ்லிம், மலையக மக்களுக்கு அரசியல் ரீதியாக அதிகாரங்களைக் கொடுப்பதற்கு நீங்கள் தயாரில்லை என்பது. அதுதான் உண்மை! தயவுசெய்து, கறுப்பு யூலை பற்றி பேசுவதற்கு முன்பு, நீங்கள் தமிழ் பேசும் தமிழ், முஸ்லிம், மலையக மக்களுக்கு அரசியல் அதிகாரங்களை வழங்கத் தயாரா? என்பதை உங்களுடைய மனசாட்சியைத் தொட்டுக் கேளுங்களெனக் கேட்டு, என்னுடைய உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ கந்தசாமி பிரபு அவர்கள்! உங்களுக்கு 06 நிமிடங்கள் உண்டு. *[சபையில் சமுகமாயில்லை.]*

அடுத்து, கௌரவ பிரதி அமைச்சர் முனீர் முலாபர் அவர்கள்! உங்களுக்கு 07 நிமிடங்கள் உண்டு.

[අ.භා. 4.01]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

විශේෂයෙන් මේ ගරු සභාව තුළ අද අපි කළු ජූලිය පිළිබඳව කථා කරනවා. අපි ඇයි අද ඒ ගැන කථා කරන්නේ? මා හිතන විධියට, ශ්‍රී ලාංකිකයන් වන අප හැම කෙනාගේම ප්‍රාර්ථනාව, බලාපොරොත්තුව නැවතත් එවැනි තත්ත්වයක් අපේ රට තුළ ඇති නොවේවි කියන එකයි. මන්ද, මේ සභාව තුළ අදහස් දක්වපු සියලු දෙනා ඇතුළු අපි හැම කෙනාම දන්නවා එහි පැවැති කෲරත්වය, ම්ලේච්ඡත්වය සහ ඒ තුළ තිබුණු වේදනාකාරී බව. අපේ කථිකයෝ එය ඉතාම හොඳින් පැහැදිලි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද මේ ගැන කථා කරන්න මූලිකම හේතුව මොකක්ද? එය එතරම් ම්ලේච්ඡත්වයක්, එතරම් කෲරත්වයක් සහිත සිදුවීමක් බව දැන දැනත් විපක්ෂයේ ඉන්න සමහර උදවිය මීට දින කිහිපයකට පෙර පවා පාර්ලිමේන්තුවේදී කටයුතු කළ ආකාරය අපි දැක්කා. නීති විරෝධී ක්‍රියාවක් කරපු කෙනෙකු අත්අඩංගුවට ගත්තාම, ඒ අ අඩංගුවට ගැනීම පවා ඒ අය ජාතිවාදයට හෝ ආගම්වාදයට ලඝු කරන්නයි හදන්නේ. ඒ සිදුවීම පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම තුළ අපට පෙනෙන්නේ, ඔවුන් තවමත් ඒ අතීතයෙන් පාඩම් ඉගෙන ගෙන නැති බවයි.

මේ ගරු සභාව තුළ විපක්ෂයේ එක්තරා මන්ත්‍රීවරයෙක් කථා කරමින්, "අපේ යහ පාලන ආණ්ඩුව සමයේ මුස්ලිම් ඇමතිවරු 4 දෙනෙක් හිටියා, ද්‍රවිඩ ඇමතිවරු කිහිප දෙනෙක්ම හිටියා" කියන කාරණය මතක් කර දුන්නා. හැබැයි, තමන් නියෝජනය කරන ආණ්ඩුව තුළ ඒ ඒ ජනවාර්ගිකයන් නියෝජනය කරන ඇමතිවරුන් කොච්චර ප්‍රමාණයක් ඉන්නවාද කියන එක නොවෙයි ගැටලුව. එදා මුස්ලිම් ඇමතිවරු එතරම් විශාල පිරිසක් ඒ අමාත්‍ය මණ්ඩලය තුළ සිටියත්, අපි හැම කෙනාම දන්නවා, අපේ හෘදය සාක්ෂිය දන්නවා පාස්කු ඉරුදින ප්‍රහාරය එල්ල වුණු අවස්ථාවේ මොකක්ද වුණේ කියලා. ඒ සිදුවීමත් එක්ක ඒ සියලු මුස්ලිම් ඇමතිවරුන්ට එදා ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණා. ඒ වෙලාවේ ඔවුන් වෙනුවෙන් කථා කරන්නවත්, ඔවුන් ආරක්ෂා කරන්නවත්, "ඔබතුමන්ලා ඒ තීන්දුව ගන්නේ නැතිව ඉන්න" කියන්නවත් ඒ කිසිම කෙනෙකුට ඒ අවස්ථාවේදී හැකි වුණේ නැහැ. විශේෂයෙන් එය මේ සමාජය තුළ දැවැන්ත පණිවුඩයක් බවට ද පත් වුණා කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1983 කළු ජූලි කෝලාහල තත්ත්වය තුළ එදා අපේ ආදරණීය සහෝදර දෙමළ ජනතාව කොතරම් පීඩාවට පත් වෙන්නට ඇත්ද කියන එක, 2019 පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව මුස්ලිම් සමාජය ලෙස අපි අත් දුටු කාරණාවලින් අපට හොඳින් හැඟී ගියා. එය කොතරම් පීඩාවක්ද, කොතරම් වද දීමක්ද? අදත් සමහරු -ආගමික නායකයන් යැයි කියා ගන්නා සමහර පිරිස් - ඇවිල්ලා අභූත, වැරැදි, පට්ට වැරැදි චෝදනා අපට නඟන කොටත් අප ඒවා නිහඬව අසා සිටින්නේ හැම විටම සාමය, සහෝදරත්වය බැඳුණු රටක් මිස බෙදුණු, විසිරිලා ගිය රටක් අපට අවශ්‍ය නොවන නිසායි. ආගම්වාදය හෝ ජාතිවාදය මේ රටට කිසිසේත් විසඳුමක් නොවන වග ඉතාම පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඇත්තටම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, අපි හැම කෙනාම - බොහෝ දුරට අපේ තරුණ ප්‍රජාවත්, පාපන්දු ක්‍රීඩාවට උනන්දුව දක්වන හැම දෙනාත් - පාපන්දු ලෝක කුසලානය දෙස බලා සිටියා; එහි තරග දෙස බලා සිටියා. හැබැයි, ඒ තරගාවලිය තුළ ස්පාඤ්ඤය නියෝජනය කරපු ලැමීන් යමාල් කියන 19වන වියේ පසු වන ක්‍රීඩකයා ලෝකයට හරි ලස්සන පණිවුඩයක් ලබා දුන්නා. ඒ පණිවුඩය මොකක්ද? ස්පාඤ්ඤයේ හිටපු අගමැතිවරයා ප්‍රංශ පාපන්දු කණ්ඩායම පිළිබඳව එක්තරා විවේචනයක් ඉදිරිපත් කළා; එක්තරා අදහසක් ප්‍රකාශ කළා. අප හැම කෙනාම දන්නා පරිදි ඒ ප්‍රකාශය තමයි, "ප්‍රංශ කණ්ඩායමේ ප්‍රංශ ක්‍රීඩකයන් නැහැ" කියන විවේචනය. එවිට 19වන වියේ පසු වන - භද්‍ර යෞවනයේ සිටින - ලැමීන් යමාල් කියන තරුණයා අප හැම කෙනාටම ලස්සන පණිවුඩයක් ලබා දුන්නා. රටක් ලෙසත්, ජාතියක් ලෙසත්, ශ්‍රී ලාංකිකයන් ලෙසත් ඒ පණිවුඩය අපට වැදගත් කියලා මම විශ්වාස කරනවා. ඒ පණිවුඩය තුළ තිබුණු වැදගත්ම කාරණාව තමයි, 'පාපන්දු ක්‍රීඩාවේ ප්‍රධාන අරමුණ මිනිසුන් එකට ගෙන ඒම සහ සමාජ එකමුතුවයි' කියන එක. තමා කරන පාපන්දු ක්‍රීඩාවේ ප්‍රධාන අරමුණ සමාජ එකමුතුවයි කියා එම ක්‍රීඩකයා සඳහන් කළා. ඔහු කථාව එතැනින් නතර කළේ නැහැ. ඔහු තවත් වැදගත් පණිවුඩයක් අපට ලබා දුන්නා. ඒ පණිවුඩය මොකක්ද? ඔහු කියනවා, "ඒ සඳහා ප්‍රංශයත්, ස්පාඤ්ඤයත් හොඳම උදාහරණ දෙකක්. අපි සියලුදෙනා එකට ජීවත් වෙන සමාජයක නියෝජිතයෝ" කියලා. ජාතික ජන බලවේගයේ අපි ශ්‍රී ලාංකික ජාතිය ගොඩනැඟීම තුළින් බලාපොරොත්තු වන්නේද එයයි. 'අපි හැමදෙනාම එකට ජීවත් වෙන සමාජයක නියෝජිතයෝ' කියන පණිවුඩය රටට ලබා දෙන්න අපට පුළුවන්.

මීට පෙරත් මෙහිදී මතක් කළා වාගේම, ජේ.ආර්. ජයවර්ධනට හයෙන් පහක ජයග්‍රහණයක් ලැබුණත්, ඔහුට දිනා ගන්න බැරි වුණා, උතුර, නැඟෙනහිර වාගේම කඳුකරයත්. හැබැයි, අපි දන්නවා, නිදහසින් පසුව ජාතික ජන බලවේගයේ අපට මේ රටේ සියලුදෙනාම ජයග්‍රහණය කරන්න පුළුවන් වූ බව. ජනවාර්ගිකයන්, ආගමිකයන් වෙනත් නම්වලින් සඳහන් කළත් ඒ සියලුදෙනාගේ ආශීර්වාදය, ආදරය දිනා ගන්න අපට පුළුවන් වුණා. අප දිනා ගත්තු ඒ දේවල් රජයක් ලෙස ශක්තිමත්ව පෙරට ගෙන යන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා.

මෙහිදී මට පෙර කථා කරපු විපක්ෂයේ ඇතැම් කථිකයන් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අරගෙන, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු කරුණු පිළිබඳව, මේ රටේ සමගිය හා සාමය ඇති කරන්න ප්‍රතිපත්තියක් ලෙස අප රැගෙන ඒමට බලාපොරොත්තු වෙච්ච කරුණු කාරණා පිළිබඳව මතු කළා. අපට ආඩම්බරයෙන් කියන්න පුළුවන්, අපට අවංකව කියන්න පුළුවන්, ජාතික ජන බලවේගය රජය යටතේ ගෙවුණු මේ අවුරුදු දෙක නිදහසින් පසුව ජාතිවාදී, ආගම්වාදී කෝලාහලවලින් තොරව, සාමයෙන් ගෙවුණු අවුරුදු දෙකක්ය කියන එක. සියලු ප්‍රජාව සමඟ සාකච්ඡා කරන කොට, ඔවුන් බොහෝ විට ඒ බව අපට සඳහන් කරනවා. අපට ඇත්තටම වුවමනා වන්නේ එවැනි රටක්. එකට එකතු වෙලා සමගියෙන්, ආදරයෙන් බැඳිලා ජීවත් වෙන්න පුළුවන් රටක් අපට අත්‍යවශ්‍ය වෙනවා.

අවසාන වශයෙන් තවත් එක පණිවුඩයක් විතරක් සඳහන් කරමින් මගේ කථාව නතර කරන්නම්. එක්තරා අවස්ථාවක නෙල්සන් මැන්ඩෙලා තමන් ආපණ ශාලාවක සිටින විට වෙච්ච සිද්ධියකදී කරපු ප්‍රකාශයක් ගැනයි මා කියන්න යන්නේ. ඒ සිද්ධිය මේකයි. එම ආපණ ශාලාවේ ඈත මේසයක කෙනෙක් වාඩි වෙලා ඉන්නවා. ඔහුව නෙල්සන් මැන්ඩෙලා හිටපු මේසයට රැගෙන ආවාම ඔහු වෙවුලන්න පටන් ගන්නවා. නෙල්සන් මැන්ඩෙලාගේ ආරක්ෂකයෝ නෙල්සන් මැන්ඩෙලාට කියනවා,

[ගරු මුනීර් මුලාෆර් මහතා]

ඔහු යම් අසනීප තත්ත්වයකින් පසු වෙනවා කියලා. හැබැයි, එහිදී නෙල්සන් මැන්ඩෙලා ලබා දුන් උත්තරය මොකක්ද? ඒ උත්තරය තුළින් දෙන පණිවුඩය ජාති, කුල භේදයකින් තොරව, පක්ෂ භේදයකින් තොරව, ශ්‍රී ලාංකිකයන් ලෙස අප හැම කෙනාටම හරිම වැදගත් කියලා මම විශ්වාස කරනවා. "නැහැ, ඔහු අසනීපයෙන් නොවෙයි. මම සිරගතව සිටි කාලයේ මට වද දුන් බන්ධනාගාර නිලධාරියෙක්, ඔහු. මම වතුර ඉල්ලූ විට මට පහර දී, මගේ මුහුණට මුත්‍ර කළේ ඔහුයි. අද මම ජනාධිපති. ඔහු සිතුවේ, මම පළි ගනීවි කියලා. නමුත් මම එසේ කළේ නැහැ. පළි ගැනීම විනාශයට ගෙන යයි, සමාව දීම ජාතිය ගොඩනඟයි" කියලා එතුමා කිව්වා. අපි අද මේ මාතෘකාව කථා කරන්නේ පළිගන්නවත්, වෙනත් අරමුණකින්වත් නොවෙයි. අපට අවශ්‍යයි, ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟන්න. වෛරයෙන් වෛරය නොසන්සිඳේ; අවෛරයෙන් වෛරය සන්සිඳේ. එම නිසා වෛරයෙන් තොර වෙච්ච අවෛරයෙන් පිරිච්ච සමාජයක් අපට අවශ්‍යයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ அமிர்தநாதன் அடைக்கலநாதன் அவர்கள்! உங்களுக்கு இரண்டு நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.10]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இந்த நாடாளுமன்றத்தில் கறுப்பு யூலை பற்றி உரையாற்றுவதற்கு தமிழீழ விடுதலை இயக்கத்துக்கு உரித்து இருக்கிறது என்பதைக் கூறிக்கொண்டு, கறுப்பு யூலையின் போது வெலிக்கடை சிறைச்சாலையில் படுகொலை செய்யப்பட்ட தங்கத்துரை அண்ணன், குட்டிமணி அண்ணன், ஜெகன், நடேசதாசன் மற்றும் ஏனையோருக்கும், படுகொலை செய்யப்பட்ட எங்களுடைய பொதுமக்களுக்கும் இந்த உயரிய சபையில் தமிழீழ விடுதலை இயக்கத்தின் சார்பாகவும் ஜனநாயக தமிழ் தேசிய கூட்டமைப்பின் சார்பாகவும் எனது ஆழ்ந்த இரங்கலையும் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்தப் படுகொலைச் சம்பவமானது, இன்றைக்கும் எங்களுடைய மக்களின் மனங்களில் மாறாத வடுவாகவே இருக்கின்றது. இதற்கு கறுப்பு யூலை என்று சொல்வது உண்மையிலேயே மிகவும் பொருத்தமாகத்தான் இருக்கின்றது. 1983ஆம் ஆண்டு முப்படையினரின் துணையோடு அன்றிருந்த அரசாங்கம் நிகழ்த்திய கறுப்பு யூலையானது, இந்த நாட்டின் தேசிய இனங்களில் சிங்கள மக்களைத் தவிர ஏனையவர்கள் இந்த நாட்டில் வாழ அருகதையற்றவர்கள் என்பதைப் பறைசாற்றியது. இதே கறுப்பு யூலையில்தான் எங்களுடைய தமிழ் மக்கள் காருக்குள் அரை உயிருடன் படுகொலை செய்யப்பட்டார்கள். அந்த வகையில், எங்களுடைய தமிழ் மக்கள் யாழ்ப்பாணத்துக்கும் ஏனைய இடங்களுக்கும் அகதிகளாகச் சென்ற மிகவும் துக்ககரமான நாளாக இந்த கரிநாள் விளங்குகின்றது. இந்த விவாதத்தை இச்சபையில் கொண்டுவந்ததற்கு நான் நன்றி சொல்கின்றேன். ஏனெனில், பலருக்கு 1983ஆம் ஆண்டு இடம்பெற்ற கலவரம் சம்பந்தமாக தெளிவில்லாமல் இருக்கின்றது.

நாங்கள் இதில் ஒரு விடயத்தைப் பார்த்தோம். இந்தக் கலவரம் இடம்பெற்ற நேரத்தில், முஸ்லிம் சகோதரர்களும் குறிப்பிட்ட சில சிங்கள சகோதரர்களும் எங்களுடைய தமிழ் மக்களைக் காப்பாற்றிய நிலையைக் கண்டோம். நான் ஒன்றைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். ஊழல் ஒழிப்பு போன்ற விடயங்களில் கவனம் செலுத்துகின்ற இந்த அரசாங்கம், யூலை கலவரத்தின்போது வெலிக்கடை சிறைச்சாலையில் படுகொலை செய்யப்பட்ட எங்களுடைய அமைப்பின் ஸ்தாபகர்களான தங்கத்துரை, குட்டிமணி, ஜெகன் போன்றவர்களின் உடல்கள் எங்கே புதைக்கப்பட்டு இருக்கின்றன என்பதைத் தெரிவிக்க வேண்டும். இந்த யூலை மாதத்திலும் சிறைச்சாலையில் கலவரமொன்று ஏற்பட்டு இருக்கின்றது. அன்று காடையர்களை உள்ளே அனுப்பி படுகொலை செய்தமை தொடர்பில் விசாரணை செய்து நியாயத்தைப் பெற்றுத்தர வேண்டுமென 1983ஆம் ஆண்டு இறந்த மக்களுடைய ஆத்மாக்கள் சார்பாக உங்களிடம் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

தமிழீழ விடுதலை இயக்கத்தைப் பொறுத்தமட்டில், இந்த யூலை 23 என்பது துக்கநாளாக, கரிநாளாக, படுகொலை செய்யப்பட்ட எங்களுடைய மக்களுக்கும் ஸ்தாபகர் களுக்கும் அஞ்சலி செலுத்துகின்ற நாளாக தொடர்ச்சியாக இருந்து வருகின்றது. இறுதியாக, எனக்கு உரையாற்ற வாய்ப்புத் தந்த கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கும் எதிர்க்கட்சிக்கும் எனது நன்றியை தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.14]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමා මූලාසනයේ සිටියදී මේ විවාදයට අදාළව කථා කරන්න ලැබීමත් එක්තරා විධියකට සතුටට කරුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ පක්ෂයක් ලෙස ජාතික ජන බලවේගයත්, සමාජවාදී තරුණ සංගමයත් ඒ තරුණ සංගම්වල ක්‍රියාකාරිත්ව සමඟිනි. මේ ඉදිරිපත් වෙන්නේ ඔවුන්ට අහිමි කරපු අනාගතය පිළිබඳ කරුණු. තමන්ගේ අම්මලා තාත්තලා, අයියලා අක්කලා නැති වෙච්ච තාරුණ්‍යයේ හඬ තමයි මේ යෝජනාව තුළ තිබෙන්නේ. 1980න් පස්සේ ලංකාවේ තරුණයන්ට භාර දෙන්න තිබුණේ "සුන්දර, සාමකාමී, සහෝදරත්වයෙන් පිරි ශ්‍රී ලංකාවක්" කියන බැටන් එක. ඒ බැටන් එක තමයි අලුත් පරම්පරාවට භාර දිය යුතුව තිබුණේ. හැබැයි, ඒ වෙනුවට කළු ජූලිය තුළින් සංකේතාත්මකවත්, ඊට පෙරත්, ඊට පසුවත් සිද්ධ වෙච්ච දේ තමයි, - විශේෂයෙන්ම කළු ජූලියේදී සිද්ධ වෙච්ච දේ තමයි - ඒ සහෝදරත්වය, සාමකාමී බව, සමඟිය පිරිච්ච ලංකාවක් කියන බැටන් එක වෙනුවට, සංකාව, වෛරය පිරිච්ච, තුවක්කුව අතට ගත්ත බැටන් එකක් අපට භාර දීම. ඒක දුන්නේ ජේ.ආර්. ජයවර්ධන. ඒක දුන්නේ, එක්සත් ජාතික පක්ෂය. ඊට කලින් අයත් - ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව - ඒකට අදාළව කරපු දේවල් තිබෙනවා. නමුත් ඒක යුද්ධයක් කරලා, තුවක්කුවක් අතට දීලා, ඒක අපේ රටේ සදාකාලික කැළැලක් ලෙස නිශ්චිතව කළේ එක්සත් ජාතික පක්ෂය. ඒක මේ රටේ ඉතිහාසයේ නිශ්චිත කරුණක්, හංගන්න බැරි. අන්න ඒ වේදනාව නිසා තමයි කළු ජූලියට එරෙහිව සහෝදරත්වය වර්ධනය කරන, සහජීවනය වර්ධනය කරන, ලංකාව දෙමළ, මුස්ලිම්, සිංහල අප කාටත් එක හා සමානව අයිතියි කියලා ලංකාවේ තාරුණ්‍යයට අපි මේ හරහා කියන්නේ. කළු ජූලිය මතක් කිරීමෙන් ඒ හරහා ඉස්සරහට යන ගමන ගැන තමයි මේ තිබෙන්නේ.

මට කලින් මන්ත්‍රීවරයෙක් කථා කළා. එතුමාගේ කථාව ගැන මම ඉතාම කනගාටු වෙනවා. නමුත් මම පුදුම වෙන්නේ නැහැ. මා දන්නා තරමින් එතුමා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ. දැන් නම් මොන පක්ෂයෙන් ඇවිල්ලා ඉන්නවාද කියලා මම දන්නේ නැහැ. එතුමා චෝදනා කිහිපයක් කළා, කළු ජූලිය ජනතා විමුක්ති පෙරමුණෙන් කළා කියලා. ඒක කියන්නේ ජේ.ආර්. විතරයි මම හිතන විධියට. කළු ජූලිය ජනතා විමුක්ති පෙරමුණෙන් කළාය කියන්නේ, මැරිච්ච ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විතරයි. මේ රටේ සිහිබුද්ධිය තිබෙන, සාමාන්‍ය අවබෝධයක් තිබෙන කිසිම මිනිහෙක් ඒක කියන්නේ නැහැ. කළු ජූලිය ගැන කථා කරලා, 1987 ඉන්දු-ලංකා ගිවිසුම ගැනත් එතුමා කිව්වා. ඉන්දු-ලංකා ගිවිසුමට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වුණේ ඉන්දියාවට විරුද්ධ වෙන්න ඕනෑ නිසාවත්, දෙමළ මුස්ලිම් ජනතාවට විරුද්ධ වෙන්න ඕනෑ නිසාවත් නොවෙයි. මේක අහගන්න. ඉන්දු-ලංකා ගිවිසුම ගැන එම්.එච්.එම්. අෂ්රොෆ් මැතිතුමා 1987 ඔක්තෝබර් 8වැනි දා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මහා සම්මේලනයේදී මොකක්ද කියලා තිබෙන්නේ? එතුමා කියපු දෙය මම කියවන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙහෙමයි කියා තිබෙන්නේ.

"උතුරු සහ නැඟෙනහිර එකතු කිරීම තුළ නැඟෙනහිර වෙසෙන මුස්ලිම් ජනතාව සුළුතරයකගේත් සුළුතරයක් - a minority within a minority - බවට පත් වෙනවා. දෙමළ සන්නද්ධ කණ්ඩායම් සහ රාජ්‍යය අතර සිදුවන බල පොරයේදී මුස්ලිම් ජනතාවගේ දේශපාලනික හා භූගෝලීය අනන්‍යතාව සම්පූර්ණයෙන්ම අහෝසි වෙනවා." ඊට පසුවත් එතුමා ඒ සම්බන්ධයෙන් දිගටම කියලා තිබෙනවා. එක අවස්ථාවක නොවෙයි අවස්ථා රාශියක කියලා තිබෙනවා, 1987දී බලහත්කාරයෙන්, ප්‍රජාතන්ත්‍ර විරෝධීව ගෙනාපු ඉන්දු-ලංකා ගිවිසුම නිසා තමයි මුස්ලිම් කොංග්‍රසය ඇතුළු වෙනම දේශපාලන පක්ෂයක් හදන්න සිද්ධ වුණේ කියලා. මුස්ලිම් කොංග්‍රසයේ හිටපු නායකතුමා, ආරම්භක නායකතුමා, ඒක ගැන ඇති වෙන්න කියලා තිබෙනවා. මම අහලා තිබෙන විධියට, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය හදන්න කලින් එතුමා දෙමළ දේශපාලන සංවිධාන සමඟ, විශේෂයෙන් අලුත් ඒවාත් එක්ක වැඩ කරපු කෙනෙක්. මම හිතන විධියට එතුමා ITAK නොවෙයි, ඒ කාලයේ තිබුණු TULF එකත් එක්ක වැඩ කරපු කෙනෙක්. එතුමා ඒකෙන් කැඩිලා මුස්ලිම් කොංග්‍රසය හදන්නේ ඇයි? බලහත්කාරයෙන් ලංකාවේ ව්‍යවස්ථාව පළලා මේ බලෙන් ගෙනාපු සංශෝධන නිසා. ඒ සංශෝධන හොඳ ද, නරක ද කියන එක වෙනම විවාදයක්. ඒක ගෙනාවේ බලහත්කාරයෙන්; ඒක discourse එකකින් කරපු එකක් නොවෙයි. ඒ නිසා තමයි අදත් ඒක සාර්ථක වෙන්නේ නැත්තේ.

අපි පළාත් සභා ක්‍රමය පිළිගෙන තිබෙනවා, ඒක පවත්වාගෙන යන්න ඕනෑ කියලා. ඒක, මුස්ලිම් ජනතාව, මලෙයහම් ජනතාව තමන්ට තරමක් හරි ලැබුණා; වුට්ටක් හරි ලැබුණා කියලා හිතන නිසා. නමුත් ඒකෙන් විසඳිච්ච ප්‍රශ්නයක් නැහැ. පිල්ලෙයාන් මහ ඇමතිකම් කළා. විග්නේෂ්වරන් මැතිතුමා මහ ඇමතිකම කළා. මුස්ලිම් නායකයෝ මහ ඇමතිකම් කළා. දෙමළ නායකයෝ මහ ඇමතිකම් කරලා තිබෙනවා. කළුකරයේ වැඩිපුර ඉඳලා තිබෙනවා, දෙමළ කියලා හිතන මැති ඇමතිවරු. නමුත් ඒගොල්ලන් ඒ ජනතාවට විශේෂ දෙයක් කළේ නැහැ. සිංහල නායකයෝ සිංහල අයට කළේ නැහැ වාගේම තමයි. රාජපක්ෂලා කළේ සිංහල අයටද? 2022දී රට බංකොලොත් වෙන්න, රාජපක්ෂලා කළේ. 1989දී ප්‍රේමදාසලා වැඩිපුර මැරුවේ කවුද? සිංහල අය නේ. එහෙම තමයි ප්‍රේමදාසලා කළේ. ඒ නිසා සිංහල අය, සිංහල අයට සලකනවා, දෙමළ අය, දෙමළ අයට සලකනවා, මුස්ලිම් නායකයෝ, මුස්ලිම් අයට සලකනවා කියන්නේ ලොකු මිථ්‍යාවක්. මම කියන්නේ ඒකයි. රෝහණ විජේවීර සහෝදරයාගේ නම කියන්න කොන්ද තිබෙන අය, 1983දී දෙමළ මිනිස්සු මරන එක දැකපු මිනිස්සු ජේ.ආර්. ගේ නම කියන්නේ නැහැ. කොන්ද තියා ගන්න, මන්ත්‍රීතුමා. කොන්ද තියා ගෙන ඇත්ත කථා කරන්න.

1983 කළු ජූලිය ජේ.ආර්ලා කළේ නැත්නම්, එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ වශයෙන් හිටපු ත්‍රස්තවාදී නායකයෝ, මිනීමරුවෝ කළේ නැත්නම්, කවුද කළේ? මට මේ සාකච්ඡාව කිසිසේත් මේ විධියට කරන්න ඕනෑකමක් තිබුණේ නැහැ. හැබැයි, අමු අමුවේ අලුත් පරම්පරාවට බොරු කියනවා. 1983දී කුට්ටමනීලා මැරුවේ විජේවීරද? 1983දී prison එකට ගහලා මැරුවේ කවුද? එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ නේ. මේ, එක්සත් ජාතික පාක්ෂිකයෝ නොවෙයි. ඒවා මේ රටේ ඉතිහාසයේ ලියලා තිබෙනවා. හැබැයි, ඒ ආණ්ඩුව තව අවුරුදු 11ක් ආණ්ඩු කළ නිසා ඇත්ත මිනීමරුවෝ කවුරුත් උසාවි ගෙන යන්න බැරි වුණා. චන්ද්‍රිකා මැතිනිය 1994දී ඇවිල්ලා ඒවා කළේ නැහැ. 2002දී චන්ද්‍රිකා මැතිනිය Commission එකක් දැම්මාට ඒ අපරාධකරුවන්ට දඬුවම් දුන්නේ නැහැ. එතුමිය පොත ගහලා බේරුණා. 2002දී සත්‍ය සෙවීම සඳහා Commission එකක් පත් කරලා තිබෙනවා, "*Karuppu* July" ගැන. හැබැයි, එතුමිය එක අපරාධකරුවෙකුට දඬුවම් දුන්නේ නැහැ. ඒ නිසා 1983 කළු ජූලිය, ආණ්ඩුව බලය පවත්වා ගැනීම සඳහා කරන ලද මහා පරිමාණ විනාශයක්ය කියන්න බැරි දෙමළ හෝ මුස්ලිම් නායකයෙක් ඉන්නවා නම්, ඒ ජේ.ආර්ගේ අවතාර වැහිච්ච අය; ඒ, ජේ.ආර් ගේ අවතාර. මොකද, අද අපට හොඳට පෙනෙනවා. 1983 කළු ජූලිය අපට තේරුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා සමහර විට පූනාගල කන්දේ ඉඳන් දුක් විඳින්න ඇති. මම හිතන විධියට, අපේ කලෙයිවෙල්වි මන්ත්‍රීතුමියගේ තාත්තාට පහර දුන්නා, කළු ජූලියෙන්. සීයා මැරුවා. හරිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඊට වඩා අත්දැකීම් ඇති. ඒ නිසා, 1983 කළු ජූලියේදී අපට පුළුවන් මට්ටමින් අපි කොහොමද දෙමළ ජනතාව ආරක්ෂා කළේ කියන එකට මේ පක්ෂය තුළ ඉතිහාසගත සාක්ෂි තිබෙනවා. අපි ගරු කරන්නේ ඒකට. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අපේ මහා ශිෂ්‍ය සංගම් නායකයෝ කැම්පස් එකේ

[ගරු බිමල් රත්නායක මහතා]

සිවිලිම් අස්සේ දෙමළ තරුණ යහළුවන් ආරක්ෂා කළේ කොහොමද කියන එක කට්ටිය දන්නවා. ඒවා කරුණු. 1987 ඉන්දු -ලංකා ගිවිසුම කියන්නේ මේ කළු ජූලියෙන් හදපු ජාතිවාදී ගින්න පැතිරිලා, පැතිරිලා ගිහිල්ලා ඊට පස්සේ ඒකේ මතු වෙච්ච අවස්ථා.

ඉතින් මම මේවා ගැන ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් ඉතිහාසය විකෘති කරන්න ඔබතුමන්ලාට ඕනෑකම ඇති. මොකද, ඔබතුමන්ලා ජැක් ගහගෙන ඉන්නේ තවම UNP එකත් එක්ක නිසා, තවම UNP එකේ ජාතික ලැයිස්තුවෙන් එන නිසා, තවම සජබ ජාතික ලැයිස්තුවෙන් එන නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක නේ. ඒවා ටික කියන්න ගිහිල්ලා වෙලාව ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කළු ජූලිය ගැන කථා කළේ වෙන මොකකටවත් නොවෙයි. අපට ඕනෑකම තිබෙනවා විශේෂ දෙයක් කියන්න. මේ ඔක්කෝම දේවලින් පස්සේ ලංකාවේම මිනිස්සුන්ට එක පාර බුද්ධිය පහළ වෙලා වාගේ ඩෙල්ෆ්ට් ඉඳලා දෙවුන්දර දක්වාත්, මඩකලපුවේ ඉඳලා කොළඹ දක්වාත්, - හලාවත දක්වා - දෙමළ, සිංහල, මුස්ලිම්, බර්ගර්, මැලේ ඔක්කෝමලා එක දේශපාලන පක්ෂයක් බවට පත් වෙලා, එක ජනතා ව්‍යාපාරයක් බවට පත් වෙලා කියලා තිබෙනවා අපි එකට ඉන්න ඕනෑ කියලා. ඒක පිළිගන්න ඕනෑ. යාපනය දිස්ත්‍රික්කයේ සුමන්තිරන් ගෙදර තියලා ඉලංකුමාරන් මේ සභාවට එවනකොට ඒක තේරුම් ගන්න ඕනෑ දෙයක් නොවෙයිද? සුමන්තිරන්ව ගෙදර තියලා, යාපනයේ ITAK එක එකට බස්සලා, ඉලංකුමාරන්ලා මේ සභාවට එවනකොට ඒක දෙමළ ජනතාවගේ ප්‍රාර්ථනයක් නොවෙයිද? නුවරඑළිය දිස්ත්‍රික්කය විපක්ෂය දෙදෙනෙකුට සීමා කරලා, - රාධක්‍රිෂ්ණන් මැතිතුමායි, තොණ්ඩමන් මැතිතුමායි - ජාතික ජන බලවේගයෙන් පස්දෙනෙක් මේ සභාවට එවනකොට ඒක හිතන්න ඕනෑ දෙයක් නොවෙයිද? මාතරින් සරෝජා පෝල්රාජ්ලා එනකොට, මාතරින් අර්කම්ලා එනකොට ඒක හිතන්න ඕනෑ දෙයක් නොවෙයිද? වෙනසක් වෙලා තිබෙනවා.

අපි ගෙනියන්න හදන්නේ කළු ජූලියේ ඉතිහාසය නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ගෙනියන්න ඕනෑකම තිබෙන්නේ 2024 සැප්තැම්බර් 21වෙනි දා උතුරේත්, දකුණේත්, නැඟෙනහිරත්, කඳුකරයේත් ජනතාව දුන් spirit එක. ඒ spirit එක ගෙනියද්දී කළු ජූලිය ගත යුත්තේ මොකටද?

අදත් තිබෙනවා, කරුණක්. සාමාන්‍යයෙන් පුරාවිද්‍යා ස්ථාන කියන්නේ ජාතිවාදය අවුළන්න පුළුවන් තැන්. යුද්ධයෙන් ඇති කරපු තුවාල අදත් අපි දකිනවා. ඒ තුවාල හොඳ කරන්න බෙහෙත් දෙන්න ඕනෑ. අපි ඒ තුවාලවලට දාන බෙහෙත්වලින් උතුරේත්, දකුණේත් අනාථ වෙලා වැලේ වැල් නැතිව ඉන්න ජාතිවාදීන්ට up වෙන්න දෙන්න හොඳ නැහැ. අපි දන්නවා, සමහර ආගමික ස්ථාන, සමහර පුරාවිද්‍යා ස්ථාන තිබෙනවා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම කියන්නේ මේකයි. ආණ්ඩු කරපු කට්ටිය නේ විපක්ෂයේ ඉන්නේ, ජාතිවාදයේ වාසි ගත්ත කට්ටිය නේ ඉන්නේ. ඒගොල්ලන්ට ඉතාම කුඩා සිදුවීමක් විශාල ජාතිවාදී ශබ්දයක් බවට පත් කරන්න පුළුවන්කම තිබෙනවා. අපි ඒක මෑතකදී ත්‍රිකුණාමලයේදී දැක්කා. මොකක්ද? කුඩා සිද්ධි විශාල ජාතිවාදී සිදුවීම් බවට පත් කරන්න පුළුවන් තාක්ෂණය ඒගොල්ලන් දන්නවා. අන්න ඒකට රැවටෙන්න එපා.

මේ සාකච්ඡාවෙන් පස්සේ අපේ සාවිත්‍රී ඇමතිතුමිය, එරංග ඇතිතුමන්ලා එකතු වෙලා යම් ආකාරයක වැඩ පිළිවෙළක් සකස් කරයි කියලා අපි හිතනවා. මම උදාහරණ කිහිපයක් ඉක්මනින් කියාගෙන යන්නම්. දැන් ලංකාවේ වැඩියෙන්ම ජාතිවාදයට ගිනි සපයන්න යොදා ගන්නේ social media. හැම දෙයකම හොඳ පැත්ත වාගේම නරක පැත්තත් තිබෙනවා. ජර්මනියේ තිබෙනවා Network Enforcement Act එක. ඒක අනුව, Facebook, YouTube, Twitter වැනි සමාජ මාධ්‍යවල ජාතිවාදී හෝ ආගම්වාදී වෛරී ප්‍රකාශ පළ වූ විට පැමිණිල්ලක් ලැබී පැය 24ක් ඇතුළත ඒවා ඉවත් කිරීමට සමාජ මාධ්‍ය සමාගම් බැඳී සිටිනවා. එසේ නොකළහොත් දඬුවම් කරනවා. මට මතකයි, ලංකාවේ ජාතිවාදී සිද්ධීන් ඇති වෙච්ච වෙලාවේදී හරින් ප්‍රනාන්දු මැතිතුමා ඇමති කාලයේ කිව්වා, "ඒ social media සමාගම hate speech අයින් කළේ නැහැ. මොකද, ඒගොල්ලන්ට අවශ්‍ය තරම් සිංහල තේරුම් ගන්න පුළුවන් කට්ටිය හිටපු නැති නිසා" කියලා. ඒකම තමයි රෝහින්ග්‍යාවරුන්ට ගහනකොට මියන්මාර්වල වුණේ. ඒ වාගේම යුරෝපා සංගමයේ තිබෙනවා Code of Conduct එකක්. ඒකෙදිත් algorithmsවලින් පාලනය කරනවා, මේ ජාතිවාදී ප්‍රකාශන. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ Rabat Plan of Action තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් අමතරව ලැබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හරි, මේ ඇති. අනෙක් අයගේ වේලාවත් වැදගත් නේ.

ජාතිවාදී සිදුවීම් වාගේ ජේන දේවල්වලට අහුවෙලා මිනිස්සු ජාතිවාදී තත්ත්වයන්ට ගොදුරු වෙනවා. අන්න ඒවා වළක්වන්න අවශ්‍ය ක්‍රියාමාර්ග රාශියක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, ඒ Rabat Plan of Actionහි තිබෙනවා. උදාහරණයක් විධියට Englandවල තිබෙනවා, සරලව තේරුම ගත්තොත් racism monitoring centre එකක්. කොහේ හරි ජාතිවාදී තත්ත්වයක් ඇති වෙමින් තිබෙනවා නම් මිනිස්සුන්ට ඒක කියන්න පුළුවන්. කිව්ව පළියටම දේවල් විසඳෙන එකක් නැහැ, නමුත් වාර්තා කරන්න පුළුවන්.

ලංකාවේ ජාතිවාදයට ඉඩක් නැහැ. මොකද, ආණ්ඩුව ජාතිවාදය promote කරන්නේ නැහැ. නමුත් ඉතාම කුඩා සිදුවීම්, බොරු මත පදනම් වෙලා හදන දේවල් ප්‍රයෝජනයට ගන්නවා අපි දැකලා තිබෙනවා. පසුගිය කාලයේ පාස්කු ප්‍රහාරය සැලසුම් කරපු

පුද්ගලයෝ අත්අඩංගුවට ගත්තාට පස්සේ ඒගොල්ලන්ට බොරු වීරත්වයක් ආරෝපණය කරන්න ගියා. සමහර දේවල් දිහා හැම වෙලාවේම බලන්නේ සිංහල, දෙමළ හා මුස්ලිම් කියන කෝණයෙන්. අපට කළු ජූලියෙන් ඉගෙන ගන්න තිබෙන්නේ ගිනි තබන එක නොවෙයි. ඒවා එක්සත් ජාතික පක්ෂයත් එක්කම වැළලිලා යයි. ඒවා නැවත මේ රටේ සිදු වෙන්නේ නැහැ. නමුත් අපට ඕනෑකම තිබෙන්නේ, සහෝදරත්වය බිඳලා විනාශ කර දමපු කාරණා රටේ නැවත ඇති කරන්න කුඩා මට්ටමෙන් හෝ උදවු වන දේවල් තිබෙනවා නම් ඒවා වළක්වලා, ඉතාම කුඩා සිදුවීමකින් වුණත් ජනතාව නොරැවටී, සිංහල, දෙමළ හා මුස්ලිම් කියන කාටත් සහයෝගයෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් ලෙස ලංකාව තව තවත් ශක්තිමත් කරන්නේ කොහොමද කියලා සිතා කටයුතු කිරීමයි.

සලේගේ බොරු උපවාසවලට ජනතාව රැවටුණේ නැහැ නේ. දවස් දෙකයි, සලේගේ ඒ වැඩත් ඉවරයි; සලේට කඩේ ගිය කට්ටියත් ඉවරයි; අට්ටාලයත් නැහැ. අපේ රටේ මිනිසුන් සෑහෙන ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒ සිද්ධිය වෙන කාලයක වුණා නම්, සලේ කියන්නේ අවුළවන්න හොඳම බෝම්බයක්. ඉතින්, සලේටත් නැත්නම් වෙන කාටවත් නැහැ. ආයේ කවුරුත් එවැනි කාරණාවලට රැවටෙන්නේ නැහැ.

අපට කියන්න තිබෙන්නේ මෙයයි. කළු ජූලියත්, Easter Sunday attack එකත් මේ රට පාලනය කළ පක්ෂ දෙකේ කර්මාන්ත. 1983දී කළේ, එක්සත් ජාතික පක්ෂය. 2019දී කළේ, පොදු ජන පෙරමුණේ නායකයෝ. ඒක fact එකක්; පැහැදිලි කරුණක්. අපට ඕනෑකම තිබෙන්නේ, මේවා නැවත නැවත කිය කියා ඉන්න නොවෙයි. මේවායින් ඉගෙන ගෙන, නැවත මේවා පාවිච්චි කරලා උතුරේවත්, දකුණේවත්, වෙන කොහේවත් ජාතිවාදී පදනමකින් ආණ්ඩු වෙනස් කරන්නවත්, ආණ්ඩු හදන්නවත් ඉඩ නොදීමයි. ඒකයි අපේ අරමුණ. මේ සාකච්ඡාව ප්‍රතිඵලදායක - productive - දේකට ගෙන යන්න ගරු එරංග මැතිතුමා, ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මැතිනිය හා ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා වැනි අය කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, 1983ஆம் ஆண்டு தங்கத்துரை, குட்டிமணி போன்றவர்கள் படுகொலை செய்யப் பட்டது தொடர்பில் நிச்சயமாக உங்களுடைய அரசாங்கம் விசாரணை செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, இது point of Order இல்லை.

அடுத்து, கௌரவ சிவஞானம் சிறீதரன் அவர்கள்! உங்களுக்கு 5 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.30]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் 43 வருடங்களுக்குப் பிறகு ruling party - ஆளும் கட்சி - அரசாங்கம் கொண்டுவந்து இருக்கின்ற யூலை படுகொலை பற்றிய விடயம் முக்கியத்துவம் பெறுகின்றது. 43 ஆண்டுகளுக்கு முதல் இலங்கையில் வெலிக்கடை, களுத்துறை, பிந்துனுவெவ என பல சிறைச்சாலைகளில் கைதிகள் மிகக் கொடூரமான முறையில் கொல்லப்பட்டார்கள். இது இலங்கையில் நடந்த முதலாவது இனரீதியான படுகொலையல்ல. இதற்கு முதல் 1954ஆம் ஆண்டு அல்லைக் கந்தளாயில் 154 தமிழ் விவசாயிகள் பொலிசார் பார்த்திருக்க சிங்களக் காடையர்களால் வெட்டிப் படுகொலை செய்யப்பட்டார்கள். அதற்குப் பிறகு, 1956ஆம் ஆண்டு அநுராதபுரத்தில் கிட்டத்தட்ட 26,000 குடும்பங்களை இரவோடு இரவாக அங்கிருந்து கலைத்தார்கள்; பலரைக் கொலைசெய்தார்கள். 1985ஆம் ஆண்டுவரை அநுராதபுரத்தில் நகரசபை தலைவராக ஒரு தமிழர் இருந்திருக்கிறார். ஆனால், இப்பொழுது ஒரு தமிழ் பிரதிநிதிகூட இல்லாத அளவுக்கு தமிழர்களுடைய வரலாறு அங்கே அழிக்கப்பட்டு இருக்கின்றது.

அந்தக் காலத்தில் லலித் அத்துலத்முதலி, காமினி திசாநாயக்க, சிறில் மத்தியூ போன்ற ஐக்கிய தேசியக் கட்சியில் கோலோச்சிய அமைச்சர்கள், அப்பாவிகளாக இருந்த, ஆயுதம் தரிக்காத தமிழர்களை நோக்கி, "போர் என்றால் போர், சமாதானம் என்றால் சமாதானம்" என்று சொன்ன ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய வழிநடத்தலில் மிகக் கொடூரமான கொலைகளை இந்த நாட்டில் செய்தார்கள். குட்டிமணி, தங்கத்துரை மட்டுமல்ல, பல்லாயிரக்கணக் கானவர்கள் கொல்லப்பட்டார்கள்; பல கோடி ரூபாய் பெறுமதியான சொத்துகள் இந்த மண்ணிலே அழிக்கப்பட்டன. தமிழீழத்தைப் பார்க்கப்போகிறதா? என்று குட்டிமணியின் கண்கள்கூட தோண்டி எடுக்கப்பட்டன. இந்தளவு வன்மங்களும் கொடூரங்களும் இந்த மண்ணில் நடந்தது. 1983 யூலையில் நடந்த படுகொலை என்பது சாதாரணமானதல்ல. இதற்கு முதலே 1981ஆம் ஆண்டு யாழ். பொது நூலகம் எரிக்கப்பட்டது; ஈழநாடு அலுவலகம் எரிக்கப்பட்டது. இவை யெல்லாம் நடந்து முடிந்திருக்கின்றன.

அரச தரப்பினரான நீங்கள் இன்றைக்கு இந்த விடயத்தை இச்சபையில் ஒத்திவைப்பு வேளைப் பிரேரணையாகக் கொண்டுவந்து இருக்கிறீர்கள். இங்கு நீதி அமைச்சர் அவர்கள் இருக்கிறார். நான் இந்த அரசாங்கத்திடம் கேட்கின்றேன், ஒரு காலத்தில் Sansoni Commission இருந்ததைப்போல, கொலைகள் தொடர்பான இந்த விடயத்தை விசாரணை செய்ய ஒரு குழுவை நியமித்து நீதியைப் பெற்றுத்தர முடியுமா? என்று.

உங்களுடைய அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்று இரண்டு ஆண்டுகளாகின்றது. முள்ளிவாய்க்காலில் நடந்த இனப்படுகொலைக்குக்கூட, சர்வதேச விசாரணை மேற் கொள்வதை அனுமதிக்க மாட்டோமென நீங்கள் ஜெனீவாவில் உங்களுடைய பிரேரணைகளைக் கொடுத்திருக்கிறீர்கள். ஆகவே, இந்த மண்ணில் நடந்த மிகப் பெரிய இனப்படு கொலைகளான வாகரைப் படுகொலை, முள்ளிவாய்க்கால் படுகொலைக்குக்கூட நீதியை வழங்க நீங்கள் தயாராக இல்லை.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

செம்மணியில் கிட்டத்தட்ட 471 மனித எலும்புக்கூடுகள் அடையாளம் காணப்பட்டு இருக்கின்றன. இன்றும்கூட நாங்கள் இங்கே அது பற்றி பேசிக்கொண்டு இருக்கின்றோம். அவற்றுள் 455 எலும்புக்கூடுகள் அகழ்ந்தெடுக்கப்பட்டுள்ளன. இவை தமிழர்களுடையவை. நேற்றைய தினம் வரைக்கும், ஆசியாவின் இரண்டாவது மிகப்பெரிய மனித புதைகுழியாக இது அடையாளம் காணப்பட்டு இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1983ஆம் ஆண்டு 13 இராணுவத்தினர் கொல்லப்பட்டதற்காக மலையகத்தில் 2,000க்கும் மேற்பட்ட தமிழ் மக்கள் கொடூரமாகக் கொல்லப்பட்டார்கள். அவர்கள் அப்பாவிகள்! அவர்கள் என்ன செய்தார்கள்? அவர்களா கண்ணிவெடி வைத்தார்கள்? என நான் கேட்கின்றேன். அதிலிருந்து 13 ஆண்டுகள் கடந்து பாருங்கள்! 1996ஆம் ஆண்டு முல்லைத் தீவில் 'ஓயாத அலைகள்' நடவடிக்கைமூலம் தமிழீழ விடுதலைப் புலிகள் முல்லைத்தீவு இராணுவ முகாமைக் கைப்பற்றியபொழுது, 1,000க்கும் மேற்பட்ட இராணுவத்தினர் கொல்லப்பட்டார்கள். ஆனால், கொழும்பிலோ, மலைய கத்திலோ ஒரு தமிழர்கூட கொல்லப்படவில்லை. தமிழர்கள் பலமாக இருந்தபொழுது நீங்கள் மிகவும் யோசனையோடு இருந்தீர்கள். அதாவது, சிங்களத் தலைமைகள் யோசனையோடு இருந்தார்கள். தமிழர்கள் பலவீனமாக இருந்தபொழுது பல்லாயிரக்கணக்கானவர்கள் கொன்றொழிக் கப்பட்டார்கள்.

இதே 1983ஆம் ஆண்டு கலவரத்தின்போது, மலையகத்தி லிருந்த தமிழ் மக்களும் சரி, கொழும்பிலிருந்த தமிழ் மக்களும் சரி, அங்கிருந்து கலைக்கப்பட்டார்கள். அவ்வாறு கலைக்கப் பட்டபோது, இந்தியக் கப்பல்கள் வந்து கொழும்பிலிருந்து மலையகத் தமிழர்களை ஏற்றிச் சென்று வடக்கில் குறிப்பாக, கிளிநொச்சி மாவட்டத்தில் இறக்கிவிட்டன.

வடக்கு, கிழக்கு தமிழர்களுடைய தாயகம் என்பதை இந்தியா அந்த நேரமே உணர்த்தியிருந்தது; சர்வதேச சமூகம் இன்றும் அதனை ஏற்றுக்கொள்கிறது. வடக்கு, கிழக்கு என்பது தமிழர்களின் வரலாற்று வழி; மரபுவழித் தாயகம்; homeland. 1987ஆம் ஆண்டு மேற்கொள்ளப்பட்ட இலங்கை - இந்திய ஒப்பந்தத்தின் ஊடாக வந்த 13ஆம் திருத்தத்தின்மூலம் வட, கிழக்கு தற்காலிகமாக இணைக்கப்பட்டு இருந்தது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
எனக்கு இன்னும் இரண்டு நிமிடங்கள் தாருங்கள்!

இணைக்கப்பட்ட வட - கிழக்கை வழக்குத் தாக்கல் செய்து பிரித்தவர்கள் JVPஇனர். அதேபோல, 2004ஆம் ஆண்டு சுனாமி கட்டமைப்பு வந்தபொழுது, அதனை தமிழீழ விடுதலைப் புலிகளோடு இணைந்து சந்திரிக்கா அம்மையாரின் அரசு செய்ய முனைந்தபொழுது, வழக்குத் தாக்கல்செய்து நிறுத்தியவர்கள் JVPஇனர். ஆகவே, உங்களிடமும் குற்றங்கள் இருக்கின்றன. நீங்கள் இப்பொழுது என்ன செய்யப் போகிறீர்கள்? தமிழர்களை சமத்துவம், சமதர்மம் என்ற சொற்களுக்குள் அடக்கப் போகின்றீர்களா?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

தமிழர்கள் இந்த நாட்டின் ஒரு தேசிய இனம். வடக்கு, கிழக்கு என்பது அவர்களுடைய தாயக பூமி! அவர்களுக்காக ஒரு நிரந்தர அரசியல் தீர்வை உங்களால் முன்வைக்க முடியுமா? இல்லாவிட்டால், நீங்கள் இப்படி தமிழர்களை ஏமாற்றுவதற்கான தீர்மானங்களைக் கொண்டுவந்து, மாற்றுத் திசைக்குக் கொண்டுசெல்லப் போகின்றீர்களா? என்பதைத் தான் நான் இந்த உயர்ந்த சபையில் கேட்கின்றேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தமிழர்களுக்கு நீதி கிடைக்க வேண்டும் என்றால், அது வெறும் பேச்சளவில் மாத்திரம் இருக்கக்கூடாதெனக் கூறி, நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ உறுப்பினர் கந்தசாமி பிரபு அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.36]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கறுப்பு யூலை தொடர்பான விவாதத்தில் நாங்கள் கலந்துகொண்டுள்ளோம். அதன்போது உயிர்நீத்த அனைத்து உறவுகளையும் முதலில் நினைவுகூர்கின்றேன். 1983ஆம் ஆண்டு யூலை மாதம் 23ஆம் திகதி இனவாதத்தின் முதல் கறுப்புப் புள்ளியாக ஆரம்பிக்கப்பட்ட அந்த நிகழ்வை இலங்கை வரலாற்றிலே என்றுமே நாங்கள் மறந்துவிட முடியாது.

பிரிவினைவாதத்துக்கும் இனவாதத்துக்குமான ஒரு போராட்டமாக தமிழ் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் இடையே விரிசல்களை உருவாக்கி, அதனூடாக தங்களது அரசியல் இலாபத்தையும் அதிகாரப் பசியையும் உருவாக்கிக் கொண்ட ஒரு காலமாக அது அமைந்திருந்தது. இலங்கை சுதந்திரம் பெற்றதன் பின்னர் தங்களது அதிகாரப் போட்டிக்காக 1956ஆம் ஆண்டு காலப்பகுதியிலே எஸ்.டபிள்யூ.ஆர்.டி. பண்டாரநாயக்க அவர்கள் தனது அரசியல் தேவைக்காக சில சட்டங்களைக் கொண்டுவந்தார். குறிப்பாக, தனிச் சிங்களச் சட்டம் மற்றும் பௌத்த மதத்துக்கு முன்னுரிமை என்ற விடயங்களைக் கொண்டுவந்து தனக்கான ஓர் அரசியல் பாதையை உருவாக்கிக் கொண்டிருந்தார்.

1977ஆம் ஆண்டு ஜே.ஆர். ஜயவர்தன அவர்கள் 5/6 பெரும்பான்மையோடு ஆட்சி அதிகாரத்தை கைப்பற்றி யிருந்தாலும், வட பகுதியில் தன்னால் அதிகாரத்தை கைப்பற்ற முடியவில்லை என்ற கவலை அவருக்கிருந்தது. 1981ஆம் ஆண்டு அது வெளிப்படையாகவே தெரிந்தது. வட பகுதி மக்கள் தங்களை நிராகரித்து விட்டார்கள் என்பதற்காக புத்திஜீவிகளை உருவாக்கக்கூடிய பொக்கிஷமாக இருந்த

யாழ். பொது நூலகத்தை UNP அரசாங்கத்தினர் எரித்தார்கள். அதை என்றுமே எங்களால் மறக்கவும் முடியாது; மன்னிக்கவும் முடியாது. ஆசியாவிலே அதிக பெறுமதியான நூல்களைக் கொண்ட அறிவுப் பொக்கிஷத்தை அவர்கள் மிலேச்சத்தனமாக எரித்திருந்ததை எங்களால் எப்போதுமே ஏற்றுக்கொள்ள முடியாது. கோவிலாக மதிக்கப்படும் அந்த யாழ். பொது நூலகத்தை அவர்கள் எரித்ததை எங்களது தமிழ் மக்கள் ஒருபோதும் மறந்துவிட மாட்டார்கள்.

UNP அரசாங்கத்தைப் பொறுத்தவரை, அவர்கள் இத்தகைய செயற்பாடுகளைத் தொடர்ச்சியாக செய்து வந்தார்கள். தங்களின் அரசியல் பசிக்காக இந்த நாட்டை தீக்கிரையாக்கி இருந்தார்கள். 1983ஆம் ஆண்டு யாழ்ப்பாணத்தில் 13 இராணுவத்தினர் கொல்லப்பட்ட விடயத்தை வைத்து ஓர் இனவாதத் தூண்டுதலை பின்னாலிருந்துகொண்டு மேற்கொண்டிருந்தார்கள். அந்தச் செயற்பாடுகளை எங்களால் மன்னிக்க முடியாது. சாதாரண மாக ஒரு சிப்பாய் இறந்தால், அவரது உடலை குடும்பத் தினரிடம் கையளிப்பதுதான் வழமை. ஆனால், அன்றைய தினம் குறித்த 13 இராணுவத்தினரின் உடல்களும் பொரளை பொது மயானத்துக்குக் கொண்டுவரப்பட்டன. அங்கு காடையர்கள் அனைவரும் ஒன்றுசேர்ந்து அந்த உடலங்களை கேடயமாக வைத்துக்கொண்டு இனவாதச் செயற்பாடுகளை ஆரம்பித்திருந்தார்கள். கொழும்பு பிரதேசத்தில் வசித்த தமிழ் மக்களை அடித்து விரட்டி, அவர்களது சொத்துகளையும் உடைமைகளையும் சேதப்படுத்தியதுடன், அவர்களது உயிர் களையும் காவுகொண்டனர்.

அதுமாத்திரமல்ல, தங்கத்துரை, குட்டிமணி உட்பட 53 தமிழ் அரசியல் கைதிகளை கொலைசெய்து, அவர்களது ஆசைகளையும் கனவுகளையும் சுக்குநூறாக்கி இருந்தார்கள். அந்த விடயங்களையும் நாங்கள் இந்த நேரத்தில் மறந்துவிட முடியாது. அந்த கறுப்புப் பக்கத்தை மீட்டி, அந்த நினைவுகளை வைத்துக்கொண்டு எங்களுடைய சகோதரத்துவத்தை நாங்கள் மறந்துவிடவும் முடியாது. அந்தக் கலவரத்திலும்கூட தமிழ் மக்கள், சிங்கள மக்கள் என இரு இனத்தவரும் பிரிந்துவிடாமல், தங்களது தமிழ் சகோதரர்களை சிங்கள மக்கள் பலர் காப்பாற்றியிருந்தார்கள்; அவர்களை காப்பாற்று வதற்காகப் பல சிரமங்களை எதிர்கொண்டிருந்தார்கள். தமது உயிரைத் துச்சமாக மதித்து அவர்கள் தமிழ் சகோதரர்களை காப்பாற்றியிருந்ததை நாங்கள் இந்த நேரத்தில் நினைவுகூர வேண்டியிருக்கின்றது.

எங்கள் சோசலிச இளைஞர் சங்கத்தின் ஊடாக ஒவ்வொரு வருடமும் யூலை மாதம் 23ஆம் திகதி 'சகோதரத்துவ தினம்' அனுஷ்டிக்கப்படுகிறது. இம்முறை சகோதரத்துவ தினத்தை மட்டக்களப்பு மாவட்டத்தில் ஏற்பாடு செய்திருக்கின்றோம். முறக்கொட்டாஞ்சேனை, புன்னக்குடா, ஏறாவூர் பிரதேச மக்களுட்பட இந்த நாட்டிலே இருக்கின்ற அனைத்து இளைஞர், யுவதிகளையும் ஒன்றிணைத்து அந்தத் தினத்தைக் கொண்டாட ஏற்பாடு செய்திருக்கின்றோம். இந்நிகழ்வின் ஊடாக விழிப்புணர்வு நிகழ்வுகள், சிரமதான நிகழ்வுகள், விளையாட்டுப் போட்டிகள், சித்திரப் போட்டிகள் மற்றும் கலை நிகழ்ச்சிகளை நாங்கள் நடத்த இருக்கிறோம். இந்த நாட்டு மக்களிடம் குறிப்பாக இளைஞர், யுவதிகளிடம் நான் கேட்டுக்கொள்கின்ற விடயம் என்னவென்றால், மட்டக்களப்பு மாவட்டத்தின் புன்னக்குடா கடற்கரையில் நடைபெறவிருக்கும் இந்த நிகழ்வில் கலந்துகொள்ளுங்கள் என்றுதான். நாம் அனைவரும் சகோதரத்துவத்துடன் வாழ்வோம்; இலங்கை யர்கள் என்பதை வெளிப்படுத்துவோம் எனக் கேட்டுக் கொள்கின்றேன்.

சுதந்திரமாகவும் அதேநேரம் சந்தோஷமாகவும் வாழக் கூடிய நிலைமை எங்களது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் காலப்பகுதியில்தான் ஏற்பட்டிருக்கிறது. கடந்த காலங்களில் இனவாதத்தை தூண்டுபவர்கள் அரசாங்கத்தைச் சார்ந்தவர் களாக இருந்தார்கள். அன்றைய காலகட்டத்தில் இருந்த அரசியல்வாதிகளும் அந்த அரசாங்கத்துக்குத் துணைபோய் இருந்தார்கள். ஆனால், இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள், Burghers, மலையகத் தவர்கள் என வேறுபாடு பார்க்காமல் அனைவரும் ஒன்றாக இணைந்து வாழக்கூடிய ஒரு நாட்டை உருவாக்கி வருகின்றது என்ற விடயத்தைக் கூறி, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ கே. காதர் மஸ்தான் அவர்கள்! உங்களுக்கு 3 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 4.43]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கறுப்பு யூலை என்றாலே 1983ஆம் ஆண்டு யூலை 23ஆம் நாளன்று சிறைச்சாலையில் இடம்பெற்ற படுகொலைகளும் அதனைத் தொடர்ந்து தமிழ் மக்களுக்கு எதிராக இடம்பெற்ற இனக் கலவரமும்தான் எம் கண்முன் ஞாபகத்துக்கு வருகின்றன. அந்தக் காலத்தில் நான் வவுனியாவில்தான் இருந்தேன். உயிரிழப்புகள் குறைவு என்றாலும், அங்கும் பல கடைகள் எரிக்கப்பட்டன. கடைகளில் இருந்த சாமான்களை எல்லாம் நாங்கள் கஷ்டப்பட்டு பாதுகாத்துக் கொடுத்தோம். வெலிக்கடை சிறைச்சாலையில் இருந்த குட்டிமணி, தங்கத்துரை போன்ற அரசியல் கைதிகளையும் வெளியில் பிரசித்திபெற்ற அரச அதிகாரிகள், doctors, engineers போன்றோர்களையும் பாகுபாடில்லாமல் கொன்று குவித்தார்கள். அவர்களின் ஆத்மா சாந்திக்காக இந்த இடத்திலே பிரார்த்திக்கின்றேன்.

இந்தப் பிரேரணை கொண்டு வரப்பட்டிருக்கும் நோக்கம், இந்த நிலைமைக்கு முழுக்க முழுக்க கடந்த கால அரசாங்கம்தான் காரணம் என்று சொல்லி அந்த அரசாங்கத்தின்மீது பழிபோடுவதே ஆகும். பாதுகாப்புத் தரப்பினரின் அறிக்கையை வைத்து அந்தக் காலகட்டத்தில் JVP தடைசெய்யப்பட்டது என்று நாங்கள் அறிகிறோம். அது பற்றி எங்களுக்குச் சரியாகத் தெரியாது, தகவல்களை வைத்துத்தான் சொல்கிறோம். அதன் உண்மையான காரணம் எப்படியிருந்தாலும், அரசியலுக்காகத் திட்டமிடப்பட்ட ஓர் இனக்கலவரமே இந்தக் கறுப்பு யூலைக் கலவரம்! அந்தக் கலவரத்தில் பாதிக்கப்பட்ட மக்கள் இன்றும் இருக்கின்றார்கள். சரியான விசாரணை ஆணைக்குழு அமைத்து பாதிக்கப் பட்டவர்களுக்கு இன்னும் நீதி வழங்கப்படவில்லை. இதில் உங்களுக்குச் சம்பந்தம் இல்லையென்றால், பாதிக்கப்பட்ட இனத்துக்கு நீதி வழங்கும் விதமாக ஓர் ஆணைக்குழுவை உடனடியாக அமையுங்கள்!

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

இதனோடு ஒப்பிட்டுப் பார்க்கையில், 2019இல் முஸ்லிம் பெயர் தாங்கிகளைக்கொண்டு நடாத்தப்பட்ட 'ஈஸ்டர்' தாக்குதலுக்கும் அரசியல்தான் காரணம் என்று தெரிகின்றது. அது தொடர்பான விசாரணை ஒழுங்காக நடைபெறுகின்றது. அந்தச் சமூகத்துக்கு ஏற்பட்ட பாதிப்புகளுக்கு எந்தவித நிவாரணமும் வழங்கப்படவில்லை. குறிப்பாகச் சொல்வதென்றால், இந்தச் சம்பவத்துக்குப் பிறகு எங்களுடைய புனித அல்-குர்ஆனின் மொழிபெயர்ப்பை தடை பண்ணியிருக்கிறார்கள். அதேபோன்று, கண்ணியத்துக்குரிய உலமாக்கள் மற்றும் மார்க்க அறிஞர்களால் எழுதப்பட்ட கிட்டத்தட்ட 35 நூல்களை இங்கே கொண்டுவர முடியாதென்று review committeeஇன் பரிந்துரையின் பேரில் தடைசெய்திருக்கிறார்கள். அது பற்றி கேட்டால், "உங்களுடைய ஆட்கள்தானே அதனைச் செய்திருக்கிறர்கள்" என்று சொல்லப்படுகிறது. எந்தச் சட்டத்தின் அடிப்படையில் அந்த review committee அமைக்கப்பட்டது? அந்த committee சட்டபூர்வமானதல்ல. அதற்கான காலவரையறை என்ன? மற்றையது, அவ்வாறான குழு அமைப்பதற்குரிய நிபந்தனைகள் என்ன?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு வழங்கப்பட்ட நேரம் நிறைவடைகின்றது.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

சகல முஸ்லிம் இயக்கங்களையும் சார்ந்த உறுப்பினர்களை உள்ளடக்கிய review committee ஒன்று அமைக்கப்பட்டிருக்க வேண்டும். ஆனால், அப்படிச் செய்யப்படவில்லை. அதை எப்படி நிவர்த்தி பண்ணப் போகிறீர்கள்? இந்த விடயத்தில் முஸ்லிம் மக்களுடைய அடிப்படை உரிமை மீறப்பட்டு இருக்கின்றது. கடந்த காலத்தில் எவ்வாறு தடையின்றி அல்-குர்ஆன் மொழிபெயர்ப்புப் பிரதிகள் வந்ததோ, அதேபோல் இன்றும் வர வேண்டும். அதற்குப் பொறுப்பான department இந்த விடயங்களை கண்காணிக்க வேண்டும். அதற்கு உரிய அதிகாரத்தைக் கொடுங்கள்! 2019ஆம் ஆண்டுக்குப் பிறகு இந்த நாட்டில் முஸ்லிம் சமூகத்தினர் இரண்டாம் தரப்பினராகவே பார்க்கப்பட்டனர். நீங்களும் அதை ஏற்றுக்கொள்வீர்கள். அந்த வகையில், எல்லா சமயத்தவர்களையும் இலங்கை மக்களாகப் பார்க்க வேண்டும். இந்த review committeeஐ கட்டாயம் இல்லாமலாக்குவதோடு, தடுத்து வைக்கப்பட்டு இருக்கின்ற அல்-குர்ஆன் மொழிபெயர்ப்புப் பிரதிகளையும் விடுவித்துத் தருமாறு கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் அவர்கள்! உங்களுக்கு எட்டு நிமிடங்கள் உண்டு.

[பி.ப. 4.48]

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1983ஆம் ஆண்டு இடம்பெற்ற கறுப்பு யூலை பற்றிய இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு எனது அனுபவங்களைப் பகிர்ந்து கொள்ள விரும்புகின்றேன். ஏனெனில், இது அனைவரும் தெரிந்து கொள்ள வேண்டிய ஒரு விடயமாகும். ඇත්තටම අද අපි මේ සභාව කල් තැබීමේ විවාදය පවත්වනු ලබන්නේ 1983දී ඇති වුණු කළු ජූලිය පිළිබඳවයි. වෙනදා වාගේ මට අද තිබෙන්නේ අදාළ මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්න නොවෙයි, කථාවක් කියන්න. ඒ කථාව වෙන කාගේවත් කථාවක් නොවෙයි. මේක මගේ කථාව.

මමත් 1983දී ඇති වූ කළු ජූලියේ වින්දිතයෙක්. මගේ පවුලේ අයත්, මමත් ඒ සිදුවීම්වල සජීවී පංගුකරුවෝ වෙලා තිබෙනවා. ඉපදුණු දා ඉඳලා මම මාතර නගරයේ ජීවත් වුණා වාගේම, 1983 වර්ෂය වෙනකොට මම පාසල් වයසේ පළමු වසරේ අධ්‍යාපනය ලබන පුංචි ළමයෙක්. ඉතින්, ඒ මොහොත වෙනකොට මට මේ සම්බන්ධයෙන් දේශපාලන පසුබිමක් තිබුණේ නැහැ. ඒ පුංචි වයසේදී දේශපාලනික අවබෝධයක් සහිතව නොවෙයි, අපි ඒ අත්දැකීමට මුහුණ දුන්නේ. දින කිහිපයක් තිස්සේ අපේ ගෙවල් වටපිටාව ආරක්ෂිත නැහැ කියන එක; ඇහෙන වචන හොඳ නැහැ කියන එක; උදේට ගෙදරින් එළියට යන තාත්තා ආපසු ගෙදර එන්නේ භයෙන් කියන එක තමයි මට මතක. මොකද, ඒ වෙනකොට අපට මාතර නගරයේ වෙළෙඳ ව්‍යාපාරික ස්ථානයක් තිබුණා. ඒ වෙළෙඳ ව්‍යාපාරයත් එක්කම මාතර නගරය කියලා කියන්නේ මා පුංචි කාලයේ සිංහල, දෙමළ, මුස්ලිම් හැමෝම එකට ජීවත් වුණු, හැම කෙනෙක්ම එකට සහජීවනයෙන් ජීවත් වුණු හොඳම සහජීවනයේ පුරවරයක් - සහජීවනයේ නගරයක්. ඇත්තටම, ඒ කාලය වෙනකොට මාතර නගරයේ අපේ ව්‍යාපාරික ස්ථානයත් එක්කම ඒ වටපිටාවේ සිංහල, දෙමළ, මුස්ලිම් හැමෝටම අයත් ව්‍යාපාර තිබුණා. සිංහල ව්‍යාපාර හැටියට ගත්තොත්, ඩේවිඩ් සිංඥෝ සහ සහෝදරයෝ, නන්දියස් අප්පුහාමි, දාස මුදලිලාලා, විජය මාතර, ඕදිරිස් පොල්තෙල් මෝල, හරිස්චන්ද්‍ර සමාගම වාගේ ව්‍යාපාරිකයන් ඒ කාලයේ මාතර නගරයේ හිටියා. මුස්ලිම් ව්‍යාපාරිකයින් හැටියට, ඕන් සහෝදරයෝ, ඒ වාගේම මුහුලාර් ඇන්ඩ් සන්ස්, හලීමාස්, රකීබ් ඇන්ඩ් සන්ස් වාගේ ව්‍යාපාරික ආයතන තිබුණා. ඒ වාගේම, මාතර "කෝයිර්පිල්ලෙ නාඩාර්" කියන්නේ අපේ ව්‍යාපාරික ස්ථානය. எங்களுடைய அப்பாவின் குடும்பப் பெயர் "கோயிற்பிள்ளை நாடார்".

මාතර නගරය කියන්නේ, ව්‍යාපාරික ස්ථාන විතරක් නොවෙයි, විවිධ ක්ෂේත්‍රවල නියැළුණු සුන්දරලින්ගම්, අලහරත්නම්, Dr. Nagarajan වාගේ හැම කෙනෙක්ම එකට ජීවත් වුණු නගරයක්. මට හොඳට මතකයි, එක්වරම ඇති වුණු කළු ජූලියත් එක්ක අපි එක රැයෙන්ම අවතැන් වෙනවා, අපේ ව්‍යාපාරික ස්ථාන ගිනිබත් වෙනවා, මුළු නගරයම කළු දුමෙන් පිරිලා යනවා. මුළු මාතර දිස්ත්‍රික්කයේම හිටපු පවුල් ගණනාවක් එකම පාසලක - මාතර ශාන්ත සර්වේශස් විද්‍යාලයේ- පිහිටුවා තිබූ අවතැන් කඳවුරකට එක සැරේටම එනවා මට මතකයි. අපි පොඩි කාලයේ බෙහෙත් ගන්න යනකොට, බක්කි කරත්තයෙන්

දොස්තර මහත්මයා ළඟට යන්න එන්න පුළුවන් මට්ටමේ හිටපු අපි, එක රැයකින් කිසිවක් නැති මිනිස්සු බවට පත් වුණා. ඒක තමයි මට තිබෙන අත්දැකීම.

ඒක තමයි යුද්ධයේ තිබෙන භයානකකම. ඒක තමයි දේශපාලනික සංහාරය. ඒ දේශපාලන කුමන්ත්‍රණය පිළිබඳව කිසිවක් දන්නේ නැති, ඒ වාගේම දේශපාලනික වශයෙන් කිසිසේත්ම පංගුකාරයෝ නොවුණු, කිසිසේත්ම චේතනාන්විතව හෝ චේතනාවකින් තොරව කිසිදු සම්බන්ධතාවක් නැතුව හිටපු අපි ඒ කුමන්ත්‍රණයේ වින්දිතයෝ බවට පත් වුණා. මම මේ විධියට සිංහල කථා කළාට, මගේ අම්මා කියන්නේ සිංහල කථා කරන්න පුළුවන් කෙනෙක් නොවෙයි. ඒ අවතැන් කඳවුරක, වෙනම පරිපාලනයක් තිබෙන ඒ විධියේ පරිසරයක, ව්‍යාපාර කරගෙන තමන්ගේ ජීවිතය ගත කරගෙන හිටපු කෙනෙකුට එක්වරම දරුවන් කිහිලි ගත්වාගෙන පෝලිමේ බෙලෙක් තැටියක් අරගෙන ඉන්න වෙනවා කියන අත්දැකීම කොච්චර නීරසද කියලා අපි දන්නවා. මම මේ සිදුවීම් මතක් කරන්නේ, ඒ වේදනාත්මක අතීතයේ කිසිවක් නැවත මතක් කරන්න නොවෙයි. ඒ කාලය ඇතුළත අපි පවුල් ගණනාවක් නිදා ගන්න තැනක් නැතුව පන්ති කාමරයක් තුළ සාරි වට කරලා බිම පුංචි පුංචි තැන්වල නිදාගෙන සිටියා මට මතකයි. ඒ වාගේම, මගේ මල්ලීත්, මමත්, අක්කාත් ඉතාම පරිස්සමින් අම්මාත් එක්ක තුරුළු වෙලා හිටපු හැටි මට මතකයි. අපේ තාත්තාව මරන්න එනවා කියලා දැන ගත්තාම, ඒ වාගේම ව්‍යාපාරික ස්ථානවල මංකොල්ලකාරී ක්‍රියා සිද්ධ වෙනකොට එකට ගාල්වෙලා හිටපු මිනිස්සු, එකට ජීවත් වුණු මිනිස්සු භයේ අඳෝනා දුන් හැටි මට තවමත් ඇහෙනවා වාගෙයි. ඒ වාගේම එහි නරකම දේ මම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සිදුවීමකට මුහුණ දීලා අපි සතියකින් ආපහු ආවා. මම එක වසරේ පන්ති කාමරයේ ඉගෙන ගන්නකොට මට පොත්පත් අරගෙන යන්න පුංචි සූට්කේස් එකක් තිබුණා. අපි හිටපු ගෙදර ඉස්සරහා කිසිවක් නැතුව මගේ සෙල්ලම් බඩු ටික, ඒ පුංචි සූට්කේස් එක ගිනි අරගෙන තිබෙන මතකය තමයි මේ කථා කරන මොහොතේත් මගේ ඇස් ඉස්සරහා මැවී පෙනෙන්නේ. ඒ තත්ත්වය ඇති කළේ කවුරු විසින් වුණත්, ඒ දේශපාලනික බලපෑම සිදු කළේ කවුරුන් විසින් වුණත්, වින්දිතයන්ගේ හදවතේ තිබෙන්නේ, තමාට අහිමි වූ දේවල් ගැන, ඒ වාගේම තමන්ගේ අම්හිරි මතකයන් ගැන. මා හිතන්නේ අපට කවදාවත් එතැනින් එහාට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்கு இன்னும் 2 நிமிடங்கள் மாத்திரமே இருக்கின்றன.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் முடிக்கின்றேன்.

මගේ අතීතය ගැන කියනවා නම්, මම ඉපදිලා තිබෙන්නේ 1977 වසරේ ජූලි මාසයේ. එතැන් සිට දින 40ක් වෙනකොට - ලංකාවේ පැවති දූෂිතම මැතිවරණය වන 1977දී පැවති මහ මැතිවරණයෙන් පසුව- ඇති වුණු ඒ ජාතිවාදී කලබලවලදී, ඒ ගින්න වෙලාවේ මගේ අම්මා මාව ආරක්ෂා කර ගත්ත නිසා තමයි අද මම මෙතැන ඉඳගෙන මේ මාතෘකාවට කථා කරන්නේ.

මා ඉතාම ගෞරවයෙන් කාරණයක් කියන්න කැමැතියි. අපි ඒ අම්හිරි අතීතයන් මතක් කරන්නේ ඇත්තටම අපට අවශ්‍ය වෙන්නේ මනුෂ්‍යත්වය නිසායි. අපි කඳවුරේ සිටි ඒ දින ගණනේදී අපට මොනවත්ම නැතුව ඉන්නකොට අපේ වට පිටාවේ හිටපු අය අපට කෑම බීම ටික, නිදා ගන්න පැදුරක් කොට්ටයක්, දත් බෙහෙත් හා සබන් වාගේ අත්‍යාවශ්‍ය දේවල් ටික අරගෙන ආපු මතකයත් මට තිබෙනවා. ඒ ජාතිවාදී අරගළයක් අස්සේ, ජාතිවාදී කලබලයක් වපුරපු දේශපාලකයන්ගේ දූෂිත ක්‍රියා මැද මනුෂ්‍යත්වයේ සුවඳ අරගෙන ආපු, ඒ ආදරණීය මිනිසුන්ට ස්තුති කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම ඒ අම්හිරි අතීතය කොයි විධියේ එකක් වුවත් මාතර නගරයේ වැලි කැටයක් ගණනේ මා අදටත් හඳුනනවා.

සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, මම සහ අර්කම් ඉල්යාස් නියෝජ්‍ය ඇමතිතුමා - අපි තුන්දෙනාම - මාතර නගරයෙන් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා ඇවිල්ලා තිබෙන්නේ, ජාතික ජන බලවේගයේ අපට ඒ ජාතිවාදයේ ගිනිදැල් පරාජය කරලා, ජාතික සමගිය ඇති කරන්න පුළුවන්කම තිබෙන නිසා. අපි හැමෝම මේ අවස්ථාව පාවිච්චි කර ගන්න ඕනෑ, පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් නම් කරලා, ඒ සිදුවීම්වලින් හදවත්වලට වෙච්ච තුවාලය අපි සුවපත් කරන්න. සමාදානයේ දෑත් අපි දිගු කරනවා. 1983දී ඇති වූ කළු ජූලියේ විශාලම හානිය සිදු වුණේ, මිනිසුන් අතර වෙච්ච විශ්වාසයට. දශක ගණනාවක් සහෝදරත්වයෙන් ජීවත් වූ ජනතාව අතර සැකය, බිය වර්ධනය වුණා. ඒ විතරක් නොවෙයි, දිගු කාලීන ගැටුමකට පසුබිමක් ඇති කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய நேரம் நிறைவடைந்துவிட்டது.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
எனக்கு இன்னும் ஒரு நிமிடம் மாத்திரம் தாருங்கள்!

වෛරයට වඩා මනුෂ්‍යත්වය ඉතාම ශක්තිමත්. සිංහල, දෙමළ, මුස්ලිම් ජනවර්ග කිසිවකට බෙදී ජීවත් වෙන්න බැහැ. මම ගත්තොත්, මාතර හැරෙන්න වෙන නගරයක ජීවත් වෙන්න මම දන්නේ නැහැ. මේ ලංකාව හැර මට වෙන රටක් නැහැ. ලාංකිකයෙක් හැටියට මම මේ රට තුළ ජීවත් වෙන්නේ ඉතාම ආදරයෙන්. ඒ නිසා මට තිබෙන අනන්‍යතාව මේ රටේ සියලු පුරවැසියන්ට ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි මේ රට ඇතුළේ අනාගතය වෙනුවෙන් ගොඩ නැඟීමක් කරන්නේ. මම එකම එක කවියකින් මගේ කථාව ඉවර කරන්නම්.

චේරන් කියන කවියා "එරිගින්ර නගරම්" කියලා කවියක් ලියනවා, කළු ජූලියෙන් සිදු වූ විනාශය, මිනිසුන්ගේ අසරණභාවය ගැන. එය මෙසේ සඳහන් වනවා:

"எரிந்து கொண்டிருக்கிறது என் நகரம்,
சாம்பல் புகைக்குள் மூழ்குகிறது நினைவுகள்.
இரத்தமும் கண்ணீரும் கலந்த வீதிகளில்,
நாடோடிகளாய் நாம் அலைகின்றோம்.
புகை மண்டலத்தின் நடுவே,
தாயின் அலறல் கேட்கிறது.
காலத்தின் சுவர்களில் எழுதப்படுகிறது,

இந்தக் கொடூரத்தின் வரலாறு!"

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය ]

"ගිනිගෙන දැවෙමින් පවතියි මාගේ නගරය,
අළු සහ දුමාරය අතරේ ගිලී යයි අතීත මතකයන්.
ලේ සහ කඳුළු මුසු වූ වීදි පුරා,
අපි අනාථයන් වී ඇවිද යන්නෙමු.
ඝන දූම් වලා අතරින්,
ඇසෙමින් පවතියි මවකගේ විලාපය.
කාලයේ ප්‍රාකාර මත ලියැවෙමින් පවතියි,
මේ අතිශය තදබල ඛේදනීය ඉතිහාසය."

ඉතින්, ඇත්තටම ගත්තොත්, මම මේ දකින්නේ මගේ අම්මා ගැන, ඒ කඳුළු ගැන. කිසිම මවකට ඒ වාගේ වේදනාවක් ඇති නොවෙන්න නම් සමාදානයේ රාජ්‍යයක් අපි නිර්මාණය කරන්නට ඕනෑ. ඒ වෙනුවෙන් අපි අනිවාර්යයෙන්ම වග වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[අ.භා. 4.58]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදේ ලොකු ගැටලුවක් ඇති වුණා. Dr. Ramanathan Archchuna දෙමළ පොරක්. අද වෙනකල්, මැරෙනකල් මම කියනවා, මම දෙමළ පොරක් කියලා. හින්දු පොරක් කියලාවත් කියනවා. මම කියන්නේ නැහැ, මම සිංහල, මම මුස්ලිම් කියලා. මම දෙමළ පොරක්. මම මේ රටේ ඉපදුණේ. මේක මගේ රට. අද උදේ කිව්වා, මානසික ලෙඩෙක් කියලා.

මට මතකයි, අංගොඩ ward rounds කරනකොටත් සමහර ලෙඩ්ඩු ඇවිල්ලා කියනවා, -මම දෙවෙනි පාර මේක කියන්නේ- "ඔයා doctor කෙනෙක් නොවෙයි, ඔයා ලෙඩෙක්, අපි තමයි doctor" කියලා. එතකොට අපි කියනවා, "ඔව්, සතුටුයි. බෙහෙත් බිව්වාද?" කියලා. ඔවුන් ආපහු කියනවා, "නැහැ, නැහැ, නැහැ" කියලා. මම කිව්වා, "හරි කමක් නැහැ, බෙහෙත් බීලා හෙට උදේ එනකොට ලස්සනට කථා කරමු" කියලා.

ඒ වෙනුවට මම දෙමළ නිසා අද newsවල ගිය comments ටික කියවන්නම්, ඒ සිද්ධිය ගැන. මේක අහන්න. කියපු එක්කෙනාට සිංහල කෙනෙක් ගහලා තිබෙන්නේ, comment එක. "ඕක ගිනි තියන්න ආපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන් විනය ගැන කථා කරනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. ඒ, පළමුවෙනි comment එක. දෙවෙනි comment එක,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තුන්වෙනි comment එක,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ screenshot සඳහන් ලේඛනය මම **සභාගත*** කරනවා.

හතරවෙනි එක,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පස්වෙනි එක,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හයවෙනි comment එක, "අර්ච්චුනා සර්ට අපහාස කරන්න එපා, එයා කියන්නේ සම්පූර්ණ ඇත්ත." මේක තනිකරම comment කරලා තිබෙන්නේ සිංහල ජනතාව. මේක නිකම් ඇවිල්ලා,-

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා භාවිත කරන වචන පිළිබඳව සැලකිලිමත් වෙන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හරි, හරි. කරදර කරන්න එපා. කළු ජූලිය ගැන කථා කරලා, දෙමළ මිනිස්සු අවුස්සනවා කියලා කියනවා. තනිකරම ඡන්ද 27,000ක් අරගෙන ආපු කෙනා. මම කියන්නම්. ඔයගොල්ලන් එනකොට අපි නොවෙයි, රටම විශ්වාස කළා, ඔව්, ඔව් දෙවෙනි ප්‍රභාකරන් ආවා කියලා. දෙවෙනි ප්‍රභාකරන් ආවා කියලා. ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි අපි ඡන්දය දුන්නේ. තනිකරම ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි ඡන්දය දුන්නේ.

මමත් ඒ ටීෂර්ට් ඇඳගෙන හැම තැනටම ගියා, "අනුරට ඡන්දය දාන්න" කියමින්. ඒ රැවටුණු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අවුරුදු ගණනක් ගිහිල්ලාත් තවම කියනවා. අවුරුදු දෙකකින් පස්සේත් කියනවා. මිනිස්සු ඒ ගොල්ලන්ට කැමැතියි ලු; ගොඩක් කැමැතියි ලු. වෙලා තියෙන්නේ මේකයි. මේ අය කියන ඒවා දෙමළ මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ. අපි වාගේ සිංහල තේරෙන අයට තමයි ඒවා තේරෙන්නේ. ඒ පළමුවැනි එක.

දෙවෙනි එක මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2009දී තමයි යුද්ධය ඉවර කළේ. ආණ්ඩුව පැත්තේ ඔය ඉස්සරහා පේළියේ ඉන්න ඔක්කොම තමයි යුද්ධය ආපහු ආරම්භ කරන්න කියලා 2006දී පෙළපාළි ගියේ.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, **රීති ප්‍රශ්නයක්.**

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අර්ච්චුනා මන්ත්‍රීතුමා සභාවට නොගැළපෙන වචන කිහිපයක්ම සභානායකතුමා එල්ල කරමින් ප්‍රකාශ කළා. එම වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඕන එකක් නයා කර ගන්න- *[බාධා කිරීමක්]* මම මෙහෙන් resign වෙලා යනවා. පස්සේ ඔයගොල්ලෝ නයා කර ගන්න- *[බාධා කිරීමක්]* මට ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, 2006 යුද්ධය ඕනෑ කියලා පෙළපාළි ගිය මේ කට්ටිය ඇවිල්ලා දැන් කියනවා, "දෙමළ මිනිස්සු අපේ මිනිස්සු" කියලා. මේ ගොල්ලොන්ගේ කැබිනට් මණ්ඩලයේ ඉන්න, එක දෙමළ පුද්ගලයෙකුට හරි අත ඔසවන්න කියන්න. එක්කෙනෙක්වත් නැහැ. Clean Sri Lanka වුණාට කැබිනට් එක ඇතුළේ දෙමළ කථා කරන එක පුද්ගලයෙක්වත් නැහැ. සමහරු ගෙන්නලා -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒවා ගෙන්නලා- කියන්න එපා, "දෙමළ" කියලා. ඒවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අපි තනිකර දෙමළ. මම බුද්ධාගමට ගරු කරන කෙනෙක්. හැබැයි මම තනිකරම දෙමළ. මම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නෙවෙයි. ඔය ඉස්සරහා පේළියේ ඉන්න ඔක්කෝම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අල්ලපු ගෙදර, ඉස්සරහා ගෙදර- *[බාධා කිරීමක්]* උදේ මට එක්කෙනෙක් කිව්වා නේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැබැයි, මම එහෙම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වෙලා ආවේ නැහැ. රාමනාදන්ට දාව ඉපදිච්ච පුද්ගලයෙක්, මම. ඒ නිසා මතක තියා ගන්න- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රීති ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අර්ච්චුනා මන්ත්‍රීතුමා මලෙයහම් ජනතාව එල්ල කර ගනිමින් ජාතිවාදී ප්‍රකාශ මේ සභාවේදී සිදු කරනවා. එම ප්‍රකාශ සිදු කිරීමට ඉඩ නොදෙන ලෙස බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම මේ කියෙව්වේ, මම දෙමළ පුද්ගලයා කියලා කිව්වාට පස්සේ සිංහල ජනතාව ගහපු comments. මේවා දෙමළ මිනිස්සු comment කරපු ඒවා නොවෙයි. සිංහල අයට අපි ආදරෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගරු සභා ගැබේ භාවිත කරන වචන පිළිබඳව සැලකිලිමත් වෙන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හරි, හරි. මම ඉස්සරහට ඉගෙන ගෙන එන්නම්. හැබැයි, මට දන්න සිංහලෙන් කියන්න දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please use sober language.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එහෙම නම්, ඔබතුමිය ඕක දෙමළෙන් කියන්න බලන්න. මට කථා කරන්න දීලා තියෙන්නේ විනාඩි 7යි. ඒකෙනුත් විනාඩි 2ක් ඔය බබ්බු ටිකක් නැඟිටලා සම්පූර්ණයෙන්ම නාස්ති කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ප්‍රවීණත්වය ඇති භාෂාවක් මේ සභා ගැබේ කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කරුණාකරලා මට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ප්‍රවීණත්වය ඇති භාෂාවකින් කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔය ගොල්ලොන්ගේ පෙප්පොන්ගේ පාට් එක මම පෙන්නන්නම්.

2004 සුනාමි එන කොට මේ පෙප්පෝ ටික තමයි නැඟිටලා කිව්වේ, දෙමළ මිනිස්සුන්ට සත පහක්වත් දෙන්න එපා කියලා. මතක නැද්ද, ඔය ගොල්ලන්ට? සුනාමිය ආවාම, දෙමළ මිනිස්සු ඔක්කෝම මරා ගන්න කියලා, සත පහක්වත් දෙන්න එපා කියපු මිනිස්සු අද නැඟිටලා යුඑන්පීකාරයන්ට කියනවා මිනීමරුවෝ, අපේ library එක පිච්චුවා කියලා. අනේ! ඒ ගොල්ලෝ පිච්චුවේ අපේ library එක විතරයි. ඔයගොල්ලන් තනිකරම පිච්චුවා අපේ ඔක්කොම. 2009 යුද්ධය අවසන් කළේ- *[බාධා කිරීමක්]* මේ ඔක්කොම ගිහිල්ලා අරවා, මේවා- *[බාධා කිරීමක්]* මම ඒවා කියන්න කැමැති නැහැ, හැන්සාඩ් එකේ පළවෙන නිසා. යට තිබෙන ඔක්කෝම බෙදලා සපත්තු ටික ගලවලා ඔළුවට දාගෙන ගියේ අපිද? අපි දෙමළ. හැබැයි, අපි සිංහල අයට ආදරෙයි. ඒ නිසා තමයි මෙන්න මේ වාගේ comments ඇවිල්ලා තිබෙන්නේ. මට බොරු කියන්න බැහැ, මම දෙමළ නෙවෙයි කියලා. මම සිංහල කෙනෙක් නෙවෙයි, මුස්ලිම් කෙනෙකුත් නෙවෙයි. මම කලින්ම පිළිගන්න ඕනෑ, මම දෙමළ කෙනෙක් කියලා.

මම ඔබතුමන්ලාට තව එකක් කියන්නම්. උතුරේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් ආණ්ඩුවේ ඉන්නවා නේ. ඒ එක පුද්ගලයෙකුටවත් මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ ඉඩක් දුන්නාද? මුස්ලිම් මන්ත්‍රීවරු එක්කෙනෙකුටවත් කැබිනට් මණ්ඩලයේ ඉඩක් දුන්නාද? නැහැ. ඔක්කෝම දීලා තිබෙන්නේ ත්‍රිකුණාමලයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ අය original Tamil නෙවෙයි. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගෙනැල්ලා Tamil කියලා පෙන්වන්න යන්න එපා. ඕනෑ නම් අපි විවාදයක් කරලා බලමු, ඒ කාටද දෙමළ පුළුවන් කියලා.

මම ස්තුතිවන්ත වෙනවා, අපේ විපක්ෂ නායකතුමාට. මේ සභාවට ආපු මුල් දවසේ මම එතුමාගේ පුටුවේ වාඩි වුණා. හැබැයි, අද මට මඩ ගහන කොට ගරු විපක්ෂ නායකතුමා විතරයි නැඟිටලා කථා කළේ. වෙන කවුරුවත් නැඟිටලා කථා කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තව එකක් කියන්න කැමැතියි. මේ ගොල්ලෝ උතුරට ඇවිල්ලා මුල්ගල් තියනවා. මිනිස්සු දැන් ඒ ගල් ටික අරගෙන ගෙදර යනවා. අපි ආවේ, කළු ජූලිය ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේ Debate එකකට නෙවෙයි. පලාලිවල මිනිස්සු ඉන්න ඉඩම් නැතුව පෙළපාළි කරනවා. ගිහිල්ලා බලන්න. මිනිස්සු එහේ උද්ඝෝෂණ කරනවා. හැබැයි, ඔය ගොල්ලන්ගේ ආරක්ෂක නියෝජ්‍ය ඇමති ඇවිල්ලා කියනවා, මිනිස්සු උද්ඝෝෂණය කරන්නේ නැහැ කියලා. ඒක කොච්චර පට්ටපල් බොරුවක්ද කියන්න කෝ. එතකොට සිංහල සමාජයේ ඔක්කෝම හිතනවා, දෙමළ මිනිස්සු මේ ගොල්ලන් එක්ක එකතු වෙලා ඉන්නේ කියලා. එහෙම එකතු වෙලා නැහැ අනේ. ඔය පුටුවේ කලින් වාඩි වෙලා හිටපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සමහර වෙලාවට මම මානසික රෝගියෙක් වෙන්න පුළුවන්. මම එකක් කියන්නද? මම homosexual නෙවෙයි. මට ඒක කරන්න බැහැ. ඔය ගොල්ලන්ගේ ඇමතිලාටයි, ඔය පුටුවේ වාඩි වෙන එක්කෙනාටයි කියන්න,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Use sober language, Hon. Member.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you so much.

ඒක හැන්සාඩ් එකෙන් අයින් කර ගන්න. මම යනවා මගේ ගෙදර. මම මේ පාර්ලිමේන්තුව දාලා යන්නේ. 2029දී මම එනවා. හරි ද? හැබැයි, මට දුකයි. ඒ කාලය වෙනකොට ඔයගොල්ලන්ට කවුරුවත් නැතිව යනවා. ඒකයි දුක. මම ඉඳලා ගහන්න කැමැතියි. දැක්කාද, අර චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කිව්වා, 25වැනි දා හිරේ දාන්න යනවා කියලා. ඒ වාගේ මගේ නඩුවත් ඔයගොල්ලන් කැමති විධියට ඉවර කරලා මාව හිරේ දාන්න. හැබැයි, මම නම් මේ රට දාලා යන්නේ නැහැ. මම සිංහල අයට ආදරෙයි; මුස්ලිම් අයට ආදරෙයි. ඇත්ත මුස්ලිම් මිනිස්සු ඉන්නවා; ඇත්ත සිංහල මිනිස්සු ඉන්නවා මේ පැත්තේ. ඒ මිනිස්සුන්ට ආදරෙයි;

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අපි ආදරේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.05]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமசந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மிக முக்கியமானதொரு விடயம் தொடர்பான விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது.

இலங்கை வரலாற்றில் கறுப்புப் புள்ளியை ஏற்படுத்திய ஒரு சம்பவம்தான் 1983ஆம் ஆண்டு நடைபெற்ற கறுப்பு யூலை கலவரம். அதனைத் தொடர்ந்து இலங்கையில் யுத்தம் தீவிரமடைந்தது. அதுமாத்திரமல்ல, மக்களுக்கு இடையிலும் இனங்களுக்கு இடையிலும் பல்வேறுபட்ட விரிசல்கள் ஏற்பட்டன. இதனால் இந்த நாட்டில் சொல்லொணா துயரங்களுக்கு மக்கள் முகங்கொடுக்க வேண்டிய நிலைமை ஏற்பட்டது.

கடந்த 2024ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் இந்த நாட்டு மக்கள் மிகவும் முக்கியமானதொரு தீர்மானத்தை எடுத்திருந்தார்கள். அதாவது, தேசிய மக்கள் சக்தியை ஆட்சிபீடம் ஏற்றியிருந்தார்கள். அதன் பிரகாரம், இன்று நாங்கள் இனவாதம், மதவாதம், அடிப்படைவாதம் இல்லாத நாட்டைக் கட்டியெழுப்பி வருகின்றோம். இது இலகுவான ஒரு விடயம் அல்ல. பல்வேறு தரப்பட்ட நபர்களுக்கு இனவாதம் தேவைப்படுகின்ற வேளையில், அதனைத் தோற்கடித்து ஓர் உறுதியான கட்டமைப்பை ஏற்படுத்துவது என்பது இலகுவான ஒரு விடயம் அல்ல. ஆனாலும், இன்று நாங்கள் பல்வேறுபட்ட சவால்களுக்கு மத்தியில் அதனை வெற்றிகரமாகச் செய்து வருகின்றோம். ஆங்காங்கே சில சவால்கள் ஏற்பட்டாலும், அவற்றையும் நாங்கள் தோற்கடித்து வருகின்றோம்.

கடந்த சில நாட்களாக திருகோணமலை மாவட்டத்தில் ஒரு துரதிருஷ்டவசமான சம்பவம் இடம்பெற்று வருகின்றது. திருகோணமலையிலுள்ள கன்னியா வெந்நீர் ஊற்றுப் பிரதேசமானது, தொல்லியல் சார்ந்த ஒரு பிரதேசமாகப் பிரகடனப்படுத்தப்பட்டு இருப்பது எங்களுக்குத் தெரியும். எங்களுக்குத் தெரிந்த காலத்திலிருந்தே அந்தப் பிரதேசத்தில் விநாயகர் - பிள்ளையார் கோவில் ஒன்று இருந்தது. பல்வேறு சான்றுகளின் அடிப்படையில், அந்த இடம் பௌத்த தொல்லியல் இடமாகவும் அடையாளம் காணப்பட்டு இருக்கின்றது. இதனை நாங்கள் overlapping history என்று சொல்வோம். எது எவ்வாறு இருப்பினும், இது சம்பந்தமாகப் பல்வேறு தரப்பட்ட வாதங்களும் தீர்ப்புகளும் இருக்கின்றன. இந்த விடயம் தொடர்பில் இணக்கப்பாடு எட்டப்பட்டிருந்தது.

குறிப்பாக, Case No. HCT/Writ/590/19 தொடர்பான நீதிமன்ற ஆணையின் பிரகாரம், சில தீர்மானங்கள் எட்டப்பட்டு இருந்தன.

"1. The 1st Respondent would continue the conservation and maintenance of the monuments more fully described in the Gazette Notification marked and annexed as P4 to the petition;

2. The 1st Respondent agrees that, as far as the ancient structures/ Stupa referred to in the said Gazette Notification are concerned, the conservation only referred to in Term 01 will be carried out according to the plan marked and annexed as A 1 to these terms;

3. The parties agree that the Petitioner could use the portion of land demarcated by the following Global Positioning System (GPS) coordinates for building a Pillayar Temple to place the Statue subject to Clause 4;......"

"4. The parties agree that in the event any construction is carried out by the Petitioner and/or any other person acting under his authority within the portion of land referred to in Term 03, such construction will be carried out under the supervision of the 1st Respondent and in terms of the provisions of law, particularly the Antiquities Ordinance (As amended);"

இவை இணக்கப்பாடு எட்டப்பட்ட விடயங்களாகும். இந்த விடயத்தில் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்கள்தான் சட்டத்தரணியாக முன்னின்றிருக்கிறார். அங்கு புதிய கட்டுமானமொன்றை ஏற்படுத்தாத வகையில், புனர்நிர்மாணம் செய்யும் நோக்கத்துடன் அல்லது அந்த இடத்தைப் பாதுகாக்கும் - conservation - நோக்கத்துடன் தீர்மானமொன்று எடுக்கப்பட்டு இருந்தது. தொல்லியல் திணைக்களம் மூலமாகத்தான் இத்தீர்மானம் எடுக்கப்பட்டு இருந்தது.

இதனை மேற்கொண்ட விதம் சரியா, பிழையா என்ற விடயம் தொடர்பில் அவர்களுக்கு நீதிமன்றம் செல்ல முடியும். அதாவது, இந்த விடயத்தைச் சட்டத்தின் மூலமாக அணுக

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

முடியும். ஆனால், அங்கு மோசமான இனவாதம் விதைக்கப்பட்டு, மீண்டும் பல்வேறுதரப்பட்ட அரசியல் சார்ந்த நடவடிக்கைகளை அரங்கேற்றுவதற்கான முன்னெடுப்புகள் முன்னெடுக்கப்படுகின்றன. இன்றைய தினம்கூட அவர்கள் நீதிமன்றத்துக்குச் சென்றிருந்தார்கள். நான் அவர்களுக்கு ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். அங்கு contempt of court என்ற விடயம் தொடர்பில் அவர்கள் நிச்சயமாகக் கேட்டிருக்க வேண்டும். தொல்பொருள் திணைக்களமானது குறித்த கட்டுமானத்தைப் பாதுகாக்கும் நோக்கத்துடன் அல்லது அதை மீளவும் புதிதாகக் கட்டாமல் புனர்நிர்மாணம் செய்யும் நோக்கத்துடன் இதனைச் செய்திருந்தால் பிரச்சினை இல்லை! எனினும், சட்டத்துக்கு முரணாக தீர்மானங்களை அல்லது நடவடிக்கைகளை மேற்கொண்டிருந்தால், அதற்கு எதிராக நிச்சயமாக அவர்கள் நீதிமன்ற அவமதிப்பு என்ற விடயத்தைக் கையில் எடுத்திருக்க முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Your time is up, Hon. Deputy Minister.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஆட்சிபீடம் ஏறியதிலிருந்து - கடந்த இரண்டு வருட காலப்பகுதியில் - தொல்லியல் திணைக்களமானது கடந்த காலங்களில் இயங்கியதைப்போல் அல்லாமல், ஏனைய மதம் சார்ந்த விடயங்களையும் கருத்திலெடுத்துச் செயற்பட்டு வருகின்றது.

குறிப்பாக, 10ஆம் நூற்றாண்டு காலப்பகுதியைச் சேர்ந்த பழைமைவாய்ந்த மண்ணித்தலை சிவன் ஆலயம், கௌதாரிமுனை பிள்ளையார் கோவில், பருத்தித்துறை மணற்காடு தேவாலயம், காங்கேசன்துறை கலங்கரை விளக்கம், காரைநகர் கலங்கரை விளக்கம், பருத்தித்துறை கலங்கரை விளக்கம், மந்திரிமனை, சங்கிலியன்தோப்பு, திருகோணமலை மாவட்டத்துக்கு உட்பட்ட திருமங்களாய் சிவன் கோயில் உள்ளிட்ட பல இடங்களைப் பாதுகாக்கும் நோக்கத்துடன் அல்லது அவற்றைப் புனர்நிர்மாணம் செய்யும் நோக்கத்துடன் அது இயங்கி வருகின்றது.

நான் ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். 2019ஆம் ஆண்டு காலப்பகுதியை - இந்த விடயம் தொடர்பான தீர்ப்புகள் வெளிவந்த காலப்பகுதியை - நாங்கள் எடுத்துப் பார்த்தால், அந்தக் காலப்பகுதியில் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள்தான் கலாசார அலுவல்களுக்குப் பொறுப்பான அமைச்சராக இருந்தார். அவர் அங்கம்வகித்த நல்லாட்சி அரசாங்கத்துக்கு முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்கள் வெளியேயிருந்து ஆதரவு வழங்கியிருந்தார். அதுமாத்திரமல்ல, அப்போது நடைபெற்ற சனாதிபதித் தேர்தலில்கூட நிபந்தனையின்றிய ஆதரவை வழங்கியிருந்தார். எனவே, இவர்கள் இந்த விடயத்தைப் பேசித் தீர்த்திருக்க முடியும். வேண்டுமென்றால், குறித்த வர்த்தமானி அறிவித்தலை மீளப்பெற்றிருக்க முடியும். அவ்வாறு செய்யாமல், இன்று எமது அரசாங்கத்தின்மீது விரல் நீட்டுவதை எங்களால் ஒருபோதும் ஏற்றுக்கொள்ள முடியாது. எனவே, இந்த விடயத்தில் விழிப்புணர்வோடு செயற்படுமாறு நாங்கள் மக்களைக் கேட்டுக்கொள்வதுடன், இங்கு நீதிமன்ற அவமதிப்பு இடம்பெற்றிருந்தால் அதற்கு எதிராக நடவடிக்கை எடுக்குமாறும் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.13]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම 83 කළු ජූලිය ගැන කථා කළොත්, ඒක ඉතාම අවාසනාවන්ත සිද්ධියක්. අපි ඒ සම්බන්ධයෙන් බෙහෙවින්ම කනගාටු වෙනවා. "1983 වසරේ සිදු වූ 'කළු ජූලිය' යනු හුදෙක් දේශපාලන වුවමනාව මතම නිර්මාණය කරන ලද්දකි" යනුවෙන් තමයි මේ කල් තැබීමේ යෝජනාව පටන් ගන්නේ. ඇත්තටම හරි දේ තමයි මේ පළමුවැනි යෝජනාවෙන්ම කියා තිබෙන්නේ.

කළු ජූලිය සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් දිහා බැලුවාම, එක පැත්තකින්, එවකට රාජ්‍ය නායකත්වය දැරූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඇතුළු රජයට ඒ ජීවිත ආරක්ෂා කරන්න වගකීමක් තිබුණා. ඒක අපිත් පිළිගන්නවා. ඒකේ ගැටලුවක් නැහැ. ඒ වගකීම එතුමන්ලාට තිබුණා. හැබැයි, රාජ්‍ය බුද්ධි අංශ තොරතුරු අනුව බලලා එවකට පක්ෂ ගණනාවක් තහනම් කරනවා. ඒවා අතර මුලින්ම තිබුණු පක්ෂයක් තමයි තමුන්නාන්සේලාගේ JVP එක. ඒ නිසා අපි කියනවා, තමුන්නාන්සේලාට මේකෙන් මඟ හරින්න බැරි බව. අද තමුන්නාන්සේලා මොනවා කථා කළත්, ඒ හැම සිද්ධියක් පිටුපසම එදා ප්‍රචණ්ඩත්වය, ඒ වාගේම ජාතිවාදී තත්ත්වය තිබුණා. තමුන්නාන්සේලාගේ පක්ෂය ආරම්භයේ ඉඳලාම ඒ දේවල් තිබුණා කියන එක පැහැදිලියි. ඒ නිසා තමයි තමුන්නාන්සේලා ඉන්දියානු ව්‍යාප්තවාදයක් ගැන කථා කළේ. ඊට පසුව තමුන්නාන්සේලා ඒ ඉන්දියානු ව්‍යාප්තවාදයටත් එහා ගිහිල්ලා කටයුතු කළා. 1965දී JVP එක ආරම්භ කරන කොට, "ඉන්දියානු ව්‍යාප්තවාදය සහ කඳුකර සෝදාපාලුව" ගැන කථා කළා; පන්ති 5 පැවැත්වූවා. මේ විධියට තමයි තමුන්නාන්සේලා ඒ වැඩ කටයුතු ආරම්භ කළේ. මේක තමයි ඉතිහාසය. අවුරුදු 43කට පස්සේ ඒ ඉතිහාසය ගැන තමුන්නාන්සේලා කථා කරනවා නම්, මේ ඉතිහාසය ගැන කථා කරන්න අපටත් අයිතිය තිබෙනවා.

ගරු සභානායකතුමා කථා කරද්දී කිව්වා, 1983දී එක්සත් ජාතික පක්ෂය තමයි තුවක්කු අතට ගත්තේ කියලා. මම පැහැදිලිවම කියනවා, නිදහසින් පස්සේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පෙරළන්න ඉස්සෙල්ලාම තුවක්කු අතට ගත්තේ 71 කැරැල්ලේදී තමුන්නාන්සේලා බව. එහෙම නම්, මේ මුල අමතක කරලා අපට මේ ගැන කථා කරන්න බැහැ. අපි මේවා කථා කරන්න නොවෙයි හිටියේ. නමුත්, තමුන්නාන්සේලා කියපු නිසා කියන්න වෙනවා. අලුතින් ඉපදුණු බබාලා වගේ අද අපි කථා කරලා වැඩක් වෙන්නේ නැහැ. මේ රටේ ඉතිහාසය මේ රටේ ජනතාව දන්නවා. ඒක සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා නැතිව හැම කෙනෙක්ම දන්නවා. ඒවා ගැන දන්නේ නැතිව ඉන්නවා නම් ඉන්නේ අලුත් කණ්ඩායමක් විතරයි. ඉතිහාසය පරීක්ෂා කර බලන ඕනෑම කෙනෙකුට ඒවා ගැන දැනගන්න පුළුවන්. අපි පැහැදිලිව කියනවා, 1983දී ඇති වුණු එම සිද්ධිය ඉතාම අවාසනාවන්ත සිද්ධියක් බව. එවකට පාසල් ගිය ශිෂ්‍යයන් හැටියට අපට ඒ සිදුවීම්

මතකයි. මම කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ 10 වසරේ, එහෙම නැත්නම් O/L පන්තියේ ඉන්න කොට එදා වෙච්ච සිදුවීම් මට මතකයි. එදා පාසල උදේ 10.00වන කොට වැහුවා. හැබැයි අපි එළියට එද්දී දැක්කා, බොරැල්ලේදී ඇති වුණු සිද්ධි කොහොමද වුණේ කියලා. අපි එදා ශිෂ්‍යයන් හැටියට කොළඹ ඇවිදින කොට දැක්කා ඒ වෙච්ච අවාසනාවන්ත සිද්ධි. එම නිසා එවැනි ඉරණමක් මේ රටේ කිසිම පුද්ගලයකුට අත් වෙන්න ඕනෑ කියා අපි හිතන්නේ නැහැ.

අපි පැහැදිලිවම මේ කාරණයත් කියන්න ඕනෑ. අද තමුන්නාන්සේලා බලයට පත්වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුව තුළ 159ක බලයක් දීලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ රටේ සමගිය වෙනුවෙන් මොනවාද ක්‍රියාත්මක කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා මේ වෙනකොට අවුරුදු එකහමාරකට වඩා ගතවෙලා තිබෙනවා. තමුන්නාන්සේලා අවුරුදු 43ක් පැරණි මේ වාගේ දේවල් අද මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ, ඒවා නැවත මතක් කරලා, හිත් පාරලා ජාතිවාදයක් ඇති කරන්නද?

1988දී පළාත් සභා ක්‍රමය සඳහා ඉන්දු-ලංකා ගිවිසුම ගේනකොට තමුන්නාන්සේලා මොකක්ද කිව්වේ? තමුන්නාන්සේලා විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ, පාසල් ශිෂයෝ ඇතුළු හැම කෙනෙක්ම පාරට ගෙනාවා. පාරට ගෙනැල්ලා විශාල විනාශයක් ආරම්භ කළා. පළාත් සභා මැතිවරණය ගේනකොට ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? පළාත් සභා මැතිවරණයේදී ඡන්දය දෙන පළමුවැනි පුද්ගලයන් පස්දෙනා ඝාතනය කරනවා කිව්වා. ඒක කිව්වා විතරක් නොවෙයි, ඝාතනය කළා. අද තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව මොන ක්‍රමයෙන් හරි ප්‍රජාතන්ත්‍රවාදී විධියට බලය දීලා තිබෙනවා. එහෙනම් මේ රටේ ප්‍රශ්නවලට තමුන්නාන්සේලා විසඳුම් ලබා දෙන්න. අපි කියනවා, ඒ සඳහා ඉස්සෙල්ලාම පළාත් සභා මැතිවරණය පවත්වන්න. අනුර කුමාර දිසානායක මැතිතුමා එදා විපක්ෂය පැත්තේ ඉඳගෙන පළාත් සභා මැතිවරණය තියන්නේ නැහැ කියලා ආණ්ඩු ගණනාවකටම චෝදනා කළා. ඒ නිසා අපි කියනවා, පුළුවන් තරම් ඉක්මනට මේ වසර ඇතුළතදී හෝ එහෙම නැත්නම් ලබන අවුරුද්දේ මුල හෝ පළාත් සභා මැතිවරණය පවත්වන්න අවශ්‍ය පියවර ගන්න කියලා. අධිකරණ ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. අවශ්‍ය නම් ඒ සඳහා පාර්ලිමේන්තුවට යෝජනාවක් ගේන්න. ඒකට අපේ සහාය දෙන්නම් කියලා අපි හැම වෙලාවේම කියලා තිබෙනවා. සීමා නිර්ණය කමිටු දමාගෙන මේකට කල් ගන්න අවශ්‍ය නැහැ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑම කෙනෙක් පැහැදිලිව දන්නා විධියට, පළාත් සභා මැතිවරණය තියන්න නම් පාර්ලිමේන්තුවට අලුත් යෝජනාවක් ගේන්න ඕනෑ. පරණ ඡන්ද ක්‍රමයට මේ පළාත් සභා මැතිවරණය තියන්න මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාම එකඟ වෙයි, තමුන්නාන්සේලා 159දෙනා එකඟ නම්. නමුත් ඒක නවතාගෙන ඉන්න තමයි මේ සීමා නිර්ණ කමිටු වාගේ නොයෙකුත් දේවල් දමාගෙන කල්ගත කරන්නේ. මේ රටේ ජාතික සමගිය ඇති කරන්න ආරම්භ කරපු ඒ පළාත් සභා ක්‍රමය පවත්වාගෙන යන්න නම්, තමුන්නාන්සේලා ඒ මැතිවරණය පවත්වලා උතුර, නැඟෙනහිර සහ අනෙකුත් පළාත්වල ඉන්න ජනතාවගේ අයිතිය ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න. ඒකට ඕනෑ තරම් කල් තිබුණා. අපි විපක්ෂයක් හැටියට ඕනෑම වෙලාවක ලැහැස්තියි පාර්ලිමේන්තුව තුළදී ඒ සඳහා අපේ සහයෝගය ලබා දෙන්න.

මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ යෝජනාවේ අරමුණ ගැන. තමුන්නාන්සේලා මේවා නැවත නැවත මතක් කරලා පක්ෂවලට මඩ ගහන්න කල්පනා කරනවා නම්, මම නම් හිතන්නේ නැහැ ඒකෙන් ප්‍රතිඵලයක් ලැබෙයි කියලා. මම පැහැදිලිව කියනවා, මේ තත්ත්වය තුළ ඔබට කරන්න තිබෙන්නේ, මේ රටේ සියලු ජනතාව වෙනුවෙන් - සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා වෙනුවෙන් - ගතයුතු පියවර ගැනීමයි. තමුන්නාන්සේලා ජනතාවට දුන් මැතිවරණ පොරොන්දු ටික ඉටු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කරන්න. අන්න ඒක තමයි මේ රටේ විය යුත්තේ කියන එක මතක් කරමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.20]

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 5 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது.

1956இலேயே எம்மீதான இனக்கலவரத்துக்கு நீதி கிடைத்திருந்தால், 2009 வரை இனப்படுகொலைகள் தொடர்ந் திருக்காது. எமக்கு அரணாகுதலே இத்தீவில் நல்லிணக்கம். ஈழத்தமிழர்களும் ஈழத்தமிழர்களின் சார்பாளர்களாக இந்தப் பேரவையில் கடந்த காலங்களில் இருந்தவர்களும் இப்போது இருக்கின்றவர்களாக நாமும் நல்லிணக்கத்துக்கு எதிரான வர்கள் அல்லர். ஈழத்தமிழர்களாகிய நாங்களும் எமது தாயகத்தில் தன்னாட்சி அதிகாரங்களோடு ஒரு தேசிய இனமாக வாழ வேண்டும் என்பதே எங்களின் அன்று தொட்டு இன்றுவரையான அடிப்படைக் கோரிக்கையும் அரசியலும். ஈழத்தமிழர்கள் ஒட்டுமொத்த தீவையும் அளவற்று நேசித்த வர்கள்; நேசிப்பவர்கள்.

தீவு முழுமைக்கும் படர்ந்திருந்த எங்கள் வாழ்வும் வளமும் காலவெளியிலே அடக்குமுறைகளால் சுருக்கப்பட்டன. எண்ணிக்கையில் சிறுபான்மையினருக்கு அரணாகுதல் என்பதே பல்லினவாழ் சமூகத்தின் நிலைபேறான எழுச்சிக் கான அடிப்படை! ஆனாலும், இத்தீவின் அதிகாரம் பிரித்தானியரிடம் இருந்து கைமாற்றப்பட்ட பின்னர், மாறிவரும் ஒவ்வோர் அரசாங்கமும் அந்த அடிப்படைக் கருத்தியலைக் கையிலெடுக்கவில்லை. மாறாக, ஈழத்தமிழர் களின் உரிமைகளை நேரடியாகவும் கட்டமைக்கப்பட்ட வழிகளிலும் கட்டுப்படுத்தியது; கட்டுப்படுத்துகிறது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 'கறுப்பு யூலை' என்பது ஈழத்தமிழர் அழிப்பில் தொடக்கப் புள்ளியும் அல்ல; முற்றுப்புள்ளியும் அல்ல. மாறாக, கட்டமைக்கப்பட்ட இன அழிப்பு வெளியில் கறுப்பு யூலை ஒரு காற்புள்ளி! கல்லோயா குடியேற்றத் திட்டங்களுக்காக 1956இல் கொல்லப்பட்டோம்; எங்கள் வாழிடங்களிலிருந்து அப்புறப்படுத்தப்பட்டோம். தனிச் சிங்களச் சட்டத்தை எதிர்த்தோம். அதனால் 1958இல் மீண்டும் கொல்லப் பட்டோம்.

அஹிம்சை வழியில் எங்களின் உரிமைக்குரல் உயரும்போதெல்லாம் அரச இயந்திரத்தின் துணையோடு எம்மீதான அடக்குமுறைகள் இனக்கலவரங்களாகத் தொடர்ந்தன. 1977ஆம் ஆண்டின் பின்னர், 1981இல் யாழ்ப்பாணத்தில் நேரடியாக எங்கள் நூலகமும் கடைகளும்

[ගරු තුරෙෙරාසා රවිකරන් මහතා]

சொத்துகளும் அரச ஆதரவோடு எரித்து நாசமாக்கப்பட்டன. அதன் பின்னரே இன்றைய ஒத்திவைப்பு வேளையில் உரையாடப்படும் கறுப்பு யூலைக் கலவரம் அரங்கேறியது. ஈழத்தமிழர்கள் உயிரோடு எரிக்கப்பட்டார்கள்; சொல்லொணா உயிர், உடைமை இழப்புகளுக்கு உள்ளாக்கப்பட்டார்கள். பன்னாட்டு நீதித்துறை வல்லுநர்கள் ஆணையம் - ICJ - இதனை இனப்படுகொலையென விபரித்தது. இதன் தொடர்ச்சியாக சிறைகளுக்குள்ளும் அரச ஆதரவோடு தமிழர்கள் மீதான இனக்கலவரங்கள் கட்டவிழ்த்து விடப் பட்டன. 1983இல் வெலிக்கடைச் சிறைச்சாலையில், 1997இல் களுத்துறைச் சிறைச்சாலையில், 2000இல் பிந்துனுவெவ சிறைச்சாலையில் என இப்பட்டியல் நீண்டது.

பல்லினவாழ் சமூகம் இத்தீவில் மட்டும் வாழவில்லை. பல்லினவாழ் சமூகம் வாழும் அனைத்து இடங்களிலும் இவ்வாறான அடக்குமுறைகளும் இனக்கலவரங்களும் தொடர்ச்சியாக ஏவப்படுவதில்லை. எங்களுக்காக இறந்த எங்களின் உறவுகளை நினைவேந்த இயலுமாக இருப்பதுதான் சுதந்திரம் என்று இருக்கும் நிலைக்கு இத்தீவில் இன்று சுதந்திரம் சுருக்கப்பட்டுவிட்டது. உரத்துக்கேட்டு உயிர்மாய்த்து இன்று செம்மணியில் என்புகளாகியும் இந்தத் தீவிலே எங்கள் நீதியை வேண்டிக்கொண்டு இருக்கின்றோம். செம்மணி உங்களுக்கு ஆப்பு என்பதையும் சொல்லுகின்றேன்.

அடக்குமுறையே சமஷ்டியைக் கோரியது; தனி ஈழத்தை தீர்வாக்கியது; இன்றளவும் இத்தீவில் இயல்பான எங்களை வேறுபட்டவர்களாகக் காட்டுகின்றது. எங்களின் நீதிக்காக நீங்களும் குரல்கொடுங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Madam, please give me one more minute.

எங்களுக்காகப் பல்வேறு வழிகளிலும் போராடியவர்கள் அரசியல் கைதிகளாக சிறையிலே வாடும்போது நல்லிணக்கம் எப்போது மலரும்? கடைசி அரசியல் கைதியும் சிறையில் மரணிக்கும்வரைகூட, இந்த அரசின் நெஞ்சும் கல்லாகித்தான் கிடக்குமா?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute.

இது பற்றி நாங்கள்தான் கதைக்க வேண்டும். நேரத்தை மட்டுப்படுத்தினால் நாங்கள் என்ன செய்வது? யார் யாரோ கதைக்கிறார்கள்; சண்டை பிடிக்கிறார்கள். நாங்கள் கதைக்கும்போது நேரத்தைச் சுருக்குகிறீர்கள்!

அரசே ஆதரவாக நின்று மேற்கொண்ட குற்றங்களுக்கு அரசு எவ்வாறு தீர்வு கொடுக்கும்? தீர்வு கொடுக்க இயலும்? பன்னாட்டு விசாரணைகளுக்காகக் குரல்கொடுங்கள்! ஈழத் தமிழர்கள் ஒருபோதும் நல்லிணக்கத்துக்கு எதிரானவர்களாக இருந்ததில்லை. மாறாக, பல்வேறு வழிகளிலும் தம்மைத் தற்காத்தபடி, உயிரிழந்து, உடைமை இழந்து, நிலம் இழந்து, அடையாளங்களை இழந்து தொடர்ந்தும் தமக்கான நீதிக்காகப் போராடிக் கொண்டு இருக்கின்றார்கள். கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, எமக்கு அரணாகுதலே இத்தீவில் நல்லிணக்கம் எனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.26]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම 1983 වසරේ සිදු වූ කළු ජූලියත්, ඒ වාගේම මේවා නැවත වතාවක් ඇතිවෙන්න ඉඩ නොදෙන්න ඕනෑ කියන අදහසත්, ශ්‍රී ලාංකික ජාතියක් නිර්මාණය කළ යුතුයි කියන යෝජනාවත් මේ සභාව කල් තැබීමේ යෝජනාවට ඇතුළත් වෙලා තිබෙනවා. අපි කවුරුවත් කළු ජූලියේ සිදුවීම පිළිගන්නේ නැහැ. ඒක, එදා සිදු නොවිය යුතුව තිබුණු දෙයක් හැටියට තමයි අප සියලු දෙනාම විශ්වාස කරන්නේ. ඒ ගැන තර්කයක් නැහැ. විශේෂයෙන්ම 1948දී අපි නිදහස ලබා ගත්තාට පසුව ශ්‍රී ලාංකික ජාතියක් ලෙස එකම රටක් ගොඩනහන්න අවස්ථාව තිබුණත්, එදා හිටපු දේශපාලන පක්ෂවල නායකයින්ට ඒක කරගන්න නොහැකි වුණා. ඒ නොහැකි වීම නිසාම අපේ රටේ ජාතිවාදී කෝලාහල, වර්ගවාදී කෝලාහල නොයෙකුත් කාලවලදී අපිට දිගටම දකින්නට ලැබුණා. අපි කලින් කලට ඒ සිදුවීම් දැක්කා. ඒක වුණේම අපේ රටේ ශ්‍රී ලාංකික අනන්‍යතාව හදාගන්න පුළුවන්, ජාතික සමගිය ගොඩනහන්න පුළුවන් දේශපාලන ව්‍යුහය අපිට ගොඩනඟාගන්න බැරි වුණු නිසායි. එහි ප්‍රතිඵලය තමයි, 1983 දක්වාම ආවේ.

විශේෂයෙන්ම 1983 සිදුවීමෙන් පසුව, ජේ.ආර් ජයවර්ධන මැතිතුමා - සමහර විට ඒ සිදුවීම නිවැරදි කරගන්න එතුමා මේක කළා වෙන්න පුළුවන් - දෙමළ කථා කරන ජනතාවට මේ රටේ පාලනයට හවුල් වෙන්න පුළුවන්, ඔවුන්ව මේ රටේ පාලනයට හවුල් කරගන්න පුළුවන්, කොළඹ කේන්ද්‍රීය කරගත්ත බලය විමධ්‍යගත කරන්න පළාත් සභා ක්‍රමය යෝජනා කරලා ගෙනාවා, අපි දැක්කා. ඒ විධියට තමයි පළාත් සභා ක්‍රමය ආවේ. විශේෂයෙන්ම මේ රටේ උතුරු, නැඟෙනහිර දෙමළ කථා කරන ජනතාව මුල් කරගෙන, මුළු රටේම සිටින ජනතාව පාලන බලයට හවුල් කරගන්න මේ බලය තවත් විමධ්‍යගත කරන්න තමයි එය ගෙනාවේ. අද මේ යෝජනාව ගෙනාපු තමුන්නාන්සේලා එතකොට මොකක්ද කළේ? තමුන්නාන්සේලා පළාත් සභා ක්‍රමයට එකඟ වුණාද? තමුන්නාන්සේලා මේ රටේ දෙමළ ජනතාවට අයිතිය දෙනවා. එතකොට තමුන්නාන්සේලා එදා ඒකට පක්ෂව සිටියාද? තමුන්නාන්සේලා ඒකට පක්ෂව හිටියේ නැහැ. එදා පළාත් සභා ක්‍රමය ගේනකොට "රට කඩනවා, පළාත් සභා ක්‍රමය එපා, ඡන්දය දෙන අයව ඝාතනය කරනවා" කියලා තමුන්නාන්සේලා කිව්වා. ඊළඟට, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය හදලා කොනක ඉඳන් මිනිස්සු මරන්න පටන් ගත්තා. අද මේ

සභාවේ වාඩි වෙලා ඉන්න අධිකරණ ඇමතිතුමාගේ මහප්පායි, තාත්තායි දෙදෙනාම බොහොම අමාරුවෙන් තමයි එදා ජීවිතය බේරා ගත්තේ. අධිකරණ ඇමතිතුමාට ඒක මතක ඇති කියලා මම හිතනවා. එතුමාගේ මහප්පායි, තාත්තායි පළාත් සභාවට ඉල්ලුවා. පළාත් සභාවට ඉල්ලුවේ කොහොමද? එදා එතුමාගේ තාත්තා තුවක්කු අරගෙන ආරක්ෂා වෙලා තමයි ගියේ. අධිකරණ ඇමතිතුමාගේ එහා පැත්තේ වාඩිවෙලා ඉන්නවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එතුමන්ලා එදා තමුන්නාන්සේගේ තාත්තාවයි, මහප්පාවයි මරන්න හිටපු අය.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමුන්නාන්සේලා එදා මෙතුමාගේ තාත්තාවයි, මහප්පාවයි මරන්න හිටියේ. අද එකට වාඩි වෙලා ඉන්නවා. ඒක හොඳ දෙයක්. එදා තිබුණු වාතාවරණය මම කියන්නේ. අපේ අධිකරණ ඇමතිතුමාට ඒක මතක ඇති කියලා මම හිතනවා.

"පළාත් සභා ක්‍රමය එපා, ඒකෙන් රට කැඩෙනවා" කියන එක තමයි තමුන්නාසේලා එදා හිටපු දේශපාලන මතවාදය. එදා මේ රටේ දෙමළ ජනතාවට යම් අයිතිවාසිකමක් දෙනවා නම් ඒකට විරුද්ධවයි තමුන්නාන්සේලා හිටියේ. අද මොකද වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලා අද මේ යෝජනාව තුළ ශ්‍රී ලාංකික ජාතියක් හදන එක ගැන කථා කරනවා. ඒක හොඳයි. අද ඔබතුමන්ලාට ඒ බලය ලැබිලා තිබෙනවා. "අද අපිට සියලු ජන කොටස් ඡන්දය දීලා තිබෙනවා" කියලා අද කථා කරපු තමුන්නාන්සේලාගේ මන්ත්‍රීතුමන්ලා කිව්වා. ඔව්, ඔවුන් ඔබතුමන්ලාට ඡන්දය දීලා තිබෙනවා. ඔවුන් ඡන්දය දීලා බලාපොරොත්තු වන්නේ මොකක්ද? ජනතාව 1994දී චන්ද්‍රිකා මැතිනියටත් ඡන්දය දුන්නා. චන්ද්‍රිකා මැතිනිය ඒක කළේ නැහැ. චන්ද්‍රිකා මැතිනියගේ අතින් ඒ අවස්ථාව ගිලිහී ගියා. අද ජනතාව තමුන්නාන්සේලාටත් ඡන්දය දීලා තිබෙනවා. අද මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමනි, මේ රටේ ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනඟන්නේ කොහොමද කියන එක ගැන මේකේ යෝජනාවලියක් තිබෙනවාද? මේකේ එහෙම යෝජනාවලියක් නැහැ. එතුමා නිකම් විපක්ෂයට පහර ගහන්න ආයුධයක් හැටියට අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා. එහෙම නැතුව ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟන්නේ කොහොමද කියන එක ගැන අදහසක්වත් මේ යෝජනාව ඇතුළේ එතුමා කියලා නැහැ. විපක්ෂයට පහර ගහන්න නිකම් මේක පාවිච්චි කරලා තිබෙනවා කියලා අපට පෙනෙන්න තිබෙනවා.

තමුන්නාන්සේලා මේක හොඳට මතක තියාගන්න. ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟන්න අවශ්‍ය මූලික පදනම වන දෙමළ කථා කරන ජනතාව මේ පාලනයට හවුල් කර ගන්නා වූ පළාත් සභා ක්‍රමය, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ව්‍යවස්ථාපිතව ඒ ජාතික අනන්‍යතාව හා ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟන්නා වූ ඒ පියවර අද තමුන්නාන්සේලා ගන්නේ නැතුව ඉන්නවා. අද පළාත් සභා මැතිවරණය තියන්නේ නැහැ. අද පළාත් සභා මැතිවරණය මඟහරිනවා. දැන් තමුන්නාන්සේලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මූලික කරගත් ජාතික සමඟිය හා ශ්‍රී ලාංකික ජාතිය ගොඩනැඟීම සඳහා වූ මූලික අභිලාෂය නැතුව "ජාතික සමඟිය හදමු. ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟමු" කියලා කියනවා. ශ්‍රී ලාංකික ජාතිය හා ජාතික සමඟිය හදන්න අවශ්‍ය ඒ මූලික දේවල් ටික නොකර ඉන්නේ ඇයි? මේ ඡන්දය නොපවත්වා ඉන්නේ ඇයි? ඒ ඡන්දය නොපවත්වා ඉදිරියට යන්න එපා කියන එකයි මම මේ තමුන්නාන්සේලාට මතක් කරන්නේ. ඉතිහාසයේ හැම දාම හැම එක්කෙනාම මේ වාගේ කථා කළා. හැම එක්කෙනාම, ජාතික සමඟිය හදමු, අපි අරක හදමු, මේක හදමු කියලා කිව්වා. නමුත් ඒවා ඔක්කෝම වචනවලට විතරයි සීමා වුණේ. කාටවත් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ.

අඩුම ගණනේ, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා එදා පළාත් සභා ක්‍රමය හඳුන්වා දීලා, ඒ හරහා මේ රටේ දෙමළ කථා කරන ජනතාවටත් පාලන ව්‍යූහයට සම්බන්ධ වන්න පුළුවන් ක්‍රමවේදයක් හඳුන්වා දුන්නා. ඒ ක්‍රමවේදය අද වනකොට නැවතිලා තිබෙනවා. අවුරුදු ගණනාවකින් පළාත් සභා මැතිවරණය පවත්වා නැහැ. තමුන්නාන්සේලා බලයට එන්න කලින් විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ඡන්ද campaign එකේදී පැහැදිලිව කිව්වා, පළාත් සභාව ශක්තිමත් කරනවා, පළාත් සභාව තව ඉස්සරහට ගෙනියනවා කියලා, බලය බෙදන එකට එකඟයි කියලා. දැන් තමුන්නාන්සේලා බලයට ඇවිල්ලාත් අවුරුදු එකහමාරක කාලයක් වනවා. නමුත්, තමුන්නාන්සේලා පළාත් සභාව සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය කරන්නත්, පළාත් සභා මැතිවරණය නොතියා ඉන්නත් උත්සාහ කරනවා. මේ සම්බන්ධයෙන් වූ විශේෂ කාරක සභාවට දින දාගෙන හැමදාම නොයෙකුත් ආකාරයේ කථා කියමින් ඒ මැතිවරණය පවත්වන්නේ නැති තත්ත්වයක් අද වනකොට උදා කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ජාතික සමඟිය ගොඩ නඟන්න ඕනෑ. මේ රටේ ජාතික සමඟිය ගොඩ නැඟීම, ශ්‍රී ලාංකීය අනන්‍යතාව ගොඩ නැඟීම අත්‍යවශ්‍ය දෙයක්. ඕනෑම ආණ්ඩුවකට ඉස්සරහට යන්න පුළුවන් වන්නේ ඒ අනන්‍යතාව ගොඩ නැඟීමෙන් හා මේ රටේ ජීවත් වන ජාතීන්ගේ තිබෙන විවිධතාවන් විශ්වාස කරමින්, ඒ විවිධතාවන් පිළිගනිමින් එකතු කර ගත් ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැඟීමෙන්. එය ගොඩනැඟීම සඳහා වූ ජන වරම ඔබතුමන්ලාට ලැබිලා තිබෙනවා. තමුන්නාන්සේලාට ජන වරම ලැබුණාට තමුන්නාන්සේලා ඒ සඳහා වූ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නේ නැහැ.

මේ අවස්ථාවේ මම තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම පසුගිය කාලයේ කොවිඩ්-19 වසංගතය පවතිනකොට ඉතා අසාධාරණ විධියට මේ රටේ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගෙන මුස්ලිම් ප්‍රජාවේ අනන්‍යතාවට ගරු නොකර මුස්ලිම් ජාතිකයින්ගේ මරණත් ආදාහනය කරන්න තමුන්නාන්සේලා තීරණය කළා. ඒ වෙනුවෙන් තමුන්නාන්සේලා ගත්තා වූ ක්‍රියාමාර්ග, ඒක කරපු නිලධාරින්ට, දේශපාලනඥයින්ට විරුද්ධව ගත්තා වූ ක්‍රියාමාර්ග තිබෙනවාද? එහෙම නැහැ. එදා ගෝඨාභය රාජපක්ෂ මහත්මයා, ඒ දේශපාලන නායකත්වය කොරෝනා සිද්ධියෙන් ඒ ආදාහනය සාධාරණීකරණය කරමින් කථා කරනකොට ඒ වෙනුවෙන් පෙනී හිටපු නිලධාරින් අද තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශවල ලේකම් ධුර දරනවා. එහෙම තිබියදී තමුන්නාන්සේලා කියනවා, ජාතික සමඟිය හදන්න ඕනෑ කියලා. ඒ වාගේම කියනවා, අපි මේවාට ඉඩ දෙන්නේ නැහැ කියලා. ඒ වාගේම කියනවා, ජාතිවාදයට ඉඩ දෙන්නේ නැහැ, අපි මේවාට සම්බන්ධ වෙන්නේ නැහැ, සම්බන්ධ වෙච්ච කවුරුවත් අපි ගන්නේත් නැහැ කියලා. නමුත්, පැහැදිලිවම එදා ඒ මුස්ලිම් ප්‍රජාවට වූ අසාධාරණයට, අත් වූ ඉරණමට අද සාධාරණයක් කරන්නේ නැහැ. ආදාහනය බලහත්කාරයෙන් කරපු අය, ඒ වෙනුවෙන් පෙනී හිටපු රාජ්‍ය නිලධාරින්, ඒ වෙනුවෙන් කථා කරපු, ඒක සාධාරණීකරණය කරපු රාජ්‍ය නිලධාරින් අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ සිටීම ගැන අපි කනගාටු වනවා. ඔබතුමන්ලා ඒගොල්ලන්ට ඉන්න ඉඩ දීලා තිබෙනවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මේ යෝජනාවේ එක තැනක තිබෙනවා, "... ආපසු හැරවීම උදෙසා ජාතිවාදී සහ අන්තවාදී පටු දේශපාලන අරමුණු සහිතවූවන් 83 නැවත වෙනත් මුහුණුවරක් ප්‍රතිනිර්මාණය කිරීමට නිරර්ථක උත්සාහයක නිරත වෙමින් සිටී" කියලා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, නැවත වතාවක් 83 ප්‍රතිනිර්මාණය කරන්න උත්සාහ දරනවා කියලා. මම අහන්න කැමැතියි, එහෙම කරන්න උත්සාහ දරන්නේ කවුද කියලා. එහෙනම් ඒ මන්ත්‍රීතුමා ගිහිල්ලා ඒ පුද්ගලයන්ට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් දාලා තිබෙනවාද, ජාතිවාදී ගැටුම් නැවත නිර්මාණය කරන්න යම් කණ්ඩායමක්, යම් ව්‍යාපාරයක් වැඩ කරගෙන යනවා කියලා? එහෙම නැත්නම් ඒගොල්ලන්ව හඳුනාගෙන ඒගොල්ලන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවාද කියලා අපි අහන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්.

අපි විපක්ෂයේ හිටියත් ආණ්ඩුවට කියනවා, අපි ශ්‍රී ලාංකීය අනන්‍යතාව තිබෙන ජාතියක් ගොඩ නැඟීම සඳහා ජාතික සමගිය වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායමක් කියලා. ඒ වාගේම ජාතික ගීයෙන් කියනවා, අපි එක මවකගේ දරුවෝ කියලා. ඒ එක මවකගේ දරුවෝ කියන සංකල්පය මේ මහ පොළොවේ යථාර්ථයක් කරන්න තමුන්නාන්සේලාට වරමක් ලැබී තිබෙනවා. ඒ වරම ඉෂ්ට කරන්න. ඒ වෙනුවෙන් අපේ සහයෝගයත් ලබා දෙනවා කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[5.36 p.m.]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Hon. Presiding Member, today, the Debate on the Adjournment Motion is about the Black July riots of 1983. Why have we decided to speak on that today? Why have we taken up this Adjournment Debate? It is not to blame the past, but to learn from the past and never to repeat the mistakes of the past. It is important that our new generation understands what Black July is and what it did to us, our friendships, our country, our society and to our economy. It is very important. So, we must learn from the past. The whole lesson should be, when we are divided, we would fall and with unity, we would stand tall regardless of race, religion or any other reason. But, quite unfortunately, this simple topic was unable to be comprehended by some of the Hon. Members of the Opposition, who were preaching venomous hatred even today. But, that is up to them; that is their political culture.

Madam, no person is born a racist; no person is born hating another person's race or religion. Hatred is taught; it is learnt. People are born with natural feelings like love, compassion and brotherhood. Those are the feelings that are natural to a human being. So, it is with those feelings and unity that we survived for thousands of years; that is how we survived. And, hatred, racial hatred especially, is being taught for political reasons.

Then, talking about Black July - we have to learn about it - that was the pinnacle or the height of our racist tensions, where so many of our brothers and sisters lost their lives and properties for no fault of theirs, but for belonging to a particular ethnic group. Madam, 1983 සිද්ධි දාමය වෙන්න කලින්, 1948න් පසු වූ සිද්ධි කිහිපයක් තිබෙනවා. මේ දේශපාලන වැරදි සියල්ලම සංකලනය වෙලා තමයි, the 1983 riots transpired. I was only 11 years of age when that happened, and I lived in Kalubowila. As a young boy, what I saw should not be seen by anyone. On that fateful day, first, it was a rumor that was going around saying that the LTTE was coming to Colombo to attack us. Remember, it was at a time when there was no social media, no mobile phones, but only land phones available that the rumour was being spread like a wildfire and in an organized manner. They were sending messages to Kalubowila saying, "Maharagama is flat because, now, the LTTE has attacked Maharagama and people are dying". So, people in Kalubowila panicked. And to Maharagama, they had told, "They have destroyed Kirulapone already. Now, they are coming to your village." How did this organized rumour go around at a time when there were only land phones and no mobile phones or Facebook? It was State-sponsored is my answer. Those rumours were State-sponsored. After 13 soldiers died on that fateful day, the Government at the time - JR's Government - deliberately waited for two days without mobilizing the Police, allowing people to run riot. So, that is why I say J.R. Jayewardene's Government was a terrorist government and it, this attack, was State-sponsored terrorism of the highest order.

I remember that the Tamil people who lived among us lived with no fear. Our cultural identity, our friendship and all were based on that. As a child, I remember that the first sweet I tasted was "*sookiri*" when I was in Jaffna. That is how I remember Jaffna. The first time I ate "*idli*" in my life was in Kandy at Uncle Ganesan's house while we were watching the Kandy Perahera. That is how we were raised and that is what we remember.

In July, 1983, in my house, we had to keep Uncle Ganesan, his wife and his family. When they were seing other places being burnt down, they were in tears inside our rooms, fearing for their lives. Remember, the Sinhala people or the Sri Lankan Colombo people stood by the Tamil people, but the State-sponsored terrorism went on.

My grandfather, Alfred Perera, had been living in Kalubowila since the 1920s. On that day, I was standing with my grandfather by the side of the road only about 100 metres from the Kalubowila Hospital. A group of people had come with electoral registers in their hands, said my grandfather, and had asked him, “Who are you? Are there any Tamil people living in this house?” They had lists with them. And remember, that was not a time when people had WhatsApp. So, how did those goons get all that information? It was State-sponsored and they had electoral registers. The villagers came and said, “This is Alfred Perera. He is a Sinhala man and there are no Tamils living there”, while we had eight to 15 Tamils inside our own house. That is a different matter. So, that is why I say that it was sponsored by the then UNP Government and no one else. Thereafter, I remember, we had to get them out of the country.

My father, being a filmmaker, always believed that we must have a Tamil film industry. So, many years later, he made a movie called “*Anuragam*” and another called “*Nadu Potra Vaalga*”, with which Uncle Ganeshan was involved, both as a producer as well as an actor. It was only much later, in the 1990s, that I realized that Uncle Ganeshan and his wife, who lived with his family in our house, were actually the Hon. Mano Ganesan’s parents. I did not know that earlier; only in the late 1990s I realized that and I spoke to him. So, that is how we looked after each other. At the same time, there was also a great filmmaker called Venkat. We called him Uncle Venkat. He was the director of “*Siri Pathula*”, a movie about the Buddha. My father told him - we were living at No. 15, Peiris Road - “Venkat, do not go out today. Today seems to be a little unsettling. So, you had better stay with us tonight.” He said, “This is my village. Why should I fear? I am the man who made that movie about the Buddha. So, who would touch me?” Only fifteen minutes later, we got the message that he was burned alive inside his own vehicle.

So, we have suffered enough. We have seen enough blood, sweated enough, shed enough tears and that should not happen again. So much so that I, Harshana Nanayakkara, being the Minister of Justice and National Integration, have a particular section in my Ministry which I like the most. That is the section on National Integration, where we work to trace missing persons and bring back people together through the Office for National Unity and Reconciliation. In order to investigate into the missing persons, our Government has spent Rs. 375 million. Right now, there are 75 members serving on 15 panels working to identify what happened to those missing persons, not only after what happened in the North after 2000, but even during 1988 and 1989. So, what happened to those who went missing in the entire Island, we want to find out and bring a closure to those cases. So, as the Minister of Justice and National Integration, I am glad that I spoke today, sharing my personal experiences. As a child, I saw when I was in Kalubowila Junction how they came and killed the man who had been mending our shoes for years in a brutal manner. I had seen the people wounded and who were trying to reach the hospital being beaten up by the racist goons. I feel embarrassed because, now, I meet so many of my friends who are living overseas. After the ‘83 riots, they left this country and they are not here. But, they have forgiven us; those people have forgiven us.

We understand that all this racism has to come to an end. Our Government will make sure that it comes to an end. Why? Why am I, Harshana Nanayakkara - they said a lot of things about 1988, 1989 and the JVP - with such a background, Hon. Rahuman, here? The reason is simple. The reason is, this Government stands by all the human rights and values. We are not racist; we treat people equally. One thing that impressed me about my leader Anura Dissanayake from the very beginning was his compassion and also his stance on racial and religious issues. He always tells us that all of us are the same, that we are equal. We may be different, but we are equal. So, I am glad that I am part of the Government in bringing that dream to a complete success. If you look at how the ratings of our President at the recent social researches, his popularity is the highest in Jaffna in the North as well as among the Malaiyagam community. So, therefore, I think, we are doing the right thing without being racist.

However, what I would like to say is, we should not make the same mistake again. We have to understand that we were wrong, that what happened in July, 1983 was wrong. That is why this country suffered for well over 30 years. And, believe me, when we fight for well over 30 years, it takes more than one Provincial Council Election and more than enacting laws to build the lost trust. That trust can only be built with compassion, love, brotherhood and believing in unity.

Madam, I will finish off by quoting Psalm 133:1:

> “How good and pleasant it is when God’s people live together in unity!”

That is why God created us, to be united. Why? Unity among God’s people is seen as something good and pleasant, reflecting God’s desire for His followers to live in peace and mutual support. That is how humans are intended to live and that is exactly what the National People’s Power wants to do. So, today’s Adjournment Motion is about learning from the past and making sure that such an incident does not get repeated. No matter whatever people try - I do not want to engage in petty politics here - we have a bigger job to do and our bigger job is to make sure that those ugly incidents would never happen, that we all would live like one mother’s children.

Thank you.

*එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.46ට, 2026 ජූලි 24වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.46க்கு, பாராளுமன்றம் 2026 யூலை 24, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.46 p.m. until 9.30 a.m. on Friday, 24th July, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 893/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 893/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 01 - 893/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 894/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 894/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 02 - 894/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 895/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 895/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வாரகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 03 - 895/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah, appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.